INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

# පළාත් පාලන දේශපාලනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී යථාර්ථයන්හි පැවැත්ම සහ බලපෑම





උවිනි පණ්ඩිත

# පළාත් පාලන දේශපාලනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී යථාර්ථයන්හි පැවැත්ම සහ බලපෑම

උවිනි පණ්ඩිත

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය
2026

පළාත් පාලන දේශපාලනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී යථාර්ථයන්හි පැවැත්ම සහ බලපෑම


© ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය (ICES)
02, කිංසි ටෙරස්, කොළඹ 08, ශ්‍රී ලංකාව
විද්‍යුත් තැපැල : admin@ices.lk
URL : www.ices.lk



සියලු ම හිමිකම් ඇවිරිණි.



ISBN: : 978-624-5502-52-3

මෙම ප්‍රකාශනය සඳහා යුරෝපා සංගමය විසින් අරමුදල් සපයන ලදි. මෙහි අන්තර්ගතය ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයේ තනි වගකීම වන අතර යුරෝපා සංගමයේ අදහස් පිළිබිඹු නොකරයි.



මෙම පොතේ ඕනෑම කොටසක් කතුවරයාට සහ ප්‍රකාශකයාට නිසි පිළිගැනීමක් සහිතව ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය.


INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

Funded by
the European Union


කවරය: අයේෂා රවුෆ්, විමලා විජේවර්ධන, චන්ද්‍රා රණරාජා, වෛද්‍ය මේරි රත්නම්, ඩොරීන් වික්‍රමසිංහ, විවියන් ගුණවර්ධන සහ ඇඩ්ලින් මොලමුරේ.

ස්තුතිය: ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට

ඉංග්‍රීසියෙන් සිංහලයට පරිවර්තනය: චතුරංග තිලකරත්න සහ ඉනෝකා පල්ලියගුරු

මුද්‍රණය :
හොරයිසන් ප්‍රින්ට් පුද්ගලික සමාගම
1616/6, හතරමං හන්දිය,
මාළඹේ පාර, කොට්ටාව,
පන්නිපිටිය.

# පළාත් පාලන දේශපාලනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී යථාර්ථයන්හි පැවැත්ම සහ බලපෑම

**උවිනි පණ්ඩිත***

---

* **උවිනි පණ්ඩිත** යනු ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයේ පර්යේෂිකාවකි.

# ස්තූතිය

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා මා හට අවස්ථාව ලබා දීම සහ ක්‍රියාවලිය පුරාම අඛණ්ඩ මග පෙන්වීම සහ සහයෝගය ලබා දීම පිළිබඳව කොළඹ ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයේ (International Centre for Ethnic Studies) විධායක අධ්‍යක්ෂ ආචාර්ය මාරියෝ ගෝමස් මහතාට මම බෙහෙවින් කෘතඥ වෙමි.

මෙම පර්යේෂණයේ, වාර්තාව සඳහා අඩිතාලම දැමූ, දත්ත රැස් කිරීමට සහ අවසන් කෙටුම්පත සමාලෝචනය කළ බ්‍රියෝනි රණසිංහ මෙනවියගෙන් ආරම්භ වී කිහිප දෙනෙකුගේ වෙහෙස මහන්සි වී වැඩ කිරීමේ ප්‍රතිඵලයකි. ඇය නොමැතිව මෙම අධ්‍යයනය කළ නොහැකි වනු ඇති අතර ඇගේ දායකත්වය පිළිබඳව මම කෘතඥ පූර්වක වෙමි. මෙම පර්යේෂණය ආරම්භයේ සිටම දත්ත රැස් කරමින්, බ්‍රියෝනි සමග එකතුව වැඩ කරමින් සහ පසුව වාර්තාව දෙමළ භාෂාව සඳහා පරිවර්තනය කරමින් සහය වූ සරන්‍යා සිවසුබ්‍රමනියම්ට මම බෙහෙවින් කෘතඥ පූර්වක වෙමි.

එසේම වාර්තාව සමාලෝචනය කිරීමට සහ සවිස්තරාත්මක මෙන්ම සාධනීය අදහස් සහ යෝජනා ලබා දීමට බොහෝ වැඩ රාජකාරි මධ්‍යයේ වුවද නොමසුරුව කාලය වෙන් කළ ආචාර්ය චූලනි කොඩිකාර, ආචාර්ය නිරේකා වීරතුංග සහ ආචාර්ය සසංක පෙරේරා යන අයට මම ඒ හා සමානව කෘතඥ වෙමි.

ඉංග්‍රීසි පිටපතේ සෝදුපත් කියවූ ජස්ටින් හොරොවිට්ස් ට ද ස්තූතිය පුද කරමි. පර්යේෂණය දේශීය භාෂාවලට පරිවර්තනය කිරීමේ මෙම මහඟු කාර්යය භාර ගනිමින් නිස්සරණාධ්‍යාශයෙන් දිවා රාත්‍රී දෙකෙහිම ඒ සඳහා අවධානය යොමු කළ සරන්‍යා, චතුරංග තිලකරත්න සහ ඉනෝකා පල්ලියගුරු යන අයට  බෙහෙවින් කෘතඥ පූර්වක වෙමි. එසේම සිංහල සෝදුපත් කියවූ දේමිණි ගුණසේනට සහ දෙමළ සෝදුපත් කියවූ ජනන්දන් තවරාජාට ද මගේ ස්තූතිය හිමි වේ.

මෙම ප්‍රකාශනය නිම කිරීම සඳහා නිරන්තරයෙන් කැමැත්තෙන් සහාය වූ ටිරනි විජේවික්‍රම, මෙත්මිණි කාරියකරවන සහ යොහානි දොඩංගොඩ යන අයට සහ මෙම ප්‍රකාශනය නිම කිරීමට සහාය දැක්වූ ICES කණ්ඩායමේ සෙසු සාමාජිකයින්ට ද මම කෘතඥ වෙමි.

එසේම මීට අමතරව තම කාර්යබහුල වැඩ රාජකාරි මධ්‍යයේ වුවද අප සමඟ කතා කිරීමට සහ ඔවුන්ගේ දැනුම, අත්දැකීම් ඉතා විවෘතව බෙදා ගැනීමට කාලය වෙන් කරමින් තොරතුරු සැපයූවන්ටද මම බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

ප්‍රතිවිපාක හා අපහසුතා පවතිද්දීත් විවෘතභාවයෙන් හා විශ්වාසයෙන් යුතුව තම අත්දැකීම් බෙදා ගැනීමට කාලය වෙන්කළ සියලුම කාන්තා දේශපාලනඥයින්ට මම විශේෂයෙන් කෘතඥ වෙමි. මන්ද යත් අභියෝග හමුවේ වුවද ඒවාට මුහුණ දෙමින් දේශපාලන ක්ෂේත්‍රයට

ඇතුළු වීමට, ඒ වෙනුවෙන් කතා කිරීමට ධෛර්ය සම්පන්න වූ ඔබ සැම නොසිටින්නට මෙම පර්යේෂණය යථාර්ථයක් නොවනු ඇත.

වසර ගණනාවක් තිස්සේ කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය පුළුල් කිරීම සඳහා අනේකවිධ ආකාරවලින් සටන් කළ සියලූම කාන්තාවනි, ඔබේ ධෛර්යය නොමැති වූවා නම් මේ කිසිවක් කළ නොහැකි වනු ඇත.

# පටුන


ස්තුතිය .......................................................................................v

පළමු පරිච්ඡේදය : හැඳින්වීම .......................................................1

දෙවන පරිච්ඡේදය : ශ්‍රී ලාංකේය කාන්තාවගේ දේශපාලන සහභාගීත්වයඃ ඓතිහාසික සන්දර්භයක් ........................................ 5

පිතෘමූලික බැල්ම සහ ජාතික අනන්‍යතාවය........................... 6

සංකේතාත්මක නියෝජනයට එදිරිව ප්‍රමාණාත්මක නියෝජනය.... 13

තුන්වන පරිච්ඡේදය : සංකල්පීය රාමුව ඃ ස්ත්‍රීවාදී ආයතනවාදය .............................20

කෝටා ක්‍රමය සහ දකුණු ආසියානු පර්යාවලෝකනය ............24

හතරවන පරිච්ඡේදය : ක්‍රමවේදය ..........................................................32

පස්වන පරිච්ඡේදය : 2018 මැතිවරණ කාලය අතරතුර කාන්තාවන් විසින් මුහුණ දෙනු ලැබූ අභියෝග ..........................................35

5.1 දේශපාලන පක්ෂ අභ්‍යන්තරයෙන් ප්‍රවේශය පාලනය කිරීම සහ ආන්තීකරණය ...................................36

5.2 පළාත් පාලන ආයතන අභ්‍යන්තරයෙහි පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී බල යාන්ත්‍රණ.............................54

5.3 පවුල සහ ප්‍රජාව ඇතුළත දේශපාලනය සාකච්ඡා කිරීම...64

හයවන පරිච්ඡේදය : බාධක සමග ගනුදෙනු කිරීම සහ ප්‍රතිරෝධය අභියෝගයට ලක් කිරීම ..................................................76

6.1 බහිෂ්කරණය අභියෝගයට ලක් කිරීම සඳහා දැනුම වර්ධනය කිරීම ...........................................76

6.2 අවිධිමත් ප්‍රතිරෝධය සහ හරස්-පක්ෂ සහයෝගීතාවය.....77

හත්වන පරිච්ඡේදය : සමාප්තිය ....................................................... 81

අටවන පරිච්ඡේදය : නිර්දේශයන් ...............................................85

8.1 රජය සඳහාවන නිර්දේශයන් .......................................85

8.2 දේශපාලන පක්ෂ සඳහා වන නිර්දේශයන් ...................88

8.3 පළාත් පාලන ආයතන සඳහා වන නිර්දේශයන් ............90

8.4 මැතිවරණ කොමිසමට කෙරෙන නිර්දේශයන් ................90

8.5 සිවිල් සමාජ සංවිධාන සඳහා නිර්දේශයන් .................. 91

8.6 අන්තර්-අංශගත නිර්දේශයන් ...................................92

ආශ්‍රිත මූලාශ්‍රය ................................................................95

# වගු

වගු අංක 1 : 1947 සිට 2024 දක්වා පාර්ලිමේන්තු මට්ටමේ කාන්තා නියෝජනය ...... 15

වගු අංක 2 : 1966 සිට 2018 දක්වා පළාත් පාලන මට්ටමින් පැවති කාන්තා නියෝජනය ........................................................................ 16

වගු අංක 3 : සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගි වූ කාන්තා මන්ත්‍රීවරියන් දිස්ත්‍රික් සහ ජාතීන් ලෙස ව්‍යාප්තිය ........................................................ 33

*"අනේ මගේ ආදරණීයේ, ඔයාට ඡන්දය දෙන්න හෝ ගෘහණියකගේ භූමිකාවෙන් ඔබ්බට යමක් කිරීමට අවශ්‍ය වන්නේ ඇයි? 'තොටිල්ල නළවන අත ලෝකය පාලනය කරයි' කියන කියමන ඔයා හොඳින්ම දන්නවානේ. එසේ නම්, ඔයාට තවත් අවශ්‍ය වන්නේ මොනවද?" ...................... එහෙත් මෙවැනි පිරිමින්ට නොවැටහෙන්නේ, නිවස කාන්තාවගේ ස්ථානය නම්, එය පුරුෂයාගේ ස්ථානය ද වන බවයි. මන්ද, රාජ්‍යය යනු තනි තනි නිවාසවල එකතුවක් නොවේද? තවද, රාජ්‍යයට අදාළ කාරණා නිවාස ඇති සියලු දෙනාටම, පුරුෂයන්ට මෙන්ම කාන්තාවන්ටද අතිශය වැදගත් නොවන්නේද?"*

(Kularatne, 1922)

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක ලොව ප්‍රථම කාන්තා අගමැති වීමත් සමග, ශ්‍රී ලංකාව ගෝලීය ඉතිහාසයට එක් විය (Kodikara 2009, 15). ඇය බලයට පත්වීම ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි සමානාත්මතාවය සඳහා වන ගෝලීය අරගලයේ සන්ධිස්ථානයක් ලෙස සහ ප්‍රගතිශීලී වෙනසක මං සලකුණක් ලෙස පුළුල්ව සමරනු ලැබීය. කෙසේ වෙතත්, Kodikara (2009) සහ de Alwis (1995-96) වැනි ශාස්ත්‍රඥයින් සඳහන් කරන පරිදි කාන්තාවන් පුද්ගලික වපසරියකට සීමා කරන ලද පිතෘමූලික ව්‍යුහයන් බිඳ දැමීමට තරම් මෙම සිදුවීම ප්‍රමාණවත් නොවීය. බණ්ඩාරනායක සිය සැමියාගේ ඝාතනයෙන් පසු දේශපාලනයට අවතීර්ණ වූ අතර, එය ශ්‍රී ලංකාවේ කාන්තාවන් විධිමත් දේශපාලනයට පිවිසෙන රටාවකට අනුනාද විය. මන්ද යත් එය මූලික වශයෙන් පිරිමි දේශපාලනඥයින්ගේ භාර්යාවන්, වැන්දඹුවන් සහ දියණියන් ලෙස මිස ස්වාධීන බලමුළු ගැන්වීමක් ලෙස නොවේ. මේ අර්ථයෙන් ගත්කල, ඇගේ දේශපාලන අධිකාරිය කාන්තා සාමූහික සවිබල ගැන්වීමේ පිළිබිඹුවක් නොවූ අතර වැන්දඹුභාවය සහ පූජා මාතෘත්වයේ සංකේතාත්මක සුජාතභාවය සමග නැවත ඇසුරුම් කරන ලද පිතෘ මූලික දේශපාලනයේ අඛණ්ඩ පැවැත්මක් විය (Kodikara 2009, 15). සැබවින්ම, ස්ත්‍රීවාදී ශාස්ත්‍රඥයින් පෙන්වා දෙන පරිදි සිරිමාවෝ බණ්ඩාරනායකගේ මහජන ප්‍රතිරූපය ගැඹුරින් මුල්බැස ගෙන තිබුණේ ගුණවත්, ආත්ම පරිත්‍යාගශීලී සහ පරමාදර්ශී සිංහල-බෞද්ධ කාන්තාවක් තුළ මෙන් ම බණ්ඩාරනායකව නිතර සංසන්දනය කළ වඩාත් ප්‍රබල ලෙස මූර්තිමත් වූ විහාර මහා දේවියගේ චරිතය තුළය (de Alwis 2004).

සිංහල ස්ත්‍රීත්වයේ ඓතිහාසික ප්‍රතිමූර්ති අතර ප්‍රධානියා වන විහාර මහා දේවිය "කැළැලක් නැති ගැහැනියක්", "අචල ඇදහිල්ලක් ඇති" සහ "ධර්මිෂ්ඨ" ලෙස විස්තර කර ඇත (Seneviratne 1969). දුටුගැමුණු රජුගේ[1] මව ලෙස සහ දේශප්‍රේමී පරිත්‍යාගයේ චිරස්ථායී සංකේතයක් ලෙස, යටත් විජිත යුගයේ කතුවැකිවල සිට පශ්චාත්-නිදහස් ජාතිකවාදී විරෝධතා දක්වා පරමාදර්ශී ස්ත්‍රීත්වයේ ප්‍රතිමූර්තිය වන "සදාචාරවත් මව" නියෝජනය කිරීම සඳහා ඇය නැවත නැවතත් මහජන කතිකාව තුළ මතුකර ඇත. ජාතිය වෙනුවෙන් පුතුන් පෝෂණය කරන ගැහැනියක් රට, ජාතිය හා ආගම ආරක්ෂා කිරීම වෙනුවෙන් යටත් වන අතර මාතෘ සදාචාරයේ සීමාවන් තුළ පමණක් තම බලපෑම ක්‍රියාත්මක කරයි (de Alwis 2004). ඓතිහාසික වශයෙන් ශ්‍රී ලාංකික සමාජය තුළ කාන්තාවගේ භූමිකාව වඩාත් සංකීර්ණ වුවද, මෙම ස්ත්‍රී-පුරුෂ ජාතිකවාදී ආඛ්‍යානය පොදු ජීවිතයේ ගැහැනියගේ

---

1 ක්‍රි.පූ. 161 සිට 137 දක්වා අනුරාධපුර රාජධානිය පාලනය කළ දුටුගැමුණු රජු යනු, එළාර රජු පරාජය කර දිවයින එක්සේසත් කිරීම ගැන ශ්‍රී ලාංකේය ඓතිහාසික වංශකථාවල සඳහන් වන පාලකයෙකි. සිංහල-බෞද්ධ ජාතිකවාදී ආඛ්‍යානය තුළ ඔහු බොහෝ විට ජාතියේ සහ බුදු දහමේ වීරෝදාර ආරක්ෂකයෙකු ලෙස නිරූපණය කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමකාලීන දේශපාලනඥයින් නිරන්තරයෙන් ඔහුගේ ප්‍රතිරූපය ශක්තිමත් නායකත්වය, ජාතික සමගිය සහ ජාතික ස්වෛරීභාවය ආරක්ෂා කිරීම සංකේතවත් කිරීම පිණිස යොදා ගනී.

සහභාගිත්වය පිළිබඳ තේරුම් ගැනීම සැලකිය යුතු ලෙස හැඩ ගස්වා ඇති අතර එය බොහෝ විට ප්‍රමාණාත්මක ලෙස නොව සංකේතාත්මක ව අගය කර ඇත.

එහෙත්, මෙම සංකේතාත්මකව ගෞරවනීය ආරක පැවතුනත්, විධිමත් දේශපාලනය තුළ කාන්තාවන්ගේ සැබෑ පැවැත්ම අසමානුපාතික ලෙස අඩු මට්ටමක පවතී. 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී තේරී පත් වූ සාමාජිකයින්ගෙන් 5.4% ක් පමණක් කාන්තාවන් විය (IPU 2025a). මෙම අගය 2024 දී 9.8% දක්වා ඉහළ ගියද, විශේෂයෙන් කාන්තාවන් ජනගහනයෙන් 51.61% ක් වන රටක එය තවමත් ප්‍රමාණවත් නියෝජනයකට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතී (IPU 2025b; World Bank 2025a). සංකේතවාදය, ව්‍යුහාත්මක ප්‍රවේශයක් බවට හෝ දේශපාලන සමානාත්මතාවයක් බවට හෝ පරිවර්තනය වී නොමැති බව පෙනේ. සැබවින්ම, ශ්‍රී ලංකාවේ කාන්තාවගේ දේශපාලන නියෝජනය, ජාතික පාර්ලිමේන්තු වල කාන්තාවන්ගේ ගෝලීය මාසික ශ්‍රේණිගත කිරීම්වල 163 වන ස්ථානය නිරූපණය කරන අතර එය ලෝකයේ පහළම සහ දකුණු ආසියානු අසල්වැසියන්ටත් වඩා පහළ මට්ටමක පවතී. පකිස්තානය සහ ඉන්දියාව අනුපිළිවෙළින් 111 වන සහ 149 වන ලෙස සිටී (IPU 2026).

මෙම හිඩැස් හඳුනා ගනිමින් 2017 අංක 16 දරණ පළාත් පාලන මැතිවරණ (සංශෝධිත) පනත මගින් පළාත් මට්ටමින් කාන්තාවන් සඳහා අනිවාර්ය 25% කෝටාවක් හඳුන්වා දෙන ලදි (Vijeyarasa 2020). 2018 දී මෙය ක්‍රියාත්මක කළ විට කාන්තා නියෝජනයේ කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කළ අතර 2008 සහ 2011 අතර 2% සිට 23% දක්වා ඉහළ ගිය අතර (Wickramasinghe සහ Kodikara 2012), කාන්තාවන් 2000 ක් පමණ නිලයන්ට තේරී පත් විය (Manuratne et al. 2024). එමගින් පූර්ව දේශපාලන පළපුරුද්දක් නොමැති සහ පවුල් දේශපාලන පසුබිමක් නොමැති බොහෝ කාන්තාවන්ට පළාත් පාලන ආයතනවලට ඇතුළු වීමට හැකි විය (Peiris සහ Lekamwasam 2021). මීට අමතරව 2018 ට පෙර මුස්ලිම් මන්ත්‍රීවරියන් තිදෙනෙක් පමණක් සිටි අතර මෙම කෝටාව මගින් පළාත් පාලන ආයතනවල වඩාත් අඩු නියෝජනයක් ලැබී තිබූ මුස්ලිම් කාන්තාවන් ඇතුළත් කිරීමට පවා ඉඩ ප්‍රස්ථාව සැලසීය (Kodikara 2023). එහෙත්, කෝටාව හඳුන්වා දීම මගින් දේශපාලන භූ දර්ශනය තුළ පවතින ව්‍යුහාත්මක බල අසමතුලිතතාවයන් බිඳ දමා නැත. නාමයෝජනා ලබා ගැනීම සඳහා කාන්තාවන් පුරුෂ මූලික පක්ෂ ධූරාවලි මත රඳා පවතී. එය කාන්තාවන් ගමන් කළ යුතු සූරාකෑමේ ගතිකයන්ට නිදර්ශන සපයමින් නාමයෝජනා සඳහා ලිංගික අනුග්‍රහය යදිමින් සිටින පක්ෂ නිලධාරීන් පිළිබඳ වාර්තා සමග දේශපාලන ප්‍රවේශය අවහිර කිරීම බහුලව පවතී. (Munasinghe සහ Ariyarathne 2019).

එබැවින් කෝටාව, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය සඳහා ව්‍යුහාත්මක ඉඩ ප්‍රස්ථාවක් පිරිනමන අතර ගෝලීය වශයෙන් සහ ශ්‍රී ලංකාවේ තනතුරු සඳහා තේරී පත් වූ කාන්තාවන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට සමත් වී ඇත (Rai 2016; Manuratne et al. 2024). කෙසේ වෙතත්, ඒවා ස්වයංක්‍රීය ලෙස සවිබල ගැන්වීමකට, බලපෑමක් හෝ පාලනයේ

අර්ථවත් මැදිහත් වීමකට හේතු නොවේ. ආයතනගත ලිංගිකත්වය, සංකේතවාදය සහ තීරණ ගැනීමෙන් බැහැර කිරීම ඇතුළු බාධක වලට බොහෝ කාන්තාවන් අපේක්ෂකත්වය අතරතුර සහ මැතිවරණයෙන් පසු මුහුණ දෙයි (Vijeyarasa 2020). මේ අනුව ප්‍රමාණාත්මක නියෝජනයක් (Substantive Representation) කෙරෙහි කෝටා ක්‍රමයේ බලපෑම අපැහැදිලි බව පෙනේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කෝටාව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඇති ශාස්ත්‍රීය අවධානය වැඩි වෙමින් පවතියි. නමුත් එවැනි කෝටා හඳුන්වා දීමෙන් පසු කාන්තාවන් ඡන්දයෙන් තේරී පත් වුව ද, ශ්‍රී ලංකාවේ ගැඹුරින් පවතින පිතෘමූලික හා පුරුෂාධිපත්‍යය සහිත දේශපාලන වටපිටාවක හැසිරීම පිළිබඳව වූ, පර්යේෂණාත්මක ගවේෂණයන්හි සැලකිය යුතු හිඩැසක් පවතී. විශේෂයෙන්ම ප්‍රවේශය අවහිර කිරීම, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ අපේක්ෂාවන් සහ පිරිමි සගයන්ගේ ප්‍රතිරෝධය වැනි අවිධිමත් ආයතනික භාවිතාවන් නිසා, අර්ථවත් ලෙස සහභාගී වීමට සහ අධිකාරිය ක්‍රියාත්මක කිරීමට කාන්තාවන්ට ඇති හැකියාව කෙරෙහි බලපානු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳව දැනුවත් බව අල්පය.

එබැවින්, මෙම ප්‍රතිපත්තිමය මැදිහත් වීම, අර්ථවත් පරිවර්තනයන්ට තුඩු දී තිබේද නැතහොත්, සැබෑ බලයක් නොමැතිව ගෞරවයේ දීර්ඝ උරුමයකට, නව සංකේතාත්මක චරිත එකතු කර ඇත් දැයි තක්සේරු කිරීම සඳහා, සංඛ්‍යාවෙන් ඔබ්බට ගොස් මෙම කෝටා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසුව, කාන්තාවන්ගේ ජීවන අත්දැකීම් ගවේෂණය කිරීම අවශ්‍ය වේ.

මේ අනුව, පර්යේෂණ පෙළ (Research text) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අරමුණු කරයිඃ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර අතරතුර සහ තේරී පත්වීමෙන් පසු කාන්තාවන් මුහුණ දුන් ආයතනික හා සමාජ-සංස්කෘතික බාධක මොනවාද? කෝටාව ප්‍රමාණාත්මක සහභාගිත්වයක් සඳහා කොතරම් දුරට අවකාශය නිර්මාණය කර තිබේද? සහ ප්‍රාදේශීය සභා තුළ කාන්තාවන් ඔවුන්ගේ භූමිකාවන් සහ වගකීම් නියාමනය කරගන්නේ කෙසේ ද? යන ප්‍රශ්න පිළිබඳව වේ.

ගුණාත්මක සම්මුඛ සාකච්ඡා 40ක් මගින් ප්‍රාථමික දත්ත සපයා ගනිමින් සහ ද්විතීයික මූලාශ්‍රය පිළිබඳ සාහිත්‍යය විමර්ශනයක් මත පදනම්ව, ස්ත්‍රීවාදී ආයතනිකවාදයේ (Feminist Institutionalism) දෘෂ්ටිය හරහා ඔවුන්ගේ අත්දැකීම් විශ්ලේෂණය කරමින් මෙම අධ්‍යයනය, 2018 දී පළාත් පාලන ආයතනවලට ඇතුළත් වීමෙන් පසු, කාන්තා නියෝජිතයින්ට මුහුණ දීමට සිදු වූ ආයතනික ගතිකයන් සහ සමාජ-දේශපාලන අභියෝග පිළිබඳ ගවේෂණය කරයි. මෙම න්‍යායාත්මක රාමුව දේශපාලන ආයතන තුළ විධිමත් නීති රීති සහ අවිධිමත් ප්‍රතිමාන යන දෙකම කාන්තාවන්ගේ දේශපාලන ගමන් මග හැඩ ගස්වා ගැනීමට, සීමා කිරීමට හෝ සක්‍රීය කිරීමට හැකි ආකාරය තේරුම් ගැනීමට

උපකාර වෙමින්, සහභාගීත්වය, ඇතුළත් කිරීම සහ අධිකාරිය පාලනය කරන බොහෝ විට සැඟවුණු යාන්ත්‍රණයන් හෙළිදරව් කර ගැනීමට ආලෝකයක් සපයයි.

මෙම හැඳින්වීමෙන් පසුව, රචනය "ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගීත්වයේ ඓතිහාසික සන්දර්භය" විමර්ශනය කරයි. මෙම කොටසේ දී ජාතිකවාදී කතිකාවේ පිතෘ මූලික බැල්මේ භූමිකාව සහ සංකේතාත්මක (Symbolic) හා ප්‍රමාණාත්මක (Substantive) නියෝජනය අතර පවතින වෙනස කෙරෙහි අවධානය යොමු කරමින්, දේශපාලන බලය සඳහා කාන්තාවන්ගේ ප්‍රවේශය හැඩ ගස්වා ඇති ආකාරය ගවේෂණය කරයි. ඊළඟ කොටසේ දී යෝජිත අධ්‍යයනයේ සංකල්පීය රාමුව ගෙනහැර දක්වන අතර විධිමත් හා අවිධිමත් ආයතනික ප්‍රතිමාන, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය හැඩගස්වන ආකාරය විශ්ලේෂණය කිරීම සඳහා, ස්ත්‍රීවාදී ආයතනිකවාදය (Feminist Institutionalism) උකහා ගෙන ඇත. 2018 දී පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ කාන්තාවන් සමඟ පවත්වන ලද ගුණාත්මක අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මත පදනම් වූ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡාවක් ඉන්පසුව වේ. ඊළඟ කොටස මගින් පළාත් පාලන මැතිවරණයේ දී සහ ඉන්පසුව කාන්තාවන් මුහුණ දුන් ප්‍රධාන අභියෝග විමර්ශනය කරන අතර දේශපාලන පක්ෂ, පළාත් සභා සහ පවුලේ හා පුළුල් සමාජය වපසරිය තුළ මුහුණ දුන් බාධක පිළිබඳව විශ්ලේෂණය කරයි. පසුව කාන්තාවන් ඔවුන්ගේ දේශපාලන කටයුතුවල දී මෙම සීමාවන් හරහා ගමන් කළ ආකාරය සහ කතිකා කළ ආකාරය මෙම රචනය මගින් ගවේෂණය කර ඇත. අවසාන කොටස් තත් අධ්‍යයනයේ නිගමනය ඉදිරිපත් කරන අතර රජය, දේශපාලන පක්ෂ, පළාත් පාලන ආයතන, මැතිවරණ කොමිසම සහ සිවිල් සමාජ සංවිධාන ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවන් සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

## දෙවන පරිච්ඡේදය

# ශ්‍රී ලාංකේය කාන්තාවගේ දේශපාලන සහභාගීත්වය: ඓතිහාසික සන්දර්භයක්

ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරීන් විසින් 1931 මාර්තු මාසයේ දී වයස අවුරුදු 21 ට වැඩි කාන්තාවන් සඳහා ඡන්ද බලය ලබා ගැනීම දේශපාලන සහභාගීත්වය සඳහා වූ කාන්තා අරගලයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එහෙත්, එම වසරේ ජූනි මාසයේ දී සර්වජන ඡන්ද බලය යටතේ පැවති පළමු මැතිවරණයේ දී කිසිදු කාන්තාවක් අවසානයේ තරග කර නැත. ඒ සඳහා කිහිප දෙනෙක් මුලින් ඔවුන්ගේ නම් ඉදිරිපත් කර තිබුණද මැතිවරණ දිනයට පෙර ඔවුන් ඉවත් වූහ (de Alwis සහ Jayawardena 2023). Ceylon Observer පුවත්පත උපහාසාත්මකව ප්‍රකාශ කර තිබුණේ *"වර්තමාන ගෘහස්ථ අයවැය අනාගත අමාත්‍යවරුන් විසින් සකස් කරන අයවැයට වඩා රාජ්‍ය නිලධාරීන්ගේ භාර්යාවන්ට වඩාත් ආසන්නතම ගැටලුවක් ඉදිරිපත් කළ යුතු ව ඇත"* යනුවෙනි (Ceylon Observer, 1931 මාර්තු 5). එහෙත්, මෙම පුවත්පත විසින් නොසලකා හරින ලද කාරණයක් නම්, තරග කිරීමට උත්සාහ කළ කාන්තාවන්ගෙන් දෙදෙනෙකු රජයේ වෛද්‍යවරුන්ගේ භාර්යාවන් වූ බවත්, 1931 ජනවාරි මාසයේ දී රජයේ සේවකයින්ගේ භාර්යාවන්ට මැතිවරණයට ඉදිරිපත් වීම තහනම් කරමින් පනවන ලද රෙගුලාසි වලට අනුව ඔවුන්ට ඉල්ලා අස්වීමට බල කර තිබුණ බවත් ය.  එම වසර අග භාගයේ දී එනම් 1931 නොවැම්බර් මාසයේ දී ඇඩ්ලීන් මොලමුරේ පළමු කාන්තාව ලෙස රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඇතුළත් විය (de Alwis සහ Jayawardena 2023). මෙය වැදගත් සංකේතාත්මක ඉදිරි ගමනක් සනිටුහන් කළ නමුදු ශ්‍රී ලංකාවේ විධිමත් දේශපාලනයට කාන්තාවන්ගේ ප්‍රවේශය සීමිත වූ අතර, පුහු සහ සමාජීය ලෙස අනුමත මාර්ග සමග සමීපව බැඳී තිබුණු බව පෙනේ. මෙම රටාව ඊළඟ දශක කිහිපය තුළ තවදුරටත් ශක්තිමත් වෙමින් සිරිමාවෝ බණ්ඩාරනායක ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය ලෙස පත් වීමත් සමඟ එහි කූටප්‍රාප්තිය සනිටුහන් කළාය. කෙසේ වෙතත්, මෙවැනි සන්ධිස්ථානීය අවස්ථාවන් තිබියදීත්, කාන්තාවන්ගේ සමස්ත දේශපාලන නියෝජනය අඛණ්ඩව අඩු මට්ටමක පවතින අතර එයින් විද්‍යමාන වනුයේ එවැනි ජයග්‍රහණ කාන්තාවන්ගේ දේශපාලන බලයට ඇති ප්‍රවේශයෙහි පුළුල් ව්‍යුහාත්මක වෙනසක් බවට පරිවර්තනය නොවී ඇති බවයි. සීමාසහිත මෙන් ම ප්‍රභූ ප්‍රවේශයක් ඇති මෙම මුල්කාලීන රටාවන්, දේශපාලනය පුරුෂ මූලික බලමණ්ඩලයක් ලෙස ස්ථානගත කරන අතරම කාන්තාවන් ගෘහස්ථ ක්ෂේත්‍රය සමඟ අනුබද්ධ කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ආබද්ධ ප්‍රතිමාන සමඟ සමීපව බැඳී ඇත. ජාතිකවාදී කතිකාව සහ පිතෘ මූලික බැල්ම හරහා මෙම ගතිකයන් හැඩගස්වා ඇති ආකාරය සහ ශ්‍රී ලංකාවේ සංකේතාත්මක හා ප්‍රමාණාත්මක නියෝජනය අතර වෙනස මෙන් ම ඒවා දිගටම දැනුම් දෙන ආකාරය පිළිබඳ පහත කොටසින් විමර්ශනය කරයි.

## පිතෘමූලික බැල්ම සහ ජාතික අනන්‍යතාවය

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය පිළිබඳව පවතින ශාස්ත්‍රීය වාද විවාද බොහෝ විට කැපී පෙනෙන විරුද්ධාභාසයක් ඉස්මතු කර ඇත. අගමැති ධුරය සහ ජනාධිපති ධුරය වැනි බලයේ ඉහළ තනතුරුවල පවා කාන්තාවන් සංකේතාත්මකව අභිමුඛව තිබියදීත්, ව්‍යුහාත්මක බාධක අඛණ්ඩව කාන්තාවන් අර්ථවත් නියෝජනයෙන් බැහැර කර ඇත (Jayawardena 1986; Kodikara 2009). ප්‍රභූන් සහ පරම්පරාගතව තනතුරු සඳහා ඇති ප්‍රවේශයෙහි ආධිපත්‍යය දරමින්, තීරණ ගැනීමේ අවකාශයන්හි දේශපාලන රාජවංශවලින් පිටත කාන්තාවන්ගේ සම්ප්‍රාප්තිය වසන් කර ඇත (Jayawardena 1986). 2018 දී හඳුන්වා දුන් 25% පළාත් පාලන කෝටාව කාන්තා සහභාගීත්වය පුළුල් කිරීම සඳහා ව්‍යුහාත්මක උත්සාහයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තේ මෙම පසුබිම තුළ වන අතර එය ප්‍රායෝගිකව සැලකිය යුතු ප්‍රතිරෝධයකට මුහුණ පා ඇත.

ශ්‍රී ලංකාවේ දේශපාලන බලය සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය සම්බන්ධ ගැඹුරු ඓතිහාසික මූලයෝ හැඩගැසී ඇත්තේ ඥාතිත්වය සහ වරප්‍රසාද අනුව වෙති. ඓතිහාසික වාර්තා පෙන්වා දෙන පරිදි පුරාණ කාලයේ කුවේනි, අනුලා දේවි, සෝමා දේවි සහ ලීලාවතී වැනි රැජිනන් රට පාලනය කළ අතර සමහර වාර්තාවලට අනුව හමුදාවන් සටනට ද මෙහෙයවා ඇත (Jayawardena 1986). දේශපාලන උපාය මාර්ග මාලාවකින් පසු සිංහාසනාරූඪ වූ බව පැවසෙන අනුලා රැජිනගේ සිද්ධිය මගින් පාලනයේ ඉහළම මට්ටම් වලට කාන්තාවන්ට කොතරම් දුරට බලාධිකාරිය ක්‍රියාත්මක කළ හැකි ද යන්න ඉස්මතු කරයි. කෙසේ වෙතත්, මහා වංශය[2] වැනි වංශකථාවල ඇයව බොහෝ විට සදාචාර විරෝධී නැතහොත් අපගාමී[3] ආකාරයට නිරූපණය කර ඇති ආකාරය තුළින්ද සම්මත ස්ත්‍රී-පුරුෂ ප්‍රතිමාන ඉක්මවා ගිය කාන්තා අධිකාරිය සමඟ ඇති අසහනයක් පිළිබිඹු කරන බව පෙනේ.

මේ අනුව, දකුණු ආසියාවේ වෙනත් ප්‍රදේශවල "සම්භාව්‍ය පුරුෂාධිපත්‍යය" ලෙස විස්තර කර ඇති දෙයට ශ්‍රී ලංකාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි පර්යාය සමානුපාතික නොවන බව විද්‍යමාන වේ (Kandiyoti 1991). පූර්ව යටත් විජිත යුගයේ සාක්ෂි වලින් පෙනී යන්නේ සිංහල කාන්තාවන් ගෘහස්ථ වපසරියකට ඒකාකාරී ලෙස සීමා නොවූ බවත්, ඔවුන්ට දේපළ සඳහා ප්‍රවේශය තිබූ අතර පවුලේ පිය උරුමයට ඇති හිමිකම කියාපෑම පවත්වා ගනිමින් පවුලෙන් ඔබ්බෙහි වූ ආර්ථික හා සමාජ ජීවිතයට සහභාගී වූ බවත් ය. එබැවින් මෙම රටාවන් අඟවන්නේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සබඳතා ධූරාවලිගත වුවත්,

---

2 මෙය පාලි භාෂාවෙන් රචිත පුරාණ බෞද්ධ ග්‍රන්ථයක් වන අතර එය ශ්‍රී ලංකාවේ පැරණිතම ඓතිහාසික වාර්තා වලින් එකක් ලෙස ද සැලකේ. කෙසේ වෙතත්, මහාවංශය බෞද්ධ භික්ෂුවක් විසින් රචනා කරන ලද බැවින් එහි දේශපාලන හෝ සමාජ ඉතිහාසයට වඩා බුදු දහමේ ඉතිහාසය සහ රාජවංශ අනුප්‍රාප්තිකත්වයෙහි ඉතිහාසය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

3 අනුරාධපුර සිට රට පාලනය කළ අනුලා රැජින යනු ක්‍රි. පූ. 47 සිට 42 දක්වා ශ්‍රී ලංකාව පාලනය කළ ප්‍රථම වාර්තාගත රැජින වේ. මහාවංශය සහ දීපවංශයට අනුව ඇය චෝරනාග රජුගේ බිරිඳ බව වංශකථාව කියයි. පසුව වාර්තා පෙන්වා දෙන්නේ ඇය අවම වශයෙන් තවත් ස්වාමිපුරුෂයන් හතර දෙනෙකුට සහ වල්ලභයන්නට වස පොවා ඇති බවත්, අවසානයේ ඇය තනිවම රට පාලනය කළ බවත් ය.

කලාපයේ වෙනත් තැන්වල දක්නට ලැබෙන හුදකලාව සහ පාලනයේ තත් දෘඪ ව්‍යුහයන් හරහා ක්‍රියාත්මක වී නැති බවයි (Jayawardena 2002).

කෙසේ වෙතත් මෙයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ධූරාවලියක් නැතැයි ඇඟවෙන්නේ නැත. ඒ වෙනුවට, පොදු හා දේශපාලන ජීවිතය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය ලබා ගත හැකි වූ නමුත් පුරුෂ අධිකාරිය සහ සමාජ ගෞරවය පිළිබඳ අපේක්ෂාවන් මගින් මැදිහත් වූ සන්දර්භයක් පැවති බව ශ්‍රී ලංකාවේ ඓතිහාසික අත්දැකීම පෙන්වා දෙයි. මෙවැනි ආතතියක් තුළින් පසුකාලීන ජාතිකවාදී කතිකාවන් මගින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ පැවති පරමාදර්ශයන් තවදුරටත් ශක්තිමත් කළ අතර කාන්තාවන් පුද්ගලික වපසරිය සමඟ වැඩි වැඩියෙන් සම්බන්ධ කරන අතරම ජාතිය තුළ ඔවුන්ගේ භූමිකාව ද සංකේතාත්මකව ඉහළ නංවා ඇත (Jayawardena 2002).

නේසම් සරවනමුත්තු සහ ඇඩ්ලීන් මොලමුරේ වැනි මුල් කාන්තා ව්‍යවස්ථාදායකයින්ගේ ප්‍රවේශය තුළින් ද මෙම ගතිකත්වය පැහැදිලි වේ. එහි දී කාන්තාවන්ට දේශපාලන තනතුරු වෙත තිබූ ප්‍රවේශයට බොහෝ විට ස්වාධීන දේශපාලන බලමුළු ගැන්වීමකට වඩා පවුල් පෙළපත සහ ප්‍රභූභාවය හරහා පහසුකම් සපයන ලදි (Jayawardena 1986). මෙම "වැන්දඹුව-බිරිඳ-දියණිය" යන රටාව නූතන යුගය දක්වා පැවතුණි, එහි දී දේශපාලන ක්ෂේත්‍රයට සාර්ථකව පිවිසුණු කාන්තාවන් කිහිප දෙනෙකු බොහෝ විට පවුල් සබඳතා හරහා එය උදා කරගත් අතර විශේෂයෙන් පිරිමි ඥාතීන්ගේ මරණයෙන් පසුව එසේ කර ඇත. නිදසුනක් ලෙස, සිරිමාවෝ බණ්ඩාරනායක සිය සැමියාගේ ඝාතනයෙන් පසු අගමැති ධූරයට පත් වූ අතර ඇගේ දියණිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සිය සැමියා වූ ජනාධිපති ධූරය සඳහා බලාපොරොත්තුවක් පැවති විජය කුමාරතුංගගේ මරණයෙන් පසු දේශපාලනයට අවතීර්ණ විය. මෙම අවස්ථා වලින් පෙනී යන්නේ දේශපාලන සුජාතභාවය සංකේතාත්මකව පිරිමි පැළැන්තිය හරහාම සිත්නක්කරව පවතින අතර, කාන්තාවන්ගේ දේශපාලන භූමිකාව ස්වතන්ත්‍ර දේශපාලන කාරකත්වයකට වඩා බලවත් පිරිමින් සමඟ ඔවුන්ගේ සම්බන්ධතා මත රඳා පවතී යන සංකල්පය ශක්තිමත් කරයි (Jayawardena 1986).

මෙම උරුමය අදටත් දේශපාලනයට ඇති කාන්තාවන්ගේ ප්‍රවේශය හැඩ ගස්වමින් සිටී. බොහෝ කාන්තා මන්ත්‍රීවරියන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මූල්‍ය සහායන් සහ ශක්තිමත් ආධාරක ජාලයන් වෙත ප්‍රවේශය සපයන ස්ථාපිත දේශපාලන පවුල් වලින් පැන නගින අතර ස්වාධීන කාන්තා අපේක්ෂකයින් බොහෝ විට නාම යෝජනා හෝ සම්පත් අත්පත් කර ගැනීමට අරගල කරති. අද්‍යතන ශ්‍රී ලංකාවේ මැතිවරණ සාර්ථකත්වය තවමත් රඳා පවතින්නේ බොහෝ දුරට පිරිමින් විසින් පාලනය කරන "ධනය හා පිරිස් බලය" යන ද්විත්ව අවශ්‍යතා මත ය. එබැවින්, කාන්තාවන් තම පිරිමි ඥාතීන්ගේ "මිනිය උඩින්" දේශපාලනයට පිවිස නොමැති අවස්ථාවන්හිදී, ඔවුන්ගේ දේශපාලන දියුණුව බොහෝ දුරට රඳා පවතින්නේ පිරිමි උපකාරය සහ ඥාති සබඳතා මත වේ. මේ අර්ථයෙන් ගත් කල,

කාන්තාවන් දේශපාලනයට පිවිසෙන්නේ පිතෘමූලික ව්‍යුහයන් හරහා පමණක් නොව මෙම ව්‍යුහයන් විසින් පනවන ලද සීමාවන් තුළ ද වේ (Pinto-Jayawardena සහ Kodikara 2003).

දකුණු ආසියාව පුරා දේශපාලනයට පරම්පරාගත පිවිසීම පොදු සංසිද්ධියක් සේ පෙනෙන අතර Pinto-Jayawardena සහ Kodikara (2003) නිරීක්ෂණය කරන්නේ ශ්‍රී ලංකාවේ පවතින මෙම ප්‍රවණතාවය වංශවත් පවුල් වලට පමණක් සීමා වී නොමැති බවයි. ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් පුනරාවර්තිත දේශපාලන ඝාතන වලින් සලකුණු වූ රටේ අස්ථාවර දේශපාලන වාතාවරණය හේතුවෙන් බොහෝ විට ඝාතනය කරන ලද පිරිමි ඥාතීන්ගේ අනුප්‍රාප්තිකයන් ලෙස වැන්දඹුවන්, මව්වරුන් සහ දියණියන් රජයේ සෑම තරාතිරමකම දේශපාලනයට පිවිස ඇත.

එහෙත්, ඥාතීත්වය මත පදනම් වූ දේශපාලන ප්‍රවේශය සෑම විටම පිරිමි මරණය මත පමණක් රඳා පවතින්නේ නැත. ඇතැම් අවස්ථාවල දී, භාර්යාවන් සහ දියණියන් දේශපාලනයට පිවිස ඇති අතර ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් හෝ පියවරුන් දේශපාලනිකව ක්‍රියාශීලී ව සිටිති. නිදසුනක් වශයෙන්, නේසම් සරවනමුත්තු 1931 මැතිවරණයට තරඟ කළේ ඇගේ සැමියාට පුරවැසි අයිතිවාසිකම් අහිමි වී ඔහුගේ දේශපාලන තනතුරෙන් ඉවත් වීමෙන් පසුව ය (Wickramasinghe සහ Kodikara 2012). "යුවළ දේශපාලනය" ("Couple Politics") ලෙස ශාස්ත්‍රඥයින් විස්තර කරන ලද දෙයෙහි මතුවීමක් මෙහි දී සනිටුහන් කළේ ය. පළාත් සභා පිහිටුවීමත් සමඟ එය වඩාත් කැපී පෙනෙන රටාවක් බවට පත් වී තිබේ. කාන්තාවන්ගේ දේශපාලන පැවැත්ම බොහෝ විට ස්වාධීන කාරකත්ව ප්‍රකාශනයක් ලෙස නොව පිරිමි පාලනයේ දිගුවක් ලෙස ක්‍රියා කළ ආකාරය නිරූපණය කරමින් පිරිමි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඔවුන්ගේ ප්‍රාදේශීය බල කඳවුරු තහවුරු කර ගැනීම සඳහා තත් ආයතනවලට ස්වකීය භාර්යාවන් උපායමාර්ගිකව නම් කර ඇත (Pinto-Jayawardena සහ Kodikara 2003).

කෙසේ වෙතත්, කාන්තා දේශපාලනඥයින්ගේ මුල් පරම්පරාවන් විශේෂයෙන් 1930 සහ 1950 දශක අතර සිටි ක්‍රියාකාරිනියන් වෙනස් ගමන් මගක් පෙන්නුම් කරයි. මන්ද යත් ඔවුන්ගෙන් ඇතැමෙක් ප්‍රසිද්ධ පිරිමි දේශපාලනඥයින් සමඟ විවාහ වී සිටි නමුත් ඔවුන්ගේ දේශපාලන අනන්‍යතාවය මෙම සබඳතා වලට ඌනනය කළ නොහැකි විය. විවාහයට බොහෝ කලකට පෙර ක්‍රියාකාරිත්වයේ සහ රාජ්‍ය සේවයේ නිරත වෙමින් ඔවුහු ස්වාධීන දේශපාලන විශ්වාසයක් පවත්වා ගෙන ගියහ. නිදසුනක් වශයෙන්, විවියන් ගුණවර්ධන[4] පිතෘ මූලිකත්වය පිළිබඳ ප්‍රබල විවේචකයෙකු පමණක් නොව ඇගේ ස්වාමිපුරුෂයාගේ සහ තනතුරේ සිටින පිරිමි ඥාතීන්ගෙන් තියුණු ලෙස වෙනස් වූ දේශපාලන අදහස් දැරීම සඳහා ද ප්‍රසිද්ධියක් ඉසිලුවාය. (Jayawardena 1997). මේ අනුව උක්ත කාන්තාවෝ

4 විවියන් ගුණවර්ධන ශ්‍රී ලංකාවේ පළමු දේශපාලන පක්ෂයේ කොටසක් වූ ප්‍රමුඛ සමාජවාදී දේශපාලනඥවරියකි; 1950 දී ලංකා සමසමාජ පක්ෂයේ නාගරික මන්ත්‍රීවරියක් වූ ඇය 1956-60, 1964-65 සහ 1970-77 අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් බවට ද තේරී පත්විය. එසේ ම ඇය කනිෂ්ඨ සෞඛ්‍යය අමාත්‍යය (Junior Minister of Health) ලෙසද කලක් සේවය කළා ය.

වඩාත් ස්වාධීන සහභාගීත්වයක් නියෝජනය කරමින් කාන්තා දේශපාලනඥයින් ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ගේ දිගුවක් පමණක්ය යන පිතෘ මූලික අභ්‍යුපගමනයට ද අභියෝග කළහ.

කෙසේ වෙතත්, Pinto-Jayawardena සහ Kodikara (2003) සඳහන් කරන පරිදි, නාමිකව ධුරය දරන නමුත් මූලික වශයෙන් තම ස්වාමිපුරුෂයන් හෝ පිරිමි ඥාතීන් වෙනුවට ක්‍රියා කරන වර්තමාන බහුතර "නියෝජිත" කාත්තා දේශපාලනඥයින්ට වඩා මෙම මුල් පරම්පරාව හාත්පසින්ම වෙනස් ය. එවැනි කාන්තාවන්ට බොහෝ විට තමන්ගේ ම දේශපාලන ස්වාධීනත්වයක් හෝ දෘෂ්ටිවාදී කැපවීමක් නොමැතිව වුවද පුරුෂ බලය සමඟ ඇති ඔවුන්ගේ සම්බන්ධතාවය ගැන ආඩම්බර වන අතර ම ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ පිතෘමූලික අනුග්‍රහයේ අඛණ්ඩ සංස්ථිතිය ද පිළිබිඹු කරයි.

සාම්ප්‍රදායක ව පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි භූමිකාවන් කඩාකප්පල් කිරීම වෙනුවට ශක්තිමත් කිරීම සඳහා අධ්‍යාපනය සතු කාර්යභාරය ඉස්මතු කරමින් Jayawardena (1986) ශ්‍රී ලංකාවේ කාන්තාවන් අඛණ්ඩව දේශපාලන යටත් කර ගැනීම සඳහා වූ ප්‍රබල පැහැදිලි කිරීමක් යෝජනා කරයි. ඇය තර්ක කරන්නේ කාන්තාවන්ට අධ්‍යාපනයට ප්‍රවේශය ලබා දීම සාම්ප්‍රදායික සමාජය විසින් නියම කරන ලද භූමිකාවන්ට වඩා මතුපිටින් පමණක් වෙනස් වූ භූමිකාවන් ලෙස සමාජගත කිරීමට ක්‍රියා කළ බවයි. වෙනත් වචන වලින් කිවහොත්, අධ්‍යාපන පද්ධතිය පිතෘමූලික ව්‍යුහයන්ට අභියෝග කිරීමට කාන්තාවන් සන්නද්ධ නොකළ නමුත් ඒ වෙනුවට ඒවා වඩාත් නවීකරණය වූ ස්වරූපයෙන් ප්‍රතිනිෂ්පාදනය කර ඇත. තව දුරටත් Jayawardena (1986) තර්ක කරන්නේ ශ්‍රී ලාංකික කාන්තාවන් අසල්වැසි දකුණු ආසියාවේ පැවති සම්ප්‍රදායන් සලකුණු කරන සති පූජාව හෝ ළමා විවාහය වැනි ප්‍රකට කුරිරු භාවිතයන් වලට යටත් නොවූ හෙයින්, යටින් පවතින සමාජ පර්යාය පරිවර්තනය කිරීමට උත්සාහ කරන විමුක්තිය සඳහා වූ මහජන ව්‍යාපාරයක් ඔවුන් අතින් වර්ධනය නොවූ බවයි. අධ්‍යාපනය සහ සෞඛ්‍යය ක්ෂේත්‍ර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ලංකාවේ සාපේක්ෂව ප්‍රගතිශීලී දර්ශක පවතී. විශේෂයෙන් ඉහළ කාන්තා සාක්ෂරතා අනුපාතය, අඩු මාතෘ මරණ අනුපාතය, ඉහළ කාන්තා ආයු අපේක්ෂාව[5] මෙන් ම සාපේක්ෂව ගතහොත් ප්‍රසිද්ධියේ දෘඩ සීමාසහිත භාවිතයන් නොමැතිකම හරහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ ප්‍රතිරූපයක් ප්‍රක්ෂේපණය කළද, මෙයින් පුරුෂාධිපත්‍යය නොමැති බව අදහස් නොවේ. ඒ වෙනුවට, එය වඩාත් සියුම් හා සමාජීය වශයෙන් කාවැද්දූ ස්වරූපවලින් ක්‍රියාත්මක විය (Jayawardena 1986). ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ යටහත් පහත් කර ගැනීමට හැකි ගැඹුරු රටාවන්ට බාධා නොකර, කාන්තා අගමැතිනියක් සහ ජනාධිපතිවරියක් වැනි ඉහළම දේශපාලන තනතුරුවල කාන්තාවන්ට මතු වීමට හැකි වීම ආදිය ද ඇතුළුව මෙසේ විවෘත ගැටුම් නොමැති වීම නිසා සමහර කාන්තාවන්ට වෘත්තීය හා දේශපාලන අවකාශයන්ට ඇතුළු වීමට හැකි වූ තත්ත්වයන් නිර්මාණය විය. අධ්‍යාපනය

5 මෑත කාලීන දත්ත මෙම රටාව පිළිබිඹු කරන බව පෙනේ. 2023 සිට සංඛ්‍යාලේඛන හෙළි කරන්නේ ශ්‍රී ලංකාවේ කාන්තා සාක්ෂරතා අනුපාතය ඉතා ඉහළ මට්ටමක පවතින බවය. එය වැඩිහිටි කාන්තාවන් (වයස අවුරුදු 15 සහ ඊට වැඩි) සඳහා 92% කට වඩා වැඩි ප්‍රමාණයක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මාතෘ මරණ අනුපාතය සජීවී උපත් 100,000 කට මරණ 18 ක් වැනි අඩු මට්ටමක පවතින බවයි (World Bank 2025b).

හා සමාජ ප්‍රතිමාන මගින් ශක්තිමත් කරන ලද ප්‍රභූ ප්‍රවේශයේ මෙම ඓතිහාසික රටාව ජාතිකවාදී කතිකාවන් ගොඩනැගීමට දායක වූ අතර එය වර්තමාන දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ ස්ථානය හැඩ ගස්වා සීමා කර ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව කාන්තා ශ්‍රම බලකායේ අඩු සහභාගීත්වයක් සහ සීමිත කාන්තා දේශපාලන නියෝජනයක් වාර්තා කරන බැවින් මෙම සමාජ ජයග්‍රහණ පුළුල් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයක් බවට පරිවර්තනය වී නැත (World Bank 2025b).

කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වයට එල්ල වන මෙම ප්‍රතිරෝධය සමාජය තුළ කාන්තාවන්ගේ භූමිකාවන් නිර්වචනය කරන සංස්කෘතික හා ජාතිකවාදී කතිකාවන් තුළ ගැඹුරින් මුල් බැස ගෙන ඇත. de Alwis (2002) තර්ක කරන්නේ කාන්තා දේශපාලන සහභාගීත්වය වටා ඇති විවාදවල සැකසුම සහ අන්තර්ගතය කාලයත් සමඟ විතැන් වී ඇති නමුත් මෙම කතිකාවන්ට යටින් ඇති "ප්‍රාථමික මූලසාධක" වෙනස් වී නැති බවයි. සිංහල, දෙමළ හෝ මුස්ලිම් වේවා ශ්‍රී ලාංකික කාන්තාවන්ව 'සම්ප්‍රදාය', 'සංස්කෘතිය', 'ප්‍රජාව' සහ 'ජාතිය' ප්‍රතිනිෂ්පාදකයන්, පෝෂණය කරන්නන් සහ භාරකරුවන් ලෙස අඛණ්ඩව ගොඩනගා ඇත.

මෙම පුළුල් රාමුව තුළ, විශේෂයෙන්ම සිංහල ජාතිකවාදය කාන්තාව ව නිහතමානී, පතිවත රකින, නිවසෙන් පිටත ලෝකය ගැන නොදැනුවත්, තම ස්වාමිපුරුෂයන්ට කීකරු සහ ඔවුන්ගේ පවුල් සඳහා කැප වූ කාන්තාවක් ලෙස දිගු කලක් තිස්සේ පරමාදර්ශනය කර ඇත (Marecek 2000). එවැනි ආඛ්‍යාන තුළ, කාන්තාවන් ජාතියේ ගෞරවය සහ පාරිශුද්ධත්වය මූර්තිමත් කරන ජාතිකත්වයේ සංකේත ලෙස දක්නට ලැබෙන ලැබේ; නැතිනම් ආරක්ෂා කළ යුතු හෝ පාලනය කළ යුතු ජාතික සාමූහිකත්වයේ දේපළක් බවට පත් වෙයි (Enloe 2014; Jayawardena සහ de Alwis 1996). මෙම නිරූපණයන් කාන්තාවන් දේශපාලන ආත්මීයත්වයෙන් ගලවා දමමින් දේශපාලන පාත්‍රයන් වෙනුවට සංස්කෘතික නිරූපිකාවන් ලෙස වාත්තු කරන අතර ඔවුන් ගෘහස්ථ වපසරියකට සීමා කරන ධූරාවලිගත ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි භූමිකාවන් ද ශක්තිමත් කරයි.

යටත්විජිතවාදය මෙම බෙදීම් ශක්තිමත් කළේ වික්ටෝරියානු සදාචාරය පිළිබඳ අදහස් ශ්‍රී ලාංකික සමාජය තුළට ගෙන ඒමෙනි. මෙම පරමාදර්ශයන්, ක්‍රිස්තියානි පිතෘමූලික සම්මතයන්හි බලපෑම සහ දහනව වන සියවසේ සිංහල බෞද්ධ ජාතිකවාදී චින්තනයේ මතු වීම සමඟ ඒකාබද්ධ ව, ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ ගෞරවනීයභාවය පිළිබඳ සංකල්පයක් ගොඩනැගීමට දායක වූ අතර එමගින් යටහත් පහත් ස්ත්‍රීත්වයක් බිහි විය (Jayaweera 1990; de Alwis 1997). නිදසුනක් වශයෙන් යටත් විජිත සමයේ දී ක්‍රිස්තියානි මිෂනාරි සේවකයන් විසින් සංගෘහිත කරන ලද ලේඛන වලින් හෙළි වන්නේ ක්‍රිස්තියානි ආගම වැළඳ ගත් සිංහල කාන්තාවන් "වඩාත් බුද්ධිමත්, බාහිර පෙනුමෙන් විනීත සහ අන් අයට වඩා සදාචාරාත්මක" ලෙස ඔවුන් සැලකා ඇති බවයි (Selkirk 1844, 324). de Alwis (1997) සඳහන් කරන පරිදි, 'බාහිර පෙනුම' යන යෙදුම බොහෝ විට "විනීත",

"ගෘහස්ථ", "නිහතමානී", "මෘදු", "සරල", "යටහත්" සහ "ලැජ්ජාශීලී" වැනි වචන වලින් සරසා ඇත. වික්ටෝරියානු පරමාදර්ශයන් නිහතමානී, සදාචාරාත්මකව අවංක භාරකරුවන් ලෙස කාන්තාවන්ගේ භූමිකාවන් අවධාරණය කළේ කෙසේ ද යන්න මෙයින් පැහැදිලි වේ. එමගින් ස්ත්‍රීත්වය ගෘහස්ථභාවය සහ සදාචාරාත්මක ගුණධර්ම සමඟ සම්බන්ධ කරන ලදි. යටත් විජිත ආධිපත්‍යයට ප්‍රතිචාර වශයෙන් ජාතිකවාදී දෘෂ්ටිවාදයන් විසින් "සම්ප්‍රදාය" රොමාන්තිකකරණය කළ අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අවකාශීය බෙදීම තවදුරටත් ශක්තිමත් කළහ; ස්ත්‍රීකරණය වූ පුද්ගලික වපසරියට එදිරිව පුරුෂාධිපත්‍යකරණයකට ලක් වූ මහජන වපසරියක් බිහි විය (de Alwis 1995-96). කාන්තාවන් නිවස තුළට වී සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කිරීමට අපේක්ෂා කරන ලද අතර දේශපාලන බලය පිරිමි බල ප්‍රදේශයක් ලෙස පැවතුණි (Marecek 2000). මෙම ක්‍රියාවලිය හරහා කාන්තාවන් වාර්ගික ගෞරවයේ ආරක්ෂකයින් ලෙස ස්ථානගත කරන ලද අතර ඔවුන්ගේ සමාජ වටිනාකම සදාචාරාත්මක ගෞරවය පවත්වා ගැනීම මත රඳා පැවති බව පෙනේ.

මේ අනුව, කාන්තාවන්ට භාර්යාවකගේ, මාතෘත්වයේ හෝ වැන්දඹුභාවයේ ගෞරවයෙන් වසන්වී පොදු අවකාශ වෙත ඇතුළු වීමට බල කෙරිණ (de Alwis 1995). හොඳ බිරිඳක් සහ මවක් ලෙස වූ "ගෞරවනීය කාන්තාවක්" යන ජාතිකවාදී නිර්මිතය කාන්තාවන්ගේ ඇඳුම, කථනය සහ හැසිරීම දැඩි සදාචාරාත්මක පරීක්ෂාවට ලක් කළේය. සුදුසු හෝ විනීත යැයි සලකන දේවල සීමාවන් අතික්‍රමණය කළ ගැහැනුන් ප්‍රසිද්ධියේ නින්දා අපහාස වලට, චරිත ඝාතනයන්ට සහ සදාචාරාත්මක හෙළා දැකීම වැනි අවදානමකට ලක් විය (Pinto-Jayawardena සහ Kodikara 2003).

ස්ත්‍රීවාදී ශාස්ත්‍රඥයින් තර්ක කරන්නේ කාන්තාවන්ගේ වුවමනාවන් සහ අභිරුචිය සැබවින්ම පිළිගැනීමට සහ ඒවාට ගරු කිරීමට නම්, ඒවා ජාතිය තුළ ඇතුළත් කළ යුත්තේ උදාසීන සංකේත ලෙස නොව දේශපාලන කාරකත්වය සමඟ ගනුදෙනු කරන විෂයයන් ලෙස බවයි (Marecek 2000). එහෙත් කාන්තාවන්ගේ ජාතිකවාදී නිරූපණයන් ධූරාවලිගත ස්ත්‍රී පුරුෂ සබඳතා ශක්තිමත් කරන අතර කාන්තාවන්ගේ යටත් පහත් භාවය සහ ආන්තිකකරණය පවත්වා ගෙන යන පිතෘමූලික සමාජ ව්‍යුහයන්ගෙන් බලය ලබා ගනී (Qamar 2023). මෙවැනි රාමුවක් තුළ, ගෘහස්ථ ප්‍රතිමාන උල්ලංඝනය කරන හෝ දේශපාලන ජීවිතයට පිවිසෙන කාන්තාවන් සදාචාරාත්මක හා ලිංගික අපකීර්තියට මුහුණ දෙයි (Marecek 2000). Yuval-Davis (1997) සඳහන් කරන පරිදි කාන්තාවන් ජාතියේ ජීව විද්‍යාත්මක හා සංස්කෘතික ප්‍රතිනිෂ්පාදිකාවන් ලෙස නිරූපණය කරනු ලැබේ. එය සමාජය තුළ ඔවුන්ගේ "නිසි" ස්ථානය පිළිබඳ සීමාසහිත අදහස් ශක්තිමත් කරන භූමිකාවකි.

එසේම දේශපාලන තනතුරුවලට පිවිසෙන වරප්‍රසාද ලත් පසුබිමක සිටින කාන්තාවන් පවා මෙම ගතිකයන්ගෙන් විනිර්මුක්ත නොවේ. ඔවුන් බොහෝ විට සදාචාරාත්මක ප්‍රහාර සහ චරිත ඝාතනවල ඉලක්ක බවට පත් වේ. විශේෂයෙන් ඔවුන්ගේ ලිංගික සදාචාරය

ගැන ප්‍රශ්න කිරීම පොදු ජීවිතය ගැන සිතන වෙනත් කාන්තාවන්ට අනතුරු ඇඟවීමක් ලෙසට උපාය මාර්ගිකව භාවිතා කරයි (Marecek 2000). මහජන වපසරියට ඇතුළත් වීම සඳහා කොන්දේසියක් ලෙස ගෞරවනීය භාවය ඉල්ලා සිටින නමුත් එහි නියුක්ත වූ පසු එය ආරක්ෂා කර ගත නොහැකි බැවින් මෙය දේශපාලනය තුළ කාන්තාවන් මුහුණ දෙන උභතෝකෝටික තත්ත්වයක් හෙළිදරව් කරයි (de Alwis 1995). Malathi de Alwis (1995, 150) ජාතිකවාදය සහ පුරුෂාධිපත්‍යයේ සන්දර්භය තුළ මෙම විරුද්ධාභාසය අර්ථ නිරූපණය කරන්නේ *"ජාතියේ පිතෘමූලික බැල්ම... එය නිරන්තරයෙන් ගෞරවනීයත්වයේ සැඟවුණු අප්‍රසන්න කොටස පරීක්ෂා කිරීමට උත්සාහ කරයි"* යන්නයි.

මෙම පිතෘමූලික බැල්ම විසින් දේශපාලනය පුරුෂ බල ප්‍රදේශයක් ලෙස සලකන දේශපාලන සංස්කෘතියක් දිගටම පවත්වා ගෙන යන අතර දේශපාලනය ඇතුළු මහජන ජීවිතයකට කාන්තාවන් ඇතුළු වීම ඔවුන්ගේ සමාජීය වශයෙන් නියම කරන ලද භූමිකාව උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබේ (Marecek 2000).

මෙම රටාවන් ඓතිහාසිකව ශ්‍රී ලංකාවේ දේශපාලන තනතුරු සඳහා කාන්තාවන්ගේ ප්‍රවේශය හැඩ ගස්වා ඇති අතර මෑත කාලීන වර්ධනයන් යෝජනා කරන්නේ ඒවා මුළුමනින් ම ස්ථාවර විය නොහැකි බවයි. ඉහතින් නිරූපිත වූ පරිදි, නිදහසින් පසු දශක කිහිපය තුළ පිරිමි දේශපාලනඥයින්ගේ භාර්යාවන්, දියණියන් හෝ වැන්දඹුවන් ලෙස පාර්ලිමේන්තුවට ගිය කාන්තාවන්ගේ ප්‍රවේශය බොහෝ දුරට මැදිහත් ප්‍රවේශයක් වූ අතර ප්‍රභූ දේශපාලන ජාලයන් සමඟ ද සමීපව බැඳී සිටියේ ය. මැතිවරණ දේශපාලනය ද එකම දේශපාලන පාත්‍රයින් පිරිසක් ප්‍රතිනිෂ්පාදනය කිරීමට නැඹුරු වූ අතර හුරුපුරුදු චරිත මැතිවරණ ක්‍රමය හරහා නැවත පාර්ලිමේන්තුවට ඇතුළු වූ අතර බොහෝ විට පක්ෂ සම්බන්ධතා වෙනස් කළ නමුත් ඔවුන්ගේ දේශපාලන පැවැත්ම රඳවා තබා ගත්හ. කෙසේ වෙතත් 2024 මහ මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ කාන්තාවන් සංඛ්‍යාවේ පමණක් නොව ඔවුන් දේශපාලනයට පිවිසෙන මාර්ගවල ද සැලකිය යුතු වෙනසක් සනිටුහන් කළේ ය. මෙහි දී ඉතා වැදගත් කාරණය වන්නේ මෙම කාන්තාවන්ගෙන් බොහෝ දෙනෙක් විශේෂයෙන්, පාලක පක්ෂය නියෝජනය කරන අය, ස්ථාපිත දේශපාලන පවුල්වලින් මතු නොවී තිබීමයි. මෙය දේශපාලන පෙළපත මූලික පිවිසුම් සාධකයක් ලෙසට ක්‍රියා කළ මුල් කාලීන ප්‍රවණතා වලින් බිඳී යාමක් සලකුණු කරයි. සැලකිය යුතු ප්‍රමාණයක් උගත් වෘත්තිකාවන් වූ අතර බහුතරය පළමු වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් ලෙස තේරී පත් විය. එබැවින් දේශපාලන තනතුරු සඳහා ප්‍රවේශය තවදුරටත් ප්‍රභූ පවුල් පදනම් කරගත් ජාලවලට පමණක් සීමා නොවන බව අඟවයි.

මෙම විතැන් වීම තවදුරටත් ඉස්මතු වූයේ පාර්ලිමේන්තුවේ කාන්තාවන්ගේ සමාජ හා ජනවාර්ගික පැතිකඩෙහි පුළුල් වීමක් සනිටුහන් කරමින් කිසිදු දේශපාලන පෙළපතක් නොමැති මලයියාහ කාන්තාවක් තෝරා පත් කර ගැනීමෙනි. මෙහිදී නීතිඥයින්, ගුරුවරියන්, සමාජ ක්‍රියාකාරීන්, ව්‍යවසායිකාවන්, විද්වතුන් සහ සමාජ විද්‍යාඥවරියන් ඇතුළු විවිධ

වෘත්තීය පසුබිම්වල කාන්තාවන් සිටීම විධිමත් දේශපාලනයට පිවිසෙන ප්‍රවීණත්වය සහ අත්දැකීම් මාදිලි පුළුල් කිරීම පිළිබිඹු කරයි. වෘත්තීයමය දේශපාලන ප්‍රවේශයක් කරා යන මෙම සංක්‍රාන්තිය සංකේතවත් කරමින් ශ්‍රී ලංකාවේ ආචාර්ය උපාධියක් ලැබූ පළමු කාන්තා අග්‍රාමාත්‍යවරිය බවට පත් වූ ආචාර්ය හරිනි අමරසූරිය ද ඒ අතර වෙයි (Parliament of Sri Lanka 2026a). මෙම වෙනස්කම් තිරසාර පරිවර්තනයක් දක්වා පරිවර්තනය වේදැයි බැලීමට ඉතිරිව ඇති අතර ඔවුන් පෙන්වා දෙන්නේ මෙය ශ්‍රී ලංකාවේ කාන්තාවන් දේශපාලන තනතුරුවලට ප්‍රවේශ වන ව්‍යුහාත්මක මාර්ගවල විභව ප්‍රතිව්‍යුහගත කිරීමක් බවයි.

පළාත් පාලන මට්ටමින් ද ඒ හා සමාන වඩාත් ප්‍රවේසම් සහගත විතැන් වීමක් නිරීක්ෂණය කළ හැකිය. 2025 පළාත් පාලන මැතිවරණයේ ප්‍රාථමික දත්ත මගින් පෙන්නුම් කරන්නේ 2018 මැතිවරණයෙන් පසු 23% ට සාපේක්ෂව කාන්තා නියෝජනය දළ වශයෙන් 24% දක්වා ඉහළ ගොස් ඇති බවයි.[6] මෙම දර්ශක හරහා ප්‍රමාණවත් ඉහළ නැඹුරුවක් යෝජනා කරන නමුත් මෙම ප්‍රතිශතයන් තවමත් තාවකාලිකව වේ. මන්ද යත් විභාග වෙමින් පවතින නඩු සහ පළාත් පාලන ආයතන කිහිපයක නොවිසඳුණු පත්වීම් හේතුවෙන් අවසන් ප්‍රතිඵල තවමත් තහවුරු කර නොමැති බැවිනි. ඒ අනුව, මෙම වැඩි වීම කාන්තා සංඛ්‍යාත්මක නියෝජනය වැඩි දියුණු කිරීම සඳහා කෝටා ක්‍රමයේ අඛණ්ඩ බලපෑම පෙන්නුම් කරන නමුත් මෙය ප්‍රාදේශීය මට්ටමින් දේශපාලන සහභාගීත්වයේ වඩාත් සක්‍රීය ස්වරූප බවට පරිවර්තනය කරනු ඇත්දැ?යි යන්න පැහැදිලි නැත.

## සංකේතාත්මක නියෝජනයට එදිරිව ප්‍රමාණාත්මක නියෝජනය

කාන්තාවන් සංස්කෘතික සංකේත ලෙස අර්ථ දක්වන ශ්‍රී ලංකාවේ ජාතිකවාදී හා පිතෘමූලික රාමුව තුළ දේශපාලනයේ කාන්තා පැවැත්ම ඉහළ යාම සැබවින්ම බල සබඳතා විතැන් කරන්නේ ද නැතහොත් හුදෙක් පවත්නා ධූරාවලි ප්‍රතිනිෂ්පාදනය කරන්නේ ද යන්න පිළිබඳව ප්‍රශ්න පැන නගී. කාන්තාවන් පොදු ජීවිතයට ප්‍රවිෂ්ට වන විට ඔවුන් සදාචාරාත්මක පරීක්ෂාවට, ආයතනික ප්‍රතිරෝධයට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිමානයන්ට දිගින් දිගටම මුහුණ දෙයි. එබැවින් මෙම සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ 25% ක් වූ පළාත් පාලන කෝටාව වැනි ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල තක්සේරු කිරීම සඳහා පැවැත්ම සහ බලපෑම අතර වෙනස තීරණාත්මක දෙයක් බවට පත් වේ.

මෙය ගවේෂණය කිරීම සඳහා දේශපාලන නියෝජනය යනු කුමක් ද යන්න පැහැදිලි කර ගැනීම අවශ්‍යය වේ. දේශපාලන නියෝජනය මුල් බැසගෙන ඇත්තේ ජනගහනයේ විවිධත්වය පිළිබිඹු කිරීමට අදහස් කරන ආයතන හරහා ස්වෛරීභාවය ක්‍රියාත්මක වේ යන මූලධර්මය මත ය. පරමාදර්ශී ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් මගින් කාන්තාවන් සමාන හෝ සමාන සංඛ්‍යාවකින් නියෝජනය වන අතර ඔවුන්ගේ පොදු හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය

6 2026 මාර්තු මස 30 වන දින පළාත් පාලන ආයතන සහකාර කොමසාරිස් සමග කතුවරයා කළ පුද්ගලික කතාබහක් හා බැඳේ. තවමත් විභාග වෙමින් පවතින නඩු සහ නොවිසඳුණු පත්වීම් හේතුවෙන් මෙම සංඛ්‍යාවන් තාවකාලික වේ.

පිළිබඳ විශේෂිත අභිරුචි එලදායී ලෙස ආමන්ත්‍රණය කරනු ඇත (Wickramasinghe සහ Kodikara 2012). විධිමත්, විස්තරාත්මක, සංකේතාත්මක සහ ප්‍රමාණාත්මක ලෙස නියෝජනයේ ආකාර හතරක් Pitkin (1967) හඳුනා ගත්තේ ය. විධිමත් නියෝජනය යනු නියෝජිතයින් තෝරා පත්කර ගන්නා ආකාරය තීරණය කරන ක්‍රියාවලීන් ය. එසේ ම විස්තරාත්මක නියෝජනය මගින් දේශපාලන ආයතනවල කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක පැවැත්ම මනිනු ලබයි. සංකේතාත්මක නියෝජනය හරහා කාන්තාවන්ගේ පැවැත්මට සම්බන්ධ අර්ථයන් කෙරෙහි අවධානය යොමු කරයි. මෙහි ප්‍රමාණාත්මක නියෝජනය යන්නෙන් අදහස් කරන්නේ නියෝජිතයින් ඔවුන්ව නියෝජනය කරන අයගේ අවශ්‍යතා ක්‍රියාශීලීව ඉදිරියට ගෙන යන ප්‍රමාණයයි (Pitkin 1967; Childs සහ Krook 2009). Pitkin (1967) සැලකුවේ නියෝජිතයින්ගේ ක්‍රියාවන් ඡන්ද දායකයන්ගේ අවශ්‍යතාවන්ට අනුකූල වන ලෙස ඉල්ලා සිටින බැවින් සක්‍රීය නියෝජනය "එකම නිර්ව්‍යාජ ආකාරය" ලෙසයි.

එහෙත් මෙම ප්‍රමාණාත්මක නියෝජනයේ වැදගත්කම අවධාරණය කරන සාහිත්‍යයක් වර්ධනය වෙමින් තිබියදීත් නිදහස ලැබූ දා සිට ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලනයේ පැවැත්ම කැපී පෙනෙන ලෙස අවම මට්ටමක පවතී. පහත වගු අංක 01 හි දක්වා ඇති පරිදි ලෝකයේ ප්‍රථම කාන්තා අගමැතිනිය සහ පසුව කාන්තා ජනාධිපතිනියක් පවා තෝරා පත් කර ගැනීමක් ගැන ශ්‍රී ලංකාව නිතර නිතර සඳහන් කළද, නිදහසින් පසු දශක කිහිපය තුළ ජාතික මට්ටමේ කාන්තා නියෝජනය 6.5% ඉක්මවා නැත. මෑත කාලීනව එය 9.8% දක්වා ඉහළ ගියද ජනගහනයේ කාන්තා ප්‍රතිශතයට සාපේක්ෂව දේශපාලන නියෝජනය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතී. පළාත් පාලන මට්ටමින් ද මෙවැනි ම රටාවක් දක්නට ලැබේ. පහත වගුව අංක 02 හි දැක්වෙන පරිදි 2018 දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කෝටාවක් හඳුන්වා දීමට පෙර කාන්තා නියෝජනය 2.5% නොඉක්මවූ අතර විධිමත් දේශපාලන ආයතන තුළ කාන්තාවන්ගේ ආන්තික පැවැත්ම ඉස්මතු කර ඇත. කාන්තාවන්ගේ පැවැත්ම සීමිත වන එවැනි සන්දර්භයන් තුළ දේශපාලන බලයේ සැලකිය යුතු පරිවර්තනයක් වෙනවා වෙනුවට ඔවුන්ගේ ඇතුළත් වීම පවා බොහෝ දුරට සංකේතාත්මක ව්‍යායාමයක් දක්වා අඩු වීමේ අවදානමක් ඇත.

*වගුව අංක 01: 1947 සිට 2024 දක්වා පාර්ලිමේන්තු මට්ටමේ කාන්තා නියෝජනය*

| ව්‍යවස්ථාදායකය | වර්ෂය | සමස්ත ආසන සංඛ්‍යාව | මන්ත්‍රීවරියන් ප්‍රමාණය | කාන්තා නියෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (පළමු පාර්ලිමේන්තුව) | 1947 | 101 | 3 | 3.0 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (දෙවන පාර්ලිමේන්තුව) | 1952 | 101 | 2 | 2.0 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (තෙවන පාර්ලිමේන්තුව) | 1956 | 101 | 4 | 4.0 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (සිව්වන පාර්ලිමේන්තුව) | 1960 (මාර්තු) | 157 | 3 | 1.9 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (පස්වන පාර්ලිමේන්තුව) | 1960 (අගෝස්තු) | 157 | 3 | 1.9 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (හයවන පාර්ලිමේන්තුව) | 1965 | 157 | 6 | 3.8 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (හත්වන පාර්ලිමේන්තුව) | 1970 | 157 | 6 | 3.8 |
| ජාතික රාජ්‍ය සභාව[7] | 1972 | 168 | 6 | 3.6 |
| ජාතික රාජ්‍ය සභාව | 1977 | 168 | 5 | 3.0 |
| අටවන පාර්ලිමේන්තුව | 1978 | 168 | 11 | 6.5 |
| නවවන පාර්ලිමේන්තුව | 1989 | 225 | 13 | 5.8 |
| දසවන පාර්ලිමේන්තුව | 1994 | 225 | 12 | 5.3 |
| එකොළොස්වන පාර්ලිමේන්තුව | 2000 | 225 | 9 | 4.0 |
| දොළොස්වන පාර්ලිමේන්තුව | 2001 | 225 | 10 | 4.4 |
| දහතුන් වන පාර්ලිමේන්තුව | 2004 | 225 | 14 | 6.2 |
| දහහතරවන පාර්ලිමේන්තුව | 2010 | 225 | 13 | 5.8 |
| පහළොස්වන පාර්ලිමේන්තුව | 2015 | 225 | 13 | 5.8 |
| දාසය වන පාර්ලිමේන්තුව | 2020 | 225 | 12 | 5.3 |
| දහහත් වන පාර්ලිමේන්තුව | 2024 | 225 | 22 | 9.8 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව 2026a, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව 2026b සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2026 යන වාර්තා පදනම් කර ගනිමින් කතෘ විසින් සම්පාදිත ය.

7 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය ලෙස නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවට පිහිටුවා ගන්නා ලදී.

*වගුව අංක 02: 1966 සිට 2018 දක්වා පළාත් පාලන මට්ටමින් පැවති කාන්තා නියෝජනය*

| වර්ෂය | කාන්තා නියෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| 1966 | 1.5 |
| 1970 | 2.1 |
| 1979 | 2.5 |
| 1982 | 1.5 |
| 1991 | 1.7 |
| 1997 | 1.9 |
| 2006 | 1.8 |
| 2008 -2011[8] | 2.0 |
| 2018 | 23 |

මූලාශ්‍රය: Wickramasinghe සහ Kodikara 2020 සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ මහජන ක්‍රියාන්විතය 2023 යන ලේඛන පදනම් කර ගනිමින් කතෘ විසින් සම්පාදනය කරන ලදි.

කෙසේ වෙතත් සංකේතාත්මක නියෝජනය බොහෝ විට සාම්ප්‍රදායිකව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිමාන බිඳ දැමීමට වඩා ශක්තිමත් කරන බවට සාමාන්‍යයෙන් විවේචන පවතී. Gamson (1997), Lombardo සහ Meier (2014) සඳහන් කරන්නේ පිරිමින් මහජන පාත්‍රයන් ලෙස සහ කාන්තාවන් ගෘහස්ථ භාරකරුවන් ලෙස වාත්තු කිරීමෙන් ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභාජනය ආරක්ෂා කළ හැකි බවයි. Meier සහ Severs (2018, 35) තවදුරටත් මෙය ඉදිරියට ගෙන යමින් සංකේතාත්මක නියෝජනය සමානාත්මතාවයේ මිරිඟුවක් පමණක් සපයමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂිත භූමිකාවන් සහ බල ධූරාවලියන් ඇතුළත් කළ හැකි බවට තර්ක කරයි. එය සංකේතවාදය සමග ද බැඳේ. Kanter (1977) නිරීක්ෂණය කරන්නේ කාන්තාවන් බොහෝ සෙයින් අඩු දේශපාලන අවකාශයන්හි බොහෝ විට පූර්ණ දේශපාලන පාත්‍රයන් ලෙස නොව ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ නියෝජිතයන් ලෙස හැසිරෙන බවයි. මෙමගින් ආයතනික සංස්කෘතිය ස්ථිරව පිරිමින් අතේම තබමින් කාන්තාවන්ගේ සක්‍රීය බලපෑම සීමා කර ඇත (Childs සහ Krook 2008).

එහෙත් සංකේතාත්මක නියෝජනය පිළිබඳ පවතින මෙම විවේචන මගින් කාන්තාවන්ගේ දේශපාලන අන්තඃකරණයෙන් සැබවින්ම අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න පිළිබඳ පුළුල් ප්‍රශ්න මතු කරයි. විශේෂයෙන්ම ව්‍යවස්ථාදායක ආයතන තුළ කාන්තාවන් තීරණාත්මක තැනකට ළඟා වූ පසු ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කෝටාව ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන්හි සැලකිය යුතු වෙනස්කම් වලට තුඩු දෙනු ඇතැයි බොහෝ විට උපකල්පනය කෙරේ. මෙම අපේක්ෂාවන් තුළ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ප්‍රබල හැඟීමක් ද

8 පළාත් පාලන ආයතන 2008 (මඩකලපුව සඳහා පළාත් පාලන ආයතන 9ක්), 2009 (යාපනය සහ වවුනියාව සඳහා එක් පළාත් පාලන ආයතනය බැගින්) සහ 2011 (පළාත් පාලන ආයතන 322ක්) යන වර්ෂ වල තේරී පත් වූ සාමාජිකයින් සමඟ ක්‍රියාත්මක වූ බැවින් මෙම කාල රාමුව භාවිතා කරන ලදි. (කොඩිකාර 2012).

ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසිභාවය සහ නායකත්වය සම්බන්ධ කුසලතා සහ දැනුම අත්පත් කර ගැනීම සහ කාන්තා ගැටලු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමක් ද ඇතුළත් වේ (Lupien 2020, Altschuler සහ Corrales 2012 උපුටා දක්වමින්). කෙසේ වෙතත් එවැනි අපේක්ෂාවන් නිසා කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය මත අසමානුපාතික බරක් පැටවීමේ අවදානමක් ඇත. Kodikara (2023) තර්ක කරන්නේ පිරිමින් ඔවුන්ගේ නියෝජනයේ ගුණාත්මකභාවය නොසලකා නිතිපතා දේශපාලන තනතුරට තෝරා පත් කර ගන්නවා සේම, කාන්තාවන්ට ද ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිඵල සැලකිය යුතු ලෙස පරිවර්තනය කළත් නොකළත් නියෝජනය කිරීමේ අයිතිය තිබිය යුතු බවයි. මීට අන්‍ය ආකාරයක් යෝජනා කිරීම යනු කාන්තාවන් පිරිමින්ට අදාළ ප්‍රමිතියට වඩා ඉහළ ප්‍රමිතියකට තබා ගැනීමයි.

එපමණක් නොව, කෝටා ක්‍රමය පවත්නා දේශපාලන ව්‍යුහයන් කාන්තාවන්ගේ සහභාගීත්වය හැඩගස්වා ඇති අතර බොහෝ විට සීමා කරන බව ද විශේෂයෙන් දේශපාලන පක්ෂ හරහා ක්‍රියාත්මක වන බව ද හඳුනා ගැනීම ද වැදගත් ය. කාන්තා දේශපාලනඥයින් පක්ෂ ප්‍රකාශනයන්ට සහ වැඩසටහන් වලට පමණක් වගකිව යුතු නොවේ (Cornwall සහ Goetz 2005). එහෙත් ඔවුන්ගේ කාරකත්වය සීමා කළ හැකි අවිධිමත් ආයතනික ප්‍රතිමානයන්ට ද ඔවුන් යටත් වේ. සංඛ්‍යාත්මක නිරූපණය වැඩි කිරීම ස්වයංක්‍රීය ව ප්‍රමාණාත්මක බලපෑමක් බවට පරිවර්තනය නොවන්නේ මන්දැයි පැහැදිලි කිරීමට මෙම සංරෝධනයන් උපකාර වේ. දකුණු ආසියාව තුළ පවතින සංසන්දනාත්මක සාක්ෂි මෙම ගතිකයන් තවදුරටත් නිරූපණය කරන බව පෙනේ. නිදසුනක් වශයෙන් ඉන්දියාවේ තමිල්නාඩුවේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සංචිත ප්‍රතිපත්තිය ප්‍රාදේශීය සභා තුළට කාන්තාවන්ගේ පැමිණීම සැලකිය යුතු ලෙස වැඩි කර ඇත. ඇතැම් අවස්ථාවල එය 50% දක්වා වැඩි වී තිබේ. එහෙත් බොහෝ දෙනෙක් පිරිමින් විසින් ආධිපත්‍යය දරන තීරණ ගැනීමේ ජාලයන්ගෙන් බැහැර කර ඇත (Patel et al. 2021). පකිස්තානයේ ද මේ හා සමාන රටාවන් මතු වන අතර පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශන කෙටුම්පත් කිරීම වැනි ප්‍රධාන පක්ෂ කමිටුවලට කාන්තාවන් ඇතුළත් වන්නේ කලාතුරකින් බැවින් මූලික ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර කෙරෙහි ඔවුන්ගේ බලපෑම සීමා වෙයි. ඒ වෙනුවට ඔවුන් බොහෝ විට සක්‍රීය ප්‍රතිපත්තිමය ක්‍රියාකාරීත්වයකට වඩා ඡන්දදායකයින් බලමුළු ගැන්වීම සහ මහජන උද්ඝෝෂණ සඳහා යොදවනු ලැබේ (Naseer et al. 2023). බංගලාදේශය ගතහොත් කාන්තා මන්ත්‍රීවරුන්ට අයවැය ප්‍රතිපාදන නොමැති අතර බොහෝ දෙනෙක් දෙවන පෙළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් ලෙස හෝ කැබිනට් මණ්ඩලය සඳහා "ඡන්ද බැංකුවක්" ලෙස සලකනු ලැබේ (UN Women 2021). මෙම රටවල් පුරාම කෝටා ක්‍රමයකින් තේරී පත් වූ කාන්තාවන් බොහෝ විට මූලික තීන්දු තීරණ ගන්නා ක්ෂේත්‍ර වලින් ආන්තීකරණය වී ඇත. මෙය සංකේතවාදී න්‍යාය සමඟ සමපාත වන අතර එමගින් සුළුතර තත්ත්ව සමඟ ඒකාබද්ධ වී අඩු සමාජ තත්ත්වයන් නායකත්ව භූමිකාවන්හි පවා අධිකාරිය සීමා කළ හැකි ආකාරය පෙන්වයි (Kanter 1977). ගැඹුරු පිතෘමූලික දේශපාලන පද්ධති තුළ කාන්තාවන්ගේ සංකේතාත්මක පැවැත්ම කලාතුරකින් ශක්තිමත් බල ධූරාවලි කඩාකප්පල් කළද ඒ වෙනුවට ආයතනික පාලනය ස්ථිරව ම පිරිමි අතට පත් කළ හැකිය.

කෙසේ වෙතත් මෙය කෝටා ක්‍රමය ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොවේ. ඒ වෙනුවට, කෝටාව සහ විස්තරාත්මක නියෝජනය දේශපාලන සහභාගිත්වයේ වඩාත් වැදගත් ස්වරූපයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාරම්භක පියවරක් ලෙස බැලීම අවශ්‍ය වේ. නිදසුනක් වශයෙන් සංසන්දනාත්මකව බලන කළ පෙනී යන්නේ සමහර කාන්තාවන්ට මෙමගින් ආයතනික සීමාවන් තුළ උපායමාර්ගිකව සැරිසැරීමට හැකි වී ඇති බවයි. කාන්තාවන් ඇතැම් අවස්ථාවල දී නීත්‍යානුකූලභාවය ලබා ගැනීම සඳහා පවුල් බැඳීම්, ප්‍රජා ස්ථාවරය හෝ සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ භූමිකාවන් පවා රැකුලක් කරගැනීමෙන් ඇඟවෙන්නේ, සංකේතාත්මක ස්ථානගත කිරීම ඇතැම්විට බලපෑම් සහිත සීමා කරන ලද අවකාශ නිර්මාණය කර ගැනීම සඳහා භාවිතා කළ හැකි බව Patel et al. (2021) අවධාරණය කරයි. කාන්තාවන්ගේ දේශපාලන ප්‍රවේශය පුළුල් කිරීම අරමුණු කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ තුළින් නොව එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ වැන්දඹුව ලෙස බලයට පැමිණි සිරිමාවෝ බණ්ඩාරනායක තුළින් ශ්‍රී ලංකාව තුළ වූ මෙම උපාය මාර්ගය වඩාත් පැහැදිලිව පෙනෙන්නට ඇත (Jayawardena 1986; Kodikara 2009). දේශපාලන අවාසි සහ ඇයට *"මුළුතැන්ගෙයි ගින්නට වඩා දරුණු කිසිවක මුලසුන නොදරා ඇති"* ලෙසට වූ කියාපෑම් ප්‍රතික්ෂේප කරමින් ඇය වංශාධිපති ගෘහණියක සිට තුන් වතාවක් ශ්‍රී ලංකාවේ අගමැතිනිය බවට පත්විය (Gooneratne 1986, 160). ඇයගේ නැගී ඒම පහසු වූයේ ඇගේ ප්‍රභූ වංශාධිපති පසුබිම සහ Partha Chatterjee (1993) විස්තර කරන ජාතිකවාදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දෘෂ්ටිවාදයේ "නව ගැහැනියක්" වීම නිසා වේ. එම නව ගැහැනිය නම් උගත් සහ පොදු ජීවිතයේ ගමන් කිරීමට හැකියාව ඇති නමුත් සංකේතාත්මකව සම්ප්‍රදාය තුළ මුල් බැස සිටින තැනැත්තියකි. මෙම රාමුව සමකාලීන පිරිමි දේශපාලනඥයින්ට සහ ඡන්දදායකයින්ට සැනසීමක් ලබා දුන් අතර පිතෘමූලික ප්‍රතිමානයන්ට මූලික වශයෙන් අභියෝග නොකර මහජන ජීවිතයට පිවිසීමට ඇයට ඉඩ සලසා දුන්නේය. සිරිමාවෝ විසින් ම මෙම ගතානුගතිකවාදය පිරිමින්ට කාන්තාවන්ගේ ඇති 'වහල්භාවය' ස්වේච්ඡාවෙන් සහ බෞද්ධ සම්ප්‍රදාය තුළ මුල් බැස ඇති බවත් පිරිමින් හෝ කාන්තාවන් එකිනෙකාට වඩා උසස් යැයි නොසලකන බවත් අවධාරණය කළා ය. එවැනි ප්‍රකාශයන් සමානාත්මතාවයක් ලෙස පෙනෙන අතර සංස්කෘතික වශයෙන් අනුමත කරන ලද ස්ත්‍රී පුරුෂ භූමිකාවන් ශක්තිමත් කරමින් පිතෘමූලික පවුල "පූජනීය ඒකකයක්" ලෙස සුජාත කළේය (Rambukwella සහ Ruwanpura 2016). Kodikara (2009) සඳහන් කරන පරිදි, ඥාතිත්වය මත පදනම් වූ දේශපාලන ප්‍රවේශය කණ්ඩායමක් ලෙස, කාන්තාවන් සඳහා ව්‍යුහාත්මක වෙනසක් බවට පරිවර්තනය කරන්නේ කලාතුරකිනි. ඔවුන්ගේ දේශපාලන භූමිකාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සවිඥානික න්‍යාය පත්‍ර වලට වඩා පවුල් පක්ෂපාතීත්වයට බැඳ තබයි.

කාන්තාවන් නිලයක් දැරීම සැබෑ නියෝජනයක් නොවේ යන Phillips (1995) ගේ තර්කය මෙමගින් ඉස්මතු කරයි. විස්තරාත්මක පැවැත්ම සහ ප්‍රමාණාත්මක බලපෑම අතර පරතරය විශේෂයෙන් කැපී පෙනෙන්නේ කාන්තාවන් සංකේතාත්මක හෝ පවුල් මාර්ග ඔස්සේ දේශපාලනයට පිවිසෙන විටය. එබැවින් එය ස්ත්‍රී පුරුෂ අසමානතාවය පවත්වා ගෙන

යන ආයතනික බාධක බිඳ දමන්නේ කලාතුරකිනි (Patel et al., 2021). සංකේතාත්මක නියෝජනය මගින් කැපී පෙනෙන සාර්ථක නිදර්ශන ඉදිරිපත් කළ හැකි නමුත් ගැඹුරු ආයතනික ප්‍රතිසංස්කරණ නොමැතිව එය අභියෝගයට ලක් කරන බව පෙනෙන ප්‍රතිමාන ශක්තිමත් කිරීමේ අවදානමක් ඇත.

කාන්තාවන් සංකේතාත්මක චරිතවල සිට සක්‍රීය දේශපාලන පාත්‍රයින් දක්වා ගමන් කිරීමට නම් ව්‍යුහාත්මක පරිවර්තනය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පුරුෂ ආධිපත්‍යය සහ අවිධිමත් බල ජාලයන්ගෙන් වරප්‍රසාද ලබන දේශපාලන ආයතන ප්‍රතිසංස්කරණය කිරීමට හිතාමතාම උත්සාහ කිරීම අවශ්‍ය වේ. මෙම පරතරය පියවීම සඳහා කාන්තාවන්ගේ දේශපාලන භූමිකාවන් හැඩගස්වන ආයතනික සංස්කෘතීන් පරීක්ෂා කිරීමේ අවශ්‍යතාව පවතී. කෝටාව මගින් තනතුරු වල සිටින කාන්තාවන් සංඛ්‍යාව ඉහළ නංවන විට පවා පිතෘමූලික ප්‍රතිමාන සහ අවිධිමත් බල ජාලයන් දිගටම පැවතිය හැකි අතර එමගින් කාන්තා අධිකාරිය සහ තීරණ ගැනීමේ හැකියාව අඩපණ කරයි. ස්ත්‍රීවාදී ආයතනිකවාදය (Feminist Institutionalism) විසින් විධිමත් නීති රීති සහ අවිධිමත් ප්‍රතිමානයන් යන දෙකම දේශපාලන ව්‍යුහයන් තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ බලය ඇතුළත් කරන ආකාරය පෙන්වීමෙන් මෙම ක්‍රියාවලීන් විශ්ලේෂණය කිරීම සඳහා න්‍යායාත්මක රාමුවක් ඉදිරිපත් කරයි (Mackay, Kenny සහ Chappell 2010; Krook සහ Mackay 2011).

# තුන්වන පරිච්ඡේදය

# සංකල්පීය රාමුව: ස්ත්‍රීවාදී ආයතනවාදය

සංකේතාත්මක හා ප්‍රමාණාත්මක නියෝජනය දේශපාලන අවකාශයන්හි සිටින්නේ කවුරුන්ද? සහ ඔවුන් කුමක් කරන්නේද? යන්න කෙරෙහි අවධානය යොමු කරන අතර, ස්ත්‍රීවාදී ආයතනිකවාදය විසින් එම ප්‍රතිඵල හැඩගස්වන ආයතනික නීති, ප්‍රතිමාන සහ භාවිතයන්හි විතැන් වීම කෙරෙහි අවධානය යොමු කරයි. විධිමත් යන්ත්‍රණයන් සහ අවිධිමත් සම්ප්‍රදායන් ගෙන් එකිනෙකට බැඳී ඇති ශ්‍රී ලංකාව වැනි, සන්දර්භයක දේශපාලන ජීවිතය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බලය කාවැදී ඇති ආකාරය හෙළිදරව් කිරීම සඳහා මෙම දෘෂ්ටිය විශේෂ වටිනාකමක් සපයයි.

බොහෝ විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගතහොත් අපක්ෂපාතී යැයි උපකල්පනය කරන දේශපාලන ආයතන ඓතිහාසිකව කාන්තාවන් බැහැර කිරීම තුළින් ගොඩනගා ඇති අතර, ගැඹුරින් මුල් බැස ඇති ස්ත්‍රී පුරුෂ පක්ෂග්‍රාහීත්වය පිළිබිඹු කරයි (Witz සහ Savage 1992; Goetz 2007, 47). එහි ප්‍රතිඵලයක් වශයෙන් පිරිමින් අධික ලෙස නියෝජනය කරනවා පමණක් නොව, නෛසර්ගිකව වඩාත් සුජාත දේශපාලන පාත්‍රයන් ලෙස ද සලකනු ලැබේ (Duerst-Lahti 2008, 182). පුරුෂාධිපත්‍යයේ පවතින මෙම සාමාන්‍යකරණය පවත්වා ගෙන යනු ලබන්නේ, බලහත්කාරයෙන් පමණක් නොව, නායකත්වය සහ පුරුෂාධිපත්‍යය අතර පවතින සංස්කෘතික සම්බන්ධතා හරහා ද (Hooper 2001, 41), කාන්තාවන්ගේ පර්යාලෝකනය අදෘශ්‍යමාන කරන සංවිධානාත්මක නීති, චර්යාවන් සහ කතිකාවන් මගින් ද ශක්තිමත් කරයි (Acker 1992, 567; Hawkesworth 2005, 147). මෙයට කේන්ද්‍රීය වන්නේ Chappell (2006), දේශපාලන පාත්‍රයන් සඳහා "පිළිගත හැකි" ස්ත්‍රී පුරුෂ හැසිරීම් නිරූපණය කරන විධිමත් හා අවිධිමත් නීති, ප්‍රතිමාන සහ භාවිතයන් සමූහයක් ලෙස අදහස් කරන, *"ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනය"* වේ. දේශපාලන හා නිලධාරිවාදී අවකාශයන්හි, පුරුෂ ආධිපත්‍යය විසින් ඓතිහාසිකව හැඩග ස්වා ඇති මෙම තර්ක, පුළුල් සමාජ හා දේශපාලන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අපේක්ෂාවන් පිළිබිඹු කරන සහ ශක්තිමත් කරන, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආචරණ ඇති කරයි. මෙම නීති රීති සමහරක් කේතනය කර ඇති අතර, බොහෝ ඒවා බොහෝ විට ප්‍රශ්න නොකරන අවිධිමත් චර්යාවන්හි කාවැදී ඇති අතර, ඒවා 'ස්වාභාවික' ලෙස සලකනු ලැබේ (Chappell 2006). මෙම අවිධිමත් නීති රීති ස්ත්‍රී පුරුෂ සමාජභාවී පර්යායට අභියෝග කරන, බොහෝවිට කාන්තාවන්ට එරෙහිව සියුම් ආකාරයේ බැහැර කිරීම්, ප්‍රතිරෝධය හෝ සංකේතාත්මක ප්‍රචණ්ඩත්වය හරහා ඒවා පවත්වා ගෙන යනු ලැබේ. එය ආයතනික තත්වය පවත්වා ගැනීමෙන් වඩාත්ම ප්‍රතිලාභ ලබන බලවත් පිරිමි ප්‍රභූන්ගේ අවශ්‍යතා සඳහා සේවය කරයි (Holmes 2020; Chappell 2006).

කාන්තාවන් ක්‍රමයෙන් මෙම පුරුෂාධිපත්‍යය සහිත ක්ෂේත්‍ර වලට ඇතුළු වුවද (Witz සහ Savage 1992), ඔවුන්ගේ පැමිණීම බොහෝ විට පවතින ප්‍රතිමාන කඩාකප්පල් කරන

අතර, පුරුෂ පාලනයේ විස්තාරය හෙළිදරව් කරයි (Lovenduski 2005, 147). එබැවින් සංඛ්‍යාත්මකව පමණක් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම තුළින්, ආයතනික පරිවර්තනයක් සහතික නොකරන බව පැහැදිලි ය (Chappell සහ Waylen 2013). දේශපාලන ක්ෂේත්‍රය තුළ, ස්ත්‍රී *"පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනය"*, සාම්ප්‍රදායික ව ප්‍රකාශ වී ඇත්තේ පිරිමින්ට සහජයෙන් ම තාර්කිකත්වය, අධිකාරිය සහ නායකත්වය ලබා ගැනීම සඳහා හැකියාව ඇති බව පවසමින් වන අතර කාන්තාවන්ට සහායක හෝ සහායක භූමිකාවන් නියම වී තිබේ යන උපකල්පනය හරහා වේ (Lovenduski 2005, 147). ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ Connell (2002) ගේ *"ස්ත්‍රී පුරුෂ සමාජභාවී තන්ත්‍රය (Gender Regime)"* සංකල්පය මගින් නිරූපණය කරන පරිදි එවැනි විධිවිධාන "බොහෝ පිරිමින් සඳහා සුවපහසු එහෙත් බොහෝ කාන්තාවන් සඳහා එසේ නොවන" ආයතනික පරිසරයක් නිර්මාණය කරයි (Lovenduski 2005). Hooper (2001, 52) නිරීක්ෂණය කරන පරිදි සාම්ප්‍රදායික පුරුෂ භූමිකාවන්හි පිරිමින් වෙනුවට කාන්තාවන් ආදේශ කිරීම තුළින් පවා, මෙම ආයතනවල ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකේතවාදය හෝ කාවැද්දූ භාවිතයන් අභියෝගයට ලක් වන්නේ කලාතුරකින්ය.

ස්ත්‍රීවාදී ආයතනිකවාදයේ අන්තර්දෘෂ්ටියක් වන්නේ විධිමත් හා අවිධිමත් ආයතන එකට ක්‍රියාත්මක වීමයි. විධිමත් ආයතන යනු හිතාමතාම සැලසුම් කර පැහැදිලිව සංග්‍රහකොට නිශ්චිතව දක්වා ඇති කේතගත නීති රීති වේ (Lauth 2000, 24; Lowndes 2005, 292). අවිධිමත් ආයතන ඊට පටහැනිව, කාලයත් සමඟ නොනැසී පවතින සම්ප්‍රදායන්, සිරිත් විරිත් සහ ප්‍රතිමානයන්ගෙන් සමන්විත වේ (Pejovich 1999, 166; Helmke සහ Levitsky 2004, 727). ඒවා බොහෝ විට වෙනස් වීමට වඩා ප්‍රතිරෝධයක් දක්වන්නේ, ඒවා නොලියැවී ඇති හා සංස්කෘතිකමය වශයෙන් කාවැදී ඇති බැවිනි (Helmke සහ Levitsky 2006). විධිමත් රාමු, අන්තර්ගෘහිත බව පෙනෙන විට පවා, මෙම අවිධිමත් සම්මතයන් බොහෝ විට කාන්තාවන්ට හානියක් වන පරිදි ක්‍රියාත්මක වන බව පෙනේ. විධිමත් නීතිරීති මගින් සමානාත්මතාවය සඳහා පොරොන්දු විය හැකි අතර, අවිධිමත් භාවිතයන් මගින්, ඒවායේ බලපෑම කඩාකප්පල් කිරීමට හෝ දියාරු කිරීමට, හැකි බැවින්, මේ අතර ඇති අන්තර් ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාව තුළ, මෙම අවිධිමත් ප්‍රතිමාන දේශපාලන ආයතනවලට පමණක් සීමා නොවී, පවුල සහ ප්‍රජාව හරහා ද ක්‍රියාත්මක වේ. මන්ද යත් ඒවා ගෞරවනීය හා ගෘහස්ථභාවය පිළිබඳ ප්‍රතිමාන හරහා කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය නියාමනය කරන බැවිනි. de Alwis (1998) ට අනුව, ගෘහස්ථ ක්ෂේත්‍රය ඓතිහාසිකව කාන්තාවන්ගේ ප්‍රාථමික බල ප්‍රදේශය ලෙස සලකනු ලැබූ අතර, කාන්තාවන්ගේ සමාජ පිහිටීම හැඩගස්වන "සාම්ප්‍රදායික විශ්වාසයන්, ආකල්ප සහ සමාජ භාවිතයන්" පිළිබඳ මංජරියක් ලෙස Herath (2015) විස්තර කරයි. මෙම ප්‍රතිමාන, පිතෘමූලික පවුල් ව්‍යුහයන් තුළින් ප්‍රතිනිෂ්පාදනය කරනු ලැබේ. එහි දී ගැහැණු ළමයින්, පිරිමි ළමුන්ට වඩා වෙනස් ලෙස සමාජගත වන අතර, දේශපාලන හැසිරීම බොහෝ විට පුරුෂ අධිකාරිය හරහා මැදිහත් වේ (Herath 2015). නිදසුනක් වශයෙන් භාර්යාවන් "ස්වාමි පුරුෂයාගේ ඡන්දය ප්‍රකාශිත පක්ෂයටම ඡන්දය දීම"

අපේක්ෂා කිරීම අසාමාන්‍ය දෙයක් නොවේ (Peiris 2022). "කාන්තාවන්ගේ දේශපාලන මනාපයන් ස්වාධීනත්වයකට වඩා ව්‍යුත්පන්න වේ." යන අදහස මෙමගින් ශක්තිමත් කරයි. ඒ හා සමානව මාතෘභාවය ශ්‍රී ලංකාව තුළ සංස්කෘතික වශයෙන් ගෞරවයට පාත්‍ර වූව ද, කාන්තාවන්ගේ බුද්ධිමය හා දේශපාලන හැකියාවන් බොහෝ විට සුළුකොට සලකනු ලබන අතර බොහෝ විට ඔවුන්ගේ ප්‍රඥාව *"මුළුතැන්ගෙයි හැඳි මිටක දිග"* දක්වා පමණක් විහිදී ඇත, වැනි අදහස් පවතී. කාන්තාවන්ගේ බුද්ධිමය හැකියාව ගෘහස්ථ ගැටළු වලට සීමා කරන ගැඹුරු ලිංගික ඒකාකෘතියක් ප්‍රක්ෂේපණය කරයි (Attanayake 2008). එවැනි අපේක්ෂාවන් කාන්තාවන්ගේ ප්‍රත්‍යක්ෂ හැකියාව සීමා කරනවා පමණක් නොව, මහජන ජීවිතයට පිවිසීමට උත්සාහ කරන අයට, ලබා ගත හැකි පවුල් සහයෝගයේ මට්ටම ද හැඩ ගස්වයි. එහි දී, UNFPA (2025) විසින් සඳහන් කර ඇති පරිදි කාන්තාවන් බොහෝ විට ඔවුන්ගේ ම පවුල් තුළ ප්‍රතිරෝධයන්ට මුහුණ දෙයි.

මේ අනුව, දේශපාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කළ, කාන්තාවන්ගේ භූමිකාව පිළිබඳ පවුල සහ ප්‍රජාව සතු සාම්ප්‍රදායික සංකල්පය, කාන්තා අපේක්ෂකයින් මතුවීමට සැලකිය යුතු බාධාවක් කරන බව පෙනේ. කාන්තාවන්ගේ සංචලතාව, මහජන පෙනී සිටීම් සහ රාත්‍රි දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම, පක්ෂ ව්‍යුහයන් තුළ පමණක් නොව, කාන්තාවන්ගේ පවුල් සහ දේශීය ප්‍රජාවන් තුළ ද නිරීක්ෂණයකට භාජනය වේ (Conway, Ahern සහ Steuernagel 2004; Dolan, Deckman සහ Swers 2010). මේ ආකාරයෙන් *"ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනය"* බහු ආයතනික අඩවි හරහා ප්‍රතිනිෂ්පාදනය කරනු ලබන අතර, දේශපාලන ආයතන වල නීත්‍යානුකූලව, බලයේ තනතුරු දැරිය හැක්කේ කාටද? යන්න හැඩගස්වන පුළුල් සමාජ සම්බන්ධතා තුළ කාවැදී ඇති බව පෙන්නුම් කරයි.

විධිමත් අන්තඃකරණය සහ අවිධිමත් සීමාවන් අතර මෙම අන්තර් ක්‍රියාකාරිත්වය පක්ෂ දේශපාලනය තුළ ද ඒ හා සමානව දක්නට ලැබේ. එහි දී අවිධිමත් ක්‍රියාවලිය බොහෝ විට, ප්‍රවේශය සීමා කරමින් විධිමත් ප්‍රතිසංස්කරණ අඩපණ කරයි. ප්‍රවේශය අවහිර කරන්නන් ලෙස දේශපාලන පක්ෂ අපේක්ෂකයින් තෝරා ගැනීම, සම්පත් වෙන් කිරීම සහ තීරණ ගැනීමේ ජාලයන් වෙත වූ ප්‍රවේශය තීරණය කරයි (Norris සහ Lovenduski 1995). ශ්‍රී ලංකාව තුළ, මෙම දොරටු පාලන ක්‍රියාවලිය ගැඹුරු පිතෘමූලික රාමුවක් තුළ කාවැදී ඇති අතර, එමගින් කාන්තාවන් ගෘහස්ථ භූමිකාවන්ට සීමා කරන සහ ඔවුන්ගේ දේශපාලන හැකියාවන් ප්‍රශ්න කරන පුළුල් සමාජ ප්‍රතිමාන පිළිබිඹු වේ (Kodikara 2009; Kanold 2020; Herath 2015). පක්ෂ ව්‍යුහයන් තදින් මධ්‍යගත වී ඇති අතර, පුරුෂ-ආධිපත්‍යය දරන ජාල මගින් හැඩගස්වා ඇත. එමගින් නායකත්වය සහ තීරණ ගැනීමේ තනතුරු සඳහා කාන්තාවන්ගේ ප්‍රවේශය සීමා කර ඇත (Pinto-Jayawardena සහ Kodikara 2003). දේශපාලන පක්ෂවල කාන්තාවන්ගේ මැදිහත් වීම සහ සාමාජිකත්වය බොහෝ විට කාන්තා අංශ හරහා සිදුවන නමුත්, මෙම ව්‍යුහයන් මූලික වශයෙන් කාන්තාවන්ගේ දේශපාලන දියුණුව සඳහා අව්‍යාජ මාර්ග ලෙස ක්‍රියා කරනවාට වඩා, පිරිමි පක්ෂ නායකත්වයේ අවශ්‍යතා සඳහා සේවය කරන බව ශාස්ත්‍රඥයින් සඳහන් කරයි. මෙම දේශපාලන පක්ෂ, පුළුල් පක්ෂ යාන්ත්‍රණයන් සමග

දෘෂ්ටිවාදී වශයෙන් පෙළගැසී ඇති, කාන්තා අංශ ප්‍රසිද්ධියේ ප්‍රවර්ධනය කරන බව පෙනේ. එහෙත් මෙම ආයතන ඉතිහාසය පුරාම මැතිවරණ අතරතුර කාන්තා ඡන්දදායකයින් බලමුළු ගැන්වීමට සහ පිරිමි දේශපාලනඥයින්ට අතිරේක සහායක් ලබා දීමට භාවිතා කර ඇත (Pinto-Jayawardena සහ Kodikara 2003). De Silva (1995) නිරීක්ෂණය කරන පරිදි ඔවුන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර සුබසාධන කටයුතුවල නිරත වීම, ආදායම් උත්පාදන සඳහා මුලපිරීම්, රැස්වීම්වලදී තිරය පිටුපස සිට සහාය ලබා දීම සහ පෙළපාළි සඳහා මිනිසුන් ඒකරාශී කරවා ගැනීම ආදිය ඇතුළත් වේ. කාන්තා සමිති හරහා ක්‍රියාත්මක කරන දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා මුලපිරීම් වැනි වැඩසටහන්වලට ග්‍රාමීය කාන්තාවන් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගත්තද, මෙම කමිටුවල සාමාජිකත්වය ප්‍රධාන ධාරාවේ දේශපාලන සහභාගීත්වය හෝ නායකත්වය සඳහා වන අවස්ථාවන් බවට පරිවර්තනය නොවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාන්තාවන් බොහෝ විට පක්ෂ උපාය මාර්ග හෝ ප්‍රතිපත්ති ප්‍රකාශනයට බලපෑම් කිරීම සඳහා ස්ථානගත වනවා වෙනුවට, පිරිමි නායකයින් සඳහා සහායක හෝ බිම් මට්ටමේ බලමුළු ගැන්වීමේ භූමිකාවන් වෙත පහත හෙළනු ලැබ ඇත (Kodikara 2008; Manuratne et al. 2024; Pinto-Jayawardena සහ Kodikara 2003).

Gallagher (1988) විසින් අපේක්ෂකයන් තෝරා ගැනීම *'දේශපාලනයේ රහස් උයනක්'* ('Secret garden of politics') ලෙස සංලක්ෂිත කර ඇත. එම 'රහස් උයන' විධිමත් ක්‍රියා පටිපාටිවලට වඩා, අනුග්‍රහය සහ පුද්ගලික සම්බන්ධතා මගින් හැඩගස්වා ඇති අතර, මෙම යෙදුම මුලින් ම නිර්මාණය කරන ලද අවස්ථාවේ මෙන් ම ශ්‍රී ලංකාවේ වර්තමාන සන්දර්භයට ද අදාළ වේ. පක්ෂ නායකයින් බොහෝ විට පවුලේ සාමාජිකයින්, දිගු කාලීන පක්ෂපාතීන් හෝ මියගිය දේශපාලනඥයින්ගේ ඥාතීන්ට අනුග්‍රහය දක්වන බැවින් දේශපාලනය සඳහා කාන්තා ප්‍රවේශය හොඳින් ලේඛනගත කර ඇති *"වැන්දඹුවන්, භාර්යාවන් සහ දියණියන්"* යන රටාව නිපදවයි (Manuratne et al. 2024; Jayawardena 1986; Kodikara 2009). මෙම ක්‍රියාව සමහර කාන්තාවන් ඇතුළත් කර ගැනීමට පහසුකම් සපයා ඇති නමුත්, එය බොහෝ විට සුදුසුකම් ලත් අනෙකුත් කාන්තා සාමාජිකයින් මඟ හරින අතර, කාන්තාවන් ස්වාධීන පාත්‍රයින්ට වඩා, දේශපාලන ආදේශකයින් යන සංකල්පය ශක්තිමත් කරයි (Wickramasinghe සහ Kodikara 2012).

මේ අනුව පක්ෂ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සංවිධාන ලෙස ක්‍රියා කරයි (Bjarnegård 2013; Kittilson 2013), එහි දී "පරමාදර්ශී අපේක්ෂකයා" සාමාන්‍යයෙන් පිරිමි වන අතර, (Chapman 1993; Lovenduski සහ Norris 1989) කාන්තාවන් බොහෝ විට ද්විතීයික තේරීම් ලෙස සලකනු ලැබේ. එයත් ඔවුන් පවුලේ, දේශපාලන ප්‍රාග්ධනය හෝ නම හෝ පිළිගැනීමක් ලෙස ගෙන එන්නේ නම් පමණි. නිදසුනක් වශයෙන්, හිරිහැර, පැමිණිලි විසඳීම හෝ සාධාරණව සම්පත් බෙදා හැරීම සහතික කිරීම සඳහා පක්ෂ තුළ වගවීමේ යාන්ත්‍රණයක් නොමැතිකම මෙම ගතිකයන් තවදුරටත් ශක්තිමත් කරයි. එය ප්‍රමාණාත්මක බලපෑමට බාධා කරන අතරම කාන්තාවන්ගේ සංකේතාත්මක පැවැත්ම

පවත්වා ගෙන යයි. (Khan සහ Naqvi 2020). දකුණු ආසියාව පුරා මේ හා සමාන රටාවන් දක්නට ලැබේ. ඉන්දියාවේ පංචායාත් කෝටා ක්‍රමය තුළ කාන්තාවන් බොහෝ විට පිරිමි ඥාතීන් සඳහා අතරමැදියන් ලෙස තෝරා ගනු ලැබේ. පකිස්තානය තුළ වෙන් කරන ලද ආසන, බැහැර කිරීමේ පක්ෂ ජාලයන් තවමත් බිඳ දමා නැත. එසේ ම නේපාලයේ, පළාත් පාලන ප්‍රතිසංස්කරණ මගින් කාන්තා සහභාගීත්වය වැඩි කළ නමුත් පිතෘමූලික ධූරාවලිය නොවෙනස්ව ඉතිරි කර ඇත (Patel et al. 2021; Naseer et al. 2023; Giri 2024; Norris සහ Lovenduski 1995).

එබැවින් ආයතනික වෙනසක් කිරීම සඳහා විධිමත් නීති රීති සහ අවිධිමත් ප්‍රතිමාන යන දෙකම, එකට ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාව පවතී. මැතිවරණ පද්ධති සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කෝටාව වැනි විධිමත් යන්ත්‍රණයන් මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව පක්ෂ භාවිතයන් ප්‍රතිනිර්මාණය කළ හැකිය (Bjarnegård සහ Kenny 2016). මැතිවරණ පද්ධති "සාර්ථක විය හැකි" පක්ෂ අපේක්ෂකයා 'කවුද' යන්න සැලකීමට අනුබල දෙමින්, බොහෝ විට වරප්‍රසාදය පිරිමින් හට හිමි වන අතර කෝටාව දේශපාලන පක්ෂ වලට සුදුසු කාන්තාවන් පැහැදිලිව හඳුනා ගැනීමට සහ ප්‍රවර්ධනය කිරීමට බල කරයි. එහෙත් ස්ත්‍රීවාදී ආයතනිකවාදීන් අනතුරු අඟවන්නේ නව විධිමත් නීති බොහෝ විට පවතින ඒවා අවතැන් නොකර පැරණි ආයතන මත ස්ථානගත කරන බවත්, නැතහොත් පවතින බල හිමියන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා *පරිවර්තනය* කරන බවත්ය (Holmes 2020). එබැවින් පුරුෂ අනුග්‍රාහක ජාලයන් හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතිකරණයන් වැනි දේශපාලන ආයතන පදනම් කරගත් අවිධිමත් සංස්කෘතීන් නිරාකරණය නොකිරීමෙන් ප්‍රතිසංස්කරණ සංකේතාත්මකව පැවතීමේ අවදානමක් ඇත. තිරසාර පරිවර්තනයක් සිදුවන්නේ විධිමත් රාමුවල විතැන්වීම් දේශපාලන ජීවිතය පාලනය කරන අවිධිමත් ආයතනික තර්කනයේ වෙනස්කම් සමඟ ගැළපෙන විට පමණි. එවිට සංකේතාත්මක අන්තඃකරණය ප්‍රමාණාත්මක බලපෑමක් බවට පරිවර්තනය වේ.

## කෝටා ක්‍රමය සහ දකුණු ආසියානු පර්යාවලෝකනය

අවිධිමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිමාන මගින් විධිමත් යන්ත්‍රණයන් මුලා කළ හැකි බවට ස්ත්‍රීවාදී ආයතනිකවාදී අවබෝධය මත ගොඩනඟමින් පසුගිය දශක කිහිපය තුළ දේශපාලනය තුළ කාන්තාවන්ගේ, අඩු නියෝජනය ආමන්ත්‍රණය කිරීම සඳහා වඩාත් පුළුල් ලෙස අනුගමනය කරන ලද උපාය මාර්ග වලින් එකක් ලෙස 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කෝටාව' ඉස්මතු වී ඇති අතර එය බොහෝ විට ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතාවයන්ට එළඹීම සඳහා වන තාවකාලික පියවරක් ලෙස සකස් කර ඇත (Athukorala et al 2021). මෙම කෝටා ක්‍රමය සාමාන්‍යයෙන් කාණ්ඩ තුනක් යටතට වැටේ. නෛතික අපේක්ෂක කෝටාව, නෛතිකව වෙන් කරන ලද ආසන කෝටාව සහ ස්වේච්ඡා දේශපාලන පක්ෂ කෝටාව ලෙස ය (Dahlerup et al. 2014). වෙන් කරන ලද ආසන මගින් ව්‍යවස්ථාදායක ආයතනවල ආසන වලින් යම් කොටසක් කාන්තාවන්ට

වෙන් කර ඇති අතර එමගින් ඔවුන්ගේ මැතිවරණය සහතික වේ. ඊට වෙනස්ව, අපේක්ෂක කෝටාව මගින් දේශපාලන පක්ෂවලට යම් ප්‍රතිශතයක් හෝ කාන්තා අපේක්ෂකයින් සංඛ්‍යාවක් නම් කිරීමට ඉල්ලා සිටී. කෙසේ වෙතත් මෙය ඔවුන්ගේ මැතිවරණ සාර්ථකත්වය සහතික නොකරයි. ස්වේච්ඡා පක්ෂ කෝටාව, පද්ධති දෙකෙන්ම වෙනස් වන්නේ ඒවා නීතියෙන් නියම කර නොමැති බැවිනි. ඒ වෙනුවට, දේශපාලන පක්ෂ කාන්තාවන්ගෙන් යම් ප්‍රමාණයක් අපේක්ෂකයින් ලෙස නම් කිරීමට කැපවී සිටින අභ්‍යන්තර නීති අනුග මනය කරයි. එබැවින් මෙම කෝටාව ක්‍රියාත්මක කිරීම තනි තනි දේශපාලන පක්ෂ මත රඳා පවතී (Dahlerup et al. 2014, Athukorala et al. 2021).

කෝටා ක්‍රමය බොහෝ විට බහුවිධ අරමුණු සහිතව හඳුන්වා දෙනු ලැබේ. නිදසුන් ලෙස පිරිමින් සමඟ කාන්තාවන්ගේ සමාන සහභාගීත්වය සහතික කිරීම, කණ්ඩායමක් ලෙස කාන්තාවන්ගේ සංකේතාත්මක තත්ත්වය ඉදිරියට ගෙන යාම, දේශපාලනය තුළ "කාන්තා පර්යාලෝකනය" ප්‍රවර්ධනය කිරීම සහ අනාගත නායකත්වය සඳහා දක්ෂ කාන්තාවන්ගේ සංචිතය පුළුල් කරන 'ආදර්ශමත් බලපෑමක්' ජනනය කිරීම ආදිය වෙති (Sawer 2000; Childs සහ Krook 2006; Manuratne et al. 2024). එහෙත් එකිනෙකට බැඳී ඇති මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කළ නොහැකි ය. සංඛ්‍යාත්මක ජයග්‍රහණ, අර්ථවත් හා විවිධාකාර නිරූපණයක් බවට පරිවර්තනය කරන්නේද? නැතහොත් ඒවා හුදෙක් සංකේතාත්මක (symbolic) හෝ නෛමිත්තිකව (tokenistic) ඇතුළත් කිරීමකට පමණක් හේතු වේද? යන්න පිළිබඳ ශාස්ත්‍රඥයින් අතර වාද විවාද පවතී (Bird 2003; Sater 2007; Tripp 2006).

Dahlerup සහ Gaber (2017) කෝටා ක්‍රමයේ ප්‍රතිඵල බෙහෙවින් රඳා පවතින්නේ මැතිවරණ පද්ධති, දේශපාලන සංස්කෘතිය, ආගමික ප්‍රතිමාන, කාන්තා සංවිධානවල ශක්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල ස්වභාවය ඇතුළු පුළුල් සන්දර්භීය සාධක මත බව සඳහන් කරයි. කෝටා ක්‍රමය හරහා තේරී පත් වූ කාන්තාවන්ට නැවත නැවතත් මුහුණ පෑමට සිදු වන අභියෝග තුනක් පර්යේෂණ මගින් හඳුනාගෙන ඇත. පළමුවැන්න, පක්ෂ නායකයින් කාන්තාවන් තෝරා ගන්නා විට නෛමිත්තිකවාදය (tokenism) පැන නගින්නේ ඔවුන්ගේ දේශපාලන හැකියාව සඳහා නොව ඔවුන් අනුකූල හා පහසුවෙන් පාලනය කළ හැකි යැයි දකින බැවින් වන අතර එය පිරිමි නායකත්වය සඳහා අතිරේක ඡන්දයක් අත්පත් කර ගැනීමකි. දෙවනුව, ආන්තිකකරණය (marginalisation) සිදුවන්නේ කාන්තාවන්ට විධිමත් සහභාගිත්වයට අවසර දෙන නමුත් අර්ථවත් නායකත්ව භූමිකාවන්ගෙන් බැහැර කරන විට ය. තෙවනුව, Zetterberg (2009) විසින් විස්තර කරන ලද පරිදි අදෘශ්‍යමානකරණය (Invisibilisation) කිරීම යනු කාන්තාවන් නාමිකව ආසන දරමින් සැලකිය යුතු ප්‍රමාණාත්මක බලයක් ද ක්‍රියාත්මක නොකර, ඔවුන්ව ක්‍රමානුකූලව ව්‍යවස්ථාදායක ක්‍රියාවලීන්ගෙන් ඉවත් කර ඇති අවස්ථාවය.

විවේචකයින් තවදුරටත් තර්ක කරන්නේ විවිධ සමාජ පසුබිම්වල සිටින කාන්තාවන් ඇතුළත් කිරීම සඳහා නියෝජනය පුළුල් කිරීම වෙනුවට, ශක්තිමත් පක්ෂ, පක්ෂපාතීත්වය, උසස් අධ්‍යාපන මට්ටම් හෝ බලවත් පිරිමින් සමඟ පවුල් සබඳතා ඇති ප්‍රභූ කාන්තාවන් තෝරා ගැනීමට කෝටාව හේතු විය හැකි බවයි (Bird 2003; Sater 2007; Tripp 2006). කෙසේ වෙතත්, තවත් සමහරු, මැතිවරණ දේශපාලනයට පිවිසීමට අවශ්‍ය දේශපාලන ප්‍රාග්ධනය හෝ සම්බන්ධතා ජාල නොමැති ආන්තික ප්‍රජාවන්ගේ කාන්තාවන්ට කෝටාව මගින් මාර්ග විවෘත කළ හැකි බවට තර්ක කරයි (Schwartz 2004; Mehta 2002).

අවසාන වශයෙන්, Franceschet, Krook, සහ Piscopo (2009) තර්ක කරන පරිදි, කෝටා ක්‍රමයේ කාර්යක්ෂමතාව තක්සේරු කළ යුත්තේ තේරී පත් වූ කාන්තාවන් සංඛ්‍යාව අනුව පමණක් නොව, මෙම ප්‍රතිසංස්කරණ ශක්තිමත් ධූරාවලි සහ ආධිපත්‍යයේ රටාවන් බිඳ දමන්නේ ද යන්න මතය. ස්ත්‍රීවාදී ආයතනිකවාදී දෘෂ්ටි කෝණයකින් බැලූ විට කෝටා ක්‍රමය යනු දෙපැත්ත කැපෙන පිහියක් වැනිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවී බහිෂ්කරණය අභියෝගයට ලක් කිරීමට අදහස් කරන අතරතුර මූලික වශයෙන් පුරුෂාධිපත්‍යයක් ලෙස පවතින ආයතනික ව්‍යුහයන් තුළට ඇතුළත් කරන විට ඔවුන්ට නොදැනුවත්වම පවතින ධූරාවලිය ශක්තිමත් ද කළ හැකිය (Benjamin 2025).

දකුණු ආසියාව පුරා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කෝටා ක්‍රමය විවිධ ආකාරවලින් ක්‍රියාත්මක කර ඇති අතර එමගින් ආයතනික සැලසුම නියෝජනය සහ නීත්‍යානුකූලභාවය යන දෙකම හැඩගස්වන ආකාරය නිරූපණය වේ. ඉන්දියාවේ පංචායත් රාජ් (පළාත් පාලන) ආයතනවල කාන්තාවන් සඳහා 33% වෙන් කිරීම කාන්තාවන්ගේ දේශපාලන දෘශ්‍යතාව වැඩි කර ඇති අතර ප්‍රජා ආකල්පවල ක්‍රමානුකූල විතැන් වීමකට ද දායක වී ඇත. එහෙත් ස්වාමිපුරුෂයන් හෝ පිරිමි ඥාතීන් තීරණ ගන්නන් ලෙස ක්‍රියා කරන අතරමැදි නියෝජනය (proxy representation) අභියෝගයක් ලෙස පවතී (Rai 2005; Mangayarkarasu 2011). පාකිස්ථානයේ, ජාතික හා පළාත් සභාවල කාන්තාවන් සඳහා වෙන් කරන ලද ආසන 2002 සිට පැවතුණ නමුත් ඒවා සෘජු මැතිවරණවලට වඩා පක්ෂ පත්වීම් මගින් පුරවනු ලැබේ (Rai 2005; Khan සහ Naqvi 2020). මෙම ක්‍රමය පක්ෂපාතීත්වය මත පදනම් වූ ඇතුළත් කිරීම ශක්තිමත් කරන අතර කාන්තාවන්ගේ ස්වාධීනත්වය සීමා කරයි. කෝටා ක්‍රමයෙන් තේරී පත් වූ කාන්තාවන් බොහෝ විට "දෙවන පෙළ සාමාජිකයින්" හෝ "පිනට දුන් ආසන" හිමිකරුවන් ලෙස ලේබල් කර ඇත (Khan සහ Naqvi 2020; Rai 2005).

දකුණු ආසියාවේ පවතින මෙම සිද්ධි පොදු ආතතියක් පෙන්නුම් කරයි: කෝටාව මගින් කාන්තාවන්ගේ පැවැත්ම පුළුල් කළ හැකි අතර ඒවායේ පරිවර්තන විභවය බොහෝ විට පක්ෂ පාලනය කරන තේරීම් ක්‍රියාවලියන්, පිතෘමූලික ප්‍රතිමාන සහ සාමාන්‍ය ක්‍රියාවලියන් හරහා තේරී පත් වූ නියෝජිතයින්, කෝටා ක්‍රමයකින් තේරී පත් වූ නියෝජිතයින්ගෙන් වෙන්කර හඳුනා ගන්නා ආයතනික සැලසුම් මගින් කප්පාදු කරනු ලැබේ. කලාපයේ

පවතින මෙම රටාව ශ්‍රී ලංකාවේ කෝටා ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වී ඇති ආකාරය අවබෝධ කර ගැනීම සඳහා වැදගත් සංසන්දනාත්මක පදනමක් සපයා ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කෝටා ක්‍රමය පිළිබඳ ශ්‍රී ලංකාවේ අත්දැකීම මෙම කලාපීය ගතිකයන් සමීපව පිළිබිඹු කරයි. දශක ගණනාවක් තිස්සේ ඒ වෙනුවෙන් කතා කිරීමෙන් පසුව පළාත් පාලන මට්ටමින්[9] කාන්තාවන් සඳහා කෝටාවක් 2016 දී හඳුන්වා දෙන ලදි. එය 2018 දී ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. කෙසේ වෙතත් මෙම කෝටාව හුදකලාව මතුවූ එකක් නොවීය. එය 2012 සහ 2017 අතර ක්‍රියාත්මක කරන ලද මැතිවරණ ප්‍රතිසංස්කරණ මාලාවේ ප්‍රතිඵලයකි (Vijeyarasa 2020).

පළමු ප්‍රතිසංස්කරණය වූයේ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන (මැතිවරණ) සංශෝධන පනත වේ. එමගින් පළාත් පාලන ආයතන සඳහා සරල බහුතර නියෝජන ක්‍රමය (First-Past-The-Post)[10] සහ සමානුපාතික නියෝජනය ක්‍රමය (Proportional Representation)[11] ඒකාබද්ධ කරන ලද දෙමුහුන් මැතිවරණ ක්‍රමයක් ස්ථාපිත කරන ලදි. මෙම ප්‍රතිසංස්කරණය මගින් සිදු කරන ලද සැලකිය යුතු වෙනස වූයේ දැනට පවතින 40%ක් වූ අනිවාර්ය තරුණ කෝටාව (1990 සිට ක්‍රියාත්මක වේ) අහෝසි කිරීම සහ එය වෙනුවට අභිමතය පරිදි විධිවිධානයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමයි. "එක් එක් නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් වන මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් සියයට 25 ක් සහ අතිරේක පුද්ගලයින් ... කාන්තාවන් සහ තරුණයින්ගෙන් සමන්විත විය හැකිය", එහෙත් මෙම විධිවිධානයේ ඒකාබද්ධ හා ස්වේච්ඡා ස්වභාවය නිසා මෙම පියවර බොහෝ දුරට අකාර්යක්ෂම විය (Vijeyarasa 2020).

2016 අංක 1 දරන පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත මගින් මුළු ආසන සංඛ්‍යාවෙන් තුනෙන් එකකින් ලෙස සැලකිය යුතු ලෙස වැඩි කරන ලද අතර අතිරේක ආසන සියල්ලම වෙනම ලැයිස්තුවක කාන්තාවන් සඳහා පමණක් වෙන් කරන ලදි. පොදුවේ "ස්වාධීන කණ්ඩායම් ලැයිස්තුව" ලෙස හැඳින්වෙන මෙම ලැයිස්තුව කාන්තාවන් සඳහා නව පිවිසුම් ස්ථාන නිර්මාණය කිරීමට අදහස් කරන ලද අතර එය නෛතිකව

9 ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය යනු මධ්‍යම රජය සහ පළාත් සභා වලට පසුව පවතින තුන්වන සහ පහළම ස්ථරීය පාලන ක්‍රමය වේ. පළාත් පාලන ආයතන ලෙස හැඳින්වෙන පළාත් පාලන අධිකාරිය තුළ විශාල නගර සඳහා මහ නගර සභා , මධ්‍යම ප්‍රමාණයේ නගර සඳහා නගර සභා සහ ග්‍රාමීය ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සභා ද ලෙසින් ද පළාත් පාලන අධිකාරිය සමන්විත වේ. පළාත් පාලන ආයතන 341 ක් ඇති අතර ඒ සෑම එකක්ම මැතිවරණ කොට්ඨාස වලට බෙදා ඇත. මේවා තනි සාමාජික කොට්ඨාස හෝ බහු-සාමාජික කොට්ඨාස විය හැකිය. එයින් තනි සාමාජික කොට්ඨාසයකට, එක් නියෝජිතයෙකු අදාළ පළාත් පාලන ආයතනයට තෝරා පත්කර ගනු ලැබේ. බහු-සාමාජික කොට්ඨාසවලට නියෝජිතයන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු තෝරා පත්කර ගත හැකි අතර සාමාන්‍යයෙන් සිංහල, දෙමළ හෝ මුස්ලිම් ප්‍රජාවක් සහිත කොට්ඨාසයක් තුළ සුළුතරයක් වන නමුත් වෙනම නියෝජනයක් ඇති කිරීමට  ප්‍රමාණවත් තරම් විශාල ජනගහනයක් ඇති තැනක එසේ ස්ථාපිත කරනු ලැබේ.

10 මෙම ක්‍රමය තුළදී, ඡන්දදායකයින්ට දේශපාලන පක්ෂවල නියෝජිතයන් ලෙස හෝ ස්වාධීන අපේක්ෂකයින් ලෙස ඡන්ද කොට්ඨාසයකින් තරග කරන අපේක්ෂකයින්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කර ඒ අය අතරින් එක් අපේක්ෂකයෙකුට ඡන්දය ප්‍රකාශ කරනු ලැබේ. මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 50% කට වඩා ලබා නොගත්තද, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයා තෝරා පත්කර ගනු ලබයි. නිදසුනක් වශයෙන්, අනෙක් සියලුම අපේක්ෂකයින් අඩු ඡන්ද ලබා ගන්නේ නම් අපේක්ෂකයෙකුට 40% ක ඡන්ද ප්‍රතිශතයකින් ජයග්‍රහණය කළ හැකිය.

11 මෙම ක්‍රමය යටතේ, ඡන්දදායකයින් දේශපාලන පක්ෂයකට ඡන්දය ප්‍රකාශ කරන අතර බහු-සාමාජික මැතිවරණ දිස්ත්‍රික්කයක් තුළ ඔවුන්ට ලැබෙන ඡන්ද ප්‍රතිශතයට සමානුපාතිකව පක්ෂවලට අදාළ ආසන වෙන් කරනු ලැබේ. වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් අපේක්ෂකයා පමණක් තෝරා පත් කර ගනු ලබන FPTP මෙන් නොව, සමානුපාතික නියෝජනය අරමුණු කරන්නේ තේරී පත් වූ මණ්ඩලයේ සංයුතිය ඡන්දදායකයින්ගේ මනාපයන් වඩාත් සමීපව පිළිබිඹු කරන බව සහතික කිරීම පිණිසයි.

වෙන් කරන ලද ආසන කෝටාවක් ලෙස වර්ගීකරණය කළ හැකිය. 2017 අංක 16 දරන පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත මගින් කෝටාව තවදුරටත් පැහැදිලි කරන ලද අතර සෑම පළාත් පාලන ආයතනයකම සාමාජිකයින්ගෙන් "සියයට 25 කට නොඅඩු පිරිසක්" කාන්තාවන් විය යුතු විය. එමගින් FPTP නාමයෝජනා පත්‍රවල අවම වශයෙන් 10% ක් කාන්තාවන් ඇතුළත් විය යුතු අතර PR ලැයිස්තු වල 50% කට නොඅඩු කාන්තාවන් ප්‍රමාණයක් ඇතුළත් විය යුතු විය. එමගින් ව්‍යවස්ථාපිත අපේක්ෂක කෝටාවක් පිළිබිඹු වේ (Vijeyarasa 2020; Athukorala et al. 2021).

මෙම ක්‍රමය යටතේ ආසන වලින් 60% ක් සරල බහුතර නියෝජන ක්‍රමය හරහා පුරවනු ලබන අතර ඉතිරි 40% සමානුපාතික නියෝජනය ක්‍රමය හරහා වෙන් කරනු ලැබේ. මෙයින් අදහස් කරන්නේ තේරී පත් වූ සාමාජිකයින් පමණක් නිශ්චිත කොට්ඨාශ නියෝජනය කරන අතර සමානුපාතික නියෝජන ලැයිස්තුව හරහා පත් කරන ලද අයට කොට්ඨාස පදනම් කරගත් මැතිවරණ කොට්ඨාශයක් නොමැති බවයි (Vijeyarasa 2020; Athukorala et al. 2021).[12]

ඒ අනුව, සෑම දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ම නාම යෝජනා පත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතුය. එකක් කොට්ඨාස මට්ටමින් තරඟ කරන අපේක්ෂකයින් සඳහා වන අතර, ඉන් අවම වශයෙන් 10% ක් කාන්තාවන් විය යුතු වේ. අනෙක සමානුපාතික නියෝජන ලැයිස්තුව සඳහා වන අතර එයට 50% කට නොඅඩු කාන්තාවන් ප්‍රමාණයක් ඇතුළත් විය යුතු ය. සරල බහුතර නියෝජන ක්‍රමය හරහා ලබා ගත් ආසනවලට වඩා වැඩි ආසන ප්‍රමාණයක් සඳහා පක්ෂයක් හිමිකම් ලැබූ විට, සමානුපාතික නියෝජන ලැයිස්තුව හරහා අතිරේක අපේක්ෂකයින් නම් කිරීමට එයට හැකි වේ (Vijeyarasa 2020; Athukorala et al. 2021).

මෙම ප්‍රතිසංස්කරණ හේතුවෙන් කාන්තාවන්ට තේරී පත් වූ නියෝජිතයින් ලෙස නැතිනම් සරල බහුතර ක්‍රමය යටතේ තනි තනිව තේරී පත් වූ අය ලෙස හෝ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ කාන්තා ලැයිස්තුව හරහා පත් කරන ලද සාමාජිකයින් ලෙස හෝ සභාවලට ඇතුළු විය හැකි ද්විත්ව ප්‍රවේශ ක්‍රමයක් ඇති විය. මෙම වෙනස ප්‍රායෝගිකව ද වැදගත් විය. මන්ද යත්, සමානුපාතික නියෝජන ලැයිස්තුව හරහා පත් කරන ලද බොහෝ කාන්තාවන් ඡන්දදායකයින් විසින් තෝරා ගැනීමට වඩා පක්ෂ නායකත්වය විසින් තෝරා ගන්නා ලද අතර එමගින් සභා තුළ ඔවුන්ගේ සාපේක්ෂ බලය සහ ස්වාධීනත්වය හැඩ ගස්වා ඇති බැවිනි (Athukorala et al. 2021; Kanold 2020).

12 2018 පළාත් පාලන මැතිවරණයේදී සෑම දේශපාලන පක්ෂයක්ම සහ ස්වාධීන කණ්ඩායමක්ම සෑම කොට්ඨාසයකටම තරග කිරීම සඳහා අපේක්ෂකයින් නම් කළහ. ඡන්දදායකයින් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට තනි ඡන්දයක් ප්‍රකාශ කළද, එම ඡන්දය කාර්යයන් දෙකක් ඉටු කළහ. පළමුව, එය එක් එක් කොට්ඨාසයේ ජයග්‍රාහී අපේක්ෂකයා තීරණය කළ අතර එම කොට්ඨාසයේ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලැබූ පක්ෂය හෝ කණ්ඩායම නියෝජනය කරන අපේක්ෂකයා FPTP ක්‍රමය යටතේ තේරී පත් විය. දෙවනුව, එක් එක් පක්ෂයේ සමස්ත ආසන කොටස තීරණය කිරීම සඳහා පළාත් පාලන බල ප්‍රදේශය පුරා ඡන්ද එකතු කරන ලද අතර සමානුපාතික නියෝජනය ක්‍රමය හරහා අතිරේක ආසන වෙන් කර පක්ෂයේ අතිරේක නාම යෝජනා ලැයිස්තුවෙන් පුරවනු ලැබිණි.

කෙසේ වෙතත්, මෙම ප්‍රතිසංස්කරණයට ව්‍යතිරේක දෙකක් තිබුණි. පළමුව, දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට පළාත් පාලන ආයතනයකට තේරී පත් වූ සාමාජිකයින්ගේ සංඛ්‍යාව වෙන් කරන ලද ආසන සංඛ්‍යාවට වඩා වැඩි නම් කෝටාව අදාළ නොවේ. දෙවනුව, යම් පක්ෂයක් හෝ කණ්ඩායමක් පළාත් පාලන ආයතනයක මුළු ඡන්ද වලින් 20% කට වඩා අඩු ප්‍රතිශතයක් ලබා ගන්නේ නම් සහ ආසන තුනකට වඩා අඩු ප්‍රමාණයක් ලබා ගන්නේ නම් කෝටාව අදාළ පළාත් පාලන ආයතනය සඳහා අදාළ නොවේ (Athukorala et al. 2021).

කාන්තා නියෝජනය ශක්තිමත් කිරීම සඳහා වන අභිප්‍රාය තිබුණත්, නීතිමය රාමුව "අතිශයින්ම සංකීර්ණ හා අල්ප අවබෝධයක්" ඇති කෝටා ක්‍රමයක් නිර්මාණය කළේ ය. 2018 මැතිවරණයෙන් මාස කිහිපයකට පසුව පවා පාර්ශවකරුවන් විධිවිධාන සම්බන්ධයෙන් එකඟ නොවූ අතර නිල වාර්තාවල නොගැළපීම් දිගටම පැවතුණි. ලැයිස්තු දෙකක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අඛණ්ඩ ව්‍යාකූලත්වයට හේතු විය (2017 අංක 16 දරන පළාත් පාලන ආයතන [සංශෝධන] පනත) (Vijeyarasa 2020) කෙසේ වෙතත්, 2018 මැතිවරණයේ ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් සභා ආසන වලින් 23% ක් හිමිකරගත් අතර පළාත් පාලන ආයතනවලින් 95% ක 25% වූ කෝටාවේ අවශ්‍යතාවය සපුරාලීය (Athukorala et al. 2021).

කෝටා ක්‍රමය හරහා තේරී පත් වූ කාන්තාවන් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස වැඩි වීමට හේතු වුවද, එය එක්වරම "නිත්‍ය" සහ "කෝටා" නියෝජිතයින් අතර සංකේතාත්මක බෙදීමක් ඇති කළේ ය. තරගකාරී කොට්ඨාස මට්ටමේ තරග වලින් නොව සියලුම කාන්තාවන් පාහේ අලුතින් නිර්මාණය කරන ලද සමානුපාතික නියෝජන ලැයිස්තුව හරහා තෝරා පත් කර ගනු ලැබීය. සරල බහුතර ක්‍රමය යටතේ ආසන ලබා ගත්තේ 6.2% ක් පමණි (Kodikara 2016, 15; Vijeyarasa 2020). මෙම ද්විභේදනය කෝටාව හරහා තේරී පත් වූ කාන්තාවන් අවම සුජාතභාවයක් හිමි, බලය අඩු සහ "සැබෑ දේශපාලනඥයන්" නොවන බවට වූ අදහස ශක්තිමත් කළේ ය. අවිධිමත් පක්ෂ සහ කවුන්සිල ප්‍රතිමාන මෙම අවප්‍රමාණය ගැඹුරු කරන ලදී (Kodikara 2016, 15; Vijeyarasa 2020). ශාස්ත්‍රඥයින් සඳහන් කරන්නේ සමානුපාතික නියෝජන ලැයිස්තුව හා සබැඳි විශ්වසනීයත්වය අඩු වීම කෝටාවේ පරිවර්තනීය විභවයට ඇති වූ සැලකිය යුතු ම බාධකයකි (Vijeyarasa 2020). තවද, ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ටි කෝණයකින් බලන කල කෝටාවේ සැලසුම සීමාවන් ඉදිරිපත් කරයි. මන්ද යත්, කොට්ඨාස නාමයෝජනා වලින් 10% ක් පමණක් කාන්තාවන් සඳහා අනිවාර්ය කර ඇති අතර ආසන බහුතරයක් සමානුපාතික නියෝජන ලැයිස්තුව හරහා වෙන් කර ඇත. මෙයින් අදහස් වන්නේ සමානුපාතික නියෝජන ලැයිස්තුව හරහා තේරී පත් වූ කාන්තාවන් තමන්ගේ ම සුවිශේෂී මැතිවරණ කොට්ඨාශයක් නියෝජනය නොකරන බවයි. එමගින් අර්ථවත් දායකත්වයක් ලබා දීම සහ ඔවුන්ගේ ම දේශපාලන ස්ථාවරය මත පදනම් ව නැවත මැතිවරණයක් ලබා ගැනීම ඔවුන්ට වඩාත් දුෂ්කර විය හැකිය (Vijeyarasa 2020).

සමස්තයක් ලෙස මෙය, සමානුපාතික නියෝජන ලැයිස්තුව හරහා කෝටාවෙන් වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කරන බව සහතික කරන සංශෝධිත නීති, මෙම ආසන සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමේ දී පක්ෂ සංවිධායකයින්ට "අසීමාන්තික අභිමතය බලතල" ලබා දීමෙන් පක්ෂ සාමාජිකයින්ගේ ඥාතීන් නම් කිරීමට තුඩු දෙයි. මෙය පොදුවේ "වැන්දඹුවන්, දියණියන් සහ භාර්යාවන් සහලක්ෂණය" ලෙස හැඳින්විය හැකි අතර පහසුවෙන් පාලනය කළ හැකි කාන්තාවන්ට අනුග්‍රහය දක්වයි (Vijeyarasa 2020; Manuratne et al. 2024; Kodikara සහ Samuel 2018). එවැනි භාවිතයන් පළපුරුදු කාන්තාවන් පසෙකට දමා අනුග්‍රාහක ජාලයන් ආරක්ෂා කරමින් ශක්තිමත් බල ව්‍යුහයන්ට අභියෝග කිරීමට කෝටාවට ඇති හැකියාව සීමා කළේ ය (Vijeyarasa 2020). මෙම ගතිකය කාන්තාවන් ප්‍රධාන ධාරාවේ පාත්‍රයින්ට වඩා දේශපාලන පිටස්තරයන් ලෙස ස්ථානගත කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආයතනගත තර්කයක් පිළිබිඹු කර ශක්තිමත් කරයි (Vijeyarasa 2020).

කාන්තා සංවිධානවල ප්‍රබල හඬ නැඟීමක් සහ සහයෝගයක් තිබියදීත්, ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ බොහෝ විට කාන්තා නියෝජනය ඉහළ නැංවීම සඳහා අවිනිශ්චිතභාවයක් හෝ ඍජු විරෝධය පෙන්නුම් කර ඇත. ප්‍රතිපත්ති ප්‍රකාශන කෝටාව සඳහා සහාය දක්වන නමුත් බොහෝ ජ්‍යෙෂ්ඨ නායකයින් බොහෝ විට ඒවා "ප්‍රායෝගික නොවන" ලෙස බැහැර කරන අතර කෝටා ක්‍රමය හරහා ආසන සඳහා තේරී පත් වූ කාන්තාවන් "පින් මන්ත්‍රීන්" ලෙස ලේබල් කිරීමේ අපකීර්තියට මුහුණ දෙති. මෙය ඔවුන්ගේ සුජාතභාවය අඩපණ කරන අතර යටිතල පහසුකම් ව්‍යාපෘති වැනි සැලකිය යුතු කාර්යයන් සිදු කිරීමට ඔවුන්ට ඇති හැකියාව සීමා කරයි (Manuratne et al. 2024).

පක්ෂ පුරුද්දක් ලෙස ජයග්‍රහණය කළ නොහැකි ආසන සඳහා කාන්තාවන් නම් කිරීම, ප්‍රචාරක අරමුදල් වලින් බැහැර කිරීම සහ ඔවුන්ට පිරිමි මන්ත්‍රීවරුන්ට සාපේක්ෂව අඩු බලපෑමක් සහිත ව්‍යාපෘති පැවරීම නිසා ඔවුන්ගේ පරිවර්තනීය හැකියාවන් මොට කරන ආකාරයෙන් කෝටා ක්‍රම වලට අනුකූල වේ (Manuratne et al. 2024; Naseer et al. 2023; UN Women 2021; Herath 2021) 2018 මැතිවරණයේ දී බොහෝ කාන්තාවන් තම පක්ෂ පරාජය වනු ඇතැයි පක්ෂ සංවිධායකයින් විශ්වාස කළ කොට්ඨාසවල රඳවා තබන ලදි. මෙම අපේක්ෂකයින් "බිලි ගැහැණු ළමයින්" ලෙස අපහාසාත්මක ලෙස හැඳින්වූ අතර එය විශේෂයෙන් හෙළිදරව් වන යෙදුමක් විය. මන්ද යත්, මෙම කාන්තාවන් මැතිවරණ තරඟයේදී "කැප කිරීමට" පෙර කෝටාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා පමණක් භාවිතා කළ හැකි ලෙස සලකනු ලැබ ඇති බව අඟවයි (Manuratne et al. 2024). මෙය සංකේතවාදයේ සම්භාව්‍ය ස්වරූපයක් පිළිබිඹු කරයි. එහි දී ආයතන විධිමත් අවශ්‍යතා සපුරාලන අතර යටින් පවතින පිතෘ මූලික බල ව්‍යුහයන් නොවෙනස්ව තබා ඇත (Kanter 1977).

ඉන්දියාව සහ පාකිස්තානය හා සසඳන විට, ශ්‍රී ලංකාවේ කෝටා ක්‍රමය සුවිශේෂී වන්නේ එය පවතින ආසන නැවත ස්ථානගත කිරීම වෙනුවට කාන්තාවන් සඳහා නව ආසන නිර්මාණය කළ බැවිනි. මෙම ආකෘතික තේරීම, වෙන්වීම පිළිබඳ සංජානනය ගැඹුරු කළ

අතර ප්‍රධාන ධාරාවේ දේශපාලන බලයට කාන්තාවන්ට ඒකාබද්ධ වීමට බාධා කළේය (Kodikara 2016). තවද, Kodikara (2023) ට අනුව වඩාත් ප්‍රමාණාත්මක හා පරිවර්තනීය වෙනසක් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි "තීරණාත්මක ප්‍රමාණයක්" සෑදීම සඳහා කෝටාව මගින් සාමාන්‍යයෙන් අවම වශයෙන් 30% ක් හෝ ආසන වෙන් කිරීමට අපේක්ෂා කෙරේ. කෝටාව දැනට 25% ක් ලෙස නියම කර ඇති ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ, මෙම සීමාව තවමත් සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගෙන නොමැති අතර, කෝටාව එහි අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත හැකි ප්‍රමාණය පිළිබඳ ප්‍රශ්න මතු කරයි. මෙම ශ්‍රී ලාංකික අත්දැකීම ද පක්ෂ භාවිතයන්හි හෝ අවිධිමත් ප්‍රතිමාන අනුරූප වෙනස්කම් නොමැතිව සංඛ්‍යාත්මක කෝටාවක් හඳුන්වා දීම අපේක්ෂකයින් තෝරා ගැනීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තර්කනය අර්ථවත් ලෙස වෙනස් කළ හැකිද? යන්න පිළිබඳ පුළුල් ප්‍රශ්න මතු කරයි.

දේශපාලන පක්ෂ සහ පළාත් පාලන ආයතන තුළ ව්‍යුහාත්මක වෙනසක් නොමැතිව, කෝටා ක්‍රමය ඔවුන් අභියෝගයට ලක් කිරීමට සැලසුම් කර ඇති ආයතනික අසමානතාවයන් බිඳ දැමීම වෙනුවට ශක්තිමත් කිරීමේ අවදානමක් ඇත. විධිමත් ප්‍රතිසංස්කරණ සහ අවිධිමත් ප්‍රතිරෝධය අතර පවතින මෙම ආතතිය 2018 දී පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ කාන්තාවන්ගේ අත්දැකීම් පරීක්ෂා කළ හැකි තීරණාත්මක කවුළුවක් සපයන අතර යෝජිත අධ්‍යයනයේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදාත්මක ප්‍රවේශය දැනුම් දෙයි.

# හතරවන පරිච්ඡේදය

## ක්‍රමවේදය

මෙම සංකල්පීය දෘෂ්ටිය මත ගොඩ නංවමින්, මෙම අධ්‍යයනය විසින් පළාත් පාලන ආයතන තුළ සිටින කාන්තාවන් අත්දකිනු ලබන විධිමත් ආයතනික ප්‍රතිසංස්කරණයන් සහ අවිධිමත් භාවිතයන් අතර පවතින ආතතිය පරීක්ෂා කරනු ලබයි. මෙම ගතිකයන් හසුකර ගැනීම සඳහා, පර්යේෂණය විසින් ගුණාත්මක ප්‍රවේශයක් උපයෝගී කරගන්නා අතර, 2018 වසරේ පළාත් පාලන ආයතන මගින් ඡන්දයෙන් තෝරා පත්කරගත් කාන්තාවන් විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව සිදුවන ආයතනික සීමාකාරී කම් තුළ හැසිරෙන සහ ප්‍රතිචාර දක්වන ආකාරය සොයා බැලීම සඳහා, දිස්ත්‍රික්ක දහයක් පුරා සිටින කාන්තා මන්ත්‍රීවරියන් විසි හය දෙනෙකු සමග කරනු ලද ඉතා ගැඹුරු සම්මුඛ සාකච්ඡාවන් සහ එයට අතිරේකව, ශාස්ත්‍රඥයන්, සමාජ ක්‍රියාකාරිකයන් සහ සිවිල් සමාජ නියෝජිතයන් දහ හතර දෙනෙකු සමග කරනු ලැබූ ඉතා වැදගත් දැනුවත් වීමේ සම්මුඛ සාකච්ජාවන් මේ සඳහා එකතු කරගනු ලැබේ.

පර්යේෂණයට සහභාගී වන්නන් තෝරා ගන්නා ලද්දේ, පළාත් පාලන ආයතන විසින් හඳුන්වා දෙනු ලැබූ, 25% ක ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ලබාදෙන කෝටාවට පසුව ඡන්දයෙන් තේරී පත් වූ කාන්තාවන් ඉලක්ක කර ගනිමින් කරන ලද අරමුණුකාරී නියැදි ප්‍රවේශයක් භාවිතයෙන් සහ ඒ සමගම තුන්වන වගුවේ සඳහන් වන පරිදි සියළුම දිස්ත්‍රික්ක සහ ජාතීන් අතර විවිධත්වය නියෝජනය සහ විවිධ දේශපාලන පක්ෂ නියෝජනය වන උපරිම වර්ගීකරණ උපාය මාර්ගයක් අනුගමනය කරන අතරතුරය. නියදියට අන්තර්ගත වන කාන්තාවන්, පළාත් පාලන ආයතන තුළට කොට්ඨාස මට්ටමින් වන ඡන්ද තරග තුළින් මෙන්ම සමානුපාතික නියෝජනයන්ගේ නාම ලැයිස්තුව තුළින්ද ඇතුළු වීම, පශ්චාත් කෝටා සංදර්භය තුළ දී කාන්තාවන් විසින් දේශපාලන කාර්යාල තුළට ප්‍රවේශය ලබා ගන්නා බහුවිධ මාර්ගයන් පෙන්නුම් කරයි. සියළුම මන්ත්‍රීවරියන් සම්මුඛ සාකච්ජාවන් කරන ලද්දේ මුහුණට මුහුණ මුණගැසී මෙන් වන අතර ඇතැම් ප්‍රධාන තොරතුරු සපයන්නන්, විශේෂයෙන් පිටරට ජීවත්වන්නන් සම්මුඛ සාකච්ඡා වලට සහභාගී කරවා ගැනීමට සූම් (Zoom) තාක්ෂණය භාවිතා කරන ලදි. සාකච්ජාවන් පැවැත්වූයේ 2023 සහ 2025 කාල අතරතුරය.

*වගුව 3: සම්මුඛ සාකච්ජා සඳහා සහභාගි වූ කාන්තා මන්ත්‍රීවරියන් දිස්ත්‍රික්ක සහ ජාතීන් ලෙස ව්‍යාප්තිය*

| දිස්ත්‍රික්කය | සිංහල | දෙමළ | මුස්ලිම් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|
| බදුල්ල | 2 | 1 | 0 | 0 | 3 |
| මඩකලපුව | 0 | 2 | 1 | 0 | 3 |
| කොළඹ | 1 | 0 | 2 | 1 | 4 |
| ගාල්ල | 2 | 0 | 1 | 0 | 3 |
| මහනුවර | 1 | 1 | 1 | 0 | 3 |
| කෑගල්ල | 0 | 0 | 1 | 0 | 1 |
| මන්නාරම | 0 | 3 | 0 | 0 | 3 |
| පොළොන්නරුව | 1 | 0 | 0 | 0 | 1 |
| පුත්තලම | 0 | 2 | 1 | 0 | 3 |
| රත්නපුර | 1 | 1 | 0 | 0 | 2 |

විවෘත පිළිතුරු සහිත ප්‍රශ්න ඇතුළත් අර්ධ ව්‍යුහිත සම්මුඛ සාකච්ඡා නියාමකය මගින්, සහභාගීවන්නන් හට මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර අතරතුර අත්දැකීම් සහ ඔවුන් මුහුණ දුන් පශ්චාත් මැතිවරණ අභියෝග සියල්ල පිළිබඳව නිදහසේ සාකච්ඡා කිරීමට සහ සාරවත් දේශපාලනික සහභාගිත්වයකට කෝටාවේ බලපෑම පිළිබඳව ඔවුන්ගේ ආකල්පයන් ලබා ගැනීම සිදු කරන ලදි. මෙම ආඛ්‍යානයන් තුළින් කාන්තාවන් පළාත් පාලන ආයතන සමග ගනුදෙනු කරන විට ඔවුන් මුහුණ දෙනු ලබන සංකීර්ණ යතාර්ථයන් සහ සිදුවන බහු ස්ථර වෙනස්කොට සැලකීම් සහ ඔවුන් මුහුණ දෙන්නා වූ ප්‍රතිවිරෝධය පිළිබදව සියුම් වූ අන්තර් දැක්මක් මගින් ඉදිරිපත් කරයි. සම්මුඛ සාකච්ඡා දත්ත, ආයතනික බාධාවන්, අවිධිමත් භාවිතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ  බල සම්බන්ධතා වලට අදාළ නැවත නැවතත් මතුවන රටා හඳුනා ගැනීම සඳහා වන ස්ත්‍රීවාදී ආයතනවාදය (Feminist Institutionalism) පිළිබඳව වන ප්‍රධාන සංකල්පයන් තුළින්, තේමාමය ලෙස විශ්ලේෂණය කරන ලදි.

දත්ත වල ඇති සංවේදීත්වය හේතුවෙන්, සියළුම සහභාගී වන්නන් නිර්නාමික කරන ලදී. කාන්තා මන්ත්‍රීවරියන් දිස්ත්‍රික් කේතයන් මගින් (උදා. කොළඹ 019; බදුල්ල 021) හඳුන්වා දුන් අතර, ඒවා කොට්ඨාශ අංක හෝ පෞද්ගලික හඳුනා ගැනීමක් සමග අදාළ නොවන අතර දත්ත කළමනාකරණය සඳහාම පමණක් භාවිතා කරන ලදි. එලෙසම, ප්‍රධාන දැනුවත් කරන්නන්ගේ පුළුල් රැකියා විස්තර සහ ස්ථාන සූචකයන් පමණක් ඉදිරිපත් කරමින්, ඉංග්‍රීසි හෝඩියයේ නාමකරණය (ප්‍රධාන දැනුවත් කරන්නා A-N) අනුව හඳුන්වා දෙන ලදි. මෙම උපාය මාර්ගය, රහසිගතභාවය තහවුරු කිරීමට උපකාරී වූ අතර, විවිධ දිස්ත්‍රික්ක සහ පක්ෂ හරහා පවතින රටාවන් සහ අත්දැකීම්, විශ්ලේෂණය තුළින් ඉස්මතු කිරීමටද සමත් විය.

මෙම සම්මුඛ සාකච්ඡා ආඛ්‍යාන පාදක කරගනිමින්, මින් ඉදිරියට සිදු කෙරෙන විශ්ලේෂණය මගින්, ප්‍රායෝගිකව පළාත් පාලන ආයතන තුළ පවතින විධිමත් ඇතුළත් කිරීම් සහ අවිධිමත් බාධාවන් අතර ඇති වන ආතතිය කාන්තාවන් විසින් කළමනාකරණය කරගත් ආකාරය ගවේෂණය කරනු ලබයි.

# පස්වන පරිච්ඡේදය

# 2018 මැතිවරණ කාලය අතරතුර කාන්තාවන් විසින් මුහුණ දෙනු ලැබූ අභියෝග

2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද 25% කෝටාව, ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ දේශපාලනික නියෝජනය වර්ධනය සඳහා ගන්නා ලද ඓතිහාසික පියවරක් ලෙස පුළුල්ව පිළිගනු ලැබේ. න්‍යායිකව ගත් කළ, කෝටාවන්ගේ අභිප්‍රාය වනුයේ ප්‍රවේශය සඳහා පවතින සීමාවන් බිඳ දැමීම සහ දේශපාලනයේ නිරත වන කාන්තාවන් හට, තව තවත් සමානාත්මක අවස්ථාවන් නිර්මාණය කිරීමය (Bystydzienski 1995). නමුත්, ඇතැම් විට ඔවුන්ව බැහැර කොට තිබිය හැකි ප්‍රවේශයන්, කෝටාව විසින් බොහෝ කාන්තාවන්ට විවෘත කළද, ඔවුන්ගේ අත්දැකීම් තුළින් හෙළිවන්නේ දේශපාලනය තුළට ආගමනය, ඍජු අවතීරණයකට වඩා බොහෝ ඈතින් පවතින්නක් බවය. දැනුවත් කරන්නෙකු වන එ නිරීක්ෂණය කරන පරිදි, *"අපි මේ කෝටාව ගේන්න ගත්ත හැම පියවරකම දීම සටන් කළාට, ඒ ගමන ලේසි පාසු ගමනක් නම් නෙවෙයි; ගැහැණු අය ගොඩක් දුෂ්කරතා වලට මුහුණ දුන්නා."*[13] මෙම ප්‍රකාශය විසින් පර්යේෂණය පුරාවට පුනරාවර්තනය වන තේමාවක් ග්‍රහණය කරයිඃ කෝටාව විසින් කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක නියෝජනය සැලකිය යුතු ලෙස ඉහළ නැංවුවද, එය විසින් ශ්‍රී ලාංකික දේශපාලන සැකැස්ම තුළ පවතින, ගැඹුරු ලෙස මුල් බැස ගෙන ඇති ආයතනික සහ සංස්කෘතික ප්‍රතිමානයන්, මූලධාර්මිකව වෙනස් කර නොමැති බවය.

ස්ත්‍රීවාදී ආයතනික ගත පර්යාවලෝකනයෙන් ගත් කළ, දේශපාලන පක්ෂ සහ පළාත් පාලන ආයතන විධිමත් දේශපාලනික මණ්ඩප ලෙස සහ පවුල සහ ප්‍රජාව අවිධිමත් ආයතනික මණ්ඩප ලෙස, පෙර සිට පැවත එන ආයතනික අවකාශ තුළට, ස්ථරමය ලෙස ඇතුළත් කරන ලද 'සම්මත නීතියක්' කෝටාව විසින් නියෝජනය කරයි. කෙසේ නමුත්, බොහෝ විට අවිධිමත් ක්‍රියාපටිපාටයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිමානයන් සහ පිතෘමූලික බල ගතිකයන්, මෙම විධිමත් වෙනස්කම් සමග සට්ටනය වී කාන්තාවන්ගේ සම්පූර්ණ සහ සමාන ලෙස සහභාගීවීමේ හැකියාව සීමා කරයි. බොහෝ අවස්ථාවලදී, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ කෝටාවන් වැනි, කාන්තාවන් බල ගැන්වීම අරමුණු කර ගත් මෙම ආයතනික රාමූන් විසින්ම ඊට සමගාමී ලෙස ආන්තීකරණයක් ප්‍රතිජනනය කර ඇත.

පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වන භූමිකාවෙහි සංදර්භය සලකන කළ, මෙම ආන්තිකකරණයෙහි සුවිශේෂීත්වය තවදුරටත් පැහැදිලිව දිස් වේ. ශ්‍රී ලංකාවෙහි දේශපාලනික කතිකාව විශාල ලෙස කේන්ද්‍රව ඇත්තේ පාර්ලිමේන්තු සහ ජනාධිපති මැතිවරණ මත වුවද, පළාත් පාලන අධිකාරි මගින් පුරවැසියන් තමන්ගේ එදිනෙදා ජීවිතයේ වඩාත්ම ඍජුව ගණුදෙනු කරන රාජ්‍ය තලය පිහිටුවයි. එක් මන්ත්‍රීවරියක් නිරීක්ෂණය කළ පරිදි,

13 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි මස 25, 2025.

*"මිනිස්සු හැමෝටම ඉපදීමේ ඉඳලා මරණය වෙන කල් හැමදේටම පළාත් පාලන ආයතන උවමනා වෙනවා. කෙනෙක් ඉපදෙන්න කලින් ඉඳලම එයාලට පළාත් පාලන ආයතනවල සේවය අවශ්‍ය වෙනවා, මොකද ගැබ් ගැනීම සහ ප්‍රසූතියට පෙර රැක බලා ගැනීම යන කාරණා වලදී ඒවා මූලික වන නිසා."*[14] මෙම නිරීක්ෂණය තුළින් අත්‍යවශ්‍ය පොදු සේවාවන් වන සනීපාරක්ෂක සේවා, මාර්ග සහ නාගරික සැලසුම් කිරීම් සිට සෞඛ්‍ය සහ සමාජ සුභසාධන සේවා ලබාදීම දක්වා වන පළාත් පාලන අධිකාරි මගින් සිදුකරන කේන්ද්‍රීය භූමිකාව ඉස්මතු කර පෙන්වයි. එතුළින් මෙවැනි ආයතන තුළ කාන්තාවන්ගේ අර්ථාන්විත සහභාගිත්වය, ඉතාමත් තීරණාත්මක වන්නේ මන්දැයි යන්නද හෙළි කරයි. කාන්තාවන්ගේ සම්පූර්ණ ලෙස සහභාගි වීමේ හැකියාව සීමා කරන බාධක එබැවින්, කාන්තාවන්ගේ දේශපාලන නියෝජනයට පමණක් නොව ඔවුන් නියෝජනය කරනු ලබන ප්‍රජාවෙහි එදිනෙදා ජීවිතය හැඩගස්වන තීරණ සඳහා අර්ථාන්විත සහභාගි වීමේ හැකියාව සඳහාද බලපෑම් ඇති කරයි.

එබැවින්, මෙම අධ්‍යනය තුළ ලේඛනගත කර ඇති අභියෝග, නාම යෝජනා භාර දීමට පෙර සිට මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර කාලය සහ කාර්යාලයට ඇතුළත් වීමෙන් පසු කාලය යන සම්පූර්ණ දේශපාලනික ජීවන චක්‍රය පුරා විහිදෙයි. දේශපාලන ජීවිතයට සමගාමීව ගෘහස්ත වගකීම් වල ද්විත්ව බර දරමින්, පළාත් පාලන ආයතන තුළ එදිරිවාදිකම් සහ වෙනස් කොට සැලකීම් වලට මුහුණ දෙමින්, සම්පත් ආරක්ෂා කර ගැනීම සහ පක්ෂ සහයෝගය ලබා ගැනීමෙහි අරගලයක යෙදෙන බවට කාන්තාවන් විසින් වාර්තා කර ඇත. මෙම අභියෝග මතු වන සහ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා, පහත සඳහන් විශ්ලේෂණය සංවිධානය කොට ඇත්තේ, මූලික ආයතනික අවකාශ තුනකිනි. දේශපාලන පක්ෂ, පළාත් පාලන ආයතන සහ පවුල හා ප්‍රජාව ලෙසය. මෙම අවකාශයන් එක්ව පරීක්ෂා කිරීමෙන්, විධිමත් දේශපාලනික ආයතන සහ පුළුල් සමාජ ව්‍යුහයන් යන දෙකම, පළාත් පාලන ආයතන ආණ්ඩුකරණය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය බලගැන්වීමට, සීමා කිරීමට සහ නියාමනය කිරීමට අන්‍යෝන්‍ය ලෙස ක්‍රියා කරන ආකාරය හෙළිදරව් කිරීමට උපකාරී වේ.

## 5.1 දේශපාලන පක්ෂ අභ්‍යන්තරයෙන් ප්‍රවේශය පාලනය කිරීම සහ ආන්තීකරණය

ගෝලීය වශයෙන්, විධිමත් දේශපාලන පද්ධතිය තුළ, පුරවැසියන් හට ක්‍රියාකාරී දේශපාලනික සහභාගීත්වයට සහ නියෝජනයට වේදිකාවක් සපයා දීමෙන්, නූතන නියෝජනාත්මක ප්‍රජාතන්ත්‍රවාදයෙහි මුදුන්ගල ලෙස, දේශපාලන පක්ෂ හඳුනා ගත හැක (Siriwardhana 2023). කෙසේ වෙතත්, ශ්‍රී ලාංකික සංදර්භය තුළදී, දේශපාලනික පක්ෂ වඩ වඩාත් පුරුෂකරණයට ලක් වූ, අවිධිමත් සහ කාන්තාවන්ට ගමන් කිරීමට දුෂ්කර අවකාශ බවට පත්ව ඇත (Peiris 2014; Peiris 2018; Uyangoda 2018). ඔවුන් පොදු-පෞද්ගලික

14 කොළඹ 019, කොළඹ දිස්ත්‍රික්කය. නොවැම්බර් 22,2023.

බෙදුම්කරණය ස්ථාපනය කිරීම සහ දේශපාලන වේදිකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ශ්‍රම විභජනය ප්‍රතිනිශ්පාදනය කිරීම සම්බන්ධයෙන් විවේචනයට ලක් වී ඇති අතර (Peiris 2014, 49), බොහෝ විට කාන්තාවන්, මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර, අරමුදල් රැස් කිරීම සහ ආධාර බල මුලු ගැන්වීම වැනි සංවිධායක භූමිකාවන්ට සීමා කර ඇත (De Silva 1995; Kiribamuna 1999; Liyanage 2018).

කෝටාව නීතිගත කිරීමට පෙරාතුව, ග්‍රාමීය සංවර්ධන සමාජ, අවමංගල්‍ය කමිටු හෝ සමෘද්ධි සංවිධාන වැනි බිම් මට්ටමේ ප්‍රජා නිරතවීම් වල සිට මැතිවරණ දේශපාලනය දක්වා වන සංක්‍රාන්තිය, කාන්තාවන්ට ලැබෙන දුර්ලභ අවස්ථාවක් ලෙස පැවතිණි (Uyangoda සහ de Mel 2012, 22). මෙයින් හැඟෙන්නේ, දේශපාලන පක්ෂ, දේශපාලනික නියෝජනයට දොරටුවක් ලෙස ක්‍රියා කරන අතරම, ඒවා විසින් ඊට සමගාමීව කාන්තාවන්ගේ දේශපාලන බලය සඳහා වන ප්‍රවේශය සීමා කරන ආයතන ලෙසද ක්‍රියා කරන බවය.

පහත සඳහන් කාණ්ඩය එබැවින්, අපේක්ෂකයන් තෝරා ගැනීමේ ක්‍රියාවලි තුළ දී දේශපාලනික පක්ෂ තුළ පවතින මෙවැනි ආයතනික ගතිකයන් මගින්, නෛමිත්තික (tokenistic) නාම යෝජනා සහ අවිධිමත් පක්ෂ ක්‍රියාවලියන් විසින් කාන්තාවන්ගේ මැතිවරණ දේශපාලනයට පවතින ප්‍රවේශය සහ ඉන්පසුව ඔවුන්ගේ ජීවිත පවත්වා ගැනීම හැඩගස්වන ආකාරය පිළිබඳ සොයා බලයි.

### 5.1.1 අපේක්ෂකයන් තෝරා ගැනීම සහ නෛමිත්තිකවාදය (*Tokenism*)

පළාත් පාලන ආයතන මට්ටමෙහි ස්ත්‍රී සහභාගිත්වය වැඩි කරගැනීමේ පරමාර්ථය මත කෝටාව හඳුන්වා දුන් නමුදු, දේශපාලන පක්ෂ විසින් මෙම ප්‍රතිසංස්කරණය බොහෝ විට සලකන ලද්දේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ඇතුළත් කිරීමේ සාරාත්මක වගකීමකට වඩා "කොටු පිරවීමේ අභ්‍යාසයක්" ලෙසය. වඩා තරගකාරී FPTP ආසන සඳහා නාමයෝජනා වෙනුවට වෙනුවට, 50% බෝනස් ආසන සඳහා PR ලැයිස්තුව යටතේ කාන්තාවන්ගේ නම් අසාමානුපාතික ලෙස යෝජනා විය. එබැවින් මූලික දැනුවත් කරන්නා K නිරීක්ෂණය කළ ආකාරයට, කාන්තාවන්, "ටෝකන්", "නොමිලේ ලැබෙන ආසන" හෝ "බෝනස් ආසන" ලෙස පුරවන පාරිභාෂිතයක් රාමුගත කිරීම මගින්, තවදුරටත් ඔවුන්ගේ නීත්‍යානුකූලභාවය හීන කිරීම සහ කෝටාව හේතුවෙන්ම පමණක් ඔවුන් පැමිණ ඇති බවට පවතින හැඟීම් බලගැන්වීමක් සිදු කරනු ලබයි.[15]

මෙම නෛමිත්තික රාමුගත කිරීම් බොහෝ දේශපාලනික පක්ෂ විසින් කෝටාව ආරම්භයේ සිටම පළ කරන ලද පුළුල් වූ ප්‍රතිරෝධය සමග ඉතා ලඟින් බැඳී පවතී. මූලික දැනුවත් කරන්නා D ට අනුව, එක් නායකයෙක් "අපේ ගෑණු දේශපාලනයට සම්බන්ධ වෙන්නෙ

15 විදේශයක පදිංචි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පර්යේෂක, නොවැම්බර් 20, 2023. (මාර්ගගත සම්මුඛ සාකච්ඡාවක්)

නැහැ."[16] යනුවෙන් විවෘත ප්‍රකාශයක් සිදු කිරීම මගින්, පක්ෂ නායකයන් කිහිප දෙනෙක් කෝටාව කිසිදා නීතියක් විය නොහැකි බවට වන උපකල්පනය මත ක්‍රියා කර ඇත. කාන්තාවන් ඇතුළත් කිරීමට අපහොසත් වුවහොත්, නාම අපේක්ෂක ලැයිස්තු අවලංගු වන බවට දැනුම් දුන්නද, ඇතැම් නායකයන් උදක්ම කියා සිටියේ, කෝටාව නීත්‍යානුකූලව බලාත්මක කිරීම වැළැක්විය හැකි බව හෝ එහි ක්‍රියාත්මක වීම සමග මැදිහත් විය හැකි බවට විශ්වාස කරන බවය.

එහි ප්‍රතිඵලයක් ලෙස, අපේක්ෂකයන් තෝරා ගැනීම නිරන්තරයෙන් සිදුවූයේ අවසාන මිනිත්තුව තුළ දීය. 25% අවශ්‍යතාවය සපුරා ලීම සඳහා නීතිමය වශයෙන් ඔවුන් බැඳී ඇති බවට පක්ෂ විසින් තේරුම් ගත් පසුව, බිම් මට්ටමේ සිට පක්ෂය සඳහා බොහෝ වෙහෙස මහන්සි වී ක්‍රියා කළ කාන්තාවන්ට වඩා, පක්ෂ සාමාජිකයන්ගේ දියණියන්, බිරින්දෑවරුන් හෝ අනෙකුත් කාන්තා ඥාතීන්ගේ නම් ඔවුන් විසින් හනි හනිකව එකතු කරන ලදී. මූලික දැනුවත් කරන්නා D සඳහන් කළ ආකාරයට, මෙම පක්ෂ ශක්තිමත් කාන්තා අපේක්ෂකයන්ට වඩා "ස්ථාන දරන්නන්" සොයා ගැනීමට හේතුව, හැකියාවක් සහිත කාන්තාවන්, පක්ෂ සැකිල්ල අභ්‍යන්තරයෙහි පවතින පුරුෂ ආධිපත්‍යයට දීර්ඝ කාලීනව තර්ජනයක් විය හැකි වීමය.[17]

පාරදෘශ්‍ය තෝරාගැනීමේ නිර්ණායක නොමැති වීම මෙම ගතිකයන් තවදුරටත් සංකීර්ණ කරන ලදී. කුසලතාවය, අධ්‍යාපනය, දේශපාලන අත්දැකීම් හෝ ප්‍රජාව සමග පවතින සම්බන්ධය, කාන්තාවන්ගේ නම් යෝජනා වීමේ අපේක්ෂාවන් සඳහා ඇති කරන බලපෑම ඉතා කුඩා වූ බැවින්, බොහෝ කාන්තා පක්ෂ සාමාජිකාවන් හට නාම යෝජනා ඉල්ලීම් කිරීමට හෝ ස්ථිර කර ගැනීමට පැහැදිලි යාන්ත්‍රණයක් නොමැති විය. දක්ෂ කාන්තාවන්ගේ නම් යෝජනා වන අවස්ථාවන්හිදී පවා, පිරිමි ආසන සංවිධායකයින් විසින් ඔවුන්ට අවාසි වන ලෙස එම ක්‍රියාවලිය හැසිරවීම කරගෙන යන ලදි. මූලික දැනුවත් කරන්නන් කිහිප දෙනෙකු විස්තර කරනු ලබන ආකාරයට, ඇතැම් අවස්ථා වල, කාන්තාවන් වසර ගණනාවක් ඔවුන්ගේ මැතිවරණ කොට්ඨාශ තුළ වැඩ කිරීමෙන් පසුවත්, ඔවුන් ශක්තිමත් තරගකරුවන් ලෙස මතුවී, යම් කලකදී තමන්ගේ අනාගත අපේක්ෂකත්වයට තර්ජනයක් විය හැකි යැයි යන බිය හේතුවෙන්, සංවිධායකයින් විසින් නාම යෝජනා ප්‍රතික්ෂේප කිරීම් වාර්තා වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, අත්දැකීම් බහුල කාන්තාවන්ගේ ආදේශයට, දේශපාලනික අත්දැකීම් රහිත, පවත්නා බල ධූරාවලියට කිසිදු අභියෝගයක් ඉදිරිපත් නොකරන නවකයන් නිරන්තරයෙන්ම ඇතුළත් කර ගනු ලැබේ.

අවසානයේ දී දේශපාලන පක්ෂ, කාන්තාවන්ගේ නාමයෝජනා වැඩිපුර ලබා දීමේ නීතිමය අවශ්‍යතාවය සමග අනුකූල වුවද, එම අනුකූලතාවය මගින් අපේක්ෂකයන් තෝරාග ැනීමේ අවිධිමත් ක්‍රමයන් මූලික වශයෙන් වෙනස් නොකරන ලදි. ඒ වෙනුවට, පවත්නා

16 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි INGOහි සේවය කරන උපදේශන සහ ප්‍රතිපත්ති විශේෂඥ. නොවැම්බර් 16, 2023.
17 Ibid.

බල ව්‍යුහයන් සංරක්ෂණය කරගන්නා ආකාරයකට කෝටාව, පක්ෂ මගින් අනුවර්තනය කරගන්නා ලදී. මෙය අපේක්ෂකයන් ලෙස කවුරුන් යෝජනා වීමේ තීරණය මත මෙන්ම කාන්තාවන් තරග කළ යුත්තේ කුමන ප්‍රදේශයක ද සහ කුමන තත්තවයන් යටතේ ඔවුන් දේශපාලනයට ප්‍රවේශ වන ලද්දේ ද යන සියළු කාරණා තුළ ප්‍රත්‍යමාන විය.

දේශපාලන පක්ෂ තෝරා ගත් එක් උපාය මාර්ගයක් වන්නේ, කාන්තාවන් නුපුරුදු හෝ ජයග්‍රහණය නොකළ හැකි කොට්ඨාශ තුළට නම් කිරීමය. කාන්තාවන් ඔවුන්ට ස්ථාපිත ප්‍රජා සම්බන්ධයන් හෝ මැතිවරණ සහයෝගය නොමැති මැතිවරණ කොට්ඨාශ තුළ ස්ථානගත කිරීමෙන්, පක්ෂ විසින් ඔවුන් ජයග්‍රහණය වීමේ අවස්ථාවන් විශාල ලෙස අවම කරන ලදී.

මූලික දැනුවත් කරන්නා එ ට අනුව, කොළඹ දිස්ත්‍රික්කයෙහි එක් මන්ත්‍රීවරියක්, ඇය කතා නොකරන භාෂාවක් වන ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රධාන වශයෙන් කතා කරන නගරවාසීන් සිටිනා කොට්ඨාශයකට අනුයුක්ත කර යවා තිබීමට නිශ්චිත වූ හේතුව වන්නේ, ඇගේ පරාජය තහවුරු කර ගැනීම, ආසන සංවිධායකගේ පරමාර්ථය වී තිබීමය. මෙම පැවරුම සිදු වූයේ, ඇගේ පළමු නාමයෝජනාව සංවිධායක විසින් අවහිර කිරීම හේතුවෙන් පක්ෂ නායකත්වය මැදිහත් වී ඇයව අතිරේක ලැයිස්තුවට ඇතුළත් කිරීමට පෙළඹීමෙන් පසුව වන අතර, ඉන්පසුව ඇයට තරග කිරීම සඳහා පෙත්සම් ඉදිරිපත් කිරීමටද සිදුවිය.[18]

අගයක් ලෙස, මෙම ක්‍රියාපටිපාටි මගින් පෙන්වා දෙනු ලබන්නේ, 2018 මැතිවරණ කාලය තුළ නෛමිත්තිකවාදය, එම ක්‍රියාවලියන් තුළ ක්‍රියා කළ ආකාරයයි. පක්ෂ විධිමත් ලෙස කෝටාව සමග අනුකුල වන අතරතුර දේශපාලනික ආයතන තුළ පවතින පීතෘමූලික ආකෘතිය පවත්වා ගනිමින්, පක්ෂ සංවිධායකයන් විසින් ඔවුන්ම හඳුන්වා දෙන පරිදි, " දිනන්න බැරි කොට්ඨාස" තුළ ක්‍රමානුකුලව කාන්තාවන් ස්ථානගත කර ඇති බවය. මූලික දැනුවත් කරන්නා එ ද ඉස්මතු කරන කාරණයක් වනුයේ, කාන්තාවන් යෝජනා කිරීමට තිබෙන අකැමැත්ත, පක්ෂ මගින් සාධාරණීයකරණය කරනු ලබන්නේ, "දිනන ජොකියන්" ගේ හිඟයක් තිබෙන බවට ප්‍රකාශ කරමිනි.[19] මෙය අභ්‍යන්තර පක්ෂ කතිකාවන්ට සීමා නොවී, කෝටාව ස්ථාපනය කිරීමට පෙර සිට ජ්‍යෙෂ්ඨ දේශපාලන ක්‍රියාකාරිකයන් පවා ප්‍රකාශයට පත් කර ඇති තර්කයකි. උදාහරණයක් ලෙස, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන[20] විසින්, දේශපාලන පක්ෂ අවධාරණය යොමු කරන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි සමානාත්මතාවයට වඩා "කාටද මැතිවරණය ජයග්‍රහණය කරන්න පුළුවන්" යන කාරණය යැයි, ප්‍රකාශයට පත් කිරීමෙන් අදහස් කරන්නේ, "දිනන ජොකියෝ" කාන්තාවන් අතර නොමැති බවය (Kodikara 2023).

18 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.

19 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.

20 මෙම ප්‍රකාශය සිරිසේන විසින් සිදුකලේ, ඔහු එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම් ලෙස කටයුතු කළ කාලයේ ජනප්‍රිය රූපවාහිනී වැඩසටහනක් වන 'සම්මුතිය' වැඩසටහනට 2009 සහභාගී වන අතරතුරය. පසුව ඔහු ශ්‍රී ලංකාවේ හත්වන ජනාධිපති ලෙස 2015 සිට 2019 දක්වා කටයුතු කළේය.

මෙම අවස්ථාවන් වලදී, තුරඟ තරග තුළින් ව්‍යුත්පන්න වූ "ජොකියෝ" යන වචනය, කාන්තාවන් "දිනුම් ගෙනෙන" තරඟකරුවන් ලෙස නිරූපණය කිරීමට නින්දා සහගත ලෙස පාවිච්චි කර ඇති අතර, එමගින් ඊට සමාන්තරව එවැනි කාන්තාවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති බවට අදහසක්ද ඉදිරිපත් කරයි. ප්‍රායෝගිකව, මෙම "දිනන අපේක්ෂකයා" යන සංකල්පය නිර්මාණය වී ඇත්තේ, පිළිගත් නමක් තිබීම, ආර්ථික සම්පත්, මානව සම්පත් සහ පක්ෂ සාමාජිකයන්ගේ පවුල් සමග ඇති සම්බන්ධතාවය මෙන්ම පක්ෂය සහ මැතිවරණ කොට්ඨාශය අතර පවතින අනුග්‍රාහක ජාල සක්‍රීයව පවත්වා ගැනීමේ හැකියාව යන නිර්ණායක මතය (Kodikara 2009; Liyanage 2018a). මෙම සාධාරණීකරණය මගින් හැකියාව සහිත කාන්තාවන් හට ඡන්ද නාම යෝජනා ප්‍රතික්ෂේප වන චක්‍රයක් පවත්වා ගෙන යාම සහ ඒ වෙනුවට පක්ෂ විසින් අත්දැකීම් විරහිත ස්ත්‍රී ඥාතින්ගෙන් පිරවීම සහ ඉන්පසු මෙම අපේක්ෂකයන්ගේ මැතිවරණ පරාජයන්, සාක්ෂි ලෙස උපුටා, කාන්තාවන් දිගටම අතිරේක ලැයිස්තුවෙන් පැමිණිය යුතු බව ප්‍රකාශයට පත්කර, එමගින් ඔවුන්ගේ නීත්‍යානුකූලභාවය යටපත් කිරීම සිදු වේ.

මෙම "ජයග්‍රහණය කිරීමේ හැකියාව" ගැන පවතින උපකල්පන, කාන්තාවන්ගේ හැකියාවන් පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආකල්පයන් තුළින් ද වර්ධනය වී ඇත. එක් පළාත් පාලන ආයතනයක පිරිමි මන්ත්‍රීවරයෙක් සඳහන් කළ ආකාරයට *"ගැහැණු එඩිතර නැහැ, එයාලා කැපවෙනවත් මදි. එයාලා එයාලගෙ පවුල්/ගෙවල් වලට ජීවිතය සීමා කරලා මේ පීතෘමූලික සංස්කෘතියෙ යටත් වෙලා ඉන්න එකෙන් සතුටු වෙනවා. එයාලා මේ මැතිවරණය දිනන අභියෝගය භාර අරගෙන දේශපාලන ලෝකයේ ඉන්න හිතන්න ඕන"* (Liyanage 2018b). මෙවැනි ආකල්ප දේශපාලනය කිරීම සඳහා කාන්තාවන්ගේ පවතින සුදුසුකම් වල අඩුපාඩු පිළිබඳව ඒකාකෘතිකයන් නිපදවන අතර, ආකෘතික සීමාකම් පරාජය කිරීමට ඇති වගකීම කාන්තාවන් මතටම විතැන් කරයි.

කුමන කාන්තාවන්ගේ නම් යෝජනා වන්නේ දැයි සහ ඔවුන් කුමන තත්වයන් යටතේ තරග කරන්නේ දැයි යන්න හැඩගැස්වී මෙන් ඔබ්බට ගොස්, කාන්තාවන් දේශපාලනයට ප්‍රවේශ වීමේ දී වන කොන්දේසි මත බලපෑමක් ඇති කිරීම ද පක්ෂ ක්‍රියාවලි විසින් ඉටුකරන ලදි. සම්මුඛ සාකච්ඡා දත්ත තුළින් පිළිබිඹු කරනු ලබන්නේ, අවස්ථා කිහිපයක දීම, මැතිවරණ දේශපාලනයට කාන්තාවන්ගේ ප්‍රවේශය, පුරුෂ ඥාතින්ගේ බලගැන්වී මෙන්, පුරුෂයන් ගේ දේශපාලන අධිකාරිය ස්ත්‍රීන්ට පැවරිය හැකි බවට වන පීතෘමූලික අනුමානයන් ප්‍රතිස්ථාපනය කරමින් සිදු වූ බවය. මෙවැනි අවස්ථාවන් පෙන්වා දෙනු ලබන්නේ, දේශපාලන කාර්යාල සඳහා ප්‍රවේශ වීමට නව අවස්ථාවන් කෝටාව හඳුන්වා දීම මගින් නිර්මාණය කළ ද, ඔවුන් දේශපාලනය තුළට ආගමනය කළ ක්‍රියාවලිය, කාන්තාවන් ස්වාධීන දේශපාලන ක්‍රියාකාරීන් ලෙස ඍජු ගිවිසුමක් ලෙස නොව අවිධිමත් පීතෘමූලික භාවිතයන් ගෙන් බොහෝ විට පාලනය වන්නක් වන බවය.

එක් මන්ත්‍රීවරියක් පැහැදිලි ලෙස ප්‍රකාශ කරන ලද්දේ, ඇය දේශපාලනයට ඇතුළ් වූයේ ඇගේ ස්වාමි පුරුෂයා ඒ වනවිටත් දේශපාලනයට සම්බන්ධ වී සිටීම හේතුවෙන් සහ

ඔහුගේ දේශපාලන සම්බන්ධතා තුළින් ඇයට එම අවස්ථාව ලබා ගැනීමට හැකි වූ බව සලකුණු කරමිනි. ඇය තවදුරටත් කරුණු පැහැදිලි කරමින් කියා සිටියේ, ඇය ඇගේ සැමියාගේ දේශපාලන පක්ෂයම තෝරාගනු ලැබූයේ, එමගින් නිවස තුළ දී මතභේද ඇතිවීම මගහරවා ගැනීම සඳහා බවය. ඇය එය පැහැදිලි කරන ලද්දේ මෙසේය;

*"ගෙදරක් ඇතුළෙදි, සැමියා සහ බිරිඳ කොයි දේශපාලන පක්ෂයටද සහයෝගය දක්වන්නෙ කියන කාරණයට දෙන්නා එකඟ වෙන්න ඕන. මේක මතභේදයක් දක්වා යන්න හොඳ නෑ, මොකද ඒකෙන් ප්‍රශ්න ඇති වෙන හින්දා. ඒ නිසා, එයා ඒ පක්ෂෙ සාමාජිකයෙක් හින්දා, මාත් ඒ පක්ෂෙටම බැඳුනා."*[21]

ඇයගේ දේශපාලන පක්ෂය තෝරා ගැනීම පිළිබඳ ඇය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණීයකරණයෙ හි ඇති වඩාත්ම සුවිශේෂී කාරණය නම්, මෙය තමන් මත බලෙන් පටවන ලද තීරණයක් ලෙස නොව, මන්ත්‍රීවරිය විසින් නිවස තුළ පවතින දේශපාලන සමබරතාවය ස්වභාවික සහ හිතකර ලෙස රාමුගත කරමින්, අවිධිමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගතිකයන් සාමාන්‍යකරණය සහ පවුල් සබඳතා තුළ පුනර්ජනනය කළ හැකි ආකාරය නිරූපණය කිරීමය.

සම්මුඛ සාකච්ජාවෙහි ක්ෂේත්‍ර සටහන් තුළින්, ඇගේ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා වන ස්වාමි පුරුෂයාගේ අඛණ්ඩ සම්බන්ධය, ඔහු සම්මුඛ සාකච්ජාව කරන අවස්ථාවෙහි එහි රැඳී සිටීම නිරීක්ෂණය කිරීම මගින් මෙන්ම, නිරතුරුව ආර්ථික ගැටළු පිළිබඳ ප්‍රකාශ කිරීම, සහ ඇය වෙනුවට ඇතැම් අවස්ථා වලදී ප්‍රශ්න වලට පිළිතුරු දීම, ඉන්පසුව මන්ත්‍රීවරිය ඔහුගේ ප්‍රතිචාරයන්ට එකඟ වීම යන කාරණා සලකුණු කළ හැකි විය.[22] මෙතුළින් මන්ත්‍රීවරියගේ පාර්ශ්වයෙන් නියෝජනයක් නොමැති වීම අත්‍යවශ්‍ය ලෙස පෙන්නුම් නොකරන මුත්, එමගින් නිළ වශයෙන් පත්වූ කාර්යාලයට ඔවුන්ගේ පළමු ඇතුල්වීමෙන් ඔබ්බට ගිය, ඇතැම් කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය හැඩගස්වන, අඛණ්ඩ ලෙස පවත්නා පිරිමි පවුල් සාමාජිකයන්ගේ බලපෑම පෙන්නුම් කරයි.

ඒ හා සමාන ගතිකයක්, තවත් සම්මුඛ සාකච්ජාවකින් මතුව ආ අතර, එහි දී එක් මන්ත්‍රීවරියක් පැහැදිලි කරන ලද්දේ, ඇය අපේක්ෂිකාවක් ලෙස සලකන බව ඇය දැන ගැනීමට පෙර සිටම, ඇයගේ නාම යෝජනාව ලබා දීම, ඇගේ ස්වාමි පුරුෂයා විසින් ආරම්භ කර තිබූ බවය. ඇයගේ විස්තරය අනුව, පක්ෂ නියෝජිතයන් විසින් කාන්තා අපේක්ෂිකාවක් සොයා, නිවැසියන් හා සම්බන්ධ වන විට, ඇගේ ස්වාමි පුරුෂයා ඇය වෙනුවෙන් නාම යෝජනාව භාර ගත් බව සහ ඇය සමග සාකච්ජා කිරීම පවා නොකර, ඔහු එම කාරණය පිළිබඳව වගබලා ගන්නා බවට පක්ෂ නිළධරීන් හට ඒත්තු ගැන්වූ බවය. ඉන් අනතුරුව පමණක්, ඇය මැතිවරණය සඳහා තරග කරන බවට ඇයට දැනුම්

21 පොළොන්නරුව 032, පොළොන්නරුව දිස්ත්‍රික්කය, නොවැම්බර් 13, 2023.

22 Ibid.

දෙන ලදි. ඇය පසුව ලබාගත් ජයග්‍රහණය පිළිබඳ පුනරාවර්තනය කරමින්, ඇය ඇගේ දිනුම, තමන්ගේ දේශපාලන වේදිකාව හෝ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය මත නොව ඇය ඇතුළත් වූ පක්ෂයෙහි සිටි හිටපු ජනාධිපතිවරයෙක්ගේ ජනප්‍රියත්වය මත මූලික ලෙස රඳා පැවති බව සඳහන් කළාය.[23]

මෙහිදී දැකිය හැකි එක් සුවිශේෂී කාරණයක් වන්නේ, ඇය වෙනුවෙන් ඇගේ ස්වාමි පුරුෂයා නාම යෝජනාව භාර ගැනීමේ කාරණය නොව, දේශපාලන පක්ෂය කිසි විටකත් අනාගත අපේක්ෂිකාව සමග ඍජු ලෙස සම්බන්ධ නොවීමයි. නාම යෝජනා ක්‍රියාවලිය තුළට ඇය බද්ධවීමක් සිදුනොවීම මගින් දේශපාලන ප්‍රවේශය සඳහා කාන්තාවන් ස්වාධීන දේශපාලන ක්‍රියාකාරිකයන්ව ඍජු ලෙස සම්බන්ධ වීමකට වඩා, පවත්නා ගෘහස්ත බල ව්‍යුහයන් තුළින් කෙතරම් දුරකට ගණුදෙනු කළ හැකි ද? යන්න ඉස්මතු කරයි. මෙමගින් පෞද්ගලික සහ පොදු තලයන් අතර පවතින බාධාවන්, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය තුළ අපැහැදිළි වූ ආකාරය මෙන්ම, විධිමත් දේශපාලන ආයතන තුළට ප්‍රවේශ වීමේ තීරණ නිරන්තරයෙන්ම ගෘහයේ අභ්‍යන්තර මැදිහත්වීම් වලට ලක්වන ආකාරය ද නිරූපණය වේ. අවසාන වශයෙන්, මෙම සිද්ධීන් තුළින්, විධිමත් ආයතනික ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දී තිබුණ ද, පවුල සහ පක්ෂය යන දෙකම හරහා ක්‍රියාත්මක වන අවිධිමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවී බල ව්‍යුහයන් මගින් කාන්තාවන්ගේ දේශපාලන කාර්යාලය තුළට ප්‍රවේශය හැඩගස්වන ආකාරය ඉස්මතු කර පෙන්වයි.

සමහර අවස්ථාවන් හිදී, කෙසේ වෙතත්, ඥාති පිරිමින් විසින් හුදු කාන්තාවන්ගේ දේශපාලන අවතීර්ණය සඳහා පහසුකම් සලසා දීම පමණක් ඉටු නොකළ අතර, ඔවුන් මාර්ගයෙන් කාර්යක්ෂම ලෙස දේශපාලනික අධිකාරිය ක්‍රියාත්මක කළහ. මූලික දැනුවත් කරන්නා H මහනුවර දිස්ත්‍රික්කයෙහි සිටි පුරුෂ ඥාතියෙකු වෙනුවට, කාන්තාවක් නියෝජනය වන (proxy) ලෙස නාම යෝජනා දීමේ සිද්ධියක් විස්තර කරන ලදී. අවුරුදු 19ක කාන්තාවකට නාම යෝජනා වී, පක්ෂය මගින් ආර්ථිකව නඩත්තු කළ නමුත් ඇගේ සහෝදරයා මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය, ඡන්ද සඳහා කැන්වස් කිරීම සහ දේශපාලන ක්‍රියාවන්ගේ පාලනය තමා අත තබා ගත් බවත්; ඡන්ද ලබා ගත්තේ ඇයට වඩා ඔහු බවත්ය.[24] ස්වාධීන දේශපාලන ක්‍රියාකාරීකයෙක් ලෙස සේවය කරනවා වෙනුවට, විධිමත් අපේක්ෂකයෙක් ලෙස කාන්තාව ක්‍රියාත්මක වන අතරතුර, දේශපාලන අධිකාරිය ක්‍රියාත්මක කිරීම ඇගේ සහෝදරයා විසින් අඛණ්ඩව කරනු ලැබීය. මෙවැනි සිද්ධීන් මගින් කාන්තාවන් ගේ දේශපාලන නියෝජනය වර්ධනය කිරීම වෙනුවට, කාන්තාවන්ට අවිධිමත්ව අපේක්ෂකත්වයන්හි නියැලීමට ඉඩ සලස්වන අතරම, දේශපාලනික අධිකාරිය පුරුෂ ඥාතින් ගේ අත්ල මත රඳා පවත්නා, ප්‍රතිස්ථාපිත, පීතෘමූලිකව පාලනය කළ හැකි අන්දමට කෝටාව ක්‍රියාත්මක කළ හැකි ආකාරය නිරූපණය කරනු ලබයි.

23 කොළඹ 020, කොළඹ දිස්ත්‍රික්කය, නොවැම්බර් 21, 2023.

24 මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ කාන්තා සංවිධානයක විධායක අධ්‍යක්ෂක. ජනවාරි 12, 2024.

එකට ගත් කළ, මෙම සොයාගැනීම් තුළින් පෙන්නුම් කරනු ලබන්නේ, කාන්තා අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම මගින්, කාන්තාවන් දේශපාලනයට ප්‍රවේශ වීමේ දී යටත් වන තත්ත්වයන් අනිවාර්යය ලෙස පරිවර්තනය නොකරන ආකාරයයි. කාන්තාවන්ගේ විස්තරාත්මක නියෝජනය සහ අපේක්ෂකයන් තෝරා ගැනීම, කෝටාව මගින් පුළුල් කළ අතර, සමහර අවස්ථාවන් හිදී, දේශපාලනික අධිකාරියෙහි භාවිතය, පිරිමි ඥාතින්, ස්ථාපිත අනුග්‍රාහක ජාල, සහ පවතින පක්ෂ බලධූරාවලියන්, වරප්‍රසාදිත කරන, අවිධිමත් ක්‍රමයන් මගින් හැඩගස්වමින් පවතින ලදී. ස්ත්‍රීවාදී ආයතනික වාදී දැක්මකින් බලන කළ, කෝටාව වැනි විධිමත් ආයතනික ප්‍රතිසංස්කරණයන් මගින්, පක්ෂ වලට පවත්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවී බල ව්‍යුහයන් ආරක්ෂා කර ගන්නා අතරතුර, නීතිමය අවශ්‍යතාවන්ට අනුකූල වීමට ඉඩ සලසවමින්, අවිධිමත් ආයතන තුළ ක්‍රියාත්මක වීමට පහසුකම් සලසා දෙන ආකාරය පිළිඹිබු කරයි. මූලික දැනුවත් කරන්නා M මෙය විස්තර කරන ආකාරය මෙසේය:

*"අපි මේ කෝටාව ගෙනාවෙ ගැහැණු අයව ගෙනල්ලා නිකංම පක්ෂ ලැයිස්තු පුරවන්න නෙවෙයි. අපට ඕන වුනේ ගැහැණු අයට තනියම තීරණ ගන්න පුළුවන් මට්ටමකට ගේන්න. එයාලට එයාලගෙ අදහස් ප්‍රකාශ කරන්න හරි තීරණ ගන්න හරි බැරි නං, මේ කෝටා එකේ තේරුමක් නෑ වගේම අපට කවදාවත් වෙනසක් දකින්න වෙන්නෙත් නෑ."*[25]

මෙම කාණ්ඩයෙන් පෙන්වා දෙන ආකාරයට, නෛමිත්තික නාමයෝජනා, අත්දැකීම් සහිත කාන්තාවන් ගේ බහිෂ්කරණය, පුරුෂ ඥාතින් ගේ මැදිහත් වීමෙන් සිදුවන කාන්තා ප්‍රවේශයන්, සහ යෝජිත අපේක්ෂකයන්ගේ නාමයෝජනා යන සියල්ල එකට එකතු වී, කෝටා වෙහි පරිවර්තනීය විභවය සීමා කර ඇත. දේශපාලන බඳවා ගැනීම් පාලනය කරන, අවිධිමත් ආයතන අභියෝගයට ලක් කරනවා වෙනුවට, මෙවැනි භාවිතයන් මගින්, පක්ෂ වලට පවත්නා පීතෘමූලික බල ධූරාවලියන් ආරක්ෂා කරන අතරතුර, කෝටා වෙහි විධිමත් අවශ්‍යතා සමග අනුකූල වීමට ඉඩ සලස්වා තිබේ.

### 5.1.2 ඡන්ද ව්‍යාපාරය අතරතුර පවතින ආර්ථික සීමාකම්

ආර්ථික බහිෂ්කරණය කාන්තාවන්ගේ දේශපාලනයට අවතීර්ණ වීමේ මූලයට බලපාන නිර්මාපකයක් වීම හේතුවෙන්, බොහෝ කාන්තාවන්ට දේශපාලන ජීවිතයේ පළමු කඩුල්ල, ඡන්ද පත්‍රිකා යොමු කිරීමට ඉතා දීර්ඝ කාලයකට පෙර නැගෙන්නක් වේ. සම්මුඛ සාකච්ඡාවන් පුරා, කාන්තා මන්ත්‍රීවරියන් පුන පුනා විස්තර කරන ලද කාරණයක් වන්නේ, ඔවුන්ට සම්පූර්ණයෙන්ම තමන්ගේම වියදමින් මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය කරගැනීමට සිදු වූ නමුත්, එයට හාත්පසින් වෙනස් ආකාරයකට, ඔවුන්ගේ පිරිමි සගයන්ට, පක්ෂ සංවිධායකයන්ගෙන්, ව්‍යාපාරිකයන්ගෙන් සහ ධනවත් අනුග්‍රාහකයන්ගෙන් සමන්විත ස්ථාපිත ජාල තුළින් එය කරගත හැකි වූ බවය. දේශපාලන පක්ෂ ප්‍රමාණවත් ලෙස

25 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.

උපකාර කරන්නේ බොහෝ කලාතුරකින් බැවින් අත්පත්‍රිකා මුද්‍රණය, ප්‍රචාරක බැනර් සහ ගමනාගමන වියදම් වැනි ඡන්ද ව්‍යාපාරයට අදාළ වියහියදම්හි බර දැරීමට කාන්තාවන්ට සිදුවී ඇත.[26]

පුද්ගලික අරගලයන් පිළිබිඹු කිරීමකට වඩා, මෙම අත්දැකීම් තුළින් සලකුණු කරනු ලබන්නේ, දේශපාලන පක්ෂ අභ්‍යන්තරයෙහි පවතින ගැඹුරු ආයතනික රටාවන්ය. ස්ත්‍රීවාදී ආයතනිකවාදයෙහි සංකල්පයන්ට අනුව මෙම ආර්ථිකමය අවාසිය සරලව පුද්ගලික දුෂ්කරතා මත පමණක් රඳා පවතින යමක් නොව, සම්පත් බෙදාහරින ආයතන තුළ පවතින, පුරුෂයන්ට වරප්‍රසාද ලබාදෙන එහෙත් ස්ත්‍රීන් ආන්තීකරණය කරන ආකෘතිය මගින් අත්විඳිය හැකි ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැක (Mahoney සහ Thelen 2010). පක්ෂ ව්‍යුහ ඇතුළත, ඡන්ද ව්‍යාපාර අරමුදල් සඳහා ප්‍රවේශය, ආර්ථික ජාල සහ අනෙකුත් ද්‍රව්‍යමය සම්පත් යන සියල්ල අවිධිමත් සම්බන්ධතා සහ අනුග්‍රාහක පද්ධති මැදිහත් වීමෙන්, නිරන්තරයෙන් පිරිමි අපේක්ෂයන් හට වාසියක් සැලසෙන ආකාරයට සිදුවන නැඹුරුතාවක් ඇත. බොහෝ අවස්ථාවන්හිදී මෙම අවිධිමත් සම්පත් ජාලයන් විසින් කුමන අපේක්ෂකයන් හට තරඟකාරී ඡන්ද ව්‍යාපාර කරගෙන යාමට හැකියාව තිබේ දැයි තීරණය කර ඇති බැවින්, ආරම්භයේ සිටම කාන්තාවන් සැලකිය යුතු අවාසියක් ලැබෙන සේ ස්ථානගත වී ඇත.

ආයතනික හෝ පක්ෂ සහයෝගය නොලද බොහෝ කාන්තාවන්, ගැඹුරු ලෙස පෞද්ගලික සහ අඩමාන වන ගැටළු වලට මුහුණ දීමේ උපාය මාර්ග ගැනීමට පෙළඹේ. දිස්ත්‍රික්කයන් පුරා අරමුදල් රැස් කිරීම සඳහා රන් භාණ්ඩ උකස් තැබීමේ කැපී පෙනෙන රටාවක් මතු විය. බදුල්ලේ සිට පැමිණි මන්ත්‍රීවරියක් ජන්ද ව්‍යාපාරයෙහි අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා ඇගේ ස්වර්ණාභරණ උකස් තැබීමට සිදු වූ සිද්ධියක් මතක් කළ අතර පුත්තලමේ සිට පැමිණි නියෝජිතවරියක්ද එම සිද්ධියට බොහෝ සමාන සිද්ධියක් ප්‍රකාශ කළාය.[27] මේවා හුදකලා කතාන්දර නොව, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය නිරන්තරයෙන්ම ඔවුන්ගේ පෞද්ගලික කැපකිරීම් වල යටිපෙළක් ලෙස යටපත් වී ඇති ආකාරය පෙන්වා දෙන, වඩා පුළුල් වූ රටාවක කොටසක් ය.

ණය පහසුකම් ලබා ගැනීම හෝ ආයතනික ණයවර ලබා ගැනීමට යාමට වඩා ස්වර්ණාභරණ උකස් තැබීමේ තීරණය, වඩාත් පැහැදිලි ලෙස තේරුම් ගත හැකි වන්නේ, ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් මුහුණ දෙන ව්‍යුහමය ආර්ථික අවාසි වඩා පුළුල් සංදර්භයක් තුළ පිහිටුවීමෙන්ය. කාන්තාවන් බොහෝ විට පිරිමින්ට වඩා අඩුවෙන් උපයන අතර, ප්‍රාග්ධනයට සීමාසහිත පිවිසුමක් ඇති අතර, ඉඩම් සහ වටිනා දේපළ සියල්ල සාමාන්‍යයෙන් පවතින්නේ ස්වාමි පුරුෂයාගේ නමට හෙයින් ඔවුන්ට ඇපකර ද නොමැත. ඇතැම් අවස්ථාවන් හිදී, වාණිජ ගණුදෙනු තුළ නියුතු වීම සඳහා ස්වාමි පුරුෂයාගෙන් නීතිමය අවසරයක් පවා ලබා

26 බදුල්ල 015, බදුල්ල දිස්ත්‍රික්කය. දෙසැම්බර් 8, 2025.

27 පුත්තලම 039, පුත්තලම දිස්ත්‍රික්කය. නොවැම්බර් 28, 2023.

ගත යුතු වේ. මෙම හේතුවෙන්, කාන්තාවන් "පිරිමින්ට වඩා කොහොමටත් දුප්පත්" සහ "වෘත්තීය දේශපාලනයට, තියෙන අවම සම්පත් ටික වැය කරන්න මැළිවෙනවා" හෝ පවුල් ප්‍රාග්ධනය අවධානමට ලක් කිරීමට මැළි වේ (Kanold 2020; Women's Environment and Development Organisation 2007). මෙම ආකෘතිකමය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සීමාවන් එබැවින්, බොහෝ කාන්තාවන්ට පවතින එකම ආර්ථික උපාය මාර්ගය ස්වර්ණාභරණ උකස් තැබීම පමණක් වීම, වන්නේ ඇයි දැයි යන්න පැහැදිළි කිරීමට උදව් වේ.

තමන්ගේ ඡන්ද ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය සම්පත් සඳහා, මෙම රන් භාණ්ඩ උකස් තැබීම, සංස්කෘතික දෘෂ්ටියක් තුළින් බලන විට, වඩා සුවිශේෂී ලෙස කැපී පෙනේ. ශ්‍රී ලංකාව තුළ, ස්වර්ණාභරණ විසින් කාන්තාවන්ගේ ජීවිත තුළ අතිමහත් සංකේතාත්මක වටිනාකමක් පවත්වා ගනියි (Samarakoon et al. 2022). ගැහැණු දරුවෙකු උපත ලද මොහොතේ සිට, ඇගේ දෙමව්පියන් විසින් අනාගත ආයෝජනයක් ලෙස රත්තරන් එකතු කිරීමට පටන් ගන්නා අතර, එමගින් වටිනාකමක් සහිත දෑවැද්දක් මගින් විවාහයක් සුරක්ෂිත කර ඇයට ලබාදීමට අපේක්ෂා කරයි. වැඩිවියට පත්වීමත් සමගම, ඇයට රන් ආභරණ පළඳවා, ඇයගේ ස්ත්‍රීත්වයට සංක්‍රමණයවීම සලකුණු කරනු ලැබේ (Winslow 1980). විශේෂයෙන්ම, යෝජනා මත කෙරෙන විවාහයකදී, රත්තරන් පවුලේ තත්වය සහ මනාලියගේ වටිනාකම පිළිබඳ මහජන ප්‍රදර්ශනයක් ලෙස ක්‍රියා කරයි. ඇතැම් ශ්‍රී ලාංකික මුස්ලිම් ජන කොට්ඨාශ අතර, මංගල දිනේ රාත්‍රියේ මතභේදාත්මක "කන්‍යා පරීක්ෂණය" සිදුකිරීමෙන් අනතුරුව, උත්සවාකාර චාරිත්‍ර සිදුකරන අතර එහිදී රත්තරන් පිළිගන්වා, එමගින් ඇයගේ "පවිත්‍රතාවය" පමණක් නොව, විවාහ දිවියට ඇයගේ ජයග්‍රාහී පිවිසුමද සලකුණු කරයි (Muslim Women's Research Action Forum 1999). මෙම සංදර්භයන්හි රත්තරන් හුදු ආභරණයක් නොව; පීතෘමූලික ආර්ථිකය තුළ පවත්නා මුදල් ඒකකයක් මෙන්ම කීකරුකම, ගුණධර්ම සහ විවාහයට පවතින සූදානම පිළිබඳව වන සංකේතයක්ද වේ.

එබැවින්, බොහෝ කාන්තාවන්ට, දේශපාලනික වේදිකාව මතට අවතීර්ණ වීම සඳහා ඔවුන්ට පවතින එකම ප්‍රාග්ධන ආකෘතිය ලෙස පීතෘමූලික සම්ප්‍රදායෙන් ගලාගෙන ආ එම රත්තරන්, ක්‍රියාකිරීම ඉතා හාස්‍යජනකය. දේශපාලන පක්ෂ මගින් ආර්ථික අනුබලය ප්‍රතික්ෂේප වී, ආයතනික ප්‍රවේශය සීමා කිරීම් මගින් කොන් වීමට ලක් වී සහ පුරුෂ-ආධිපත්‍යය සහිත වටපිටාවක ගමන් කරන අතරතුර, මෙම කාන්තාවන් එක් කලක ඔවුන්ව ගෘහස්ත ජීවිතයට බැඳ තැබීමට පාවිච්චි කරන ලද, ඔවුන් සතුව පවතින අවසාන වත්කම වන ස්වරණාභරණ වෙතට හැරෙයි. ඔවුන් වැඩිවියට පත්වීමේදී ඔවුන්ට ලබා දුන් කර මාල, උපතේ සිට එක් රැස් කරන ලද වළළු, සහ පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන ආභරණ උකස් කරනු ලබන්නේ, විවාහයක් රඳවා ගැනීමට නොව පාලනතන්ත්‍රයේ මේසයක ආසනයකට හිමිකම් කීමටය. මෙම යටහත් පහත්වීමේ සංකේතය, දේශපාලනික ප්‍රතිරෝධය සඳහා මෙවළමක් ලෙස නැවත පාවිච්චි කිරීමෙන්, මෙම කාන්තාවන් එහි අර්ථය නැවත නිර්වචනය කර ඇත. රත්තරන්, එක් කළෙක මනාලියකගේ සලකුණ වී, තවත් කළෙක කාන්තා දේශපාලනඥයකුගේ මුදල් ඒකකය බවට පත්විය.

අනෙකුත් අයට, ඡන්ද ව්‍යාපාරය අතරතුර, ආර්ථික පැවැත්ම උදෙසා ස්වාමි පුරුෂයන්ගේ, ඥාතීන්ගේ හෝ මිත්‍රයන්ගේ සහයෝගය දෙසට හැරීමට සිදුවිය. මෙම පරාධීනත්වය මගින් පවුලේ පිරිමි සාමාජිකයන් මත කාන්තාවන්ගේ ආර්ථික යැපීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම මෙන්ම කාන්තාවන්ගේ දේශපාලනික නිදහස වෙනුවෙන් නිර්මාණය කරන ලද කෝටාව තුළ වූ එහි භාවාර්ථයද අඩු තක්සේරු කිරීම ද සිදුවිය. එනමුත් කාන්තාවන් විසින් අරමුදල් රැස් කිරීම සඳහා විකල්ප මාර්ග සොයා ගත්තද, ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිමානයන් වන "වැදගත්කම" තුළින් සීමා කරන ලදි.

මූලික දැනුවත් කරන්නා එ උපුටා දක්වන ආකාරයට, පිරිමි දේශපාලනඥයකු හට ඉතා පහසුවෙන් පක්ෂ සාමාජිකයන්, ආසන සංවිධායකයන් සහ අරමුදල් සැපයීමට විභවයක් ඇත්තන් හට සාදයක් සංවිධානය කිරීමෙන්, මත්පැන් සපයා දීමෙන් හෝ විනෝදයට පත් කිරීමෙන් ඔවුන්ගේ සහයෝගය සුරක්ෂිත කරගත හැක.[28] කෙසේ වෙතත් මෙම නිරීක්ෂණය තේරුම් ගත හැක්කේ ශ්‍රී ලංකාව තුළ මත්පැන් ක්‍රියාත්මක වන පුළුල් වූ ස්ත්‍රී පුරුෂ සමාජභාව සංස්කෘතික සංදර්භය තුළදීය. මතභේදාත්මක ලෙස සලකුණු කරන ලද ගැඹුරු ස්ත්‍රී පුරුෂ සමාජභාවී සහ පීතෘමූලික ප්‍රතිමානයන් මගින් මත්පැන් සමග කාන්තාවන්ගේ සම්බන්ධය හැඩ ගැසී ඇත. ග්‍රාමීය මට්ටමේදී, ඓතිහාසික ලෙස කාන්තාවන් මත්පැන් නිෂ්පාදනය සඳහා, විශේෂයෙන් බොහෝ අවස්ථාන්හිදී, ගෘහස්තව හෝ ප්‍රජාව මත පදනම් වූ ආකෘතියක, සකස් කිරීම සහ කළමනාකරණය සිදුකරනු ලබන, රා නිෂ්පාදනය හා සම්බන්ධව පවතී. නමුත් මෙම නිෂ්පාදනයෙ හිදී පවත්නා සම්බන්ධය කෙසේ වෙතත්, කාන්තාවන් මත්පැන් සමග දෘශ්‍යමය ලෙස සම්බන්ධ වීම්, විශේෂයෙන්ම එහි විකිණීම, පාවිච්චිය හෝ මත්පැන් පානයට අදාළ සමාජ අවකාශ තුළ පෙනී සිටීම, දීර්ඝ කාලයක් තිස්සේ සමාජීය ලෙස අපකීර්තියට සහ සදාචාරාත්මක ලෙස වාරණයට ලක්ව ඇත.

මීට පෙර මෙම ප්‍රතිමානයන් විධිමත් නීතිමය සීමාවන් තුළින් බලපවත්වන අතර, එමගින් කාන්තාවන්ට මත්පැන් මිළදී ගැනීම සහ නිෂ්පාදනය, බෝතල් කිරීම හෝ මත්පැන් අලෙවිය හා සම්බන්ධිත ව්‍යාපාර තුළ රැකියාව කිරීම තහනම් කරන ලදි. 1979 සුරාබදු ආඥාපනතෙහි මුල් බැස තිබූ සීමාවන් නැවත හැරවීමෙන්, 2025 ජූලි මස නිකුත් කරන ලද රජයේ ගැසට් පත්‍රයක් මගින්, මෙම අසාධාරණ ප්‍රතිපාදන විධිමත් ලෙස ඉවත් කරනු ලැබුවද, මෙම නීතිමය ප්‍රතිසංස්කරණයන් මගින් භාවිතයෙහි දී කාන්තාවන්ගේ චර්යාව නියාමනය කිරීමට පවත්නා, අවිධිමත් සදාචාරාත්මක කේතයන් අකර්මණ්‍ය කර නොමැත (Verité Research 2018).

මෙම පරස්පර විරෝධය විශේෂයෙන්ම වැදගත් වන්නේ, මත්පැන් කේන්ද්‍රීය චරිතයක් රඟ දක්වන මැතිවරණ දේශපාලන සංදර්භය තුළදීය. ශ්‍රී ලංකාවේ මැතිවරණයක් ජයග්‍රහණය සඳහා "සල්ලි, බලය සහ මිනිස් ශක්තිය" අවශ්‍ය බවට සාමාන්‍යයෙන් ප්‍රකාශ කර සිටියද, සම්මුඛ සාකච්ඡා දත්ත මගින් පෙන්වා දෙනු ලබන්නේ, දේශපාලන බලමුළු ගැන්වීම්

28 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.

තුළ, නිරන්තරයෙන් මත්පැන් තවත් අත්‍යවශ්‍ය අතිරේක අංගයක් නිර්මාණය කර ඇති බවය (Kodikara 2009; Liyanage 2018a). මත්පැන් කේන්ද්‍ර වී පවතින එකතුවීම්, අවිධිමත් සාකච්ඡා සහ සන්ධාන ගතවීම් සඳහා ප්‍රධාන භූමියක් ලෙස ක්‍රියා කරන අතර, පිරිමි දේශපාලකයන් විසින් දායකයන් සමග සහජීවනාත්මක සම්බන්ධතා ඇති කරන අවකාශයක් ලෙසද සැලකිය හැකි බවයි. මෙවැනි තලයන්හි කාන්තාවන්ගේ සහභාගීත්වය මගින් ඔවුන්ගේ ප්‍රතිරූපයට හානියක් ඇතිවීමේ අවදානම හේතුවෙන්, මෙම වේදිකාවන් පුරුෂයන්ට වාසි සැලසෙන ආකාරයට, ආකෘතිකමය ලෙස පක්ෂපාතීව ඇත. පුරුද්දක් ලෙස, රැළි සහ දේශපාලන රැස්වීම් සඳහා පැමිණීම තහවුරු කර ගැනීමේ කේවල් කිරීමේ මෙවලමක් ලෙස මත්පැන් පාවිච්චි කිරීම තුළින්, එය තවදුරටත් ඡන්ද ව්‍යාපාර තුළ පවතින අවිධිමත් යාන්ත්‍රණයන් තුළට කාවද්දා ඇත. මෙම භාවිතයන්, මත්පැන් තුළින් අවුලන ලද ජාලයන් සඳහා ප්‍රවේශය, දේශපාලන ශක්‍යතාවය සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස සලකන පුරුෂ මූලික දේශපාලන සංස්කෘතියක් ප්‍රතිනිර්මාණය කර, කාන්තාවන්ගේ සහභාගිත්වයට සහ බලපෑමට අතිරේක අවිධිමත් බාධාවක් නිර්මාණය කරයි.

එක් කාන්තා දේශපාලනඥවරියක, ඇගේ ඡන්ද ව්‍යපාරය අතරතුර, ඇගේ අනුග්‍රාහකයෙකු විසින් අරක්කු බෝතල් තුනක් ඇගේ නිවසට ගෙනවිත්, රැස්වීමට පැමිණෙන අය අතර බෙදා හැරිය යුතු බවට යෝජනා කළ ආකාරය විස්තර කළාය. ඇය විසින් එය කිරීමට ඇති අකැමැත්ත හේතුවෙන්, ඇය ඇගේ සැමියාගෙන් *"මම දන්නෙ නැතුව, ඔයා දෙනවා වගේ, ඇවිල්ලා ඉන්න මිනිස්සුන්ට මේවා දෙන්න."* කියා කිවූ බව ඇය පැහැදිලි කළාය.[29] මෙය හුදකලා සිදුවීමක් බවට තරයේ කියා සිටීමට පරිස්සම් වූ ඇය, තම ඡන්ද ව්‍යපාරය පුරාවටම මත්පැන් මත විශාල ලෙස යැපෙන තම පිරිමි සගයන්ට වඩා ඇගේ එළඹුම සම්පූර්ණයෙන්ම වෙනස් බව කියා සිටියත්, ඇගේ මෙම සිද්ධිය තුළින් විද්‍යමාන වනු ලබන්නේ, බොහෝ අවස්ථා වලදී කාන්තාවන්ට කෙතරම් දුරකට අවිධිමත් ඡන්ද ව්‍යපාර බලාපොරොත්තු, වක්‍රාකාර ලෙස තමන්ගේ ගෞරවය රැක ගැනීම සඳහා, පුරුෂ අතරමැදියන් මාර්ගයෙන් හෝ ගණුදෙනු කරන්නට සිදුවී ඇති ආකාරයයි.

එබැවින් මෙවැනි භාවිතයන්, ද්‍රව්‍යමය හුවමාරුවක් පමණක්ම නොව, දේශපාලනික පක්ෂපාතීත්වය, විශ්වාසය සහ ජාලයන් නිපදවීම සහ ඒවා පවත්වා ගෙන යාම සඳහා වන යථාර්ථයේ පවතින යාන්ත්‍රණයන් ද වේ. ඔවුන්ගේ කීර්ති නාමය අවදානමකට ලක් කිරීමකින් තොරව හෝ විශ්වාසනීයත්වයට හානි පමුණුවන කටකතා වලට ආරාධනා නොකර, කාන්තා දේශපාලනඥයන් හට මෙවැනි භාවිතයන් තුළ යෙදිය නොහැක.[30] ඒ හේතුවෙන්, ඔවුන් විසින් ශ්‍රී ලාංකික දේශපාලන භූ දර්ශනයේ අනිවාර්යය අංගයක් වන මෙවැනි සමාජමය අවකාශ බිහි කිරීමෙන් ඈත් කර තබයි. මෙම ද්විත්ව බන්ධනය මගින් කාන්තාවන්ගේ අරමුදල් සඳහා ප්‍රවේශය සීමා කිරීම පමණක් නොව, පෞද්ගලික සහ පොදු තලයන්හි ඔවුන්ගේ චර්යාව මුර කිරීම සඳහා වන ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි ප්‍රතිමානයන් බලගැන්වීමට යොදා ගන්නා ලදී.

29 කොළඹ 015, කොළඹ දිස්ත්‍රික්කය.ඔක්තෝබර් 21, 2023.
30 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.

Shvedova (2005) වැනි ශාස්ත්‍රඥයන් තර්ක කරන ආකාරයට, මෙම භාවිතයන් වඩා පැතිරුණු "දේශපාලන පුරුෂාත්මක මාදිලි" වල කොටසක් වන අතර, පක්ෂ සහ දේශපාලන ජීවිතය සංවිධානය වී ඇත්තේ, රාත්‍රියේ පවත්වන මහා රැස්වීම්, අවිධිමත් තීරණ ගැනීමේ ක්‍රියාවලියන්, මත්පැන් පානය සහ සූදු ක්‍රීඩා කිරීම් වැනි පුරුෂ ප්‍රතිමානයන්, වටිනාකම් සහ ජීවන රටාවන් මතය. මෙවැනි පරිසර, මෙවැනි වතාවත් වලට සහභාගී වීමට නොහැකි (හෝ සහභාගී නොවන) අය, සත්‍ය බල කේන්ද්‍ර තුළින් ඈත් කර තබන, ප්‍රවේශය සීමා කරන අවකාශ ලෙස ක්‍රියාත්මක වේ.

කාන්තාවන් හට, මෙවැනි මාදිලියක සහභාගීත්වය යනු දෙවරක් පිරවිය යුත්තකි. තමන්ගේ විශ්වාසනීයත්වය නැතිවීමේ අවදානමකට මුහුණ දීම හෝ මෙම අවකාශයන්ට ඇතුළු වීමට උත්සහා දැරූ කළ, ඔවුන්ට "අවිචාරවත්" යැයි නම් පටබැඳීම මෙන්ම රාත්‍රී ප්‍රමාද වී පැමිණීම හෝ පොදු සමාජ එකතුවීම් නිසා සිදුවිය හැකි පවුල් අර්බුද හෝ ගෙදර දොර වගකීම් පැහැර හැරීමේ චෝදනා එල්ල වීම් වැනි ගෘහස්ථ ප්‍රතිවිපාකද ඔවුන්ට ලැබිය හැක. ක්ෂේත්‍රයට පිවිසීමේදී ආකෘතිකමය ලෙස ඔවුන්ගේ පැවැත්මට එදිරිවාදී භාවිතයන් සමග ගණුදෙනු කිරීමට සිදුවීම හේතුවෙන්, මෙය කාන්තාවන් ස්වකැමැත්තෙන් දේශපාලනය තෝරා ගැනීම අධෛර්යමත් කරන පළවෙනි කාරණය වේ (Shvedova 2005).

ඒ සමගම, පක්ෂ විසින් ව්‍යුහාත්මක සාමාජික බලමුළු ගැන්වීම් වලින් ඈත්ව, නම්‍යශීලී සම්බන්ධතා මත රඳා පවතින ක්‍රියාකාරීත්ව මාදිළි වෙතට තව තවත් නැඹුරුවීම හේතුවෙන්, මෙම පුරුෂ-ආධිපත්‍ය ජාලයන්, පක්ෂ ක්‍රියාත්මකවීම් සඳහා වඩ වඩාත් කේන්ද්‍රීය කාරණයක් වේ. මෙම ජාලයන් සාදා ගැනීමට මුල සිටම නොහැකියාවක් පවතින කාන්තාවන් හට, මෙම ප්‍රවණතාවය විසින්, තවත් ඉහළින් පවතින, ප්‍රවේශය සඳහා සීමාවක් නිර්මාණය කරයි. පක්ෂ තුළ පවතින පුරුෂරූපී ක්‍රියා රටා, ව්‍යවස්ථාදායක අංශ වෙත රැගෙන යාමෙන්, වැඩකරන මව්වරුන් සහ කාන්තා මන්ත්‍රීවරියන්ට සහයෝගයක් නොදෙන ආකෘති තුළින් දේශපාලන වෘත්තියක් පවත්වා ගැනීමේ දුෂ්කරතාවය තවදුරටත් උග්‍ර කර ඇත (Shvedova 2005).

අපට de Alwis (1995) සිහිපත් කරන ආකාරයට අනුව, කාන්තාවන් සෑම විටකදීම ජාතියෙහි පීතෘමූලික බැල්මට ලක්ව සිටින අතර, දේශපාලනයට ඇතුළු වීම සඳහා ඔවුන් අනිවාර්යය ලෙස "ගෞරවනීය" වීම අතවශ්‍යය නමුත්, අනුග්‍රාහකත්වය සහ පුරුෂමූලික ක්‍රියාවන් මත සැකිලිගතව පවතින දේශපාලන පිටියට අවතීර්ණ වීමෙන් පසු, එම ගෞරවනීයභාවය පවත්වා ගැනීම, ඔවුන්ට අපහසු වේ.

සමහර අවස්ථාවන්හිදී, මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවී බාධාවන්, සීමාකාරී වනවා පමණක් නොව බලහත්කාරීද වේ. මූලික දැනුවත් කරන්නන් හෙළි කරන ආකාරයට, ඇතැම් අවස්ථා වල, යම් පුද්ගලයන් විසින් ඡන්ද ව්‍යාපාර අරමුදල් ලබාදීම වෙනුවෙන් ලිංගික

උපකාර ඉල්ලා බලකර සිටින බවය.[31] මෙවැනි අවිචාරවත් බලකර සිටීම් තුළින් පෙන්වා දෙනු ලබන්නේ, ආර්ථික පරායත්තභාවය මගින් සූරා කෑමේ තත්වයන් නිර්මාණය කරන බවත්, ඒ සමගම පුරුෂ දේශපාලකයන් මුහුණ නොදෙන, ස්ත්‍රී පුරුෂ සමාජභාවී-විශේෂිත අනතුරකට ලක්විය හැකි අවදානම් ස්ථරයක්ද එයට එකතු වන බවය.

කෙසේ වෙතත්, ආර්ථික බහිෂ්කරණය සම්මුඛ සාකච්ඡාවන් පුරා විසිර තිබූ ප්‍රධාන රටාවක් වුවද, කාන්තාවන් ඉතා කුඩා සංඛ්‍යාවක් වඩා සහයෝගී පක්ෂ ආකෘතියක් ගැන විස්තර කරන ලදි. උදාහරණයක් ලෙස, මඩකලපුව, කාත්තන්කුඩි නාගරික සභාවේ සාමාජිකාවක් විසින් ඇගේ පක්ෂය, ඡන්ද ව්‍යාපාරයට අදාළ සියළුම වියහියදම් දැරූ බව විස්තර කරන ලදි. නමුත්, මෙය ව්‍යතිරේකයක් වන බවත්, වෙනත් පක්ෂ වල සිටිනා ඇගේ බොහෝ සගයන් හට තමන්ගේ පෞද්ගලික වියදමින් ඡන්ද ව්‍යාපාරය කරගෙන යාමට සිදු වූ බව ඇය දැන සිටිය බව කියා සිටියාය. ඇගේ පක්ෂය තුළ පවා, සම්පත් කළමණාකරණයේ වෙනස්කම් ඇති බව ඇය නිරීක්ෂණය කර ඇති බවට මෙලෙස  කියා සිටියාය:

*"පිරිමි අයට මුළු වෙන්කළ මුදලම ලැබෙනවා නං, ගැහැණු අයට ලැබෙන්නෙ ඒකෙන් බාගෙටත් වඩා අඩු ප්‍රමාණයක්".* [32]

ඇගේ ප්‍රකාශය තුළින්, දේශපාලනික ආයතන තුළ ආර්ථික සම්පත් කිසි විටකදී මධ්‍යස්ථ නොවන බවට වන ස්ත්‍රීවාදී ආයතනිකවාදී කතිකාවන් තහවුරු කරන අතර, පුරුෂ අපේක්ෂකයන් වරප්‍රසාදිත කර ඔවුන්  "වටිනා" දේශපාලන ආයෝජනයන් ලෙස සලකනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාව තර්කන මෙතුළින් බෙදා හරිනු ලබයි. (Duerst-Lahti 2008).

ඒ අතරම, පක්ෂ හරහා පවතින රටාවන් විවිධාකාර වේ. බොහෝ පක්ෂ විසින් බොහෝ අවස්ථා වලදී, තමන්ගේ යෝජිත අපේක්ෂකයන් තෝරා ගනු ලැබුවේ, ඔවුන්ගේ ඡන්ද ව්‍යාපාර තුළට තමන් විසින්ම බර-පැන දැමීමේ හැකියාව මත වුවත්, එක් පක්ෂයක්, ජාතික ජන බලවේගය (NPP), ඔවුන්ගේ සියළුම අපේක්ෂකයන්ගේ වියදම් දරන ක්‍රියාවලියක් අනුගමනය කළහ. මෙම ප්‍රවේශය මගින් දැනටමත් ආර්ථික සම්පත් සහිත අයට වරප්‍රසාද ලබාදීමේ ක්‍රමය හෝ සම්පත් වෙන් කිරීමේ ප්‍රධාන මාදිලිය ප්‍රතිවිරෝධයට ලක් කිරීම සහ සාධාරණත්වය සහ තරගකාරීත්වය පිළිබඳ වන පුළුල් වූ තර්ක ගොඩ නගන ලදි. විශේෂයෙන්ම, මූලික දැනුවත් කරන්නා M මෙම එළඹුම දෙස බැරෑරුම් ලෙස බලන ලද අතර, අනෙකුත් පක්ෂ යටතේ තරග කරන කාන්තාවන් අත්විඳින ආර්ථික බරෙන් NPP අපේක්ෂකයන් නිදහස් වීම තුළින් අසමතුලිත බිමක් නිර්මාණය කරන ලද බවට තර්ක කළාය. දැනුවත් කරන්නාගේ දැක්ම අනුව, මෙමගින් අපේක්ෂකයන් ඒ හා සමාන ආකෘතිකමය සීමාකම් වලට අන් තැනකදී මුහුණ දුන්නා දැයි යන්න පිළිබඳ ප්‍රශ්න පැන නගියි.[33]

31 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.
32 මඩකලපුව 016, මඩකලපු දිස්ත්‍රික්කය. නොවැම්බර් 15, 2023.
33 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.

කෙසේ වෙතත්, වඩාත් බරපතල ප්‍රශ්නය වනුයේ, පක්ෂයක් විසින් අපේක්ෂකයන්ට සහයෝගය දීම, සත්‍ය වශයෙන්ම 'අසාධාරණ'ද නැතහොත්, ආකෘතිකමය ගැටළුව රඳා පවතින්නේ කාන්තාවන්ට පද්ධතිගතව ආර්ථික හෝ සංවිධානාත්මක අනුබලය ලබාදීමට අනෙකුත් දේශපාලන පක්ෂ අපොහොසත් වීම මත ද යන්නය. බොහෝ පක්ෂ තුළ ආයතනික සහාය නොමැති වීම මත, එම සහයෝගය ලබාදෙන පක්ෂ, සුවිශේෂී හෝ ගැටළුකාරී ලෙස ඉදිරිපත් කිරීමක් නොකළ යුතුය. ඒ වෙනුවට, පුළුල් වූ ප්‍රශ්නය රඳා පවතින්නේ, බහුතරයක් දේශපාලන සංවිධාන තුළ කාන්තාවන්ට අවාසිදායක තත්වයක් උදා කරන, ගැඹුරු ලෙස විෂම ඡන්ද ව්‍යාපාර සම්පත් බෙදා හැරීමක් සිදුකරන ශ්‍රී ලංකාවේ පක්ෂ පද්ධතිය තුළය.

ස්ත්‍රීවාදී ආයතනිකවාදයේ දෘෂ්ටිය තුළින් විශ්ලේෂණය කිරීමේදී, කාන්තාවන්ගේ දේශපාලන බහිෂ්කරණය ව්‍යුහගත කරන, එකිනෙකා සමග සම්බන්ධිත බාධක, මෙම ආඛ්‍යානයන් තුළින් හෙළි කරයි. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සහ ඇපකරයක් නොමැති වීම වැනි ආර්ථික අසීරුතා, කාන්තාවන් මත විශේෂිත ලෙස ආරෝපණය කරන ලද ගෞරවනීයභාවය පිළිබඳ පරම සංකල්පය සමග එකතු වී, ඒවා තුළින් පිරිමින් මෙන් අනුග්‍රාහක ක්‍රියාවන්හි නිරත වීමට උත්සහා කළ විට රැඳී සිටීමට ඉතා අපහසු වන, ඒ සමගම සිදුවන ලිංගික උදව් බලකර ඉල්ලා සිටින ආකෘතියක සිදුවන බලහත්කාරී සූරා කෑම් යන සියලු කාරණා, ඡන්ද ව්‍යාපාර සම්පත් සඳහා කාන්තාවන්ගේ සීමාසහිත පිවිසුමට හැඩයක් ලබා දීම සඳහා අන්තර්ඡේදනය වේ. ආයතන, දේශපාලන පක්ෂ ඇතුළුව, ඡන්ද ව්‍යාපාර මූල්‍යකරණය සහ තීරණ-ගැනීමේ ක්‍රියාවලි තුළ නීතිමය ප්‍රවේශයන් ගෙන් කාන්තාවන් බහිෂ්කරණය කර, සම්පත් සංසරණය පිරිමින් අතර පමණක් වන සමාජ ආශ්‍රය තුළින් බිහිවන ජාල හරහා ක්‍රියාත්මක කිරීමට පෙළඹී ඇත (Bjarnegård සහ Kenny 2016; Manuratne et al. 2024). ප්‍රායෝගිකව ගත් කළ, විධිමත් නීති වලින් පිටත පවතින, මෙම අවිධිමත් නීති මගින්, කා හට සහයෝගය ලබාදිය යුතුද සහ කා හට සහයෝගය ලබා නොදිය යුතුද යන්න ගැඹුරින් හැඩගස්වන ලදි. ප්‍රතිඵලය වන්නේ, කාන්තාවන්ට තරග කිරීම සඳහා, පද්ධතිමය ලෙස ඔවුන්ගේ පෞද්ගලික දේපළ, ඔවුන්ගේ ප්‍රතිරූපය සහ ඔවුන්ගේ ශාරීරික ස්වාධිපත්‍යය පවා උකස් තැබීමට සිදුවන, දේශපාලන පොර පිටියකි.

### 5.1.3 නිළ කාර්යාලය තුළ නියෝජනයේ බරපැන

මැතිවරණයට පසුවද, කාන්තාවන්ගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යපාර තීරණය වූ ආර්ථික පීඩනයන් පහව නොගොස්, තව දුරටත්, තිබුණාටත් වඩා වැඩි බරකින්, බොහෝ අවස්ථාවල දී ඔවුන් පසුපස ඒවා නිළ කාර්යාලය තුළට ද පැමිණෙයි. ඡන්ද ව්‍යාපාර අතරතුර, කාන්තාවන් හට තමන්ගේ ස්වර්ණාභරණ උකස් තැබීමට සහ ස්වාමි පුරුෂයන්ගේ උපකාර ලබාගැනීමට බල කර සිටි එම පක්ෂ සහ ආයතනික සහයෝගය නොමැතිකම විසින්ම, දැන් මන්ත්‍රීවරියන්ගේ එදිනෙදා වගකීම් හැඩගැස්වීම සිදුකරන බව සම්මුඛ සාකච්ඡා තුළින් හෙළිදරව් වේ. සිද්ධීන් පුරා නැවත නැවතත් දැකිය හැකි තේමාවක් වන්නේ, ඍජු,

භෞතික සහයෝගයන් හරහා, මැතිවරණ කොට්ඨාශ තුළ පක්ෂපාතිත්වය ආරක්ෂා කර ගැනීම, මන්ත්‍රීවරියන්ගෙන් බලාපොරොත්තු වීමය. දුෂ්කරතාවයෙන් පෙළෙන පවුල් සඳහා ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම, ළමුන් සඳහා අධ්‍යපන උපකරණ මිළදී ගැනීමේ සිට අවමංගල්‍ය උත්සව වලට මුදල් යෙදවීම දක්වා මෙය පැතිරේ. මෙම කාර්යයන් සමාජ සේවාවල ආකෘතිය නිරූපණය කළ ද, මහජනයා විසින් ඒවා "අනිවාර්යයෙන් කළ යුතු දේවල්" යැයි අර්ථකතනය කරන බව සහ ඔවුන්ගේ භූමිකාවේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස සලකන බව බොහෝ මන්ත්‍රීවරියන් විසින් අවධාරණය කොට සිටියහ.[34,35] සැබෑ ජීවිතයේදී, ශ්‍රී ලාංකික දේශපාලනික භූ දර්ශනයේ දැකිය හැකි අනිවාර්යය අංගයක් ලෙස මෙය සැලකිය හැක. එනමුත් දේශපාලන පක්ෂ විසින් කිසිදු අනුබලයක් මේ සඳහා නොදෙන බැවින්, කාන්තාවන් හට මෙම සියළු වියහියදම් තනිව දැරීමට සිදුව ඇත.

එක් සාකච්ඡාකාරිනියක් ස්වාමි පුරුෂයාගෙන් ණයට මුදල් ඉල්ලා ගත් ආකාරය විස්තර කළ අතර, මහනුවර සිට පැමිණි තවත් එක් අයෙක්, උපකාර අවශ්‍ය ප්‍රජා සමාජිකයන් උදෙසා, ඇගේ ස්වර්ණාභරණ පමණක් නොව ඇයගේ දරුවන්ගේ ඒවා ද උකස් තැබීමට සිදුවූ බව හෙළි කළාය. ඇය තැවෙමින්, ඇයට බේරා ගත නොහැකි, "පවුම් පහළොවක් විස්සක් විතර රත්තරන් තාම බැංකුවේ" යැයි ඇය ප්‍රකාශ කළාය.[36] ඇය ඇගේ අත්දැකීම සාරාංශගත කරන ලද්දේ මෙසේයː

*"අපි හිතුවෙ පළාත් පාලන ආයතන වලට ආවම අපිට හැම දෙයක්ම කරන්න පුළුවන් වෙයි කියලා. ඒත් මේකෙ ඇතුලෙ ගොඩක් නීති තියෙනවා, අපි හිතන මුකුත් කරන්න බෑ. ඔයාට මොනව හරි කරන්න ඕන නම්, ඇමතිතුමා හම්බ වෙන්න ඕන. ඇමතිතුමා යටතේ වැඩ කරන හරිම පොඩි මිනිස්සු අපි."*[37]

මෙම කතාන්දර තුළින්, පුද්ගලික ලෝකයේ දී, සෙනෙහස සහ ආත්ම පරිත්‍යාගය වැනි බොහෝ කාලයක් තිස්සේ, කාන්තාවන්ගේ භූමිකාව සමග බැඳී පවතින ගති ලක්ෂණ, (Jayawardena 1986) දේශපාලනය තුළට ආගමනය වූ විට වටිනා දායකත්වයක් වෙනුවට ආර්ථික බරක් බවට පත්වන ආකාරය පෙන්වයි. කාන්තාවන් මත තබා ඇති මෙම බලාපොරොත්තු ගැඹුරු ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවී අවිධිමත් ආයතන තුළ මුල් බැස ගෙන ඇති අතර, සෙනෙහස, පරාර්ථකාමය, සහ සදාචාරාත්මක වගකීම වැනි දේශපාලන ලෝකය තුළදී, ස්ත්‍රීකරණය සහ අඩු තක්සේරු කරන ලද ගති ලක්ෂණ, කාන්තාවන් තුළ පැවතිය යුතු බවට අපේක්ෂා කරයි. ස්ත්‍රීවාදී ආයතනිකවාදය තුළින්, මෙවැනි ප්‍රතිමානයන්, විධිමත් භූමිකාවන් සමග අන්තර්ක්‍රියා කර, අදෘශ්‍යමාන එනමුත් අතට දැනෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවී වියදම් කාන්තාවන්ගේ සහභාගිත්වය මත තබන ආකාරය පෙන්වා දෙයි.

34 මඩකලපුව 016, මඩකලපු දිස්ත්‍රික්කය. නොවැම්බර් 15, 2023.

35 මඩකලපුව 016, මඩකලපු දිස්ත්‍රික්කය. නොවැම්බර් 15, 2023.

36 මහනුවර 026, මහනුවර දිස්ත්‍රික්කය. පෙබරවාරි 28, 2024.

37 Ibid.

මෙම බර, මන්ත්‍රීවරියන් විධිමත් ලෙස කාර්යාලය තුළ වැඩ පටන් ගත් පසුව ද පහව නොයයි. ඇත්ත වශයෙන් ගත් කළ, එය බොහෝ විට තව තවත් වර්ධනය වේ. බදුල්ලේ සිට පැමිණි හිටපු මන්ත්‍රීවරියක් විස්තර කරන ආකාරයටඃ

*"මට කිසිම ආර්ථික උපකාරයක් ලැබුනේ නැහැ. මගේ ඔළුවෙ ගොඩාක් සැලසුම් තිබුණට ඒවා කරන්න මට ආර්ථිකව සහයෝගයක් තිබ්බෙ නෑ."*[38]

ඇගේ වචන තුළින් ප්‍රතිරාවය වූයේ, අවම ආයතනික සහ පක්ෂ සහයෝගයක් සහිතව, කාන්තාවන් හට පොදු රාජකාරී කරගෙන යාමට සිදුවීම තුළින් මතුවන වඩා පුළුල් වූ ඉච්ඡාභංගත්වයකි. මන්ත්‍රීවරියකගේ විධිගත තනතුර එනයින් පැමිණෙන්නේ, නියෝජනයෙහි අර්ථය යටින් කපා දමන අදෘශ්‍යමාන ස්ත්‍රී පුරුෂ සමාජභාව වියදම් සහිතවය.

### 5.1.4. ප්‍රමාණවත් නොවන පුහුණුවීම් සහ ආයතනිකගත සහයෝගය

2018 කෝටාව තුළින්, පළාත් පාලන ආයතන තුළට තේරී පත් වූ කාන්තාවන් බොහෝ දෙනෙකු, පළමුවර අපේක්ෂකයන් ලෙස විධිමත් දේශපාලන ආයතන පිළිබඳ සීමාසහිත දැනුමක් සහ අත්දැකීමක් සහිතව අවතීර්ණ වූහ. දේශපාලන පක්ෂ විසින් නව අපේක්ෂකයන් විශාල සංඛ්‍යාවක් කෝටාව තුළින් යෝජනා කර ඇති මොහොතක දී, ප්‍රමාණවත් ලෙස දේශපාලනික දිශානතිය සහ පුහුණුව ලබාදීම සහ එයට අනුරූපී වූ වගකීමක් ද ඔවුන් සතු විය. කෙසේ වෙතත්, කාන්තා මන්ත්‍රීවරියන් පුන පුනා, පුහුණුවීම් සැසි කලාතුරකින් වසරකට එකක් පමණ තිබෙන බවත්, දේශපාලන පක්ෂ අවම පෙර සූදානමක් ලබා දුන් බවත්, තදබල ලෙස කියා සිටියෝය. පළාත් පාලන ආයතන ක්‍රියාපටිපාටයන් හෝ යෝජනා කෙටුම්පත් සකස් කිරීම පිළිබදව සුදුසු හඳුන්වාදීමක් නොමැතිව, හෝ ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන් ගේ නීතිමය සහ පරිපාලනමය වගකීම් යන සියල්ල, සුළු ආයතනික මගපෙන්වීමක් සමග ඔවුන් ගේ භූමිකාවන් කරගෙන යාමට කාන්තාවන්ට සිදුවේ. මෙයින් හැඟවෙන්නේ බොහෝ දේශපාලනික පක්ෂ, ඡන්දයෙන් තේරී පත් වූ පසුව ඔවුන්ගේ අර්ථාන්විත සහභාගිත්වය තහවුරු කිරීම වෙනුවට තමන්ගේ වගකීම කාන්තාවන්ගේ නාමයෝජනා සමගම අවසන් වූවා යැයි දැකීමය.

මෙම දිගින් දිගටම පවත්නා පුහුණුකිරීම් වල අඩුපාඩුව, පරිපාලනමය අතපසුවීමක් නොව, කාන්තාවන්ගේ ප්‍රමාණාත්මක සහභාගිත්වය කෙරෙහි ආයෝජනය සඳහා තිබෙන ගැඹුරු ආයතනික මැලිකමක් පිළිඹිබු කරයි. කාන්තාවන්ගේ දේශපාලන කුසලතාවය සඳහා පද්ධතිමය ලෙස කරන ලද අඩු ආයෝජනය විසින්, ආණ්ඩුකරණය හැඩගස්වන දක්ෂ බලාත්මක ක්‍රියාධරයන් ලෙස නොව, කෝටාවේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ, අකර්මණ්‍ය ස්ථාන රකින්නන් ලෙස කාන්තා මන්ත්‍රීවරියන් ස්ථානගත කරයි.

38 බදුල්ල 013, බදුල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 14, 2024.

ස්ත්‍රීවාදී ආයතනිකවාදය තුළින් පැහැදිලි කරන ආකාරයට, මෙම නොසලකා හැරීම, අහම්බයෙන් සිදු වූ යමක් නොව, දේශපාලන පක්ෂ තුළ පවතින ගැඹුරින් නිදන්ගත වූ පීතෘමූලික ව්‍යුහයන්ගේ නිෂ්පාදනයක් වේ. දේශපාලන පක්ෂ, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආයතන ලෙස, අවිධිමත් බල පද්ධති හරහා ක්‍රියාත්මක වන පීතෘමූලික ප්‍රතිමානයන් වටා ව්‍යුහගත වී ඇත. මෙම පද්ධති බොහෝ අවස්ථා වලදී, පුරුෂ ආධිපත්‍යයට වාසිදායක සහ පුරුද්දක් ලෙස කාන්තාවන් කොන් කරන, අනුග්‍රාහකත්වය, සේවාදායකත්වය, සහ එකම ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්ගේ පවතින සමාජ ඇසුර හේතුවෙන් හට ගන්නා ජාලයන් හරහා ප්‍රවාහනය වේ. (Bjarnegård සහ Kenny 2016; Lovenduski 2005). එබැවින්, කෝටාව (විධිමත් ආයතනයක්) කාන්තාවන්ගේ ප්‍රවේශය සඳහා ඉඩ සකස් කොට දුන්නද, පුහුණුවීම් අඩුකම, සීමිත දේශපාලන නිරාවරණය, සහ අභ්‍යන්තර තීරණ ගැනීම් වලින් බහිෂ්කරණය වැනි අවිධිමත් ආයතනික ක්‍රියාවලියන් තුළින් සූක්ෂ්ම ලෙස ඔවුන්ගේ ප්‍රමාණාත්මක දේශපාලන ක්‍රියාකාරීන් වීමේ ධාරිතාව අඩු තක්සේරු කර ඇත.

මූලික දැනුවත් කරන්නා ඊ, දේශපාලනික පක්ෂ, සක්‍රීයව කාන්තාවන්ගේ සවිබලගැන්වීම ප්‍රතික්ෂේප කරනා "පීතෘමූලික, දරුණු, දූෂිත සහ පුරුෂමූලික" අවකාශ ලෙස විස්තර කරන ලදි. මෙම සිද්ධි මගින් පක්ෂ සංස්කෘතීන් විසින් කාන්තාවන් බහිෂ්කරණය, දුර්වල ආයතනික සහයෝගයෙහි අකර්මණ්‍ය අතුරු නිෂ්පාදනයක් නොවී, සක්‍රීයව ක්‍රියාන්විත වන ආකාරය උලුප්පා පෙන්වයි. මූලික දැනුවත් කරන්නාට අනුව, පක්ෂ නායකත්වය පිළිබඳ ප්‍රශ්න නගනා හෝ ස්ථාපිත බල ධූරාවලියන් අභියෝගයට ලක්කරන කාන්තාවන්, බොහෝ අවස්ථාවන් හිදී, "නෙරපා හැර" හෝ "අනවශ්‍ය" ලෙස ලේබල් කිරීම මගින්, දේශපාලන පක්ෂ යනු, "කාන්තාවන්ට ඇහුම්කන් නොදෙන" "කල්ලි" ලෙස දැනුවත් කරන්නා විසින් අර්ථකතනය කිරීමට යාම දක්වා දිගු වේ.[39]

මූලික දැනුවත් කරන්නන් A[40] සහ J[41] යන දෙදෙනාම එක ලෙස කියා සිටියේ, ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ප්‍රධාන වශයෙන් පුරුෂ-නායකත්වය දරණ ආයතන බවය. පක්ෂ විසින් කාන්තා අංශ පවත්වාගෙන යන විටදී පවා, මෙම ව්‍යුහයන් තීරණ-ගැනීමේ අවකාශයන් තුළට කාන්තාවන්ගේ ප්‍රවේශය සඳහා ඉඩකඩ සලසන්නේ කලාතුරකිනි. ඒ වෙනුවට, කාන්තාවන් බොහෝ විට, පක්ෂ ධූරාවලිය තුළ ඔවුන්ගේ පරිධියාත්මක තත්ත්වය බලාත්මක කරමින්, බිම් මට්ටමේ ඡන්ද ව්‍යාපාර, රැළි බලමුලු ගැන්වීම්, සහ සැපයුම් ක්‍රියා වැනි අතිරේක කාර්යයන් සඳහා නියුක්ත කරනු ලැබේ. දැනුවත් කරන්නන් දෙදෙනාම අවධාරණය කොට, පක්ෂ "ගැහැණුන් තනියම හිතන අය වෙනවට කැමති නැහැ" ඒ වෙනුවට ඔවුන් "නායකයන් පස්සෙ අන්ධයො වගේ යන එකට කැමතියි" යැයි ප්‍රකාශ කර සිටියහ.

39 නැගෙනහිර පළාතේ පදිංචි වී සිටින සාමය සහ කාන්තාවන්ගේ අයිතීන් සුරැකීම පිළිබඳ ක්‍රියාධරයයෙක්. ඔක්තෝබර් 25, 2023. (මාර්ගගත සාකච්ඡාවක්)

40 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥ සහ දේශපාලනඥ. නොවැම්බර් 6, 2023.

41 වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි පදිංචි, කාන්තාවන්ගේ අයිතීන් සුරැකීමේ ක්‍රියාධරයෙක් සහ කාන්තා අයිතීන් සුරැකීමේ සංවිධානයක සභාපතිවරයෙක්. දෙසැම්බර් 21, 2023.

මූලික දැනුවත් කරන්නා C පළාත් පාලන ආයතන තුළ කාන්තාවන් බොහෝ විට කොන්කරන ලද කාර්ය භාරයන් තුළට අනුයුක්ත කරන බව සහ කාන්තාවන් සහ ළමයින්ට අදාළ ගැටළු වලට පමණක් ඔවුන්ගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කරන බවද, ඒ අතරතුර, පුරුෂ මන්ත්‍රීවරුන් ආර්ථික, යටිතල පහසුකම්, සහ ආරක්ෂාව වැනි බරපතල ගැටළු සඳහා අනුයුක්ත කරන බවද තවදුරටත් නිරීක්ෂණය කරන ලදී.[42] ප්‍රමාණවත් පුහුණුවක් නොමැතිකම සමග ස්ත්‍රී පුරුෂ සමාජභාවී වගකීම් වල නිල නොවන පැවරුම් එකතු කර, ඔවුන් ඡන්දයෙන් තේරී පත් වූ පසුවද, කාන්තාවන් තුළ බලපෑමක් ඇති කිරීමට ඇති හැකියාව සීමා කරමින්, පක්ෂ සහ පළාත් පාලන ආයතන විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනයී ප්‍රතිනිෂ්පාදනය කරයි.

එකතුවක් ලෙස, ප්‍රමාණවත් නොවන පුහුණුව ආයතනිකගත බහිෂ්කරණයෙහි වඩා පුළුල් වූ කොටසක් ලෙස මෙම ගතිකයන් තුළින් පෙන්වා දෙනු ලබයි. කෝටාවන් වැනි විධිමත් නීති මගින් කාන්තාවන් දේශපාලන අවකාශ තුළට අවතීර්ණ වුවද, අවිධිමත් ක්‍රියාවලි මගින්, ප්‍රමාණාත්මක ලෙස ඔවුන් සවිබල ගැන්වීම වෙනුවට සංකේතාත්මක ලෙස රඳවා ගැනීම තහවුරු කරයි.

## 5.2 පළාත් පාලන ආයතන අභ්‍යන්තරයෙහි පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී බල යාන්ත්‍රන

ස්ත්‍රී පුරුෂ සමාජභාවී කෝටාව හඳුන්වා දීම හේතුවෙන් පළාත් පාලන ආයතන තුළ කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක නියෝජනය ඉහළ ගියද, කාන්තා මන්ත්‍රීවරියන් ගේ අත්දැකීම් තුළින් පෙන්නුම් කරනු ලබනුයේ, මෙම ආයතන ගැඹුරු ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවී ව පවතින බවය. සම්මුඛ සාකච්ජාවන් හරහා, කාන්තාවන් දේශපාලන කාර්යාලයට ඇතුළ් වීමෙන් පසුව, බහිෂ්කරණය, නීත්‍යානුකූලභාවය අහිමි කිරීම, සහ ප්‍රතිරෝධයෙහි අඛණ්ඩ රටාවන් මගින්, ඔවුන්ගේ අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව දුර්වල කරන ආකාරය විස්තර කළහ. සිද්ධිවාචික වීම අභව්‍ය වන මෙවැනි භාවිතයන්, ස්ත්‍රීවාදී ආයතනික වාදීන් විස්තර කරනු ලබන "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනය" (gendered logic of appropriateness) පිළිබිඹු කරන අතර (Chappell 2006), එහිදී නායකත්වය, අධිකාරිය, සහ දේශපාලන හැකියාව යන කාරණා පුරුෂ ලක්ෂණ ලෙස කේතගත කර, ස්ත්‍රීන් පද්ධතිකමය ලෙස අන්තයන් ට තල්ලු කරනු ලැබේ. පහත සඳහන් කාණ්ඩ මගින්, මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආයතනික ගතිකයන් හරහා නිපදවන ලද, එකිනෙකා සමග අන්තර්සම්බන්ධිත යාන්ත්‍රණ තුනක් පරීක්ෂා කරනු ලැබේ. කවුන්සිල තුළ නිහඬ කිරීම් සහ බහිෂ්කරණයන්, කෝටාවන් හරහා නීත්‍යානුකූලභාවය අහිමි කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ලේබල් කිරීම්, සහ සම්පත් සඳහා අසමාන ප්‍රවේශය.

42 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි පවතින, කාන්තාවන්ගේ අයිතීන් සුරැකීමේ ක්‍රියාධරයෙක් සහ කාන්තා අයිතීන් සුරැකීමේ සංවිධානයක සම නිර්මාතෘවරයෙක්. දෙසැම්බර් 11, 2023.

### 5.2.1 පළාත් පාලන ආයතන තුළ නිහඬ කිරීම් සහ බහිෂ්කරණය

ස්ත්‍රී මන්ත්‍රීවරියන් ඔවුන්ගේ පළාත් පාලන ආයතන තුළට පිවිසීම, ඔවුන්ගේ පැවැත්ම ඉවසා සිටින මුත්, ඔවුන්ගේ හඬ නොඉවසන, සතුරු ආයතනික සංස්කෘතියක් සමග මුණ ගැසීමක් ලෙස නිරන්තරයෙන් විස්තර කරයි. බොහෝ අය නොසලකා හැරීම්, බාධා කිරීම්, හෝ රැස්වීම් අතරතුර විවෘතව නිශ්ශබ්ද කිරීම් වලට මුහුණ දී ඇත. ගාල්ලේ සිට පැමිණි මන්ත්‍රීවරියක්, වසර දෙකක් ඇයගේ දිස්ත්‍රික්කයේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ සංසදයේ සභාපතිනිය ලෙස සේවය කර, එවැනි නායකත්ව භූමිකාවක් තිබියදී පවා ඇය සහ අනෙකුත් කාන්තාවන් නිරන්තරයෙන්, තම පිරිමි සගයන් විසින් කෑ ගසා වාඩිකරවීමෙන්, ඔවුන්ගේ සහභාගිත්වය සඳහා වූ සමානාත්මක අවස්ථා සම්පූර්ණයෙන්ම අහිමි කළ බව පවසා සිටියාය. තවත් මන්ත්‍රීවරියක් මෙම අත්දැකීමම ප්‍රතිරාවය කළේ, මෙලෙස ප්‍රකාශ කරමින්:

*"ගැහැණු සාමාජිකාවක් විදිහට සභාවෙදි කතා කරන කොට ඒකෙ වෙනම අභියෝග ටිකක් ලැබෙනවා,"*[43]

ඇය පිරිමි දේශපාලකයන් විසින් කාන්තාවන් ගෙන එන, විශේෂයෙන්ම පෙර පාසල් පහසුකම් වැනි මූලික සේවාවන් කේන්ද්‍ර වූ යෝජනා, යෝජනා කරන්නාගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව, නිතරම ප්‍රතික්ෂේප වන ආකාරය විස්තර කළාය.[44] මූලික දැනුවත් කරන්නා ද මෙම කරුණ තහවුරු කරන ලද අතර, කාන්තා මන්ත්‍රීවරියන් බොහෝ අවස්ථා වලදී වාචික ලෙස අපහරණයට ලක්වන බව සලකුණු කරමින්, පහත සඳහන් ප්‍රකාශය ඉදිරිපත් කරන ලදි:

*"ඔයා ආවෙ කෝටා එක නිසා, ඒ හින්දා කට වහගන්න."*[45]

මෙම අත්දැකීම් තුළින් පිළිඹිබු වන්නේ විද්වතුන් විසින් විස්තර කරන "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනය" වේ (Chappell 2006). දේශපාලන ක්‍රියාකාරීන්, සම්ප්‍රදායිකව පිරිමින්, දීර්ඝ කාලයක් තිස්සේ පිරිමින් ස්වභාවික ලෙසම තාර්කික, අධිකාරිගත, සහ පාලනය සඳහා සුදුසු ලෙසත් කාන්තාවන් සියුමැලි, පරාධීන, හෝ උපකාරක භූමිකාවන්ට පමණක් ගැලපෙන ලෙසත් චරිතාංග කොට, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඔවුන් එකිනෙකා තුළ ක්‍රමානුකූලව සිතියම්ගත වී ඇති යැයි සිතා ක්‍රියා කොට ඇත (Lovenduski 2005). මෙම තර්කනය තුළ, ස්ත්‍රී මන්ත්‍රීන් කථා කිරීමේ නිදහස පාවිච්චි කිරීම හෝ ව්‍යාපෘතියකට යෝජනාවක් ඉදිරිපත් කළහොත්, ඔවුන් මෙම කිඳා බැස පවතින ප්‍රතිමානයන් උල්ලංඝනය කිරීම මත, සමච්චල් කොට, වාග් ප්‍රහාර එල්ල කොට, හෝ පටිපාටිගත බහිෂ්කරණය තුළින් හෝ නැවත නිශ්ශබ්දතාවයට විනයානුගත කළ යුතු

43 බදුල්ල 013, බදුල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 14, 2024.
44 Ibid.
45 ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයෙහි සීඩ, විධායක අධ්‍යක්ෂක. ජනවාරි 14, 2024.

'අපගාමිකයෙකු' ලෙස සලකයි. මෙවැනි "ඇලෙනසුළු" ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිමානයන් නොනැසී පැවතීම (Chappell 2006), කාන්තාවන් පළාත් පාලන ආයතන තුළට කෝටාව හරහා පැමිණීම, සමානාත්මතා සහභාගීත්වයකට ස්වයංක්‍රීය ලෙස පරිවර්තනය නොවූ ආකාරය පැහැදිලි කරයි. ඒ වෙනුවට, ඔවුන්ගේ පැවැත්ම තුළින් ආයතනිකගත ධූරාවලියන් තුළ දේශපාලනයේ නියම හිමිකරුවන් ලෙස පුරුෂයන්ට වාසිදායක වීම බාධා කරන ලදි (Chappell සහ Waylen 2013).

මෙම කාන්තාවන් මුහුණ දුන් වෙනස් කොට සැලකීම්, වාචික අපහරණ සහ නිරන්තර සුළු කොට තැකීම් ඉක්මවා ගිය, ආයතනික ක්‍රියාපටිපාටයන් දක්වා දිගු වූ ඒවා විය. බස්නාහිර පළාතේ, අයවැය සාකච්ඡා තුළදී, පුරුෂයන්ට විනාඩි පහක, දහයක කාලයක් වෙන් කර දී ඇති අතර, කාන්තාවන්ට කතා කිරීමට ලබා දී ඇත්තේ විනාඩි තුනක කාලයක් පමණක් බව වාර්තා වී ඇත. මෙම අසමාන ලෙස සැලකීම, කාන්තාවන් අත්දැකීම් අඩු සහ අඩු දායකත්වයක් ලබාදිය හැකි යැයි පවතින, පුළුල් ලෙස පැතිරුණු උපකල්පනය මත පදනම් වේ. මෙය තවත් "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනය", එනම් කාන්තාවන් කොන් කරමින්, අධිකාරිගතභාවය සහ තීරණ ගැනීම යනු සහජයෙන්ම පුරුෂමූලික ගුණාංග ලෙස සලකන, ආයතනික අභිමාතාර්ථයන් පෙළක් සහ ප්‍රතිමානයන් පිළිබඳ උදාහරණයකි (Chappell 2006). මෙම තර්කනය මුල් බැසගෙන ඇත්තේ, වඩා පුළුල් වූ සමාජීය විශ්වාසයන් මතය. මූලික දැනුවත් කරන්නන් F සහ A ඔවුන්ගේ විස්තරයන් හි පිළිවෙලින්, කාන්තාවන්ට නිරන්තරයෙන් "දේශපාලනය තියෙන්නේ පිරිමින්ට"[46] යැයි කියනු ලැබූ බවත්, ඔවුන් "හැඟීම්බරයි" හෝ "බිඳෙනසුළුයි" ලෙස ඒකාකෘතික කර, එබැවින් ඔවුන් නායකත්වයට සුදුසු නැති බවට ප්‍රකශ කළ බවත් මතක් කළහ.[47]

බහිෂ්කරණය එදිනෙදා පළාත් පාලන ආයතන තුළ ක්‍රියාකාරකම් සහ යටිතල පහසුකම් දක්වා දිගු විය. එක් මන්ත්‍රීවරියක් පැහැදිලි කළ ආකාරයට ඇගේ කවුන්සිලයෙහි කාන්තා සාමාජිකයන්ට වෙන් කරන ලද වැසිකිළි පහසුකම් නොමැති බවට පහත ප්‍රකාශය ඉදිරිපත් කළාය:

*"ගැහැණු කෙනෙකුට වැසිකිළිය පාවිච්චි කරන්න වුනොත්, එයාට සිද්ධ වෙනවා පිරිමි සාමාජිකයෙක් ඉවර වෙලා එනකල් ඉන්න, ඊට පස්සෙ තව ගැහැණු සාමාජිකාවකට දොර මුර කරන්න කියලා කියන්න."*[48]

මනා සංවිධානයෙහි ඇති වූ දෝෂයක් ලෙස පෙනෙන මෙම කාරණය තුළින්, පුරුෂ සුවපහසුව සහ සහභාගීත්වය ප්‍රමුඛ කරමින්, දේශපාලන අවකාශයේ ගෘහ නිර්මාණය දක්වා, බහිෂ්කරණය මුල් බස්වමින්, ආයතන භෞතිකව ආකෘතිකගත කර ඇති ආකාරය පෙන්වා දෙනු ලබයි. (Chappell 2006, 225).

46 ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයෙහි CSO, විධායක අධ්‍යක්ෂක. ජනවාරි 14, 2024.

47 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබද විශේෂඥ සහ දේශපාලනඥ. නොවැම්බර් 6, 2023.

48 ගාල්ල 024, ගාල්ල දිස්ත්‍රික්කය. මාර්තු 13, 2024.

ආයතනික බාධාවන්ද තවත් එල්ල කරන ලද ආකෘති බවට පත් විය. එක් මන්ත්‍රීවරියක් අඩු ආදායම්ලාභී පවුලක් විසින් පාවිච්චි කරන ලද පොදු වතුර කරාමයක් සම්බන්ධ සිද්ධියක් මතක් කළාය. ප්‍රජාව විසින් ජල බිල්පත එකට එකතු වී ගෙවා තිබුනද, එම පවුලට එහි පිවිසුම දිගටම ආරක්ෂා කිරීම සඳහා විධිමත් ලෙස සැකසුමක් ගෙන ඒමට ඇය උත්සහා කර සිටියාය. කෙසේ නමුත්, පිරිමි මන්ත්‍රීවරයෙක් මෙයට මැදිහත් වී, ඇගේ ප්‍රයත්නය නවත්වා දැමුවේය. මෙම අමනාපයෙහි ප්‍රතිඵලයක් ලෙස, අවසානයේදී කරාමය වසන ලදි.[49] තවත් අයෙක් විස්තර කර කියා සිටියේ, අරමුදල් සුරක්ෂිත වීමෙන් පසුව, සංවර්ධන ව්‍යාපෘතියකින් ඇගේ නම ඉවත්කොට ඒ වෙනුවට ඇගේ පිරිමි සගයෙක්ගේ නම එයට ඇතුළත්ව තිබූ බවය.[50] මෙවැනි ක්‍රියා මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඇති පක්ෂග්‍රාහීත්වය එදිනෙදා ආයතනික ක්‍රියාවලියන් තුළ ක්‍රියාත්මක වන ආකාරය උදාහරණගත කරයි (Chappell 2006). මෙවැනි දුටු පමණින් සරල එනමුත් නිබඳවම පවතින බාධවන් එකතු වී, ප්‍රජාවෙහි අවශ්‍යතා පිළිබඳ ඔවුන්ට කතා කිරීමට අවශ්‍ය වූ විට පවා, කාන්තාවන් හට ඔවුන් එක හා සමානව සහභාගි වන්නන් නොවන බවට සංඥා කරයි.

කාන්තාවන් විසින් පළාත් පාලන ආයතන තුළ, කාන්තා කමිටු ආරම්භ කිරීමට උත්සහා කරන ලද අවස්ථාවේදීද, ප්‍රතිරෝධ මතු විය. මෙවැනි කමිටු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි ඉහළ අධිකාරියක් මගින් අනුමත වුවද, පිරිමි මන්ත්‍රීන් නිරන්තරයෙන් ඒවා අනවශ්‍යයයි යැයි කියමින් ඒවාට විරුද්ධ විය.[51] පළාත් පාලන ආයතන තුළ, තීරණ ගැනීමේ සහ ආණ්ඩුකරණයෙහි ප්‍රධාන භූමිකාවක්, කමිටු[52] විසින් රඟ දක්වයි. කෙසේ වෙතත්, 2018ට ප්‍රථමයෙන්, විශේෂිත ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගැටළු ආමන්ත්‍රණය සඳහා වෙන් කරන ලද කිසිදු කමිටුවක්, එකදු පළාත් පාලන ආයතනයක පවා නොතිබිණි. කාන්තා නියෝජනය වර්ධනය වීමත් සමගම, බොහෝ කාන්තා මන්ත්‍රීවරියන් එවැනි කමිටු, සංස්ථාගතය වෙතට යෝජනා කරන්නට වූ නමුත් එම උත්සහයන්ට නිරන්තර ප්‍රතිරෝධතා මුණගැසිණි. ගාල්ලේ සිට පැමිණි මන්ත්‍රීවරියක්, එවැනි ව්‍යුහයක් ස්ථාපනය කිරීමට කරන ලද අරගලය මතක් කරමින්, ඇය අවසානයේදී ජයග්‍රහණය කළද, සතුරු පක්ෂයක වෙනත් මන්ත්‍රීවරයෙක් ප්‍රශංසාත්මක ලෙස මෙලෙස ප්‍රකාශ කළ බව පැවසුවාය:

*"ඇය පිරිමි මන්ත්‍රීන්වරුන්ට කරගන්න බැරි වෙච්ච දේවල්, මේ කමිටුව හරහා කර ගත්තා."*[53]

මෙවැනිම ආකාරයේ ප්‍රතිරෝධයක් මොරටුව මහා නගර සභාවේ දැකිය හැකි විය. මෙවැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවී විශේෂිත ව්‍යුහයක අවශ්‍යතාවය, පිරිමි මන්ත්‍රීවරුන් ප්‍රශ්න කර සිටි

49 ගාල්ල 024, ගාල්ල දිස්ත්‍රික්කය. මාර්තු 13, 2024.

50 මන්නාරම 031, මන්නාරම් දිස්ත්‍රික්කය. ජූනි 7, 2024.

51 ගාල්ල 024, ගාල්ල දිස්ත්‍රික්කය. මාර්තු 13, 2024.

52 පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වන්නේ, විගණනය, පොදු සේවා, සෞඛ්‍ය, කසළ කළමනාකරණය, ව්‍යාපාරික ඉඩම්, වැනි පරිපාලනයේ මූලික අංශ, පිළිබඳ වගබලා ගැනීමට පවරා ඇති ස්ථාවර කමිටු පද්ධතියක් මගිනි. මෙම කමිටු මෙහෙය වන්නේ පත් කරන ලද සභාපතිවරයෙක් සහ පාලක පක්ෂයෙන් සහ විරුද්ධ පක්ෂයෙන් යන දෙපක්ෂ වලින් සමන්විත මන්ත්‍රීවරුන් මගිනි. කමිටු සංඛ්‍යාව, කවුන්සිලයේ වර්ගය සහ ප්‍රමාණය අනුව වෙනස් වේ.

53 ගාල්ල 023, ගාල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 17, 2024.

අතර, පිරිමි මන්ත්‍රීවරුන්ටද එක හා සමානව කාන්තාවන්ගේ ගැටළු වලට ආමන්ත්‍රණය කළ හැකි බවත්, පවතින ඕනෑම කමිටුවක් හරහා මෙම ගැටළු වලට පිළිතුරු ලබාගත හැකි බවටත් ඔවුන් තර්ක කළහ. මෙම අවස්ථාවේදී, වෙනත් කාන්තා කමිටුවක් ස්ථාපනය නොකරන ලද අතර, පවත්නා පොදු සේවා කමිටුව තුළට, කාන්තාවන් සහ ළමයින් ඇතුළත් වන සේ නැවත නම් කරන ලද අතර එමගින්, කාන්තාවන්ගේ ගැටළු වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු යැයි වන සම්පූර්ණ ආයතනගත පිළිගැනීමක් වෙනුවට, පාර්ශවික සහ සාකච්ඡා කරන ලද ඉඩකඩ සලස්වා දීමක් ඉදිරිපත් කරන ලදි.

එක් සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නෙක් නිරීක්ෂණය කළ පරිදි, එවැනි විරෝධතා බොහෝ විට මුල් බැස ඇත්තේ, කාන්තා කමිටු මගින් කාන්තා මන්ත්‍රීවරියන් පළාත් පාලන ආයතන තුළ ඒකාබද්ධිත බලපෑමක් සිදු කළ හැකි යැයි පවතින බිය හේතුවෙනි.[54] කෙසේ වෙතත්, වඩා විශේෂයෙන්ම කැපී පෙනෙන දෙය වන්නේ, මෙවැනි කමිටු පිහිටුවීමේ උත්සහයන් සමග සම්මුඛ වීමේදී, විවිධාකාර පළාත් පාලන ආයතන හරහා, පුරුෂ මන්ත්‍රීවරුන් විසින් පැහැදිලි ලෙස එකම ආකාරයකට ප්‍රතිචාර දැක්වීමය. එවැනි ඒකමිතික ප්‍රතිරෝධයක් මගින් අදහස් කරනුයේ, කෝටා හෝ කාන්තා කමිටු වැනි විධිමත් ආයතනික ප්‍රතිසංස්කරණ තුළ කිඳා බැස ඇති අවිධිමත් ප්‍රතිමානයන් මගින් නිරන්තරයෙන් අවතක්සේරු කරන බවත්, එමගින් විධිමත් සමානාත්මතා නිර්ණායක විසම්මුතිගත කිරීම සහ කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වයට සහ දායකත්වයට අඩු වටිනාකමක් ලබාදීමක් සිදුකරන බවය (Helmke සහ Levitsky 2006).

මෙම නිශ්ශබ්ද කිරීමේ රටාවන්, පටිපාටිගත ආන්තිකරණයන්, භෞතික බහිෂ්කරණයන්, ආයතනගත බාධා කිරීම්, සහ ප්‍රතිසංස්කරණයන් සඳහා වූ ප්‍රතිරෝධයන්, දිස්ත්‍රික්ක සහ පළාත් පාලන ආයතන පුරා පැතිර තිබීම උපුටා දක්වනුයේ, මෙම අභියෝග හුදකලා ඒවා නොව පද්ධතිමය සහ ආකෘතිකමය ලෙස ආයතනික සංස්කෘතිය තුළ කිඳා බැස ඇති ඒවා බවය. එක්ව ගත් කළ, ඒවා තුළින් ප්‍රකාශිත කරුණ වන්නේ Lovenduski (2011) පැහැදිළි කළ ආකාරයට, ආයතන තුළ පවතින, පුරුෂයන් ආධිපත්‍ය දරන, සහ ස්ත්‍රීන් ආකෘතිකමය ලෙස සතුරු භූමියක් තුළ ගමන් කළ යුතු, "ස්ත්‍රී පුරුෂ සමාජභාවී පාලන තන්ත්‍රයක්" පවතින බවය.

### 5.2.2 කෝටාවන් සහ ලේබල් හරහා නීත්‍යානුකූලභාවය අහෝසි කිරීම

ආයතනිකගත නිශ්ශබ්ද කිරීමට ඔබ්බෙන්, කාන්තා මන්ත්‍රීවරියන් දේශපාලනය තුළ ඔවුන්ගේ පැවැත්මෙහි නීත්‍යානුකූලභාවය අහෝසි කිරීම සඳහා කළ පද්ධතිමය ව්‍යාර්ථයන්ටද මුහුණ දුන්හ.ඔවුන් නිරන්තරයෙන් "ලිස්ට් එකේ මිනිස්සු" ලෙස හඳුන්වා දුන් අතර, එමගින් ඔවුන්ගේ මැතිවරණය, තමන්ගේ දේශපාලන හැකියාව හෝ මැතිවරණ නීත්‍යානුකූලභාවය මත ලද යමක් නොව, ඔවුන්ට ලැබීමට සුදුසු නැති සහ සම්පූර්ණයෙන්ම කෝටා පද්ධතිය

54 කොළඹ 019, කොළඹ දිස්ත්‍රික්කය. නොවැම්බර් 22, 2023.

හේතුවෙන් පමණක් ලද්දක් බවට අදහස් කරන ලදී. මූලික දැනුවත් කරන්නා J විසින්, නාමයෝජනා සුරක්ෂිත කර ගැනීම සඳහා, කාන්තා මන්ත්‍රීවරියන් "ලිංගික අල්ලස්" යෝජනා කර ඇති බවට නිරන්තරයෙන් චෝදනා ලබන ආකාරය සහ මෙවැනි චෝදනා මගින් යම් ආකාරයක චරිත ඝාතනයක් නිර්මාණය වී එමගින් ඡන්දයෙන් පත් වූ නියෝජිතයන් ලෙස ඔවුන් කෙරෙහි පවතින විශ්වාසය සහ නීත්‍යානුකූලභාවය දුබල කරන ආකාරය හෙළිදරව් කරන ලදී.[55] මෙම ගතිකයන් ප්‍රතිරාව කරනුයේ "ලේබල් ආවරණය" නම් Franceschet සහ Piscopo (2008) ගේ සංකල්පය මගින් විස්තර කරන, කෝටාව තුළින් තේරී පත්වන කාන්තාවන්, දක්ෂතාවය අඩු හෝ නියෝජ්‍යත්වය අවම, "නියෝජන අපේක්ෂකයන්" (proxy candidates) ලෙස සලකන බවය (Kanold 2020).

මෙම අනුමාන කිරීම් පවතිනු ලබන්නේ බොහෝ කාලයක් තිස්සේ, පුරුෂයන් සමග බොහෝ විට බැඳී ඇති චරිත ලක්ෂණ වන, ඥාති සංග්‍රහ, දූෂණය, සහ පරම්පරාගත දේශපාලනය මගින් ජරාජීර්ණ වූ දේශපාලනික ආයතන තුළය. එනමුත්, කෝටාවන් හරහා තේරී පත්වුනු කාන්තා දේශපාලනඥයන් පමණක් දැඩි පරීක්ෂාවකට භාජනය වේ. මූලික දැනුවත් කරන්නා A සලකුණු කළ ආකාරයට, පොදු සම්මුතිය වන්නේ:

*"නායකයෙක් වෙන්න ලොකු පෞරුෂයක් එක්ක ගොඩාක් ශක්තිමත් පිරිමියෙක් වෙන්න ඕන, ගැහැණුන්ට හොඳට වැඩක් කරන්න බැහැ."*[56]

පුරුෂ නවකයන් සඳහා දැනමුතුකම් ලබාදීම සහ ආරක්ෂාව සැලසීම ජ්‍යෙෂ්ඨ පක්ෂ සාමාජිකයන් විසින් සිදු කළද, කාන්තාවන්ට දිගින් දිගටම ඔවුන්ගේ නීත්‍යානුකූලභාවය ඔප්පු කිරීමට සිදුව ඇත. මෙම වෙනස්කම පෙන්වා දෙනු ලබන්නේ, කෝටාවන් හරහා විධිමත් ඇතුළත් කිරීම් සිදු වුව ද, අවිධිමත් ප්‍රතිමානයන් සහ පක්ෂග්‍රාහීත්වයන්, කාන්තාවන් කොන් කිරීම නිරන්තරයෙන් සිදුවන, දේශපාලනික ආයතන තුළ පවතින ගැඹුරු ස්ත්‍රී පුරුෂ සමාජභාවී ස්වභාවයයි.

මෙම ස්ත්‍රී දේශපාලනඥයන්ගේ නීත්‍යානුකූලභාවය අහෝසි කිරීම, ලිංගිකමය කතිකාවන් විසින් තව දුරටත් මුල් බස්සවා ඇත. සුවිශේෂී ලෙස කැපී පෙනුනු උදාහරණයක් වන්නේ 2018 පළාත් පාලන මැතිවරණයට පසුව පාවිච්චි වූ අපහාසාත්මක "හාන්සි මන්ත්‍රිනී" යන ලේබලයයි.[57] මෙම වදන් තුළින් කාන්තාවන් ඔවුන්ගේ දක්ෂතාවයට වඩා ලිංගික උපකාර ලබාදීම තුළින්, ඔවුන්ගේ නාම යෝජනා සුරක්ෂිත කරගන්නා බවට අදහස් වන අතර, එයට පරස්පර විරෝධී ලෙස මහත් පරිශ්‍රමයෙන් ඔවුන්ගේ ස්ථානය උපයා ගෙන ඇති ලෙසට සලකන, "මහන්සි මන්ත්‍රිනී" සමග සසඳන විට, ඔවුන් බොහෝ වෙනස් බව ද

55 වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි කාන්තා අයිතීන් පිළිබඳ ක්‍රියාධරයෙක් සහ කාන්තා අයිතීන් පිළිබඳ සංවිධානයක සභාපති. දෙසැම්බර් 21, 2023.

56 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි පදිංචි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥ සහ දේශපාලනඥ. නොවැම්බර් 6, 2023.

57 මෙම අපහාසාත්මක වැකිය, ඔවුන්ගේ දක්ෂතාවය මත නොව, පක්ෂ සාමාජිකයන් සමග ලිංගික උපකාර මාර්ගයෙන් තේරී පත්වූ බවට අනුමාන කරන ලද කාන්තා දේශපාලනඥවරියන්ට එල්ල විය.

අදහස් වෙයි. පුරුෂ සංවිධායකයන් විසින් මෙම කතිකාව, උපායමාර්ගික ලෙස කාන්තා මන්ත්‍රීවරියන් ගේ විශ්වාසභංගත්වයට, අනෙක් අය ඔවුන් ආරක්ෂා කිරීම අධෛර්යමත් කිරීමට සහ ඔවුන්ගේ දේශපාලන පැවැත්ම නීති විරෝධීයි යන අදහස සාමාන්‍යකරණය කිරීම සඳහා පාවිච්චි කරන ලදී. සම්මුඛ සාකච්ජාවට සහභාගි වූවන්, පක්ෂ ධූරාවලි මෙවැනි බලහත්කාරී ක්‍රියාවන් පිළිබඳ දැන සිටිය බව ද, එනමුත් ඒවා උපායාත්මක ලෙස සාමාන්‍යකරණය කිරීම සහ කලාතුරකින් ප්‍රශ්න කිරීම කළ බව ද හඟවන ලදී.[58]

ලිංගික උපකාර සඳහා යෝජනා ඉදිරිපත් වූ බවට, සම්මුඛ සාකච්ජා කළ කාන්තා දේශපාලනඥවරියන් වාර්තා නොකළ ද, මූලික දැනුවත් කරන්නන් මෙවැනි ලිංගික බලහත්කාරකම් පක්ෂ ව්‍යුහය තුළ පවතින බව හඟවන ලද අතර, බොහෝ අවස්ථා වලදී පක්ෂ නායකත්වය විසින් සාකච්ඡා නොකර අතහැර දමන බව පවසයි. "හාන්සි මන්ත්‍රිනී" ලේබලය වැනි ලිංගිකමය කතිකාවන් තුළින් ලිංගික අශ්ශීලත්වය පිළිබඳ ඉඟි කරමින්, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වයෙහි නීත්‍යානුකූලභාවය අහෝසි කරන අන්දම උපුටා පෙන්වයි. මෙම ගතිකය, සමහර කාන්තාවන් විසින් ලිංගික අපයෝජනය යන ගැටළුව ප්‍රකාශ කරන ආකාරය තුළින් තවදුරටත් ප්‍රත්‍යමාන වේ. එක් කාන්තා මන්ත්‍රීවරියක්, "ලිංගික අපයෝජනය කියන්නේ දේශපාලනය කරන කාන්තාවන්ට වෙන්න පුළුවන් තවත් එක ගැටළුවක්" ලෙස අනුමත කරමින්, එයට පිළිතුර ලෙස රාමුගත කරන ලද්දේ, කාන්තාවන් "ඔවුන්ගේ ගෞරවය සහ හොඳ නම" පවත්වා ගත යුතු බව සහ "මූල්‍යමය ප්‍රතිලාභ වලට රැවටෙන්නෙ නැතුව"[59] සිටිය යුතු බවය. මෙම රාමුගත කිරීම තුළින් හෙළිදරව් කරනු ලබනුයේ, සූරාකෑම වැළැක්වීම සඳහා, පුරුෂ වැරදිකරුවන් හෝ දේශපාලන ආයතන මත වගකීම රඳවනවා වෙනුවට, එම ගැටළුව කාන්තාවන්ගේ හැසිරීම සහ සදාචාරය තුළ ස්ථානගත කිරීමක් ලෙසය. ස්ත්‍රීවාදී ආයතනිකවාදී දැක්මකින්, කෙතරම් ගැඹුරකට "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනය" එහි ප්‍රතිඵල අත්දකිනා අයට පවා අභ්‍යන්තරීකරණය වී ඇත්දැයි මෙවැනි ආඛ්‍යාන තුළින් පිළිඹිබු කරයි. පක්ෂ ව්‍යුහය තුළ, කාන්තාවන් පාරිශුද්ධභාවයෙහි සහ සංයමයෙහි ප්‍රමිතියක් පවත්වා ගත යුතු යැයි බලාපොරොත්තු වන අතර, පුරුෂයන්ගේ බලහත්කාරී හැසිරීම, සාමාන්‍යකරණය කර, නොසලකා හැර, හෝ නිහඬව ඉවසා සිටීම සිදුකරනු ලබයි. ගැටළුව පුද්ගලීකරණය කිරීමෙන්, කාන්තාවන්ට අනිවාර්යයෙන්ම පෙළඹවීම හික්මවා ගැනීමට යෝජනා කරමින්, පක්ෂ තුළ පවතින කාන්තාවන් ආරක්ෂා කිරීමේ සහ වරදකරුවන් විනයගත කිරීමේ පද්ධතිමය වගකීම අපහැදිලි කර ඇත. මෙමගින් පීතෘමූලික බල සම්බන්ධතා ප්‍රතිස්ථාපනය කරනවා පමණක් නොව, බලහත්කාරයට සහ දූෂණයට එරෙහිව ආයතනගත වගවීම බලකර සිටීමට කාන්තාවන්ගේ අවකාශය සීමා කරයි.

ඒ හා සමාන ලෙස, සමානුපාතික ලැයිස්තු ක්‍රමය හරහා නිළ කාර්යාලයට ඇතුළත් වූ කාන්තාවන්, ඔවුන් සත්‍ය දේශපාලන ක්‍රියාකාරීන් නොව, සංකේතාත්මක පත්කිරීම් ලෙස

58 බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ දේශපාලන ක්‍රියාකාරිකයෙකි. ජූනි 25, 2025.
59 බදුල්ල 014, බදුල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 17, 2024.

ඇඟවුම් කරමින්, නින්දාත්මක ලෙස "පින් මන්ත්‍රිනී" ලෙස හඳුන්වයි.[60] මෙම ලේබල් තුළින් කාන්තාවන්ගේ සහභාගීත්වය පුළුල් කිරීම අරමුණු කරගත් කෝටාව, ඔවුන්ගේ අධිකාරියෙහි නීත්‍යානුකූලභාවය අහෝසි කිරීමේ භූමිය බවට පත් වූ ආකාරය පිළිබිඹු කරයි. ස්ත්‍රීවාදී ආයතනිකවාදී දැක්මක් තුළ දී, මෙවැනි කතිකාවන් මගින්, අවිධිමත් ආයතන විසින් පුරුෂ ආධිපත්‍ය පවත්වා ගෙන යාම සඳහා ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දෙයි. කාන්තාවන් නිළ කාර්යාලය තුළට විධිමත් ආකාරයට පිවිසුනද. භාෂාව හරහා ඔවුන්ගේ අධිකාරියෙහි නීත්‍යානුකූලභාවය අහෝසි වන අන්දමට අවතක්සේරු කරනු ලබයි.

නාමයෝජනා ක්‍රියාවලිය තුළින් තවදුරටත් මෙම බහිෂ්කරණය බලාත්මක කරනු ලැබීය. පක්ෂ සංවිධායකයින් නිරන්තරයෙන්ම, බිම් මට්ටමෙහි දේශපාලන අත්දැකීම් සහිත කාන්තාවන්ට වඩා බිරින්දෑවරුන්, දියණියන්, හෝ ධනවත් ඇසුරු කරන්නන් හට මූලිකත්වය ලබා දුන්හ. මෙම හේතුවෙන්, සැබෑ තීරණ ගැනීමේ බලය පිරිමින් අත තිබෙන අතර, බොහෝ කාන්තාවන් තෝරාගනු ලැබුවේ, කෝටාව පිරවීම සඳහා වන සංකේතාත්මක අපේක්ෂකයන් ලෙසය. ඊට අමතරව, සංවිධායකයන් විසින් ජයග්‍රාහී කාන්තාවන් නැවත තරග කිරීම ඔවුන් පිරිමි නායකයන්ට වඩා කැපී පෙනෙතැයි යන බියෙන්, ඇතැම් විට වළක්වන ලදි. මෙවැනි භාවිතයන් තුළින්, විධිමත් ලෙස ඇතුළත් කිරීම් සහිත කෝටාවන්, කාන්තාවන්ගේ ස්වාධීනත්වය සීමා කරවන සහ දේශපාලන ආයතන තුළ ඔවුන්ගේ පරාධීනත්වය සවිගන්වන, පීතෘමූලික ප්‍රවේශ මගින් සිදුකරන අවහිර කරවීම් වලින් යටපත් වී ඇති ආකාරය පෙන්වා දෙයි.

### 5.2.3 සම්පත් සඳහා වූ අසමාන ප්‍රවේශය

සම්පත් සඳහා වූ අසමාන ප්‍රවේශය ඡන්ද ව්‍යාපාර අවධියෙන් ඔබ්බට ගොස්, කාන්තාවන් ඡන්දයෙන් තේරී පත්වුනු පසුවත් ඔවුන්ගේ භූමිකාව කාර්යක්ෂම ලෙස කරගෙන යාමට ඇති හැකියාව එමගින් නිරන්තරයෙන් හැඩගස්වයි. මෙවැනි බොහෝ අසමානතා පක්ෂ ව්‍යුහ තුළින්ම ආරම්භ වුව ද, පළාත් පාලන ආයතන තුළ දී ඒවා, පුරුෂ සාමාජිකයන්ට වාසිදායක වන අයුරින්, විධිමත් පටිපාටියන් සහ අවිධිමත් භාවිතයන් අන්තර්ඡේදනය වී නැවත ප්‍රතිනිෂ්පාදනය විය. අවසානයේ දී, මැතිවරණයෙන් තේරී පත් වූ නියෝජිතයන් ලෙස ඔවුන්ගේ වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන ආර්ථික සහ අමුද්‍රව්‍ය සම්පත් සඳහා වන ඔවුන්ගේ ප්‍රවේශය සීමාසහිත වීම මගින්, කාන්තාවන් අතිරේක ආයතනික සීමාකම් වලට මුහුණ දුන්හ.

මෙම අසමානතා පළාත් පාලන ආයතන තුළ සංවර්ධන අරමුදල් වෙන් කිරීමේදී විශේෂයෙන් දැක ගත හැකි විය. කොළඹ සිට පැමිණි මන්ත්‍රීවරියක් විස්තර කරන ලද්දේ, මධ්‍යම සහ පළාත් පාලන ආයතන විසින් වෙන් කරන ලද සංවර්ධන අරමුදල්, සභාපතිතුමාගේ අභිමතය මත, බොහෝ අවස්ථා වලදී බෙදා හරින බවය. මෙම ක්‍රියාවලිය මගින් පාලක

60 මෙම අපහාසාත්මක පදය, තමන්ගේ ශ්‍රමයෙන් හෝ දක්ෂතාවයෙන් නොව තමන් කළ "හොඳ කර්මයකින්" හෝ වාසිදායක තත්වයක් මගින් දේශපාලනයට අවතීර්ණය වන ලදැයි සලකන කාන්තා දේශපාලනඥයන්ට භාවිතා වේ.

පක්ෂ සාමාජිකයන්ට වාසි සිදු වූ අතර, විපක්ෂයේ සාමාජිකයන් විසින්, ඉන් බොහෝමයක් කාන්තාවන්, පැත්තකට කරනු ලැබීය. මොරටුව මහ නගර සභාවේ අරමුදලෙන් වැඩි ප්‍රමාණයක් පාලක පක්ෂයේ පුරුෂයන්ට ගිය අතර, පිරිමි මන්ත්‍රීවරුන්ට ලබාගත හැකි වූ අතිවිශාල මුදල් ප්‍රමාණයට වඩා ඉතා කුඩා ලක්ෂ පහක සිට දහයක පමණ වන අල්ප ප්‍රමාණයක මුදල් වෙන් කිරීමක් කාන්තාවන්ට ලබාගත හැකි විය. මෙම වෙනස්කම් වල යටිපෙළෙහි වන්නේ, කාන්තාවන්ට මහා පරිමාණයේ ව්‍යාපෘති කළමනාකරණය කිරීමේ හැකියාවක් නොමැති බවට පුළුල්ව පැතිරුණු අදහසක් වන අතර, එම නැඹුරුතාවය මගින්, අරමුදල් සඳහා පවතින ඔවුන්ගේ ප්‍රවේශය අවම කිරීම මෙන්ම ඔවුන්ගේ දේශපාලනික දෘෂ්‍යභාවය ද සීමා කරයි.[61] තවත් මන්ත්‍රීවරියක් මෙම අත්දැකීම ප්‍රතිරාවය කළ අතර, සභාවන් ඇතුළත සංවර්ධන අරමුදල් තිබිය දීම, කාන්තා මන්ත්‍රීවරියන්ට ඒවා ඉතා කලාතුරකින් වෙන් කරන බව ඇය නිරීක්ෂණය කළාය.[62]

මූලික දැනුවත් කරන්නන් තහවුරු කරන ලද ආකාරයට මෙවැනි වෙනස්කම් පද්ධතිගත ඒවා වේ. මූලික දැනුවත් කරන්නා ක ට අනුව, කාන්තා මන්ත්‍රීවරියන්ට නිතරම පිරිමි මන්ත්‍රීවරුන්ට වඩා ඉතාමත් අඩු ප්‍රමාණයක අරමුදල් ලැබෙන බවත්, සමහර අවස්ථාවල දී, පුරුෂ මන්ත්‍රීවරුන් විසින් ඔවුන්ගේ ව්‍යාපෘති යෝජනා කෙළින්ම ප්‍රතික්ෂේප කිරීම හෝ ඔවුන් විසින් ඒවා අයිති කරගැනීම සිදුකරන බවත්, මෙමගින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ විශ්වාසනීයභාවය යන දෙකම අවතක්සේරුවට ලක්කරන බව සඳහන් විය. මෙම සීමා කරන ලද සම්පත් සඳහා ප්‍රවේශය හේතුවෙන් කාන්තාවන් නිරන්තරයෙන් කුඩා, බාහිරට කැපී පෙනීමෙන් අඩු ව්‍යාපෘති තුළට කොටු වීය. හාස්‍යජනක ලෙස, මෙම දෘශ්‍යමාන බවේ අඩුවීම මත, 'ගැහැණු වැඩ කරන්නෙ නැහැ' හෝ ඔවුන්ගේ භූමිකාව තුළ අකර්මන්‍ය යැයි, වැනි හානිදායක ඒකාකෘති සඳහා යොදා ගනී.[63] මෙමගින් පෙන්වා දෙනු ලබන්නේ, ආයතනික බහිෂ්කරණය මගින් කාන්තාවන්ගේ දේශපාලන අඩුලුහුඩුකම් වල ස්වයං-ශක්තිමත් ආඛ්‍යාන නිපදවීමඃ කාන්තාවන්ට ඔවුන්ගේ කටයුතු ප්‍රදර්ශනය වන ආකාරයේ ව්‍යාපෘති ලබා ගැනීම සඳහා අවශ්‍ය වන සම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන්, ඔවුන්ට එම තත්ත්වය අහිමි වී එමගින් ඔවුන් අසාර්ථක නියෝජිතයන් වන බවට සාක්ෂි ලෙස දැක්වීම මගිනි.

කෙසේ වෙතත්, මෙම බහිෂ්කාරක රටාව සියළුම පළාත් පාලන ආයතන විසින් අනුග මනය නොකරන ලදී. හලාවත නගර සභාවේ නියෝජිතවරියක් විසින්, ඇගේ කවුන්සිලයේ තිබෙන වඩා සමානාත්මක එළඹුමක් පිළිබඳව විස්තර කරන ලද අතර, එහිදී අරමුදල් තනි මන්ත්‍රීවරුන් අතර නොව කොට්ඨාශ අනුව වෙන් කරන බව ප්‍රකාශ කළාය. මෙම ක්‍රමවේදය මගින්, පුරුෂ සහ ස්ත්‍රී සාමාජිකයන් අතර සහයෝගීතාවය එක සේ ප්‍රවර්ධනය කළ අතර අභ්‍යන්තර තරගය සහ ආරවුල සැලකිය යුතු ලෙස අවම කර ගත හැකි විය.[64]

61 කොළඹ 019, කොළඹ දිස්ත්‍රික්කය. නොවැම්බර් 22, 2023

62 ගාල්ල 023, ගාල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 17, 2024.

63 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි පදිංචි, කාන්තා අයිතීන් පිළිබඳ ක්‍රියාධරයෙක්, පර්යේෂකයෙක්, සහ කාන්තා අයිතීන් සුරැකීමේ සංවිධානයක සම-නිර්මාතෘ. දෙසැම්බර් 11, 2023.

64 පුත්තලම 035, පුත්තලම දිස්ත්‍රික්කය. නොවැම්බර් 28, 2023.

මෙවැනි උදාහරණයන්, බහිෂ්කාරක ක්‍රියාවලියන් නොවැළැක්විය නොහැකි නමුත්, සම්පත් වෙන් කිරීම පාලනය කරන ආයතනික සැලැස්මෙහි, නිශ්චිත නොවන බවක් ඇති වන බව පෙන්වා දෙයි. සමාන සහ විනිවිදභාවයකින් යුතු ක්‍රියා පටිපාටියකින් සම්පත් බෙදා හරින විට, ස්ත්‍රී පුරුෂ සමාජභාවී බහිෂ්කරණය සඳහා අවස්ථාවන්, සැලකිය යුතු ලෙස අඩු වේ.

මෙම සම්පත් සඳහා වූ අසමාන ප්‍රවේශය අනෙකුත් දිස්ත්‍රික්කයන් හරහා ප්‍රතිරාවය විය. පුත්තලමේ සිට පැමිණි මන්ත්‍රීවරියක්, මුල් අවධියේදී ලැබුනු පක්ෂ සහයෝගය කාලයක් සමග ක්‍රමයෙන් නැති වී, ඇයව කොනකට තල්ලු කරන ලද බවට සලකුණු කරන ලදී:

*"මේ වෙලාවෙ, අපිට එයාලගෙන් කිසිම සහයෝගයක් ලැබෙන්නෙ නැහැ, එයාලට පක්ෂෙ කාන්තාවන් ඉන්නවද කියලවත් මතකද දන්නෙ නෑ කියන එක ගැන සැක හිතෙනවා."*[65]

ඇය තවදුරටත් සලකුණු කරන ලද්දේ, කාන්තාවන් පැත්තකට කිරීමෙන් සහ ඔවුන්ගේ ආන්තිකකරණය නැවත බල ගැන්වීමෙන්, පිරිමි සගයන් විසින් හිතාමතාම පළාත් පාලන ආයතන මුදල් වෙන්කිරීම් ඒකාධිකාරීගත කරන ලද බවය. මෙම අභියෝග පිළිබඳ ප්‍රත්‍යවලෝකනය කරමින්, පක්ෂ සහයෝගීතාවය මදකම, දේශපාලනය සම්පූර්ණයෙන්ම අතහැර දමා යාමට ඇය සිතන තැනට යාම දක්වා, ඇයගේ දේශපාලනික අත්දැකීම අමිහිරි කර ඇති බව ඇය කියා සිටියාය.[66]

මෙම අත්දැකීම, තනි සිද්ධියක් නොවේ. මූලික දැනුවත් කරන්නා ක සලකුණු කරන ලද්දේ, පළාත් පාලන ආයතන ධූරාවලියන් සහ පක්ෂ ජාල අතර ගමන් කරමින්, කාන්තාවන් බොහෝ විට තමන් ස්ථාපනය කර ගැනීම සඳහා ද්විත්ව අරගලයක යෙදෙන බවය. දැනුවත් කරන්නා මෙම වාතාවරණය, *"දේශපාලන පක්ෂ ඇතුළත සටන් කිරීම"* ලෙස විස්තර කරන ලද අතර, පක්ෂ ආකෘති, *"කොල්ලන්ගේ ක්ලබ්"* යන මානසිකත්වයෙන් ආධිපත්‍ය කරමින්, එහිදී අනුබලය සහ සම්පත් තුළට පවතින ප්‍රවේශය තීරණය කරන, *"සම්බන්ධතා, දැනහැඳුනුම්කම්, කොමිස් මුදල්, සහ කොන්ත්‍රාත්කරුවන්"* යන අත්‍යවශ්‍ය ජාල, පුරුෂ නායකයන් මගින් පාලනය කරන ආකාරය පැහැදිලි කරන ලදී.[67]

කාන්තාවන්ගේ සම්පත් සඳහා අසමාන ප්‍රවේශය, සංවර්ධන අරමුදල් වලින් ඔබ්බට ගොස්, බොහෝ අවස්ථාවන්හි දී දේශපාලන වෘත්තීන් පවත්වා ගැනීමට බලපාන වෘත්තීමය සංවර්ධන ඉඩප්‍රස්ථාවන් සඳහා බලපායි. මහනුවර සිට පැමිණි මන්ත්‍රීවරියක්, ජපානයේ පැවැති නගරාධිපතිවරුන්ගේ සමුළුවකට ඇයට ආරාධනා ලැබූ අවස්ථාවේ දී, ඔවුන්ගේ සියළු පිරිවැය ඔවුන්ගේ පළාත් පාලන ආයතන මගින් දරණ ලද ඇගේ අන්තර්ජාතික සගයන්ට මෙන් නොව, ඇයට එම චාරිකාව සඳහා තමන්ගේම මුදල් යෙදවීමට සිදු වූ බව

65 පුත්තලම 036, පුත්තලම දිස්ත්‍රික්කය. නොවැම්බර් 28, 2023.

66 Ibid.

67 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි පදිංචි, කාන්තා අයිතීන් පිළිබඳ ක්‍රියාධරයෙක්, පර්යේෂකයෙක්, සහ කාන්තා අයිතීන් සුරැකීමේ සංවිධානයක සම-නිර්මාතෘ. දෙසැම්බර් 11, 2023.

මතක් කර සිටියාය. එයට හාත්පසින්ම වෙනස් ලෙස, එයට සහභාගි වූ ඇගේ පළාත් පාලන ආයතනයෙහි පිරිමි සභාපතිවරයා, සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමෙන් ලද අවිධිමත් කොමිස් මුදලින් ඔහුගේ වියදම් පියවා ගත්තේය. එමගින් ආයතනික දූෂණය සහ අවිධිමත් මූල්‍ය ජාලයන් සඳහා ප්‍රවේශය මගින් පද්ධතිකමය ලෙස බහුතරයක් කාන්තාවන්ට ප්‍රවේශ විය නොහැකි, එනමුත් පුරුෂයන්ට වාසිදායක ඉඩප්‍රස්ථාවන් නිපදවන වන අයුරු ඉස්මතු කර පෙන්වයි.[68]

ස්ත්‍රීවාදී ආයතනිකවාදී දෘෂ්ටියකින් බලන කල්හි, මෙම කතාන්දර තුළින් නිරූපනය කරනු ලබන්නේ, පක්ෂ පද්ධති තුළ මෙන්ම පළාත් පාලන ආයතන තුළ පවතින අවිධිමත් ප්‍රතිමානයන්, නාමික නොවන ධූරාවලි, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බල ව්‍යුහයන් මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි ධූරාවලියන්, ප්‍රතිනිෂ්පාදනය කරන යාන්ත්‍රණයන් ලෙස ක්‍රියා කරන බවය. ඔවුන් විසින් පුරුෂ ආධිපත්‍යය පවත්වා ගැනීම සහ සත්‍ය අනුබලයට සහ අධිකාරියට පවතින කාන්තාවන්ගේ ප්‍රවේශය සීමා කිරීම කරයි (Chappell සහ Waylen 2013). කාර්යාලයෙහි නිල වශයෙන් වැඩ ආරම්භ කිරීමෙන් පසුවද, කාන්තාවන් බොහෝ අවස්ථා වලදී, විධිමත් භූමිකාවක් තුළ සිටින නමුත් තීරණ ගැනීමේදී සහ සම්පත් සඳහා ප්‍රවේශයෙහිදී පරිධියෙන් එහා සිටින, ඡන්දයෙන් තෝරා ගත් නමුත් බහිෂ්කරණය කරන ලද, "ස්ත්‍රී පුරුෂ සමාජභාවී පිටස්තරයන්" ලෙස සිටීමට සිදු වේ (Bjarnegård සහ Kenny 2016). මෙම අවිධිමත් ප්‍රතිමානයන් සහ බහිෂ්කරණීය ක්‍රියාවලියන් අභියෝගයට ලක් කරනා තෙක්, කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය, පරිවර්තනීය ලෙස නොව, සංකේතාත්මක ලෙස පවතිනු ඇත (Kanold 2020; Zetterberg 2009).

## 5.3 පවුල සහ ප්‍රජාව ඇතුළත දේශපාලනය සාකච්ඡා කිරීම

ශ්‍රී ලංකාව වැනි සාමූහික සංස්කෘතියක් තුළ, එදිනෙදා ජීවිතය හැඩගස්වා ගැනීමේ දී පවුල සහ ප්‍රජාව කේන්ද්‍රීය භූමිකාවක් රඟපාන අතර, කාන්තාවන්ගේ දේශපාලනයට අවතීර්ණ වීම, ඔවුන්ගේ සමාජ වටපිටාවෙන් එහා හුදකලාවීමක් තුළින් සිදු නොවීය. ස්ත්‍රී පුරුෂ සමාජභාව කෝටාව හඳුන්වා දීමෙන් පසුවද, පීතෘමූලික ප්‍රතිමානයන් කාන්තාවන්ට සුදුසු භූමිකාවන් නිර්වචනය කිරීම සිදුකරන අතරම, මෙම කාන්තාවන්ගේ සහභාගිත්වය ඔවුන්ගේ පවුල් සහ ප්‍රජාවෙහි බලාපොරොත්තු සමග තදින් බද්ධව පවතී. විධිමත් දේශපාලන ආයතන සමග එකට ගමන් කරන අතරතුර, කාන්තාවන් මෙම බලාපොරොත්තු සමග සාකච්ඡා කිරීම කළ යුතු දෙයක් වූ අතර බොහෝ අවස්ථා වලදී තවමත් පුළුල් ලෙස පුරුෂ-ආධිපත්‍ය සහිත යැයි සැලකෙන අවකාශයක ඔවුන්ගේ පැවැත්ම සාධාරණීය කළ යුතු ද විය. එබැවින් දේශපාලනයට අවතීර්ණය වීම සඳහා, සමාජීය ලෙස නියම කරන ලද සීමාවන්ගෙන් පිටතට අඩිය තැබීමට මෙන්ම, එමගින් පරීක්ෂාවට ලක්වීම්, ප්‍රතිරෝධය, සහ ඉහළ ගිය බලාපොරොත්තු වලට අනාවරණය වීමටද ඔවුන්ට සිදුවිය. මෙම පීඩනයන්, කාන්තාවන්ගේ පොදු සහභාගිත්වය නිතරම තරඟකාරී වූ ප්‍රජා මට්ටමෙහිදී මෙන්ම

68 මහනුවර 027, මහනුවර දිස්ත්‍රික්කය, 2024 පෙබරවාරි 28.

සාම්ප්‍රදායික ගෘහස්ත භූමිකා දැරිය යුතු වූ පෞද්ගලික තල තුළදී ද ඔවුන් අත්විඳිය යුතු විය.

දේශපාලන පක්ෂ සහ පළාත් පාලන ආයතන තුළින් ඔබ්බට ගිය විට, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය, ඔවුන් ජීවත් වන පුළුල් සමාජ සන්දර්භය අනුව ද හැඩගැසී ඇත. ශ්‍රී ලංකාව තුළ, පවුල සහ ප්‍රජාව මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා සහ අපේක්ෂාවන් පාලනය කිරීමෙහි ලා කේන්ද්‍රීය භූමිකාවක් රඟ දක්වයි. කෝටාව විසින් දේශපාලන කාර්යාලයට කාන්තාවන්ගේ විධිමත් ප්‍රවේශය පුළුල් කළ ද, ඔවුන්ගේ සහභාගිත්වය, පීතෘමූලික ප්‍රතිමානයන් ආදිය මගින් කාන්තාවන් සඳහා සුදුසු භූමිකා නිර්වචනය කරන, ඔවුන්ගේ පවුල් සහ ප්‍රජාවන්ගේ අපේක්ෂා සමග ඉතා ළඟින් බැඳී පවතී. විධිමත් දේශපාලන ආයතන සමග එකට ගමන් කරන අතරතුර, කාන්තාවන් මෙම බලාපොරොත්තු සමග සාකච්ඡා කිරීම කළ යුතු දෙයක් වූ අතර බොහෝ අවස්ථා වලදී තවමත් පුළුල් ලෙස පුරුෂ-ආධිපත්‍ය සහිත යැයි සැලකෙන අවකාශයක ඔවුන්ගේ පැවැත්ම සාධාරණීය කළ යුතු ද විය. එබැවින් කාන්තාවන්ට දේශපාලනයට ඇතුළත් වීම සඳහා සමාජයෙන් අනුමත කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා වලින් ඔබ්බට ගොස්, ඔවුන්ට තව තවත් වැඩි පරීක්ෂා කිරීම්, ප්‍රතිරෝධයන් සහ අපේක්ෂාවන්ට නිරාවරණය වීමට සිදු විය. මෙම පීඩනයන් පොදු සහ පෞද්ගලික තලයන් දෙක හරහාම ක්‍රියාත්මක විය. ප්‍රජාවන් අභ්‍යන්තරයෙහි දී, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය නිරන්තරයෙන් ප්‍රශ්න කෙරුණු අතර, ඒ සමගම නිවස තුළ සාම්ප්‍රදායික ගෘහස්ථ වැඩ කටයුතු සහ රැකබලා ගැනීමේ වගකීම් ඉටු කිරීම ද ඔවුන්ගෙන් අපේක්ෂා කෙරිණි.

පහත සඳහන් කණ්ඩයන් මගින් මෙම ගතිකයන් පරීක්ෂා කරනු ලබන්නේ, පළමුව, ප්‍රතිරෝධයෙහි ආකෘතීන් මත සහ ප්‍රජාවන් තුළ පවතින බලාපොරොත්තු සමග මුණගැසීම් මත වන අතර දෙවනුව, කාන්තාවන් දේශපාලන ජීවිතය සහ පවුලේ වගකීම සමබර කරගැනීමේ පීඩනයන්ට මුහුණ දෙන ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීමෙනි.

### 5.3.1 ප්‍රජාවෙහි බලාපොරොත්තු සහ පරීක්ෂා කිරීම් අතර ගමන් කිරීම

කෝටාව හඳුන්වා දීමට පෙර සිටම, ස්ත්‍රී දේශපාලන නියෝජනයෙහි වර්ධනයට ඇති ප්‍රතිරෝධය පැහැදිලි ලෙස දැකිය හැකිවිය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විවෘතව එහි අවශ්‍යතාවය ප්‍රශ්න කරමින්, කෝටාවට සම්බන්ධ පාර්ලිමේන්තු විවාද බොහෝ විට එදිරිවාදී ඒවා ලෙස සටහන් විය (Kodikara 2023). මෙම පසුතලයට ඉදිරියෙන්, නාමයෝජනා භාරදීම සහ ඉන්පසුව කාලය අතරතුර, කාන්තාවන්ගේ දේශපාලනයට අවතීර්ණ වීම, සැක සහිත සහ විහිළු සහගත ලෙස ප්‍රජාත්මක මට්ටමෙහිදී පත්වීම, පුදුමයකට කාරණයක් නොවේ. Kodikara (2023), උදාහරණයක් ලෙස, මුස්ලිම් පූජකයෙක් වූ නියාස් මවුලවී, සමාජ මාධ්‍ය තුළ වීඩියෝවක් සංසරණය කරමින්, මුස්ලිම් කාන්තා අපේක්ෂිකාවන්ට එරෙහිව දරුණු ප්‍රහාරයක් එල්ල කිරීම ගත හැක. තවත් පුළුල්ව සංසරණය වූ වීඩියෝ සටහනක, මිනිසෙක් ඔහුට ඔහුගේ එළදෙන සොයා ගත නොහැකි බව පවසන අතර, තවත් අයෙක් ඔහුට

උත්තර දෙමින් ප්‍රකාශ කරනු ලබන්නේ, 25% කෝටාව හේතුවෙන් එළදෙන නාම යෝජනා භාරදීමට ගොස් ඇති බව වන අතර මෙමගින්, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය සුළු කොට තකන සහ නීත්‍යානුකූලභාවය අහෝසි කරන ආකාරයන් නිරූපනය කරයි.

මෙවැනි ආකල්ප මාර්ගගත අවකාශ හෝ දුර සිට නිරීක්ෂණය කරන්නන්ට පමණක් සීමා නොවූ අතර, බොහෝ අවස්ථා වලදී, සංස්කෘතිමය සහ ආගමික ප්‍රතිමානයන් තුළ මුල් බැසගත් ප්‍රතිරෝධය පවතින ඔවුන්ගේම ප්‍රජාවන් තුළද, කාන්තාවන්ට දැකිය හැකි විය. උදාහරණයක් ලෙස, දේශපාලන නිල කාර්යාලයට ඇතුළ් වීමෙන් පසු, එක් මන්ත්‍රීවරියක් නිරීක්ෂණය කළ අන්දමට, ඔවුන්ගේ දායකත්වයන් අවසානයේදී සභාපති විසින් පිළිගත්තද, අනෙකුත් පුරුෂ සාමාජිකයන් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පමණක් පදනම්ව ඔවුන් ප්‍රතික්ෂේප කළ බවය.[69]

පළාත් පාලන කුටි තුළ පවතින මෙවැනි ආකල්පයන්, කාන්තාවන්ට ඔවුන්ගේ දේශපාලන ජීවිතය තුළ, අඛණ්ඩව ප්‍රතිරෝධයට සහ ආන්තීකරණයට මුහුණදීමට සිදුවන, ඔවුන්ගේ මැතිවරණ කොට්ඨාශ තුළ ප්‍රතිබිම්භගත විය. මන්ත්‍රීවරියන් කිහිප දෙනෙකු, ඔවුන්ගේ මැතිවරණ කොට්ඨාශයෙහි ජ්‍යෙෂ්ඨ කාන්තාවන් තමන්ගේ දේශපාලන සහභාගිත්වයට විරුද්ධ වූ ආකාරය විස්තර කළාය. එක් මන්ත්‍රීවරියක් ආවර්ජනය කරමින් මෙසේ ප්‍රකාශ කළාය :

*"ගොඩක් ගැහැණු කැමැති නැහැ ගැහැණු අය දේශපාලනය කරනවට, ඒ හින්දා එයාලගෙන් හරියට උදව්වක් හම්බ වුනේ නැති හින්දා අභියෝග ගොඩක් වැඩි වුනා."*[70]

ඇය මතක් කළ අන්දමට, මැතිවරණය අතරතුර, කොට්ඨාශය තුළ කාන්තා ඡන්ද දායකයන් 2000-3000ක් පමණ සිටි මුත්, එක් කාන්තා මන්ත්‍රීවරියක් ඡන්ද 300ක් පමණක් ලබාගත් බවය.[71] මෙම කාන්තාවන් විසින් කාන්තාවන්ට ඡන්දය නොදෙන ප්‍රපංචය, මූලික දැනුවත් කරන්නන් කිහිප දෙනෙකුගේම සම්මුඛ සාකච්ජා තුළ දී අනුනාද විය. මූලික දැනුවත් කරන්නා E, දේශපාලනය යනු කාන්තාවන්ට අප්‍රසන්න ස්ථානයක්ය යන පොදුජන විභවතාවයට එය සම්බන්ධ කළද,[72] මූලික දැනුවත් කරන්නා A, එය කාන්තාවන්ට උපතින්ම වඩා අඩු හැකියාවක් ඇති බවට පවතින සාමාන්‍ය විශ්වාසය සමග ඈඳී ඇති බව පැවසුවේය.[73]

මෙම කතාවන් තුළින් ප්‍රජා-මට්ටමෙහි ආකල්ප, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ධූරාවලියන් ප්‍රතිනිෂ්පාදනය කරන ආකාරය පිළිබිඹු කරන අතර, මෙම ගතිකය තේරුම් ගත හැක්කේ,

69 මඩකලපුව 016, මඩකලපු දිස්ත්‍රික්කය. නොවැම්බර් 15, 2023.
70 Ibid.
71 Ibid.
72 බස්නාහිර පළාතේ පදිංචි ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සංහිඳියාව ගොඩනැංවීම පිළිබඳ විශේෂ පර්යේෂක සහ උපදේශක. ඔක්තෝබර් 23, 2023. (මාර්ගගත සම්මුඛ සාකච්ජාවකි)
73 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥ සහ දේශපාලනඥ. නොවැම්බර් 6, 2023.

අභ්‍යන්තරීකරණය කරන ලද ස්ත්‍රී ද්‍රෝහීත්වය යන සංකල්පය ඔස්සේය. අභ්‍යන්තරීකරණය කරන ලද ස්ත්‍රී ද්‍රෝහීත්වය සිදු වන්නේ, ස්ත්‍රීන් විසින් කාන්තාවන් ආන්තීකරණය කරන අතරතුර, පුරුෂයන්ට වරප්‍රසාද ලබාදෙන පීතෘමූලික ප්‍රතිමානය උකහා ගෙන ඒවා ප්‍රතිනිෂ්පාදනය කිරීම සහ එමගින් තමන්ගේ යටහත්පහත්භාවය ස්ථාපනය කර ගැනීමෙනි (Findlay සහ Piggott 2005). අවසානයේදී, මෙම ගතිකය මගින්, කාන්තාවන්ගේ සම්පත්, නායකත්ව භූමිකා, සහ තීරණ ගැනීමේ අවකාශ සඳහා ප්‍රවේශය සීමා කරයි (Evteeva, Burges සහ Gelabert 2024).

පවත්නා සාහිත්‍යයට අනුව, අභ්‍යන්තරීකරණය කරන ලද ස්ත්‍රී ද්‍රෝහීත්වය යනු පුද්ගලික අසාර්ථකත්වයක් නොව ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආයතන තුළ ජීවත්වීමෙන් සහ ගමන් කිරීම මගින් ප්‍රක්ෂේපණය වන ව්‍යුහාත්මක ප්‍රතිඵලයක් ලෙස තහවුරු වේ. Evteeva, Burges සහ Gelabert 2024 අවධාරණය කොට පවසන පරිදි, කාන්තාවන් විසින් පීතෘමූලික ප්‍රතිමානයන් ප්‍රතිනිෂ්පාදනය කිරීම මගින්, පද්ධතිය මගින් පාඩු ලබන අය පවා එය පවත්වා ගැනීමේ සහ එය රැකගැනීමේ ආයතනික සමාජගතකරණයෙහි බලය ප්‍රක්ෂේපනය කරනු ලබයි. මෙම දෘෂ්ටිය ඔස්සේ, ස්ත්‍රී දේශපාලන පාත්‍රයන් කෙරෙහි පවතින කාන්තාවන්ගේ අවිශ්වාසය සහ ඔවුන්ගේ පුරුෂ-ආධිපත්‍යය දරන ප්‍රතිමානය කෙරෙහි අනුකූල වීමට පවතින නැඹුරුතාවය, ආයතන තුළ පවතින, "ස්ත්‍රී පුරුෂ සමාජභාවී පාලන තන්ත්‍රය" ස්ථාපනය කරනා වඩා පුළුල් වූ ක්‍රියාවලියක කොටසක් ලෙස සැලකිය හැකිය (Lovenduski 2011).

මුස්ලිම් මන්ත්‍රීවරියන් හට, මෙම අභියෝගයන්, ආගමික සහ සංස්කෘතික අපේක්ෂාවන් සමග අන්තර්ඡේදනය වී ආන්තීකරණයෙහි අමතර ස්ථර නිර්මාණය කරයි. ඔවුන්ගේ දේශපාලනයට අවතීර්ණ වීම කටකතා හෝ ඔවුන්ගේ ස්වාමි පුරුෂයා සහ පවුල රැකබලා ගනිමින් කාන්තාවන් සිටිය යුත්තේ ඔවුන්ගේ නිවස තුළ බවට අවධාරණය කරන ආගමික නායකයන්ගේ ඍජු ප්‍රතිරෝධය සමග සිදු වූ බවට කිහිප දෙනෙකු විස්තර කරන ලදි.[74] එනමුදු, කාලයත් සමග ප්‍රකට වන්නේ, සමහර ප්‍රජාවන් ඔවුන්ගේ නායකත්වය තුළින් ලැබෙන වරප්‍රසාද හඳුනාගෙන ඔවුන් පිළිගැනීමට පටන්ගත් බවය. දකුණු පළාතෙන් පැමිණි තවත් මුස්ලිම් මන්ත්‍රීවරියක් මෙයට සමාන අත්දැකීමක් බෙදාහදා ගනිමින්, දේශපාලනය යනු කාන්තාවන් යායුතු තැනක් නොවේ කියමින්, ආගමික නායකයන් ඇයගේ දේශපාලනය සමග පවතින සම්බන්ධයට විරෝධය දැක්වුවද, ඇයගේ පැවැත්ම මගින් ඔවුන්ට ශුභසිද්ධියක් වේ යැයි විශ්වාස කරමින්, ප්‍රජාවෙහි බහුතරයක් දෙනා ඇයට සහයෝගය දැක්වූ බව පැවසුවාය.[75] මෙම කතා අන්තර්ඡේදිත ප්‍රවේශයක වැදගත්කම ඉස්මතු කරන අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළින් වෙනස් කොට සැලකීම, සංස්කෘතික සහ ආගමික ප්‍රතිමානය සමග යුගළ වන විට තීව්‍ර වන ආකාරය පෙන්වයි (Kenny 2007).

74 කෑගල්ල 041, කෑගල්ල දිස්ත්‍රික්කය. මැයි 13, 2024.
75 ගාල්ල 024, ගාල්ල දිස්ත්‍රික්කය. මාර්තු 13, 2024.

මැතිවරණ ගතිකයන්ට එහා, ප්‍රජා-මට්ටමෙහි ප්‍රතිරෝධය ද, මන්ත්‍රීවරියන් ඔවුන්ගේ දවසේ කාර්යභාරය කරගෙන යන ආකාරය හැඩගැස්වීමට බලපාන ලදී. බොහෝ ගම්මාන වලදී, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය අපහරණය සහ බාලවයස්කාර ගැබ් ගැනීම් ආදිය පිළිබඳව ගැටළු සමග කාන්තා ප්‍රජා සාමාජිකාවන් ඔවුන් වෙත පැමිණි බවට කාන්තාවන් වාර්තා කරන ලදී. එක් මන්ත්‍රීවරියක් විස්තර කරන ලද්දේ, රාජ්‍ය අධිකාරි තුළින් ඍජුව උපකාර ඉල්ලීමට නොහැකි හෝ අකැමැති කාන්තාවන් බොහෝ අවස්ථා වලදී කාන්තා නියෝජිතයන් දෙසට හැරීම පහසු ලෙස සලකන බවය. මෙවැනි අවස්ථා වලදී, මන්ත්‍රීවරියන්, සුදුසු ක්‍රියා මාර්ග ගන්නා බවට තහවුරු කර ගැනීම සඳහා අදාළ නිළධාරීන් සමග සම්බන්ධීකරණය පවත්වා ගනියි.

කෙසේ වෙතත්, මෙම මන්ත්‍රීවරිය තවදුරටත් සනිටුහන් කරන ලද්දේ, දේශපාලන ක්‍රියාධරයන් සමග සම්බන්ධ නොවී, ඔවුන්ගේ බිරියන් "උයලා, රෙදි හෝදල ගෙදරට වෙලා ඉන්න ඕන" යැයි දැඩි සේ කියමින් සමහර පිරිමින් මෙම අන්තර්ක්‍රියාවන්ට විරෝධය පළ කළ බවය.[76] කාන්තාවන්ගේ පොදු අධිකාරිත්වය සහ පුරුෂ අධීක්ෂණයෙන් පිටත, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සහයෝගිතා ජාල නිර්මාණය වීමෙ හිදී ඇතිවන පුළුල් සංස්කෘතික කාංසාවන් මෙම විරෝධතාවයන් තුළින් හෙළි වෙයි.

මෙම අනුමානයන් අභියෝගයට ලක් කිරීම ඔවුන්ගේ දේශපාලන භූමිකාවෙහි අනිවාර්යය කොටසක් බවට පත්වුනු බවට සටහන් කරමින් *"අපි පළාත් පාලන ආයතන වලට ආවෙ පාරවල් හදන්න හරි ලයිට් හදලා දෙන්න විතරක් නෙවෙයි, ගමේ තියෙන ප්‍රශ්න හඳුනගෙන, ගැහැනු අයට උදව් කරලා ඒ අයට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සම්බන්ධ කරලා දෙන්න"* ලෙස මන්ත්‍රීවරිය අවධාරණය කරමින් ප්‍රකාශ කරන ලදී.[77] සදාචාරාත්මක පරීක්ෂා කිරීම් සිට ඔවුන්ගේ ප්‍රජාව සමග අන්තර්සම්බන්ධතා විමර්ශනය දක්වා වූ මෙම කාන්තාවන් මුහුණ දුන් සමස්ත ප්‍රතිරෝධය මගින් පෙන්වා දෙනු ලබන්නේ, සංස්කෘතික ප්‍රතිමානයන් තුළින් දේශපාලන නීත්‍යානුකූලභාවයට පමණක් නොව කාන්තා මන්ත්‍රීවරියන් ගේ දක්ෂතාවයට සහ අනෙක් කාන්තාවන්ට ඔවුන්ගේ ප්‍රජාව තුළ කාර්යය කරගෙන යාම සඳහා පවතින හැකියාව සීමාකිරීම සිදුකරන ආකාරයයි.

කාන්තාවන් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ සම්බන්ධකම් තබා ගැනීම හැඩගස්වන ලද සදාචාරාත්මක පරීක්ෂා කිරීම්, ඔවුන් පොදු අවකාශයේ තමන් ඉදිරිපත් කළ ආකාරය කෙරෙහි ද දිගු විය. සම්මුඛ සාකච්ජාවට ඉදිරිපත් වූ බොහෝ කාන්තාවන්, පළාත් පාලන ආයතන තුළට ඇතුළ් වූ පසු ඔවුන්ගේ බාහිර පෙනුම, ඔවුන් "වෘත්තීමය" ලෙස පෙනීම සඳහා ප්‍රවේශමෙන් කළමණාකරණය කළ ආකාරය මෙන්ම බොහෝ දෙනෙකු සුදු හෝ ලා පැහැති වර්ණ සාරි තෝරා ගැනීම වැනි දෑ කළ බව විස්තරාත්මක ලෙස ප්‍රකාශ කළහ. එක් මන්ත්‍රීවරියක් "පන්සල් යන විදිහට ඇඳගෙන ගියා"[78] යනුවෙන් ඔවුන් ඇඳුම් ඇඳගෙන යන

76 ගාල්ල 023, ගාල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 17, 2024.
77 Ibid.
78 මහනුවර 028, මහනුවර දිස්ත්‍රික්කය. ඔක්තෝබර් 25, 2023.

ආකරය විස්තර කිරීම මගින්, වැදගත්කම සහ පොදු නීත්‍යානුකූලභාවය, එක්තරා විශේෂිත ආකාරයක ස්ත්‍රී නියෝජනයක් හා ඉතා තදින් බද්ධව ඇති බවට හඟවයි.

මෙය ස්වයං-වාරණ ආකෘතියක් ලෙස පෙනෙන නමුත්, ස්ත්‍රීවාදී ආයතනිකවාදීන් යෝජනා කරනු ලබන්නේ, මෙවැනි භාවිතයන් හැඩගස්වා ඇත්තේ, දේශපාලනය තුළ සිටිනා කාන්තාවන්ට සුදුසු චර්යාව ලෙස, වඩා පුළුල් අවිධිමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිමාන මගින් ලබා දුන් අර්ථකතනයක් මගින් බවය. කාන්තාවන් බොහෝ අවස්ථාවන්හිදී, ඔවුන්ගේ බාහිර පෙනුම පාලනය කරනු ලබන්නේ, හුදෙක් පෞද්ගලික කැමැත්ත මත නොවේ. ගෞරවනීය සහ නීත්‍යානුකූල මහජන නියෝජිතයන් ලෙස බාහිරට පෙන්නුම් කිරීම උදෙසා, කාන්තා දේශපාලකයන් පෙනී සිටිය යුතු ආකාරයෙහි අපේක්ෂාවන්ට ප්‍රතිචාරයක් ලෙසය. මෙම සම්මුඛ සාකච්ඡාවන් පෙන්නුම් කරනු ලබන්නේ, බොහෝ කාන්තාවන් හට, දේශපාලන නීත්‍යානුකූලභාවය බැඳී පැවතියේ, මන්ත්‍රීවරියන් ලෙස ඔවුන්ගේ කාර්යභාරය ඉටුකිරීමේ හැකියාව මත පමණක් නොව, ස්ත්‍රීත්වය, නිහතමානීකම, සහ ගෞරවනීයභාවය පිළිබඳ සංස්කෘතිකව පිළිගත් සංකල්පයන්ට අනුව අනුගත වීමේ ඔවුන්ගේ හැකියාව මත බවය.

මෙයට පැහැදිලි සාක්ෂි, සම්මුඛ සාකච්ඡා තුළදී දැකගත හැකි විය. රත්නපුරේ සිට පැමිණි එක් මන්ත්‍රීවරියක් පැහැදිලි කරන ලද්දේ, "නිළියක්" ලෙස පෙනෙනවාට වඩා ඇය වෘත්තීමය ලෙස ඇයගේ බාහිර පෙනුම පවත්වා ගැනීමට කැමති බවය. මන්ත්‍රීවරියන් සහ නිළියන් සංසන්දනය කිරීමෙන්, ඇය ගෞරවනීයභාවය සහ ආකර්ෂණීයභාවය අතර පුළුල්ව පවත්නා සමාජ වෙනස්කම පෙන්වා දෙන ලදී. දේශපාලනයෙහි නියුතු කාන්තාවන් එක් සුවිශේෂී ආකාරයක නිහතමානී ස්ත්‍රීත්වයෙහි ආකෘතියක සිටීම අපේක්ෂා කරන බවට ද ඇය යෝජනා කළාය. ඇය තවදුරටත් තර්ක කරමින් කියා සිටියේ, සුදුසු ආකාරයට ඇඳුම් ඇඳීමෙන්, මහජන සේවකයන් ලෙස ඔවුන්ගේ භූමිකාව පිළිඹිබු වන බවත් එමගින් "අනවශ්‍ය පවුල් ප්‍රශ්න" මග හරවා ගත හැකි බවත්ය; එමගින් කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය, පවුලේ සහ ප්‍රජාවේ අපේක්ෂාවන්ගේ කාච හරහා තවදුරටත් පරීක්ෂාවට ලක්වන බව දැක්විය හැක.

මෙම සොයාගැනීම් කාන්තා ගරුත්වය පිළිබඳ දකුණු ආසියාවේ පවතින පුළුල් ගොඩනැගීම් තුළින් ද තේරුම් ගත හැකි වේ. කාන්තාවන්ගේ ගරුත්වය බොහෝ අවස්ථාවන් හිදී විනීතභාවය, ගුණවත්භාවය, සහ සංවරභාවය යන ගුණාංගයන්හි පරමාදර්ශ සමග බැඳී පවතින අතර සාරිය වැනි පාරම්පරික ඇඳුමක් මගින් එම ගුණාංග වල දෘශ්‍යමය සලකුණක් ඉදිරිපත් කරයි (Jayawardena 2002, De Alwis 1994). මෙයට සාක්ෂි ලෙස සම්මුඛ සාකච්ඡා තුළින්, කාන්තා දේශපාලකයෙකු ලෙස ඔවුන් කෙසේ තමන් ඉදිරිපත් කළ යුතු ද යන්න සාකච්ඡා කරන අවස්ථාවේදී, කලාතුරකින් සාරිය හැර වෙනත් ඇඳුම් ආකාරයක් කාන්තාවන් යෝජනා නොකළ බව දැක ගත හැකි විය. මෙම සොයාගැනීම් Obeyesekere (1984/1987) විස්තර කරන ආකාරයට, සමාජ විනිශ්චය සහ ප්‍රතික්ෂේප වීම බලාපොරොත්තුවෙන් ඔවුන්ගේ චර්යාව පාලනය කරන, ශ්‍රී ලාංකිකයන් විසින්

සමාජගත කරන සංකල්පයක් වන "ලැජ්ජා-බය" ලෙස ද නිර්වචනය කිරීමට හැකිය. කාන්තා සහ පිරිමි දෙපාර්ශවයටම මෙය අදාළ වන අතර, ශාස්ත්‍රඥයන් සලකුණු කරන ආකාරයට පොදු ජීවිතයට ප්‍රවේශ වන කාන්තාවන් බොහෝ අවස්ථාවන් හිදී, කීර්තිය පිළිබඳ අවධානය විශේෂයෙන්ම වැදගත් වන ආකාරයකට, උග්‍ර ලෙස පරීක්ෂා කිරීම් සහ නිරීක්ෂණයට ලක්වීම් වලට භාජනය වේ. මෙම නිර්වචනය, පවත්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ යෝග්‍යතාවයේ තර්කනයට අනුගත වීමට නොහැකි වන අය, බොහෝ අවස්ථාවන් හිදී, අපගමිකයන් ලෙස සලකා ඔවුන් උපහාසයට සහ සමාජ දණ්ඩනයට පාත්‍ර වන බවට වන Chappell සහ Waylen ගේ (2013) තර්කය සමග අනුනාද වේ. මෙම ආකාරයෙන් බලන කළ, නිහතමානී සහ ගෞරවනීය ඇඳුම මත තබන ලද අවධාරණය, සරලව පෞද්ගලික කැමැත්තක් ලෙස නොව, දේශපාලන සහ සමාජ තලයන් දෙකෙ හිදිම විවේචනය මගහැරීමට සහ නීත්‍යානුකූලභාවය පවත්වා ගැනීමට කාන්තාවන් විසින් සිදුකරන ලද උපාය මාර්ගයක් ලෙස තේරුම් ගත යුතු වේ.

වැදගත් කාරණය නම්, අවධාරණය යොමුව පවතින්නේ පෞද්ගලික කීර්තිය මත පමණක්ම නොවීමය. ශාස්ත්‍රඥයන් තර්ක කරන ලද ආකාරයට, කාන්තාවන් හට, බොහෝ අවස්ථාවන් හිදී, කීර්තියට හානි පැමිණීම පෞද්ගලික මට්ටමට එහා ගොස් තමන් අරමුණු කරගත් ගෞරවය සහ පවුලේ තමන් සිටින ස්ථානය කෙරෙහි ද බලපායි (De Alwis 2002; de Silva 2005; Hewamanne 2008). මෙය ඇතැම් සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ කාන්තාවන්, ඔවුන්ගේ බාහිර පෙනුම සමග පවුල් ආරවුල් සම්බන්ධ කිරීම පිළිබඳ පැහැදිලි කර ගැනීමට උදව් විය හැක. මෙම ප්‍රකාශයෙන් පොදු අවකාශයේ දී ඔවුන් ගේ හැසිරීම සහ ඉදිරිපත් කිරීම මගින් ඔවුන් සම්පූර්ණයෙන්ම තනි දේශපාලකයන් ලෙස පමණක් නොව ඔවුන් ගේ පවුල් සහ ප්‍රජාවන් හි නියෝජිතයන් ලෙස ද විනිශ්චයට ලක්වන බවට වන ඔවුන්ගේ දැනුවත්භාවය පිළිබඳ හඟවයි.

විශේෂයෙන්ම, අවධාරණය පවතින්නේ හුදු සාරියක් ඇඳීම මත පමණක් නොව, සුදු හෝ ලා පැහැති වර්ණ සාරි ඇඳීම මත වීම ය. කාන්තාවන් පුන පුනා සුදු වර්ණ ඇඳුම් සඳහන් කිරීම මගින් මතු කරන කාරණය නම්, සාම්ප්‍රදායික ස්ත්‍රීත්වය මත පමණක් නොව, නිහතමානීත්වය, කීකරුබව සහ සදාචාරාත්මක අධිකාරිය සමග ද ගෞරවනීයභාවය සම්බන්ධ වී පවත්නා බවය. සුදු ඇඳුම, විශේෂයෙන්ම ශ්‍රී ලාංකික සංදර්භය තුළ දී, බොහෝ අවස්ථාවන් හිදී පිවිතුරු බව, ගෞරවය, සහ ආගමික වතාවත් පිළිපැදීම සමග සම්බන්ධව පවතී. කාන්තාවන් කිහිප දෙනෙක්, එබැවින්, මහජන නියෝජිතයන් ලෙස ඔවුන්ගේ නීත්‍යානුකූලභාවය පවත්වා ගෙන යන අතරතුර, ඔවුන්ව පරීක්ෂා කිරීමට අවම ලෙස ලක්වන ආකාරයෙහි මෝස්තරයකින් හෙබි ඇඳුමක් තෝරා ගත් බව පෙනී යයි.

මෙම අපේක්ෂාවන් පෞද්ගලික තෝරා ගැනීමෙන් ඔබ්බට ගොස්, ආයතනික භාවිතාවන් තුළ කිඳා බැස ඇති බව පෙනෙන්නට ඇත. කිසිදු විධිමත් පළාත් පාලන පටිපාටියකින් මන්ත්‍රීවරුන් ගේ ඇඳුමෙහි වර්ණය පාලනය නොකරන මුත්, එක් මන්ත්‍රීවරියක් කියා

සිටියේ, බදුල්ල දිස්ත්‍රික්ක යෙහි එක් කවුන්සිලයක සභාපතිවරයෙක් සෑම වසරකම කාන්තා මන්ත්‍රීවරියන්ට සුදු සාරි බෙදා දෙන බවය.[79] විධිමත් නීති කිසිවක් නොමැති වීමෙන්, මෙම භාවිතය පැවතීම සහ එහි එකතුවෙන්, අවිධිමත් ස්ත්‍රී පුරුෂ අපේක්ෂාවන් ආයතනික ගතවිය හැකි ආකාරය සහ දේශපාලන අවකාශයන් තුළ එය ප්‍රතිනිෂ්පාදනය වන ආකාරය මෙමගින් නිරූපණය වේ. මෙවැනි උදාහරණයන් තුළින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී කෝටාව වැනි යාන්ත්‍රණ මගින් දේශපාලන සහභාගිත්වයට පවතින විධිමත් සීමාකම් පිළිබඳව ආමන්ත්‍රණය කර තිබියදී පවා, කාන්තාවන් බාහිර පෙනුම සහ ගෞරවනීයත්වය පිළිබඳව වන නොලියන ලද නීති ඔස්සේ ගමන් කරන ආකාරය පෙන්නුම් කරයි.

### 5.3.2 ගෘහස්ත වගකීම සහ දේශපාලන ජීවිතය සමබර කරගැනීම

සම්මුඛ සාකච්ඡා තුළින් මතු වූ පුනරාවර්තිත තේමාවක් වනුයේ, ගෘහස්ත වගකීම් සමග දේශපාලන ජීවිතය සමබර කරගැනීමෙහි පවතින නොනවතින අරගලයයි. සමහර කාන්තාවන්ට තමන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහා අවිධිමත් සහයෝග ජාල පැවතිය ද, ආහාර පිසීම, පිරිසිදු කිරීම, සහ ළමයින් බලා ගැනීම වැනි ගෙදරදොර වැඩකටයුතු වල අතිමහත් බර ඔවුන් විසින්ම දරා ගන්නා ලදි. මෙම ද්විත්ව වැඩ බර මගින් තේරුම් ගත හැක්කේ, බොහෝ අවස්ථාවන්හිදී, දේශපාලන වගකීම් ඔවුන්ගේ ප්‍රාථමික භූමිකාව වන රැකබලාගන්නන් වටා සැකසිය යුතු බවය. එක් මන්ත්‍රීවරියක් මෙය විචිත්‍රවත් ලෙස, ඇයට මවක් ලෙස පැවරී ඇති කාර්යභාරය බොහෝ විට ඇගේ දේශපාලන භූමිකාව අතික්‍රමණය කරන බව විස්තර කරමින් මෙසේ ප්‍රකාශ කළාය:

*"මගේ මූලික අවධානය තිබුනේ ගෙදර වැඩ වලට. මම පළාත් පාලන ආයතනයට ගියේ මාසෙකට සැරයක් තියෙන කොමිටි රැස්වීමට....ගෙදර ඉන්නකොට, මම වැඩිපුරම කරන්නෙ ළමයි බලාගන්න එක, මගේ අම්මා උයනවා. මගේ බබාට මාස තුනක් විතර වයස වෙනකොට, මම පළාත් පාලන ආයතනයට ගිහිං අවශ්‍ය කරන ලිපි ලේඛන වලට අත්සන් කරලා, විනාඩි 15ක් ඇතුළත වගේ මගේ බබාට කිරි පොවන්න ආපහු ගෙදර එනවා. මම මේ විදිහට අවුරුදු දෙකක් විතර කළා. කාලයක් යද්දි, මම පළාත් පාලන ආයතනේ රැස්වීම් ඉවර වෙනකල් ඉන්න පටන් ගත්තා."*[80]

මෙවැනි පෞද්ගලික කතාන්දර තුළින් ශ්‍රී ලංකාව තුළ සංස්කෘතිකමය ලෙස, දරුවන්ගේ, වැඩිහිටියන්ගේ, සහ නිවසේ වැඩකටයුතු වල සම්පූර්ණ වගකීම කාන්තාවන් දැරිය යුතු සහ පුරුෂයන් ප්‍රාථමික ලෙස උපයන්නන් ලෙස ස්ථානගතව පවතින වඩා පුළුල් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිමානයක් පිළිබිඹු කරයි. ආහාර වේල් සැකසීමේ සිට පාසල් කටයුතු කළමනාකරණය, රෝගීන් රැක බලාගැනීම, සහ ගෘහස්ත කාර්යයන් වැනි කාන්තාවන් නොමිළයේ කරන සත්කාරක ක්‍රියා, අදෘශ්‍යමාන නමුත් අත්‍යවශ්‍ය ලෙස පවතියි. මෙම වගකීම් බොහෝ අවස්ථා වලදී ශ්‍රමය ලෙස රාමුගත නොවන අතර, ආදරය, රාජකාරිය,

79 බදුල්ල 015, බදුල්ල දිස්ත්‍රික්කය. දෙසැම්බර් 08, 2023.
80 ගාල්ල 024, ගාල්ල දිස්ත්‍රික්කය. මාර්තු 13, 2024.

හෝ සංස්කෘතික අපේක්ෂාවන්, ස්ත්‍රියක් වීමේ කොටසක් ලෙස සලකයි (Kottegoda 2023).

මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ශ්‍රම විභජනය, සුරැකීම පිළිබඳ සමාජීය අපේක්ෂාවන්, ධාරිතාව-වර්ධනය කරනා වැඩමුළුවකදී මනාවට ප්‍රකාශ වූ අතර, එහිදී කාන්තා දේශපාලනඥවරියකු මහ-රාත්‍රියෙහි පැවැති රූපවාහිනී දේශපාලන කතිකා වැඩසටහන් වලට ආරාධනා ලැබීමෙන් අනතුරුව, ඇයගෙන් සහ ඒවාට සහභාගී වූ අනෙකුත් කාන්තාවන්ගෙන් බොහෝ අවස්ථාවන් වලදී, ඒවාට සහභාගී වීමට පෙරාතුව, *"ළමයින් නිදි කරලද ආවෙ"* යනුවෙන් අසන ලද බව කියැවිණි. මෙම ප්‍රශ්නය කිසිදු විටක පුරුෂ දේශපාලනඥයෙකුගෙන් නොඅසන බව ඇය පෙන්වා දුන්නාය. කාමරයෙහි සිටි අනෙක් අය එයට එකඟ වූ අතර, මෙවැනි ප්‍රකාශයන් මගින් පෙන්වා දෙනු ලබන්නේ විධිමත් දේශපාලන අවකාශයක වුවද, කාන්තාවන් දකිනු ලබන්නේ ඔවුන්ගේ ගෘහස්ත කාර්යභාරයෙහි දෘෂ්ටිය තුළින් බවය. මෙවැනි සඳහන් කිරීම්, පෙනුමෙන් අවිහිංසක වුවද, සත්කාරක සේවය කාන්තාවන්ගේ රාජකාරියක් වන බවට වන අදහස සුමට ලෙස ප්‍රතිස්ථාපනය සහ පොදු තලයෙහි ඇගේ පැවැත්ම, ඇයගේ පෞද්ගලික වගකීම් වල කොන්දේසි මත සාධාරණීයකරණය කළ යුතු බවට හඟවයි.

මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි අපේක්ෂාවන් විසින් බොහෝ මන්ත්‍රීවරියන් තමන්ගේ දවසේ වැඩකටයුතු සඳහා අවතීර්ණ වන ආකාරය හැඩගස්වයි. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ කිහිපදෙනෙක්, ගෙදරදොර වැඩකටයුතු සියල්ල නිමකිරීම; ආහාර වේල් සැකසීම, දරුවන් පාසල් වෙත යැවීම, පළාත් පාලන ආයතන රැස්වීම් හෝ දේශපාලන කටයුතු වලට සහභාගී වීමට පෙර නිවස අස්පස් කර ඒම යනාදී සියල්ල කළ යුතු බව විස්තර කරන ලදි. එක් විශේෂයෙන් සඳහන් කළයුතු අවස්ථාවකදී, බදුල්ලේ සිට පැමිණි නියෝජිතවරියක් සභාවේ වැඩකටයුතු වන අවස්ථාවේදී දරුවා බලාගැනීමේ වගකීම ඇගේ මව මත තබමින්, ඇය ඇගේ ළදරුවා පළාත් පාලන රැස්වීමට රැගෙනා ආ ආකාරය විස්තර කරන ලද අතර,[81] එම තීරණය මගින් ඇගේ කැපවීම සහ වැඩ කරන මව්වරුන් සඳහා ව්‍යුහාත්මක සහයෝගයක් නොමැතිකම යන දෙකම පෙන්නුම් කරයි.

සම්මුඛ සාකච්ඡාවන් පුරාවටම, බොහෝ කාන්තාවන් ඔවුන් දේශපාලන වේදිකාවට අවතීර්ණ වන විට ඔවුන්ගේ සහකරුවන්ගෙන් සහ විස්තීර්ණ පවුල් තුළින් ලද දිරිමත් කිරීම සම්බන්ධව කෘතඥතාව ප්‍රකාශ කරන ලදි. කෙසේ නමුත්, සමීප පරීක්ෂා කිරීමකින් පසු මෙම ප්‍රායෝගික උපකාර බොහෝ ලෙස එකිනෙකාගෙන් එකිනෙකාට වෙනස් බව හෙළිදරව් විය. පුරුෂ සහකරුවන්ගේ සහයෝගය බොහෝ විට සංකේතාත්මක හෝ සදාචාරාත්මක වූ අතර, ප්‍රායෝගික ලෙස දරුවන් රැකබලා ගැනීම සහ නිවසේ වැඩකටයුතු සම්භාරය සඳහා සහාය සාමාන්‍යයෙන් කාන්තා ඥාතීන් විසින් ලබාදෙන ලදී. මව්වරුන්, නැන්දම්මාවරුන්, සහ සහෝදරියන් විසින් බොහෝ අවස්ථා වලදී ගෘහස්ත

81 බදුල්ල 013, බදුල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 14, 2024.

වැඩ සම්භාරයෙහි බර කරට ගැනීමට ඉදිරිපත් වූ අතර, එමගින් මෙම කාන්තාවන් හට රැස්වීම් සඳහා සහභාගී වීමට, මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර වල නියැලීමට, හෝ දේශපාලන කටයුතු සඳහා සංචාරය කිරීමට අවස්ථාව ලබාදෙන ලදි.

*"මගේ නැන්දම්මා මට ගොඩක් උදව් කළා, එයයි මායි දෙන්නම ගෙදර වැඩ සමානව බෙදාගෙන කළා. එයා හින්දා මට ගෙදරදොරේ වගකීම් වලට සම්බන්ධ වෙන්න වුනේ අඩුවෙන්, නමුත් ඒවට යන වියදම සම්පූර්ණයෙන්ම දරන ගමන් ගෙදර, ළමයින් සහ සැමියා රැකබලා ගත්තා. රැස්වීම් ගොඩක් වෙලාවට හවස 1.30ට හරි 2.00ට හරි ඉවර වෙනවා, ඊට පස්සෙ මම ගෙදර ඇවිත් ගෙදර තියෙන වැඩ ටික ඉවර කරනවා."*[82]

කෙසේ නමුත්, මෙම පවුල් "සහයෝගය" පිළිබඳ කතාවන් බොහෝ අවස්ථාවලදී, සියුම් නමුත් සුවිශේෂී වූ පාලනයෙහි මූලිකාංග වලින් සමන්විත වේ. එක් මන්ත්‍රීවරියක් විසින් ඇයගේ පවුලෙන් ඇයට සහයෝගය ලැබුණද, ඇගේ සහෝදරයා ඇයට ඇගේ දේශපාලන වෘත්තීය එක් ධූර කාලයකට (වසර හතරකට) පමණක් සීමා කිරීමට උපදෙස් දුන් බවත්, ඇය එය පිළිගත් බවත් පැහැදිලි කළාය. ඇය තවදුරටත්, කිසිදා දේශපාලන උත්සව සඳහා තනිවම සහභාගී නොවුන බවත්, සියළුම රැස්වීම් සහ භාරධූරයන් සඳහා ස්වාමි පුරුෂයා හෝ සහෝදරිය සමග සහභාගි වූ බවත් සනිටුහන් කළාය.[83] මෙවැනි කොන්දේසි මගින් පවුල් සහයෝගයෙහි ආඛ්‍යානය සංකීර්ණ කරන අතර, එමගින් කාන්තාවන්ගේ දේශපාලන සහගිත්වය, නිරන්තරයෙන් කොන්දේසි සහගත, අධීක්ෂණය කරන ලද, සහ පිරිමි ඥාතීන් විසින් සීමාසහිත කරන ලද දෙයක් ලෙස යෝජනා කරයි.

මෙම සංකේතාත්මක සහකරු සහයෝගයෙහි රටාව, සක්‍රිය ලෙස පුරුෂයන් විසින් කරනු ලබන ප්‍රවේශය අවහිර කිරීම් අවස්ථා සමග සාපේක්ෂ ලෙස සංසන්ධනය කළ විට තවත් සංකීර්ණ වේ. එක් සම්මුඛ සාකච්ජාවට සහභාගී වූ අයෙක් නිරීක්ෂණය කළ අන්දමට, ස්වාමි පුරුෂයන්ගේ අකැමැත්ත හේතුවෙන්, කාන්තාවන් කිහිප දෙනෙක් පුහුණුවීමේ වැඩසටහන් වලට සහභාගී වීම ප්‍රතික්ෂේප කරන බව සහ ඇතැම් ස්වාමි පුරුෂයන් විසින් තමන්ගේ භාර්යාව දේශපාලනයට සහභාගි වනවා දැයි සම්පූර්ණයෙන්ම තීරණය කරන බවය.[84] මෙම උදාහරණයන් මගින්, පවුල් බාහිරින් සහයෝගීත්වය දක්වන බව පෙන්නුම් කළද, පිරිමි ප්‍රවේශය හෙවත් අවහිර කරන්නන්ගේ අවසරය මත, කාන්තාවන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය, දිගින් දිගටම හැඩගස්වන ආකාරය පෙන්නුම් කරයි.

සියල්ල එකට ගත් කළ, මෙම කතා පෙළ මගින්, අසමාන පද්ධතියක් තුළ කාන්තාවන්ට දේශපාලන සහ ගෘහස්ත වගකීම් සමග කේවල් කිරීමට බලකරන, පවුල සහ දේශපාලන ව්‍යුහයන් යන දෙක තුළම පීතෘමූලික ප්‍රතිමානයන් ආයතනිකගත වී ඇති අන්දම උලුප්පා පෙන්නුම් කරයි. ස්වාමි පුරුෂයන් බොහෝ විට වාචික දිරිමත් කිරීම හෝ "අවසරය" ලබා

82 මන්නාරම 031, මන්නාරම් දිස්ත්‍රික්කය. ජූනි 7, 2024.
83 ගාල්ල 024, ගාල්ල දිස්ත්‍රික්කය. මාර්තු 13, 2024.
84 ගාල්ල 023, ගාල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 17, 2024.

දෙන අතරතුර, ඉතා කුඩා ප්‍රමාණයක පිරිසක්, කාන්තා ඥාතීන්ට එහි බර අවශෝෂණය කරගැනීමට සිදුවන, සත්‍ය වශයෙන්ම පවතින ගෘහස්ත වැඩ කන්දරාව පිළිබඳ විස්තරය බෙදාහදා ගත්තෝය. මෙහි ප්‍රතිඵලය වන්නේ Hochschild සහ Machung (2012) විස්තර කරන පරිදි "දෙවන වැඩමුරය"; එනම් විධිමත් දේශපාලන කාර්යයන්ගෙන් පසුව, ගෙවීමක් නොලබන ගෘහස්ත ශ්‍රමය කාන්තාවන් විසින් භාරගැනීම මගින් නිදන්ගත "කාල දරිද්‍රතාවය" (Ranatunga සහ Dunusınghe 2021) නිෂ්පාදනය කිරීමයි. එබැවින් දේශපාලන ක්‍රියාකාරීත්වය කළ හැක්කක් වන්නේ, ආයතනික ප්‍රතිසංස්කරණයන් හේතුවෙන් නොව, පවුල් තුළ සිටින අනෙකුත් කාන්තාවන්ගේ, ගෙවීමක් නොකරන හෝ හඳුනානොගත් ශ්‍රමය හේතුවෙනි.

මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අපේක්ෂාවන්, සංස්කෘතිකමය ලෙස පමණක් ප්‍රතිස්ථාපනය කරන ලද ඒවා නොව, දේශපාලන ආයතන ඔවුන් විසින්ම ව්‍යුහාත්මක ලෙස නිදන්ගත කරන ලද ඒවාය. මූලික දැනුවත් කරන්නා A නිරීක්ෂණය කරන අන්දමට, ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ බොහෝ අවස්ථාවලදී, "නෛසර්ගිකවම ජාතිකවාදී, ස්වෝත්තමවාදී, සහ ස්ත්‍රී විරෝධී" වේ.[85] කාන්තාවන්ගේ යථාර්ථයට ඉඩ සලස්වා දෙනු වෙනුවට, උදාහරණයක් ලෙස, දරුවන් රැස්වීම් සඳහා රැගෙන ඒමට අවසරය ලබාදීම වෙනුවට, පක්ෂ සාමාන්‍යයෙන්, කාන්තාවන් විසින්ම ඔවුන්ගේ රැකබලා ගැනීමේ ගැටළු නිරාකරණය කර ගනිතැයි බලාපොරොත්තු වෙති. මෙමගින්, රැකබලා ගැනීම යනු, සාමූහික හෝ ඔවුන් සහයෝගය දැක්වීමට බැඳී සිටින ආයතනික කාරණයක් නොව, කාන්තාවන්ගේ පෞද්ගලික වගකීමක් බවට වන උපකල්පනය තහවුරු කරයි.

මෙම රාමුගතකරණය මගින්, වඩා පුළුල්ව පැතිර පවතින ගැටළුවක් වන, මෙම කාන්තාවන් දවස මුළුල්ලේම නිවෙස් තුළ වැඩකරනු ලැබුවද, ඔවුන්ට ගෙවීමක් නොලැබෙන, රැකබලා ගැනීමේ කාර්යයන් කිරීමට නොහැකි වීම හෝ ඒවා වෙනත් අයෙකුට භාරදීමට නොහැකි වීමෙන්, කාන්තාවන් බොහෝ අවස්ථාවලදී ගෙවීමක් කරන ශ්‍රමයෙන් සම්පූර්ණයෙන් ඉවත් කොට තැබීමේ හෙවත් "ආර්ථිකව අක්‍රීය" තත්ත්වය මෙමගින් පෙන්නුම් කරයි (Kottegoda 2023). දේශපාලන ජීවිතය තුළ දී, මෙහි ප්‍රතිඵලය සමානය. කිසිදු පැමිණිල්ලක් නොකර, ව්‍යුහාත්මක සහයෝගයක් නොමැතිව, සහ නිවස කළමනාකරණය කළ යුත්තේ කවුදැයි යන පීතෘමූලික උපකල්පනයන්ට බාධාවක් නොකර කාන්තාවන්ගේ සහභාගිත්වය අපේක්ෂා කරයි. ඔවුන්ගේ සහභාගිත්වය සමාන ඉඩප්‍රස්ථාවක් නොව අවිනිශ්චිතයක් වන නමුත් එය බහිෂ්කරණයෙහි සැඟවුනු මිළ අවශෝෂණය කරගැනීමේ සහ ගමන් කිරීමේ හැකියාව මත තීරණය වන්නක් වන අතර, ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වය, ඔවුන්ගේ ගෘහස්ත භූමිකාවෙහි වියදමින් කිසිසේත්ම සිදු නොවිය යුත්තක් බවට පවතින අදහස තහවුරු කරන්නක්ද වේ.

85 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි පදිංචි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබද විශේෂඥ සහ දේශපාලනඥ. නොවැම්බර් 6, 2023.

මූලික දැනුවත් කරන්නා [P] විසින් සංස්කෘතිමය වෙනස්වීම් ක්‍රමානුකූල ක්‍රියාවලියක් වන බැවින්, එය ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණය මගින් උත්ප්‍රේරණය කළ හැකි බවට තර්ක කරන ලදී. මූලික දැනුවත් කරන්නා සලකුණු කරන ලද ආකාරයට, සත්‍ය ප්‍රගතිය යනු, පුද්ගලික කැපකිරීම මත සම්පූර්ණයෙන් රඳා පවතින්නක් නොවේ. ඇයට දැරිය හැකි ළමා රැකවරණ සේවා, වැඩිහිටියන් රැකවරණ සේවා සඳහා රාජ්‍ය ආයෝජනය සහ කාන්තාවන් විසින් දරාගනු ලබන අසමානුපාතික බර අවම කරගැනීම සහ පොදු ජීවිතය තුළදී සාධරණීය සහභාගිත්වයක් සඳහා ඉඩකඩ ලබා දීමේ සමාජ ආරක්ෂාව සඳහා පද්ධතිමය මැදිහත්වීමක හදිසි අවශ්‍යතාවය අවධාරණය කළාය.[86] මෙවැනි වෙනසක් නොමැතිව, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය, අවිනිශ්චිත, කොන්දේසි සහගත, සහ ඔවුන්ගේ නිවැස් සහ වක්‍රාකාරව ඔවුන්ගේ පොදු භූමිකාව යන දෙකම පවත්වා ගෙන යන අදෘශ්‍යමාන ශ්‍රමය මගින් සීමා කරනු ලබයි.

කෝටාව හඳුන්වා දීම, සුවිශේෂී සන්ධිස්ථානයක් වුවත්, දේශපාලනික පළාත් පාලන ආයතන තුළ ගැඹුරින් පවත්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවී ස්වභාවය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා එය ප්‍රමාණවත් නොවන බව, මෙම විශ්ලේෂණය මගින් විචිත්‍ර ලෙස නිරූපණය කරයි. බොහෝ කාන්තාවන් හට, දේශපාලන කාර්යාලය තුළට අවතීර්ණ වීම යනු, ඔවුන් පැනිය යුතු පළමු කඩුල්ල වේ. ඡන්දයෙන් තේරී පත්වුනු පසුව, ඔවුන්ට වෙන්කොට සැලකීම, බහිෂ්කරණය, ආර්ථික පීඩනය, සහ ඔවුන්ගේ අධිකාරිය අඩු තක්සේරු කරනු ලබන සහ තීරණ ගැනීමේ සහභාගිත්වය සීමා කරන ආයතනික ප්‍රතිරෝධය තුළින් ගමන් කිරීම සඳහා ඔවුන්ට බල කර සිටියි. මෙම රටාවන් පැහැදිලි ලෙස උලුප්පා පෙන්වා දෙනු ලබන්නේ, විධිමත් නියෝජනයෙහි සහ ප්‍රමාණාත්මක දේශපාලන බලගැන්වීමෙහි අතර පවතින පරතරයයි.

86 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි පදිංචි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥ සහ දේශපාලනඥ. නොවැම්බර් 6, 2023.

# හයවන පරිච්ඡේදය

# බාධක සමග ගනුදෙනු කිරීම සහ ප්‍රතිරෝධය අභියෝගයට ලක් කිරීම

2018 ස්ත්‍රී පුරුෂ සමාජභාවී කෝටාව ක්‍රියාත්මක කිරීම තුළින්, ඒ තාක් කල්, ප්‍රභූ සහ වරප්‍රසාදිත වටපිටාවකින් පැමිණෙන කාන්තාවන්ට හැර, විශාල ලෙස සීමාසහිත ලෙස සලකන ලද භූමියක ඔවුන් පිළිගන්නා බව ඔවුන්ට දැනෙන ලෙස, කාන්තාවන්ට දේශපාලනයට අවතීර්ණ වීම සඳහා මග හෙළිපෙහෙළි කිරීම කල්පික ලෙස අපේක්ෂා කරන ලද්දක් විය. කෙසේ වෙතත්, පසුගිය පරිච්ඡේදයේදී පෙන්නුම් කරන ලද ආකාරයට, මෙම කෝටාව හරහා කාන්තාවන්ගේ දේශපාලන ප්‍රවේශය කිසිසේත්ම ඍජු ගමනක් නොවීය. කාන්තාවන්ට නාම යෝජනා සඳහා සටන් කිරීම, ඡන්ද ප්‍රචාරක ව්‍යාපාර සාර්ථකව කර ගැනීම, සහ අවසානයේදී නිල කාර්යාලය තුළ නොනැසී පැවතීම කළ යුතු විය. තමන්ව පිළිගන්නා දේශපාලන වාතාවරණයකට ඇතුල් වනවා වෙනුවට, දේශපාලන පක්ෂ හෝ ඔවුන්ට පහසුකම් සලසා දිය යුතු පළාත් පාලන ආයතන මගින් ඔවුන්ට ඉතා කුඩා සහයෝගයක් ලැබෙන, බොහෝ විට සතුරු පරිසරයක ගමන් කිරීමට ඔවුන්ට සිදුවිය. නමුත්, මෙම අභියෝගයන් තිබුණද, සම්මුඛ සාකච්ඡා තුළින් පෙනී ගියේ, මෙම බාධක හමුවේ, කාන්තාවන් අකර්මණ්‍ය ලෙස නොසිටිය බවය. පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවන් පුරාවට, ඔවුන් පිළිගැනීම සඳහා යැයි උපකල්පනය කරන ලද එම පද්ධතියන්ට මුහුණ දීමට, බොහෝ කාන්තාවන් විවිධ යාන්ත්‍රණයන් නිපදවා ගත් බවට සාක්ෂි ලැබිණ. මෙම අත්දැකීම් ගවේෂණය තුළින්, ආයතනික බාධාවන්, ප්‍රතිරෝධ අභියෝග කිරීම්, සහ අවසානයේදී ඔවුන් බහිෂ්කරණය කිරීමට තැත් කළ දේශපාලනය තුළ ඔවුන්ගේ පැවැත්ම රඳවා තබා ගැනීම ගනුදෙනු කිරීම සඳහා ඔවුන් භාවිතා කළ මූලෝපායන්, ඉස්මතු කර පෙන්වයි.

## 6.1 බහිෂ්කරණය අභියෝගයට ලක් කිරීම සඳහා දැනුම වර්ධනය කිරීම

බොහෝ කාන්තාවන් විසින්, සභා රැස්වීම් තුළදී, නොසලකා හැරීමේ හෝ නිශ්ශබ්ද කරවීමේ අභියෝගයට පිළිතුරු වශයෙන්, සක්‍රීය ලෙස පරිපාලන ක්‍රියාපටිපාටිය සහ සභා රෙගුලාසි පිළිබඳ දැනුමෙන් සන්නද්ධ විය. එක් මන්ත්‍රීවරියක් හෙළි කරන ලද්දේ, සභා රැස්වීම් තුළදී ඇය හැසිරිය යුතු ආකාරය පිළිබඳව අධ්‍යනය කරමින් සහ ඇයගේ කථාවන් නීතිමය ක්‍රියාපටිපාටියන් සමග අනුගත වේ දැයි සැක හැර දැන ගැනීම සඳහා අදාළ රෙගුලාසි සහ ආඥාපනත් සමග හුරුපුරුදු වෙමින්, ඇය මාසයකට වඩා කාලයක් ගත කළ බවය. එසේ කිරීම මගින්, ඇය පුරුෂ සාමාජිකයන් විසින් ඇගේ දායකත්වයන්, අභියෝග යට හෝ නිෂ්ප්‍රභා කිරීමේ ඉඩ ප්‍රස්ථාවන් අවම කිරීමට සෙවීය.[87]

87 කොළඹ 019, කොළඹ දිස්ත්‍රික්කය. නොවැම්බර් 22, 2023.

මේ හා සමාන අත්දැකීමක් තවත් මන්ත්‍රීවරියක් බෙදා හදා ගත් අතර, දැනුවත් ප්‍රශ්න ඇසීමට සහ සභා සාකච්ඡා තුළදී ආත්ම විශ්වාසයෙන් යුතුව සහභාගී වීම සඳහා, ඇය පළාත් පාලන නීතී සහ පරිපාලන නීතිරීති අධ්‍යනය කළ ආකාරය විස්තර කර සිටියාය.[88] ඔවුන්ගේ නිපුණත්වය නිරන්තරයෙන් ප්‍රශ්න කරන පරිසරයක් තුළදී, කාන්තාවන්ගේ මෙම සූදානම් වීම බොහෝ අවස්ථා වල අවශ්‍ය කරුණකි.

කෑ ගසා වාඩි කරවීම හෝ බාධා කිරීම වළක්වා ගැනීම සඳහා, නොයෙක් අවස්ථාවලදී සවිස්තරාත්මක සටහන් සහ ඔවුන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන යෝජනා වල පැහැදිලි අවබෝධයක් සමග සභා රැස්වීම් තුළට මනාව සූදානම් වී යාමේ වැදගත්කම බොහෝ කාන්තාවන් අවධාරණය කළහ. මෙවැනි සූදානම්වීම් තුළින් ඔවුන්ට ඔවුන්ගේ අදහස් සාර්ථකව ආරක්ෂා කර ගැනීමේ හැකියාවක් සහ ඔවුන්ගේ සහභාගීත්වය අඩු තක්සේරු කරනා ව්‍යර්ථයන් ප්‍රතිරෝධගත කිරීමට හැකියාවක් ලැබේ. එක් මන්ත්‍රීවරියක් විස්තර කරන ලද්දේ, ඇය ඇගේ කථන කාලයෙහි පාලනය අතට ගනු ලැබුවේ, යෝජනා ඉදිරිපත් කරන අතරතුර, ඔවුන් ඇයට බාධා කිරීම වැළැක්වීම සඳහා, පුරුෂ සාමාජිකයන්ට *"කරුණාකරල ඔයාලගෙ කටවල් වහගෙන ඉන්න. මේක මගේ කාලය,"* යැයි කියමින් බවය.[89]

පළාත් පාලන ආයතන තුළ ගිලා බැස පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි ප්‍රතිමාන සමග කාන්තාවන් සක්‍රියව ගනුදෙනු කරන ආකාරය මෙම උපාය මාර්ග තුළින් පිළිඹිබු කරයි. ස්ත්‍රීවාදී ආයතනිකවාදීන් තර්ක කරන ආකාරයට, ආයතන යනු, ස්ථිතික සහ ඒකාශ්මික නොවන එනමුත්, දේශපාලන ක්‍රියාධරයන් මගින් හැඩය වෙනස් කළ හැකි ගතික ප්‍රස්තුත වේ. (Chappell 2006, 224). මෙවැනි ක්‍රියාවන් හරහා, පවත්නා තත්වයට අභියෝග කරන නව භාවිතයන් හඳුන්වා දීමෙන්, මෙවැනි ආයතන තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී චරිත ලක්ෂණ, ක්‍රියාධරයන් හට වෙනස් කළ හැකි වේ (Beckwith 2005, 132-3).

## 6.2 අවිධිමත් ප්‍රතිරෝධය සහ හරස්-පක්ෂ සහයෝගීතාවය

කාන්තා දේශපාලනඥයන් සමග සම්මුඛ සාකච්ඡා කළ කාලය පුරාවටම, ඔවුන්ට ඔවුන්ගේ පක්ෂය තුළින් ලැබෙන සහයෝගය මඳ බව පැහැදිලි විය. එනමුත්, විධිමත් සහයෝගය නොමැතිකමෙන් සිදුවන මෙම ආයතනික පරතරය පියවීම සඳහා නොයෙක් අවස්ථාවලදී කාන්තාවන් සහයෝගීතාවයේ අවිධිමත් ජාල නිර්මාණය කර ගත් අන්දම නිරීක්ෂණය කිරීම වැදගත් කරුණක් විය. බොහෝ පළාත් පාලන ආයතන තුළ, අවිධිමත් සහයෝගතා පද්ධතියක් නිර්මාණය කරමින් කාන්තා මන්ත්‍රීවරියන් තොරතුරු හුවමාරු කර ගැනීම සහ පක්ෂ හරහා උපදෙස් දීම කරනු ලබයි. එක් සාමාජිකාවක් පැහැදිලි කරමින්:

88 මන්නාරම 029, මන්නාරම් දිස්ත්‍රික්කය. ජූනි 7, 2024.

89 මහනුවර 028, මහනුවර දිස්ත්‍රික්කය. ඔක්තෝබර් 25,2023.

*"සභාවෙ ඉන්න ගැහැනු සාමාජිකාවන් සභාවෙ මොකද වුනේ, තිබුණ සාකච්ඡා ගැන සහ යෝජනා සම්මත වුනාද නැද්ද කියන තොරතුරු අපිත් එක්ක බෙදා හදා ගත්තා."*[90]

රත්නපුරේ සිට පැමිණි තවත් නියෝජිතවරියක් මෙම හැඟීම පුනරාවර්තනය කළ අතර, ඇය කියා සිටියේ වෙනත් පක්ෂ තුළ සිටින කාන්තා මන්ත්‍රීවරියන් බොහෝ විට, තමන්ගේ පක්ෂයෙහි පිරිමි මන්ත්‍රීන්ට වඩා තමන්ට සහයෝගය පළ කළ බවයඃ

*"සිංහල සාමාජිකයො ගොඩක් අස්සෙ එකම දෙමළ සාමාජිකයා මම වුනත්, මට එහෙම කිසිම වෙනසක් කළේ නැහැ, මට හැමෝගෙන්ම සහයෝගය හම්බ වුනා."*[91]

තවත් විටෙක මෙම සහයෝගීතාවය, දෘශ්‍ය සහ සාමූහික ආකෘතියක් ද ගත්තේය. බදුල්ල පළාත් පාලන ආයතනය තුළ, උදාහරණයක් ලෙස, ජ්‍යෙෂ්ඨ පුරුෂ දේශපාලනඥයන් විසින් ප්‍රසිද්ධියේ විවේචනයට හෝ තරවටු කිරීමට ලක් වූ කාන්තාවන්ට සහයෝගය පිණිස ඔවුන් එවැනි සැලකිල්ලකට ලක් වීම පිළිබඳ සංකේතාත්මක විරෝධය පෑම සඳහා කළු පටි පවා පැළඳ කාන්තා සාමාජිකයන් එකට සිට ගත්හ.[92] මෙවැනි සාමූහික විරෝධය පෑමේ ක්‍රියා විසින්, පළාත් පාලන ආයතන තුළ පවතින බලධූරාවලි සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංස්කෘතිය, අන්‍යෝන්‍ය සහයෝගය හරහා කාන්තාවන් විසින් අභියෝගයට ලක් කිරීමට උත්සහ කළ ආකාරය ගෙන හැර දක්වයි. විශේෂයෙන් පුරුෂ බලප්‍රදේශ යැයි සාම්ප්‍රදායිකව සලකන ලද ප්‍රදේශ තුළ, ඔවුන්ට මුහුණ දෙන්නට වූ සතුරුකම් තිබියදීම, කාන්තාවන් විසින් පළාත් පාලන ක්‍රියාවලියන් තුළ අඛණ්ඩව බලය තහවුරු කරගැනීමට සමත් විය.

මන්ත්‍රීවරියන් කිහිප දෙනෙක්, කාන්තාවන්ට දේශපාලන දැනුම හෝ තාක්ෂණික විශේෂඥතාව අඩු බවට වන වැරදි සංකල්පය අභියෝගයට ලක් කරමින්, ඔවුන් අයවැය කාරණා තුළදී සක්‍රීය භූමිකාවක් රඟ දක්වන ලද ආකාරය ඉස්මතු කරන ලදි. එක් අවස්ථාවක අම්බලන්ගොඩදී, කාන්තා මන්ත්‍රීවරියන් පළාත් පාලන අයවැය පරීක්ෂා කිරීමේ ප්‍රධාන භූමිකාවක ක්‍රියා කළ අතර, පටිපාටිමය අක්‍රමිකතා හේතුවෙන් පසුව එම යෝජිත අයවැය පරාජය සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළහ. එක් මන්ත්‍රීවරියක් පැහැදිලි කළ ආකාරයට, කාන්තා සාමාජිකයන් අයවැය අනුමත කිරීමට පෙර විගණන වාර්තා සහ මූල්‍යමය ලිපි ලේඛන විමර්ශනය කිරීමට ඔවුන් බල කර ඉල්ලා සිටි අතර, විගණන වාර්තා සකසා ඇත්තේ පළමු වර්ෂයට පමණක් බවත්, දෙවන වර්ශයට සකසා නොමැති බවත් සොයා ගැනීමට එය මුල් වුනු අතර, එම හේතුවෙන් අයවැය ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට සිදු විය.[93]

90 මහනුවර 026, මහනුවර දිස්ත්‍රික්කය. පෙබරවාරි 28, 2024

91 රත්නපුර 038, රත්නපුර දිස්ත්‍රික්කය. මාර්තු 22, 2024.

92 බදුල්ල 013, බදුල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 14, 2024.

93 ගාල්ල 023, ගාල්ල දිස්ත්‍රික්කය. ජනවාරි 17, 2024.

තනි පළාත් පාලන ආයතන වලින් ඔබ්බට ගොස්, කාන්තාවන් විසින් දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමේ පුළුල් වූ සහයෝගිතා ජාල නිර්මාණය කළහ. මන්නාරමෙහි, උදාහරණයක් ලෙස, සයරහීකදයි සංවිධානයේ සහයෝගය මත, කාන්තා මන්ත්‍රීවරියන් විසින් දිස්ත්‍රික් පළාත් පාලන කාන්තා සාමාජික වෘත්තීය සමිතියි ආරම්භ කළහ. මෙම වේදිකාව විවිධ දේශපාලන පක්ෂ සහ වටපිටාවන් තුළින් පැමිණි කාන්තා මන්ත්‍රීවරියන් විසි එක් දෙනෙකු එකට එකතු කරන ලද අතර, එමගින් ඔවුන්ට නිරන්තරයෙන් මුණ ගැසී, කුලය, ආගම, හෝ පක්ෂ අනුබද්ධයකින් තොරව පොදු අභියෝග සාකච්ජා කිරීමට ඉඩ සලසාදෙන ලදි. නිල කාර්යාලයෙන් ඉවත් වීමෙන් පසුවද, සමහර සාමාජිකාවන් මෙම ජාල තුළ අඛණ්ඩව සක්‍රීයව සිටියි.[94]

දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමෙහිදී, සන්නිවේදන සම්බන්ධතා පවත්වා ගැනීමට, පරිපාලන තොරතුරු බෙදා හදා ගැනීමට, සහ කාන්තා සාමාජිකයන් අතර වැදගත් තොරතුරු යාවත්කාලීන කිරීමට, උය්වීචච සහ ඊජැඉදදන කණ්ඩායම් බහුලව පාවිච්චි වන බව මන්ත්‍රීවරියන් හෙළි කරන ලදි. ආයතනික සීමාමායිම් හරහා දැනුම බෙදා හදා ගැනීමට සහ සහයෝගීතාවය පවත්වා ගැනීමට, මෙම තලයන් මගින් කාන්තාවන්ට ආදේශක සහ අවිධිමත් නාලිකාවක් සපයන ලදි.[95 96]

කෙසේ වෙතත්, මෙම හරස්-පක්ෂ මිත්‍රත්වයන්ගේ ආඛ්‍යානයන්, ඔවුන් තමන්ගේ පක්ෂ තුළ ලද අත්දැකීම් වලට හාත්පසින් වෙනස් විය. කාන්තාවන් අතර පවතින අවිධිමත් එකමුතුවන් මගින් සහයෝගීතාවයෙහි අදහස් සහ අන්‍යෝන්‍ය උපකාර ජනිත කළ ද, අභ්‍යන්තර දේශපාලන සංස්කෘතිය ගැඹුරු ලෙස තරගකාරී සහ බහිෂ්කාරී ලෙස පැවතුණි. බොහෝ කාන්තාවන් ප්‍රබල සහයෝගයක් පක්ෂ තුළ දී නොව පක්ෂ හරහා සොයා ගත් නමුත් අනෙක් පක්ෂ වල සාමාජිකයන් සමග සම්බන්ධතා පැවැත්වීමට උත්සහා කිරීම්, බොහෝ විට සැකයට සහ එදිරිවාදිකමට භාජනය විය. එක් මන්ත්‍රීවරියක්, උදාහරණයක් ලෙස, සරල ලෙස විරුද්ධ පක්ෂයේ සාමාජිකාවන් සමග කතා කිරීම හේතුවෙන්, පුරුෂ සගයන් විසින් ද්‍රෝහී ලෙස චෝදනා කරනු ලැබූ අතර පසුව පක්ෂ නායකත්වය මගින් ද ප්‍රසිද්ධියේ දෝෂාරෝපණයට ලක් වීමටද සිදු විය. ඇගේ පක්ෂය මගින් ඇයට නිවසට යාමට අයෙක් නම් කිරීම හෝ ඇය අසනීප වූ විට බැලීමට පැමිණීම වැනි සංකේතාත්මක සැලකිලි ඇතැම් අවස්ථාවලදී ලබාදුන්නද, ඇය සඳහන් කරන පරිදි ඒවා තුළ සත්‍ය සාරාර්ථයක් නොමැති බවය.

*"ඒ සහයෝගය ප්‍රමාණවත් මදි: ඒක ඇති තරම් ලැබුණා නම්, මේ අවුරුදු ගාණ ඇතුළත අපිට ගොඩක් දේවල් කරන්න තිබුණා. අපිට මිනිස්සුන්ගෙන් විශාල විශ්වාසයක් දිනා ගන්න තිබුණා අපිට ගොඩක් සහයෝගය තිබ්බා නම්."* [97]

94 මන්නාරම 029, මන්නාරම් දිස්ත්‍රික්කය. ජූනි 7, 2024.
95 මන්නාරම 031, මන්නාරම් දිස්ත්‍රික්කය, ජූනි 7, 2024.
96 කොළඹ 019, කොළඹ දිස්ත්‍රික්කය. නොවැම්බර් 22, 2023.
97 මහනුවර 026, මහනුවර දිස්ත්‍රික්කය. පෙබරවාරි 28, 2024.

මෙම කතා පෙළ, ස්ත්‍රීවාදී ආයතනිකවාදීන් විස්තර කරන "නිරන්තරයෙන් පුනරාවර්තනය වන බහිෂ්කරණ ක්‍රියාවලි" සමග සංගත වේ (Lovenduski 2005). දේශපාලනික පක්ෂ බාහිරින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වයට සහයෝගය දැක්වුව ද, ඔවුන්ගේ පුරුෂයන් මගින් ආධිපත්‍ය දරණ අභ්‍යන්තර සංස්කෘති තුළ දී, තොරතුරු, සම්පත්, සහ නායකත්ව ඉඩප්‍රස්ථාවන් කාන්තාවන්ට නොදී රඳවා ගැනීම මගින් ඔවුන් "පිටස්තරයන්" ලෙස ස්ථානගත කිරීම කරනු ලබයි (Bjarnegård සහ Kenny 2016).

පක්ෂ තුළදී කාන්තාවන් නිතරම, බලමුළු ගන්වන්නන්, උපස්ථායකයන් හෝ මැතිවරණ ප්‍රචාරක සංවිධායකයන් වැනි සහායක භූමිකාවන්ට අනුයුක්ත කරන බවත්, ඒ අතරම තීරණ ගැනීමේ අවකාශ පුරුෂ-ආධිපත්‍යයමය ලෙස පවතින බවත් ප්‍රධාන දැනුවත් කරන්නා A සමග කළ සම්මුඛ සාකච්ජාවේදී තහවුරු කළේය. ප්‍රධාන දැනුවත් කරන්නා A පවසන පරිදි, පක්ෂ වලට *"කාන්තාවන්ගේ ඡන්ද සහ දෘශ්‍යභාවය උවමනා උනත්, එයාලගෙ නායකත්වය ඕන නැහැ."*[98]

98 බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ජීවත් වන, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥ සහ දේශපාලනඥ. නොවැම්බර් 6, 2023.

# හත්වන පරිච්ඡේදය

# සමාප්තිය

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවයෙහි මානයන් කිහිපයකින්, විශේෂයෙන්ම කාන්තා සාක්ෂරතාවය සහ ප්‍රජා මට්ටමෙහි කාන්තා සහභාගිත්වය සලකන කළ, ශ්‍රී ලංකාව කැපී පෙනෙන වර්ධනයක් ළඟා කරගෙන තිබුණ ද, මෙම ප්‍රතිලාභයන් විධිමත් දේශපාලන ආයතන තුළ වර්ධනය වන ලද නියෝජනයක් දක්වා පරිවර්තනය වී නොමැත. ප්‍රජා-මූලික සංවිධාන (CBOs) තුළ සක්‍රීය සාමාජිකයන්ගෙන් බහුතරයක් කාන්තාවන් වන අතර, රට පුරා සෑම ගම්මානයකම පාහේ කාන්තා සමිති ක්‍රියාත්මක වේ. එනමුත්, ශ්‍රී ලංකාව තුළ පවතින කාන්තා දේශපාලන සහභාගිත්වයෙහි අඛණ්ඩ අඩු මට්ටම කැපී පෙනෙන කාරණයක් වේ. එනමුත්, නිරන්තරයෙන් ඔවුන් තේරී පත් වූ කාර්යාලය තුළ කාන්තාවන්ගේ නියෝජනය ඌන වෙමින් පවතින අතර, ප්‍රජා ජීවිතය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ ඔවුන්ගේ විධිමත් දේශපාලන තීරණ-ගැනීමේ අන්තර්කරණය අතර වන දිගු කාලීනව සම්බන්ධතාවලින් වියුක්තව සිටීම එතුළින් ඉස්මතු වේ.

1960දී ලෝකයේ ප්‍රථම අග්‍රමාත්‍යවරිය ඡන්දයෙන් පත් වීම සහ 1994දී රට තුළ වැඩිම කාලයක් පාලන තන්ත්‍රය දැරූ ජනාධිපතිනිය වැනි ශ්‍රී ලංකාවේ සංකේතාත්මක සන්ධිස්ථානයන්ගේ නිරන්තර යාතිකාවන් මගින් මෙම පරස්පරය තවදුරටත් තීව්‍ර වේ. නමුත් මෙම ඉහළ ප්‍රභූ පැළැන්තියේ උදාහරණ තිබුණද, ජනගහනයෙන් වැඩිම ප්‍රමාණයක් කාන්තාවන්ගේ සෑදුම් ලත් වුවද, විශේෂයෙන්ම පළාත් පාලන මට්ටමෙහිදී, කාන්තාවන් ඡන්දයෙන් තේරී පත් වුනු නිල කාර්යාල තුළ ඉතාමත් අවම නියෝජනයක් ලෙස ක්‍රියා කරමින් සිටී.

මෙවැනි සන්දර්භයක් තුළදී පළාත් පාලන මට්ටමට 2016 වසරේදී 25% කෝටාව හඳුන්වා දුන් අතර, එය 2018 වසරේදී ක්‍රියාත්මක විය. කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය වර්ධනය කිරීම මෙහි අභිප්‍රාය වුවද, එමගින් ප්‍රමාණාත්මක බලමුළුගැන්වීමක ප්‍රතිඵලයක් ලබා දුන්නද නැතහොත් බොහෝ දුරට සංකේතාත්මක ලෙස පැවතුනි ද යන්න, කෝටාව හරහා ඡන්දයෙන් තේරී පත් වුනු කාන්තාවන්ගේ, ජීවත් වීමෙන් ලද අත්දැකීම් එකතු කිරීම තුළින්, මෙම අධ්‍යයනය මගින් පරීක්ෂා කරනු ලබයි.

එම සොයා ගැනීම් හෙළි කරන ලද කාරණය වන්නේ, දේශපාලන පක්ෂ, පළාත් පාලන ආයතන, සහ සමාජ-සංස්කෘතික සංදර්භයන් පුරාවට, සාර්ථක දේශපාලන ක්‍රියාධරයන් ලෙස ඔවුන්ට ක්‍රියා කිරීමට ඇති හැකියාව සීමා කරමින්, කාන්තාවන් දිගින් දිගටම නොනවතින සහ ගැඹුරු ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවී බාධකයන්ට මුහුණ දෙන බවය. පක්ෂ ප්‍රවේශය අවහිර කිරීම්, ආයතනික සහයෝගය මදකම, සහ පිරිමි පක්ෂ සාමාජිකයන්ගේ ප්‍රතිරෝධය යන කාරණා සියල්ල කාන්තාවන්ගේ සහභාගීත්වය ඉතා අවම කිරීමට බලපාන ලද අතර, ගෙවීමක් නොකරන රැකබලා ගැනීමේ කාර්යයන් වල අසමාන බර තවදුරටත් ඔවුන්ගේ කටයුතු සීමා කරන ලදි. කෝටාව හරහා දේශපාලනට අවතීර්ණ වීම තුළින්,

අන්තර්කරණය, අනුබලය, හෝ අධිකාරිය ලෙසට ස්වයංක්‍රීයව පරිවර්තනය නොවන බව, මෙම ගතිකයන් තුළින් විදහා දක්වයි.

එකතුවක් ලෙස සලකන කළ, මෙම සොයාගැනීම් තුළින් පෙන්වා දෙනු ලබන්නේ, කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය එකිනෙකා සමග සම්බන්ධිත ආයතනික මණ්ඩල තුනක් හරහා හැඩගැස්වී ඇති බවය. දේශපාලන පක්ෂ විසින් නෛමිත්තික අපේක්ෂකයන් තෝරා ගැනීම, ඉඩප්‍රස්ථා සඳහා අසමාන ප්‍රවේශ ඇති කිරීම සහ සීමිත ආයතනික සහයෝගය ලබාදීම යන කාරණා හරහා ප්‍රවේශ අවහිර කරන්නන් ලෙස නොකඩවා කටයුතු කළහ. පළාත් පාලන ආයතන තුළ, සම්පත් සඳහා වන අසමාන ප්‍රවේශය සහ තීරණ ගැනීමේදී වන අවිධිමත් බහිෂ්කරණය තුළින් මැතිවරණයට පසුව කාන්තාවන්ගේ ප්‍රමාණාත්මක සහභාගිත්වය සීමා කරන ලදි. විධිමත් දේශපාලන ආයතන වලට ඔබ්බෙන් පවතින ගෙවීමක් නොකරන රැකබලා ගැනීමේ වගකීම්, සමාජයීය නිරීක්ෂණය කිරීම්, සහ කාන්තාවන්ගේ පොදු භූමිකාව වටා පවතින සාම්ප්‍රදායික ප්‍රතිමාන වැනි, පවුල් සහ ප්‍රජාවන් තුළ වන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අපේක්ෂාවන් හරහා, කාන්තාවන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය නිරන්තරයෙන් පාලනය කරනු ලබයි. මෙම සියල්ල එකට ගත් කළ, මෙම සොයාගැනීම් මගින් නිරූපණය කරනු ලබන කාරණය වන්නේ, කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය හැඩගැස්වීම, එක් ආයතනයකින් පමණක් සිදු නොකළ බවත්, දේශපාලන, ආයතනික සහ සමාජ තලයන් තුළ, බහු විධිමත් සහ අවිධිමත් ආයතන එකිනෙකා සමග සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වීමෙන් සිදු වූ බවය.

ස්ත්‍රීවාදී ආයතනිකවාදී දෘෂ්ටියකින් බලන කල්හි, එහි සොයාගැනීම් තුළින්, මධ්‍යස්ථ-ස්ත්‍රී පුරුෂ සමාජභාවී ලෙස මතුපිටින් පෙනෙන ආයතන, කාන්තාවන්ට බලය සඳහා ප්‍රවේශය නිරතුරුවම සීමා කරන අනුග්‍රාහක ජාල, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතික කිරීම්, සහ පක්ෂ බලධූරාවලියන් වැනි අවිධිමත් ප්‍රතිමාන තුළින් සහයෝගය ලබාදෙන ආකාරය ඉස්මතු කරයි. එම කාරණය හේතුවෙන්, කාන්තාවන්ගේ සංඛ්‍යාත්මක පැවැත්ම මතින් පමණක් කිඳා බැස ඇති, ආයතනික ක්‍රියාපටිපාටියන්ට බාධා කිරීමට ඇති හැකියාව අඩු වන අතර, පුළුල් ව්‍යුහාත්මක වෙනසක් නොමැති විට, විධිමත් ප්‍රතිසංස්කරණ වල සීමාකම් පිළිබඳව වන වඩා වැදගත් ප්‍රශ්න එතුළින් මතු කරයි.

ඒ අනුව, පළාත් පාලන ආයතන මට්ටමෙහිදී, කෝටාව මගින් කාන්තාවන්ගේ නියෝජනයෙහි සංඛ්‍යාත්මක අගය වර්ධනය කර තිබුණ ද, එය ප්‍රමාණාත්මක දේශපාලන බලමුළුග ැන්වීමකට තවමත් පරිවර්තනය වී නොමැත. කාන්තාවන් නිරන්තරයෙන් කෝටා ගැහැණුනී හෝ පින් මන්ත්‍රීනියනී ලෙස රාමුගත කෙරුනු අතර, දේශපාලන සහ ප්‍රජා සැකසීම් යන දෙකෙහිදීම නීත්‍යානුකූලභාවය අඩු ලෙස සලකන ලදි. කෙසේ වෙතත්, මෙය කෝටා වෙහිම අසාර්ථකත්වයක් ලෙස නොව, නමුත් එයටත් වඩා වන ආයතනික පරිවර්තන ක්‍රියාවලියන්ගේ පවතින දිගු සහ බොහෝ සංකීර්ණ පිළිඹිබු කිරීමක් ලෙස තේරුම් ගත යුතුය. ස්ත්‍රීවාදී ශාස්ත්‍රවේදය යෝජනා කරන ආකාරයට, එවැනි පරිවර්තනයන් විදාරණය

වන්නේ කාලයත් සමගය. මෙලෙස සලකන කළ, කෝටාව අවධි දෙකකින් ක්‍රියාත්මක වන බව තේරුම් ගත හැකːපළමුවැන්න කාන්තාවන්ගේ සංඛ්‍යාමය නියෝජනය වර්ධනය කිරීම සහ දෙවැන්න ආයතනික ප්‍රතිමාන සහ භාවිතයන් ප්‍රමාණාත්මක සහභාගීත්වයක් සඳහා, පරිවර්තනය කිරීම ඉලක්ක කර ගැනීමය. ශ්‍රී ලාංකික අත්දැකීම තුළින් හැඟී යන්නේ, පළමු අවධිය මගින් මැනිය හැකි සාර්ථකත්වයක් අත්පත් කර තිබෙන මුත්, දෙවැන්න තවමත් සිදුවෙමින් සහ තරගයට ලක්වෙමින් පවතින බවය.

මෙම අධ්‍යනය එම තේරුම් ගැනීම සඳහා පිටිවහල් වන්නේ, කෝටාවන් හඳුන්වා දීමෙන් අනතුරුව, විධිමත් ආයතනික ප්‍රතිසංස්කරණයන් සහ අවිධිමත් ආයතනික භාවිතයන් එකිනෙකා සමග අන්තර්ක්‍රියා කර, කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය හැඩගස්වන ලද ආකාරය නිරූපණය කිරීමෙනි. දේශපාලන පක්ෂ, පළාත් පාලන ආයතන, සහ පවුල් සහ ප්‍රජා පසුබිම් හරහා කාන්තාවන්ගේ අත්දැකීම් අධීක්ෂණය කිරීම තුළින්, විස්තරාත්මක නියෝජනයේ ප්‍රශ්න සිට ප්‍රමාණාත්මක දේශපාලන සහභාගිත්වය සීමා කිරීම සහ අවිධිමත් පීතෘමූලික ප්‍රතිමාන ක්‍රියාත්මක වන යාන්ත්‍රණයන් පෙන්වා දීම තෙක් වන ප්‍රශ්න, පවත්නා ශාස්ත්‍රීය දැනුමට එපිටට පෙළ (Text) දිගු වේ.

කෙසේ වෙතත්, මෙම පෙළ (Text) ට එහි සීමාකම් නැතුවා නොවේ. මෙහි විෂය පථය සාපේක්ෂව කුඩා සාම්පලයකට සීමා වූවකි. දීර්ඝ කාලීන දේශපාලන ගමන් පථ හෝ කාලාන්තරයක් තුළ සිදුවන ආයතනික වෙනස්කම් හෝ සම්පූර්ණ වශයෙන් එමගින් ගවේෂණය නොකරන ලදි. එබැවින් අනාගත සමීක්ෂණ වලට, කාන්තාවන්ගේ දේශපාලන වෘත්තීන් කාලයක් තිස්සේ නිරීක්ෂණය තුළින් ලබාගන්නා, කල්පවත්නා එළඹුම් මෙන්ම පක්ෂ නායකත්වයේ සහ පිරිමි මන්ත්‍රීවරුන්ගේ අදහස් සංයුක්ත කරන ලද සන්සන්දනාත්මක විශ්ලේෂණයක් මගින් ප්‍රතිලාභ ලබාගත හැක.

කාන්තාවන්ගේ අත්දැකීම් තුළ පවතින වැදගත් විවිධත්වයන් දෙසටද මෙම අධ්‍යනය යොමු කරවන අතර, විශේෂයෙන්ම ජාතිය සහ ආගම වැනි දෙයකදී, ඇතැම් කණ්ඩායම් විසින් ප්‍රජා මට්ටමෙහිදී තීව්‍ර ආකාරයේ ප්‍රතිරෝධයන්ට මුහුණ පෑම දැක්විය හැක. අනාගත සමීක්ෂණය එබැවින්, ජාතිය, ආගම, සහ අනෙකුත් අන්තර්ඡේදිත අනන්‍යතා මගින් කාන්තාවන්ගේ දේශපාලන අත්දැකීම් හැඩගස්වන ආකාරය ගවේශණය කළයුතු අතර, එතුළින් දේශපාලන ආයතන තුළ පවතින අන්තර්ඡේදිත අසමානතා ගැඹුරින් තේරුම් ගැනීමද, අවසානයේ දී වඩා අන්තර්කරණය වූ ප්‍රතිපත්ති නිර්මාණයකට සහ ක්‍රියාත්මක කිරීමකට මුල් විය හැක.

සමාප්තියක් ලෙස, ස්ත්‍රී පුරුෂ සමාජභාවී කෝටාවන්, කාන්තාවන්ගේ ඓතිහාසික දේශපාලන බහිෂ්කරණය ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් වුවද, පෙරළිය සඳහා වූ දීර්ඝ ක්‍රියාවලියක පළමු පියවර ලෙස පමණක් ඒවා නියෝජනය වන බැවින්, ඒවා තනිව ගත් කළ ප්‍රමාණවත් නොවේ. අර්ථාන්විත ආයතනික පරිවර්තනයන් සඳහා, විධිමත් නීතිරීති සහ අවිධිමත් බල, ආකෘති තුළට ආමන්ත්‍රණය කළ හැකි, රඳා පවත්නා

සහ බහු-ස්ථර ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. අවසාන වශයෙන්, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය, ප්‍රජාතන්ත්‍රවාදී අනිවාර්යය කොන්දේසියක් ලෙස හඳුනාගත යුතු අතර, සහනශීලී හෝ තාවකාලික පර්යේෂණයක් ලෙස නොව, කාන්තාවන්ට දේශපාලන කාර්යාල තුළට ඇතුළ්වීමට මෙන්ම ඔවුන්ට ඔවුන්ගේ බලය අර්ථාන්විත සහ සමාන කොන්දේසි මත හැසිරවීමට හැකියාව ලබාදෙන ආකාරයකට, දේශපාලනික ආයතන නැවත සකස් කළ යුතුය.

# අටවන පරිච්ඡේදය

# නිර්දේශයන්

මෙම පර්යේෂණය පුරාවට, කාන්තා මන්ත්‍රීවරියන් මුහුණ දෙනු ලබන අභියෝගයන්, හුදකලා සිද්ධීන් නොවන බවට පැහැදිලි ලෙස දැකගත හැකි විය. ඒ වෙනුවට, කොට්ඨාශ, දිස්ත්‍රික්ක, සහ පළාත් තුළ ද එම අත්දැකීම් වල පවතින ඒකමිතිකභාවය විසින් දැනුවත් සහ තිරසාර ක්‍රියාමාර්ග අවශ්‍ය වන වඩා ගැඹුරු වූ ආකෘතිකමය අසමානතා පෙන්වා දෙයි. මෙම අභියෝගයන් ආයතනික සහ සමාජ-දේශපාලනික ගතිකයන් තුළ මුල් බැස ඇති අතර, ඒවා දේශපාලන පක්ෂ තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී බහිෂ්කරණයන්හි සිට පළාත් පාලන ආයතන තුළ පවතින අඛණ්ඩ ආන්තිකරණය දක්වා විහිදේ.

කාන්තාවන් තමන්ගේම පවුල් සහ ප්‍රජාවන් තුළ මුහුණ දෙන පීඩනයන් තුළින් ඒවා තවදුරටත් උග්‍ර වෙයි.  එහිදී සහයෝගය සහ දිරිමත් කිරීම් වෙනුවට, බොහෝ දෙනෙකු සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා වලින් ඔබ්බට ඇවිද යාම හේතුවෙන්, එළිපිට සහ සියුම් ලෙස යන දෙයාකාරයෙන්ම සිදුවන ප්‍රතිරෝධයේ විවිධකාර ආකෘති වලට මුහුණ දීමට සිදුවේ. එබැවින් මෙම බාධක එක් රැයකින් ආමන්ත්‍රණය කළ නොහැකි නමුත්, ඒ වෙනුවට දේශපාලන පද්ධතිය තුළ විවිධ මට්ටම් වල සිටින බහු ක්‍රියාධරයන් විසින් ගතයුතු සම්බන්ධීකරණය කරන ලද සහ තිරසාර ක්‍රියාමාර්ග වෙත අවධානය යොමු කළ හැක.

එබැවින් පහත සඳහන් නිර්දේශයන් මගින්, එවැනි ක්‍රියාමාර්ග අවශ්‍ය වන පෙදෙස් ලකුණු කිරීම සහ රජය, දේශපාලන පක්ෂ, පළාත් පාලන ආයතන, මැතිවරණ කොමිසම, සහ සිවිල් සමාජ සංවිධාන යන ආයතන, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ක්‍රියාධරයන් ලෙස හඳුනා ගැනීම සිදුකරනු ලබයි. මෙම ආයතනික මැදිහත්වීම් වලට සමාන්තරව, අධ්‍යාපන පද්ධතිය තුළ මෙන්ම සමාජය තුළද ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආකල්පයන්ගේ වෙනස් වීමක්, අර්ථාන්විත වෙනසකට අවශ්‍ය බව හඳුනාගැනීම ද වැදගත් වේ.

## 8.1 රජය සඳහා වන නිර්දේශයන්

### 8.1.1 පවතින කෝටා පද්ධතිය වැඩි දියුණු කිරීම

කෝටා පද්ධතියට විශේෂයෙන්ම එහි ඵලදායීතාවය පිළිබඳ ප්‍රශ්න වැනි බොහෝ විවේචනයන් තිබුනද, මෙම අදියරෙහි දී එහි යාන්ත්‍රණය අතහැර දැමීම ප්‍රායෝගික හෝ අභිමත නොවේ. දාර්ශනිකව ගත් කළ, ඓතිහාසික ලෙස පොදු සහ දේශපාලන ජීවිතයෙන් කාන්තාවන් බහිෂ්කරණය වීම නිවැරැදි කිරීමට ගන්නා ලද තාවකාලික පියවරක් ලෙස කෝටාව සැලකුවද, එමගින් කාන්තාවන්ට, වඩා සමාන ලෙස අඩිය තබා සහභාගී විය හැකි කෘතිම නමුත් අත්‍යවශ්‍ය ප්‍රවේශයක් නිර්මාණය වන ලදි. කෙසේ නමුත්, මෙම අධ්‍යයනය මගින් කරන ලද සොයාගැනීම් තුළින් පෙනී යන්නේ, ඇතැම්විට ශ්‍රී ලාංකික

සංදර්භය තුළ මෙවැනි ප්‍රවේශයක් අපරිණත විය හැකි බවය. සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ කාන්තාවන් කිහිප දෙනෙක්, ඔවුන්ගේ දේශපාලන සහභාගීත්වයට අඛණ්ඩව පවතින ව්‍යුහාත්මක සහ ආයතනික බාධාවන් හේතුවෙන්, කෝටාව ස්ථිර පියවරක් විය යුතු බවට අදහස් ප්‍රකාශ කර තිබුනි.

මෙම ස්ථාවරය, ස්ථිර පියවරයන් පැවතිය යුතු සුදුසු කාල පරාසය විවාදාත්මක ලෙස පවතින සන්සන්දනාත්මක සන්දර්භයක් තුළ ඇති පුළුල් තර්ක පිළිඹිබු කරයි. නිදසුනක් ලෙස, කෙන්යාව වැනි රටවල් වල යෝජනා වී තිබූ, වසර 20ක සූර්යයා බැස යාමේ නියාමනයක්, විවේචනයට ලක්ව ඇත්තේ, සෙමෙන් සිදුවන ආයතනික පරිවර්තන, කෙටි කාල පරාසයන් මගින් විගණනය කිරීමට අසමත් වන පදනම මතය (Obiria 2025). මෙම කාරණා පිළිබඳ සැලකිල්ලට ගනිමින්, දැඩි ලෙස කාලය සමග බැඳී ඇති මැදිහත්වීමක් ලෙස සලකනවාට වඩා කෝටාව, එහි ඵලදායීතාවය තුලනය කිරීමට ආවර්තික විමර්ශනයක් සහිතව, පවත්වා ගතයුතු බවට නිර්දේශ කරනු ලැබේ. කෙසේ වෙතත්, මෙම අධ්‍යයනය මගින් විදහා දක්වන සොයාගැනීම් වලට අනුව, කාන්තාවන් නිරන්තරයෙන් මුහුණ දෙන ව්‍යුහාත්මක සහ ආයතනික බාධාවන් ආමන්ත්‍රණය කිරීමට, සංඛ්‍යාත්මක අන්තර්කරණය පමණක් ප්‍රමාණවත් නොවේ.

ඒ අනුව, අප්‍රිකානු රටවල් කිහිපයක් තුළ බහුලව භාවිතා කරන, "සීබ්‍රා ලැයිස්තුව" (Zebra list) වැනි ඌනපූරක පියවර ගැනීමේ අවශ්‍යතාවක් පවතී. මෙය පුරුෂයන් සහ ස්ත්‍රීන් මාරුවෙන් මාරුවට ශ්‍රේණිගත කර ඇති (M, F, M, F) අපේක්ෂිත ලැයිස්තුවක් වන අතර, එමගින් කාන්තාවන් පක්ෂ ලැයිස්තු වල අග පොකුරු ලෙස තිබෙනවා වෙනුවට, ඔවුන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය සුරැකෙන සහ ජයග්‍රහණය කළ හැකි ආකාරයට ස්ථානගත වීමේ සම්භාවිතාව වැඩි කිරීමට හේතු පාදක වේ. (Gouws සහ Madesen 2024). ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය, සාම්ප්‍රදායික සමානුපාතික සංවෘත ලැයිස්තුගත නියෝජන ආකෘතියක ක්‍රියාත්මක නොවන බැවින්, අර්ථවත් ඌනපූරක පියවරක් ලෙස "සීබ්‍රා ලැයිස්තුව" තුළ ගැබ් වූ ප්‍රතිපත්ති උපයෝජ්‍ය කරගත හැක. විශේෂයෙන්ම, කාන්තාවන් පද්ධතිගතමය ලෙස අඩු-ශ්‍රේණිගත හෝ සංකේතාත්මක ස්ථාන වෙත පහතට හෙළීම වළක්වා ගැනීම සඳහා, දේශපාලන පක්ෂ ඔවුන්ගේ අතිරේක පුද්ගල ලැයිස්තු, මාරුවෙන් මාරුවට ස්ත්‍රී පුරුෂ අනුපිළිවෙලකට (M, F, M, F) ව්‍යුහගත කළයුතු වේ. එවැනි යාන්ත්‍රනයක් පක්ෂ අභිමතයන් සීමා කරවන මෙන්ම, කෝටාව ක්‍රියාත්මක කිරීමේදී පවතින විනිවිදභාවය තවත් ශක්තිමත් කරන සහ අවම නීතිමය අවශ්‍යතාවය සැපිරීම සඳහා කාන්තාවන්ගේ නම් යෝජනා වීමේ ක්‍රමය අඩු කිරීමට හේතු වනු ඇත.

Kodikara (2023) තවදුරටත් වර්ධිත ප්‍රමාණාත්මක සහභාගීත්වයක් උදෙසා තීරණාත්මක ජන සම්භාරයක් එක් රැස් කරගැනීමට කෝටාව අවම වශයෙන් 30%ක ප්‍රමාණයකින්වත් වැඩි කළ යුතු බව කියා සිටියි.  ප්‍රධාන දැනුවත් කරන්නන්ද, කාන්තාවන් මැතිවරණය සඳහා තරග කිරීමට අවසර ලබාදෙන සමානුපාතිකය 10% සිට 50% දක්වා වැඩි කළයුතු බව ප්‍රකාශ කර සිටියහ. ඔවුන් තර්ක කර කියා සිටියේ, මෙමගින් කාන්තාවන්ට වඩා

සාධාරණීය ලෙස මැතිවරණ කොට්ඨාශ ගොඩ නැංවීමට, ඔවුන්ගේ ජන්ද පදනම මත ආසන සුරක්ෂිත කරගැනීමට, සහ "කෝටා ගැහැනුන්" හෝ "පිං මන්ත්‍රීවරියන්" ලෙස ලේබල්ගත වීමෙන් ලැබෙන අපකීර්තියට එරෙහිව සටන් කිරීමට හැකි වේ යන්නය.

මීට අමතරව, කෝටා ඉලක්ක තීරණය කරන විට (යෝජිත 50% වැනි), "සිංහල කාන්තාවන්" වෙත පමණක් නාභිගත වීමට සීමා නොවී, විවිධ සහ ඓතිහාසික ලෙස ආන්තීකරණයට ලක්වන ලද කණ්ඩායම්ද අර්ථාන්විත ලෙස නියෝජනය වන පද්ධතියක් සකස් විය යුතු වේ. කෝටාව තුළ පවතින අන්තර්ජේදිත නිර්ණායක ඒකාබද්ධ කිරීමකින්, උදාහරණයක් ලෙස, ආබාධිත, මලයියහ දෙමළ කාන්තාවන්, හෝ අනෙක් සුළුතර ප්‍රජාවන් තුළ සිටින කාන්තාවන් නියෝජනය කිරීම අවශ්‍යතාවයක් කිරීම මගින්, තවදුරටත් අන්තර්කරණය සහ සාධාරණීයකරණය වූ ඉඩප්‍රස්ථාවන්ගේ බෙදාහැරීමක් තහවුරු වේ.

### 8.1.2 රාජ්‍ය-අනුග්‍රාහක සමාජ රැකවරණ පද්ධතිය

මෙම අධ්‍යනයෙහි සොයාගැනීම් මගින් කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය සඳහා, ගෙවීමක් නොකර රැකබලා ගැනීමේ කාර්යයන් අසමාන ලෙස බෙදීම, විශාල ආකෘතික සීමාවක් ලෙස පවතින ආකාරය පෙන්නුම් කරයි. ඇතැමුන් මෙම භූමිකා දෙකම ස්වාධීන ලෙස කළමනාකරණය කිරීමට උත්සහා කළද, අනෙකුත් අය සම්පූර්ණ රැකබලා ගැනීමේ බර අවම කරගැනීමට කටයුතු කිරීමට වඩා, කාන්තා ඥාතීන්ගෙන් ගෙවීමක් නොකර ලබාග න්නා සහයෝගය මගින් කාර්යක්ෂම ලෙස රැකබලා ගැනීමේ වගකීම, එක් කාන්තාවකගෙ න් තවකෙකුට මාරු කිරීම සිදුකරයි. රැකබලා ගැනීමේ වගකීම යනු කාන්තාවන් විසින් ස්වාධීන ලෙස හෝ දේශපාලන පක්ෂ තනිව හෝ විසඳිය හැකි ගැටළුවක් නොවන අතර, මෙම ආකෘතික අසමබරතාවය විසඳීම සඳහා තිරසාර රාජ්‍ය මැදිහත් වීමක් තුළින් සමාජ ආරක්ෂාව සහ පහසුවෙන් ලබාගත හැකි සහ වියදම දැරිය හැකි ළමා සුරැකුම් සහ වැඩිහිටි සුරැකුම් සේවා සැපයීම සඳහා වැඩි ආයෝජනයක් අවශ්‍ය වේ.

මෙවැනි සේවාවන් ක්‍රියාත්මක කිරීමෙන් ගෙවීමක් නොලැබෙන රැකබලා ගැනීම් තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී බර, අතිමහත් ලෙස අවම කරගත හැකි අතර එමගින්, කාන්තාවන්ට දේශපාලන ජීවිතය තුළ වඩා අර්ථවත් ලෙස කාලය සහ ශක්තිය යොමු කිරීමට මෙමගින් හැකියාව ලැබේ. මෙයට රාජ්‍ය-අනුග්‍රාහක ළමා සුරැකුම් මධ්‍යස්ථාන, පාසල් තුළ විධාරණය කරන ලද ළමා සේවාවන්, සහ ප්‍රජා-මූලික වැඩිහිටියන් සුරැකීමේ වැඩසටහන් ඇතුලත් කළ හැක. දේශපාලනය තුළ නිරත වන කාන්තාවන්ට සහයෝගය ලබාදීමට අමතරව, මෙම සේවාවන් මගින් අනෙක් කාන්තාවන්ට නව රැකියා අවස්ථා උදා කරවන අතර එමගින් වඩා පුළුල් වූ සමාජ-ආර්ථික බලමුළුගැන්වීමක් ඇති කළ හැක.

## 8.2 දේශපාලන පක්ෂ සඳහා වන නිර්දේශයන්

### 8.2.1 විනිවිදභාවයක් සහිත සහ කුසලතා-පදනම් වූ නාම යෝජනා ක්‍රියාවලි ස්ථාපනය කිරීම

කාන්තා දේශපාලනඥයන් මුහුණ දෙන අභියෝගයන්ගේ කේන්ද්‍රය, නිල කාර්යාලයට ඇතුල් වීමට පෙර සහ පසු යන අවස්ථා දෙකෙහිදීම, දේශපාලන පක්ෂ විසින්ම ගනු ලබන තීරණ වේ. දේශපාලන පක්ෂ විසින් නාම යෝජනා ක්‍රියාවලි ආරම්භ වීමේ සිට, අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා, පුරුෂයන්ට මෙන්ම ස්ත්‍රීන්ටද අදාළ වන, පැහැදිලි, විනිවිදභාවයක් සහිත, සහ කුසලතා මත පදනම් වූ නිර්ණායක පිහිටවිය යුතුය. මෙවැනි නිර්ණායක, පෞද්ගලික සම්බන්ධයන් හෝ පවුල් සබඳතා මත නොව, දක්ෂතාවය, අත්දැකීම්, සහ ප්‍රජාව සමග පවතින සම්බන්ධතා මත පදනම් විය යුතුය. මෙමගින් නිරන්තරයෙන් සිදුවන කෝටා අවශ්‍යතාවය සඳහා පුරුෂ දේශපාලනඥයන්ගේ ස්ත්‍රී ඥාතීන්ගේ නම් හෝ පහසුවෙන් පාලනය කළ හැකි යැයි සිතන අයගේ නම් යෝජනා වන භාවිතය වැළැක්වීම සහ ඒ වෙනුවට සියළුම පක්ෂ අනුගමනය කළ යුතු, ප්‍රමිතිගත ප්‍රතිපත්ති මත පදනම්ව සිට නාම යෝජනා ලබාදීම වී ඇතැයි තහවුරු කරගැනීමද කළ හැක. විශේෂයෙන්ම නාම යෝජනා බහිෂ්කරණීය හෝ නෛමිත්තිකවාදී භාවිතයන්ගෙන් ප්‍රතිනිෂ්පාදනය වන අවස්ථාවන්හිදී, දේශපාලන පක්ෂ ඔවුන් යෝජනා කරන පුද්ගලයන්ට වග විය යුතුය.

### 8.2.2 අභ්‍යන්තර පක්ෂ බල ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය

නාම යෝජනා තුළින් ඔබ්බට ගොස්, පක්ෂ ඔවුන්ගේ අභ්‍යන්තර බල ආකෘති ආමන්ත්‍රණය කළ යුතුම වේ. තවත් වැඩිපුර කාන්තාවන් නාම යෝජනා සොයා යෑමට සහ ඔවුන් දේශපාලනිකව සක්‍රීයව සිටීමට, දේශපාලනික පක්ෂ විසින් සක්‍රීය ලෙස ඔවුන්ගේ පුරුෂ-ආධිපත්‍ය සහ පීතෘමූලික සංස්කෘතිය කඩා වෙන් කළ යුතු වේ. මේ සඳහා පක්ෂ නායකත්ව ව්‍යුහ තුළ ජ්‍යෙෂ්ඨ තීරණ-ගැනීමේ භූමිකා වලින් 50%ක් කාන්තාවන් විසින් දැරීම වැනි පියවර ඇතුළත් පක්ෂ බලධුරාවලිය අභ්‍යන්තරයෙහි ස්ථිර ක්‍රියාමාර්ගයන් ගත යුතුය. කාන්තාවන්ගේ පැවැත්මක් මෙම තලයන්ගේ නොමැතිව, නාම යෝජනා, සම්පත්, සහ පක්ෂ ප්‍රමුඛතා වල තීරණ කාන්තාවන්ගේ ලැදිකම් සහ අදහස් නිරන්තරයෙන් ආන්තීකරණයකට ලක් කරයි.

### 8.2.3 අඛණ්ඩ පුහුණුවීම් සහ ආයතනික සහයෝගය ලබාදීම

කාන්තාවන් දේශපාලන කාර්යාලය තුළ තම නිල ධූරය භාරගත් පසුව, මැතිවරණය අන්තර්කරණයෙහි අවසාන ලක්ෂය ලෙස සලකනවා වෙනුවට, පක්ෂ මත ඔවුන්ගේ ප්‍රමාණාත්මක සහභාගීත්වය සඳහා සහයෝගය දැක්වීමට වගකීමක් ඇත. සාමාන්‍ය සහ සැලසුම්සහගත පුහුණු වැඩසටහන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොසලකා, අලුතින් පත්වුනු මන්ත්‍රීවරුන් සඳහා අනිවාර්යය කළ යුතු අතර පළමුවර පත්වුනු නියෝජිතයන්ට

විශේෂ අවධානය යොමු කළ යුතුය. පුහුණුවීම් කලාතුරකින් සිදුවන හෝ වාර්ශික සැසි ලෙස සීමා නොකර, පක්ෂ විසින් තනතුර භාර ගැනීමට පෙර හඳුන්වාදීමේ වැඩසටහන් (orientation programmes) සපයා දී, පසුව පළාත් පාලන ආයතන ක්‍රියාපටිපාටයන්, ප්‍රතිපත්ති සම්පාදනය, සහ පාලනය වැනි අංශ පිළිබඳව අඛණ්ඩව පැවැත්වෙන ධාරිතාවවර්ධනය කිරීම් අවශ්‍ය වේ. එවැනි පියවර මගින් කාන්තාවන්ට බාහිර ක්‍රියාකාරීන් මත රඳා පැවතීම අවම කරගැනීමට සහ විධිමත් ආයතන තුළ දක්ෂ දේශපාලන ක්‍රියාධරයන් ලෙස ක්‍රියාත්මක වීමේ හැකියාව ශක්තිමත් කරගත හැකි වේ.

### 8.2.4 ඡන්ද ප්‍රචාරක ව්‍යාපාර මූල්‍ය සම්පත් වෙත සාධාරණීය ප්‍රවේශය තහවුරු කරගැනීම

ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරයෙහි මූල්‍ය අරමුදල් වෙත පවතින අසමාන ප්‍රවේශය, පක්ෂ ව්‍යුහ තුළ පවතින තවත් සුවිශේෂී බාධකයක් වේ. ඡන්ද ප්‍රචාරක මූල්‍ය නියාමයන් පැවතුනද, පුරුෂ දේශපාලනඥයන්ට පහසුවෙන් ලබාගත හැකි ව්‍යාපාර ජාල සහ පුද්ගලික පරිත්‍යාග ශීලීන් විසින් ලබාදෙන ලද අරමුදල්, කාන්තාවන්ට නිරන්තරයෙන් ලබාගැනීම සඳහා දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවේ. මෙම විෂමතාවය ආමන්ත්‍රණය කිරීමට, දේශපාලන පක්ෂ එක්කාසු අරමුදල් යාන්ත්‍රනය (pooled funding mechanism) සලකා බැලිය යුතු අතර, එහිදී පක්ෂ මගින් එක් රැස් කරන ලද ඡන්ද ප්‍රචාරක ව්‍යාපාර අරමුදල් කේන්ද්‍රීයව කළමනාකරණය සහ සාධාරණ ලෙස අපේක්ෂකයන් අතර බෙදා දීමක් සිදුවේ. මෙමගින් අවිධිමත් අනුග්‍රාහක ජාල මත රඳා පැවතීම අවම කිරීම සහ කාන්තා අපේක්ෂිකාවන්ට ක්‍රියාත්මක වන බිම, සම මට්ටමකට ගැනීමටද උදව් වේ.

### 8.2.5 සුරක්ෂිතා-සංවේදී පක්ෂ භාවිතයන් උපයෝග්‍ය කරගැනීම

අවසානයේදී, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය බොහෝ අවස්ථාවලදී පවත්වා ගත හැකි වන්නේ අඩමාන සහ අවිධිමත් රැකබලා ගැනීම් මත බව දේශපාලන පක්ෂ මගින් අවබෝධ කර ගත යුතුය. කාන්තාවන්ට ගෙවීමක් නොකරන රැක බලා ගැනීමේ කාර්යයන් කළමනාකරණය කිරීම සඳහා, ආතතිකාරී සහ විශ්වාස කළ නොහැකි ක්‍රියා පිළිවෙලක් වන, නිතරම ගෙවීමක් කළ යුතු රැකබලාගන්නන් හෝ කාන්තා ඥාතීන් මත රඳා පැවතීමට සිදු වේ. එබැවින්, සුදුසු අවස්ථාවන්හිදී දරුවන් රැස්වීම් සඳහා රැගෙන ඒමට අවසර ලබා දීම, හැකි සෑම අවස්ථාවකදීම මහ-රාත්‍රී රැස්වීම් නොපැවැත්වීම, සහ ප්‍රමාද වූ රැස්වීම් වලින් පසුව ප්‍රවාහන පහසුකම් සැලසීම වැනි සුරක්ෂිතා-සංවේදී (Care-Sensitive) භාවිතයක්, පක්ෂ විසින් සපයා දිය යුතු වේ. පක්ෂ ක්‍රියාවලියන් මේ ආකාරයට ප්‍රතිසංවිධානය කිරීමෙන්, රැක බලාගැනීම් පෞද්ගලික බරක් නොව සාමූහික කාරණයක් ලෙස පිළිගැනීමකට ලක් කරන අතර, කාන්තාවන්ගේ දේශපාලන ජීවිතයෙහි තිරසාර සහ අර්ථාන්විත සහභාගීත්වයක් සඳහා එය අත්‍යවශ්‍ය වේ.

## 8.3 පළාත් පාලන ආයතන සඳහා නිර්දේශයන්

### 8.3.1 හිරිහැර කිරීම් ආමන්ත්‍රණය කිරීම සහ ආයතනික වගවීම තහවුරු කිරීම

තනතුරෙහි වැඩ භාර ගැනීමෙන් අනතුරුව, බොහෝ කාන්තා මන්ත්‍රීවරියන් පළාත් පාලන ආයතන අවකාශය තුළදී, විශේෂයෙන්ම පොදු රැස්වීම් තුළදී සිදුවන වාචික අපහරණය වැනි හිරිහැර වලට මුහුණ දෙයි. එම සිද්ධීන් සිදුවන වාර ගණන සහ ඒවායෙහි බරපතලකම තිබියදී පවා වැරදිකරුවන් කලාතුරකින් දඬුවම් ලබන අතර, එමගින් පොදු කාර්යාල තුළදී කාන්තාවන්ට එරෙහිව සිදුවන එදිරිවාදිකම් සාමාන්‍යකරණය මගින් දඬුවම් නොලබන වාතාවරණයක් නිර්මාණය වේ. මෙම තත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා, සභා කටයුතු කරගෙන යැමේදී පිළිපැදිය යුතු, හැසිරීම පාලනය කරනු ලබන පැහැදිලි චර්යා ධර්ම සංග්‍රහයක් පළාත් පාලන ආයතන අනුගත කළ යුතුය. කාන්තා සාමාජිකයන්ට විරුද්ධව කරන වාචික අපහරණ, තර්ජන, හෝ ලිංගිකමය පහර ගැසීම් වලට නිශ්චිත ප්‍රතිවිපාක ලබාදෙන, ශක්තිමත් නීතිමය සහ විනයානුකූල පියවර, ආයතනගත කළ යුතුය. මෙවැනි යාන්ත්‍රනයක් කාන්තා මන්ත්‍රීවරියන් ආරක්ෂා කර ගැනීමට පමණක් නොව, පළාත් පාලන ප්‍රජාතන්ත්‍රවාදී ආයතන තුළ අවංකභාවය සහ ගෞරවය රඳවා ගැනීමටද අත්‍යවශ්‍ය වේ.

### 8.3.2 ස්ත්‍රී පුරුෂ සමාජභාව-සංවේදී සහ අන්තර්කාරී පළාත් පාලන ආයතන යටිතල පහසුකම් නිර්මාණය

පළාත් පාලන ආයතන විසින් ඔවුන්ගේ භෞතික යටිතල පහසුකම් කාන්තාවන්ගේ අවශ්‍යතා වලට අන්තර්කාරී සහ ප්‍රතිචාරවත් ලෙස පවතින බවට තහවුරු කළ යුතුය. බොහෝ පළාත් පාලන ආයතන තුළ වෙන් කළ සහ පාවිච්චි කළ හැකි වැසිකිළි වැනි මූලික පහසුකම් නොමැති ලෙස පවත්වා ගෙන යාමෙන් පෙනී යන්නේ, මෙම ආයතන නිර්මාණය කර ඇත්තේ කාන්තාවන්ගේ සහභාගිත්වය සිහි තබාගෙන නොවන බවය. පළාත් පාලන ආයතන මගින් කාන්තාවන් සඳහා, අවශ්‍ය විටෙක ඇඳුම් මාරු කිරීම සහ මව්කිරි දීම සඳහා පාවිච්චි කළ හැකි, ආරක්ෂිත, පිරිසිදු වැසිකිළි පහසුකම් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. මෙවැනි පහසුකම් සලසාදීම, අවම ආයතනික අවශ්‍යතාවයක් සහ විශේෂයෙන් දේශපාලන කාර්යයන් සමග රැකබලා ගැනීමේ වගකීම් තුලනය කරනා කාන්තාවන්ට, පළාත් පාලන ආයතන අවකාශ ඔවුන් පිළිගන්නා සහ ඇතුල් විය හැකි බවට හැඟෙන ස්පර්ශීය වෙනසක් ඇති කරයි.

## 8.4 මැතිවරණ කොමිසමට කෙරෙන නිර්දේශයන්

### 8.4.1 මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත බලාත්මකය ශක්තිමත් කිරීම

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත පනවන ලද්දේ දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන්ගේ වියදම් සීමා කිරීමට, ඇතැම් ආකාරයේ පරිත්‍යාග තහනම්

කිරීමට, සහ මැතිවරණ කොමිසමට සවිස්තරාත්මක මූල්‍ය අනාවරණ සිදු කිරීමට වුවද, මැතිවරණ කාලය තුළදී සිදු වූ, විශේෂයෙන්ම පුරුෂ දේශපාලකයන් මගින් මෙම ප්‍රතිපාදන වල පුළුල්ව පැතිරුණු සහ පද්ධතිමය උල්ලංඝනය කිරීම් මෙම විශ්ලේශණය මගින් හෙළිදරව් විය. මෙම උල්ලංඝනය කිරීම් තුළින් නීතියේ අභිප්‍රාය අඩු තක්සේරු කිරීම සහ මැතිවරණ තරගයේදී ආකෘතිකමය අසමානතා ප්‍රතිනිෂ්පාදනය කර, කාන්තා අපේක්ෂකයන් සැලකිය යුතු අවාසිදායක තත්වයකට පත් කරයි.

එබැවින් මැතිවරණ කොමිසම මගින් මෙම පනතෙහි සඳහන් ප්‍රතිපාදන දැඩි ලෙස බලාත්මක කිරීම සහ වරදකරුවන්ට එරෙහිව ශක්තිමත් දණ්ඩනීය පියවර ගැනීම අනිවාර්යය වේ. මෙම පර්යේෂණය තුළ එකතු කරගත් දත්ත අනුව, උල්ලංඝනයන් වලට උසාවි හරහා විසඳීම් සොයන විට, ඒවා වසර ගණනාවක් යනතුරු නොවිසඳී පවතී. මෙම කාලය ඇතුළත, චෝදිත අපේක්ෂකයන් ඡන්දයෙන් තේරී පත්වුනු තනතුර දැරීම සහ දඬුවම් නියම වුවද, විනිශ්චයේ බලපෑම නිල තනතුරෙහි සම්පූර්ණ බල කාලය සැපිරීම මගින් සූක්ෂම ලෙස උදාසීන කරයි.

මෙම නීතිමය වගවීම සහ දේශපාලනික ප්‍රතිවිපාක අතර පවතින පරතරය ආමන්ත්‍රණය කරනු පිණිස, මැතිවරණ ප්‍රචාරක මූල්‍ය ප්‍රතිපාදන උල්ලංඝනය කර ඇති බවට සොයා ගත් අපේක්ෂකයන් හට, අවම වශයෙන් වසර දහයක කාලයක් මැතිවරණ සඳහා තරග කිරීමට නුසුදුසු ලෙස සැලකීමට, මෙම පර්යේෂණය මගින් නිර්දේශ කරයි. මෙවැනි පියවරක් මගින්, උල්ලංඝනය කරන්නන් දීර්ඝ කාලීන නීතිමය ක්‍රියාපටිපාටි මගින්, මැතිවරණ වශයෙන් ප්‍රතිලාභ ලැබීම වැළැක්වීම සහ මැතිවරණ තුළ මූල්‍ය බලය අපහරණයට විරුද්ධ අර්ථාන්විත නිවර්තකයක් ලෙස ක්‍රියා කරනු ඇත. වඩා ශක්තිමත් බලාත්මක යාන්ත්‍රණයන් අවශ්‍ය වන්නේ නීතියේ අණපනත තබා ගැනීමට පමණක් නොව, වඩාත් සාධරණීය වූ මැතිවරණ පරිසරයක් නිර්මාණය කර, එතුළින් කාන්තා අපේක්ෂිකාවන්ට වඩා සාධාරණ කොන්දේසි මත තරග කිරීමට හැකියාව ලබාදීමටය.

## 8.5 සිවිල් සමාජ සංවිධාන සඳහා නිර්දේශයන්

### 8.5.1 කලාපීය වශයෙන් ප්‍රවේශ විය හැකි ධාරිතා-වර්ධනයන් සැපයීම

සිවිල් සමාජ සංවිධාන විසින් කාන්තා දේශපාලනඥයන්ට ධාරිතාව-වර්ධනය කිරීමේ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් තීරණාත්මක භූමිකාවක් රඟ දක්වා තිබුනද, මෙම ව්‍යාපෘති බහුතරයක් ජාතික තලය තුළ එකට කැටි වීම සහ ශ්‍රී ලංකාවේ සියළු කොට්ඨාශ හරහා සිටින කාන්තා මන්ත්‍රීවරියන් වෙත අඛණ්ඩ ලෙස ළඟා වීම සිදුවී නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ග්‍රාමීය හෝ පරිධියෙහි පවතින ප්‍රදේශ වලින් පැමිණි බොහෝ කාන්තාවන්, මෙවැනි ඉඩප්‍රස්ථා තුළින් බහිෂ්කරණය කොට පවතී. සිවිල් සමාජ සංවිධාන එබැවින්, පළාත් පාලන මට්ටමෙහි සියළු කාන්තාවන්ට ප්‍රවේශ විය හැකි ලෙස, කලාපීය පදනම යටතේ වන පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය

යුතුය. කොළඹ-කේන්ද්‍රීය හෝ ජාතික සංසද තුළින් ඔබ්බට පුහුණුවීම් ප්‍රසාරණය කළ විට, එමගින් පුළුල් සහභාගීත්වයක් සහ විවිධ භූගෝලීය සහ සමාජ-දේශපාලන සංදර්භයන් තුළින් පැමිණි කාන්තා මන්ත්‍රීවරියන්ට ප්‍රමාණවත් ලෙස සහයෝගය ලබා දී ඇති බවට තහවුරු කරගත හැක.

### 8.5.2 නෛමිත්තිකවාදයෙහි ප්‍රති ආඛ්‍යානයන් ප්‍රවර්ධනය කිරීම

මෙම විශ්ලේශණය තුළ අඛණ්ඩව හඳුනාගත හැකි වූ අභියෝගයක් වන්නේ, කාන්තා මන්ත්‍රීවරියන් පත් කරනු ලැබුවේ කෝටා අවශ්‍යතාවය සපුරා ගැනීමට සහ ඔවුන් කිසිදු ප්‍රමාණාත්මක දායකත්වයක් නොකර ඇති බවට තිබෙන්නා වූ පුළුල්ව පැතිර පවතින අදහසයි. සිවිල් සමාජ සංවිධාන විසින් පද්ධතිකමය ලෙස හඳුනාගෙන, ලේඛනගත කර, සහ කාන්තා මන්ත්‍රීවරියන්ගේ ජයග්‍රහණ ප්‍රසිද්ධියට පත් කිරීම තුළින් මෙම ආඛ්‍යාන අභියෝගයට ලක් කිරීම සඳහා, හොඳින් ස්ථානගත වී ඇත. සාර්ථක මුල පිරීම්, දක්ෂ නායකත්වය, සහ ප්‍රජා මට්ටමෙහි බලපෑම ඉස්මතු කිරීම මගින්, කෝටාව "අසාර්ථක" සහ දේශපාලන ක්‍රියාධරයන් ලෙස  කාන්තාවන්ගේ නීත්‍යානුකූලභාවය අඩු තක්සේරු කරනා, පොදු සහ දේශපාලන පක්ෂ සංදර්භයන් දෙකටම බාධා කිරීම යන චෝදනා වලට එරෙහි විය හැක.

### 8.5.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවී බල ධූරාවලියන් අභියෝගයට ලක් කිරීම සඳහා ප්‍රජාවන් නියතු කිරීම

කාන්තා දේශපාලකයන් සමග ඍජුව වැඩ කිරීමට අමතරව, සිවිල් සමාජ සංවිධාන විසින්, ගැඹුරින් වැළලී පවතින ස්ත්‍රී පුරුෂ ධූරාවලියන් කඩා බිඳ දැමීමට ඉලක්ක කරන ලද දැනුවත් කිරීම් ප්‍රවර්ධන වැඩසටහන් තුළින් ප්‍රජාවන් සම්බන්ධ කර ගත යුතුය. ප්‍රජා-මට්ටමෙහි සංවාද, වැඩමුළු, සහ පොදු අධ්‍යාපන මුල පිරීම් මගින්, කාන්තාවන්ගේ භූමිකාව, නායකත්ව හැකියාව, සහ පොදු ජීවිතය තුළ සහභාගීත්වය පිළිබඳ පවතින උපකල්පනයන්ට අභියෝග කිරීමට උදව් කරගත හැක.  බිම් මට්ටමෙහි පවතින ප්‍රතිරෝධය ආමන්ත්‍රණය කිරීමට සහ කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වයට වඩා වැඩිපුර සහයෝගයක් දක්වන සමාජ වටපිටාවක් ගොඩ නැංවීමට, මෙවැනි මැදිහත්වීම් අත්‍යවශ්‍ය වේ.

## 8.6 අන්තර්-අංශගත නිර්දේශයන්

### 8.6.1 දේශපාලන සහ සිවිල් සාක්ෂරතාවය විධිමත් අධ්‍යාපනයට අන්තර්ගත කිරීම

ශ්‍රී ලාංකික සමාජය විශාල ලෙස දේශපාලන සාකච්ජා තුළ නිරත වුවද, අර්ථාන්විත වෙනසක් ඇති කිරීමට තනි පුද්ගල ඡන්ද මනාපයෙන් හැකියාවක් නොමැති බවට වන මුල් බැසගත් විශ්වාසය හේතුවෙන්, විධිමත් දේශපාලන ක්‍රියාවලිය පිළිබඳව පුළුල්ව පැතිරුණු

කළකිරීමක්, මෙම නිරතවීම් තුළට එක්ව තිබේ. මෙම සන්දර්භය තුළ, පද්ධතිකමය ලෙස ඡන්ද දායකයන්ගේ සාක්ෂරතාවය, දේශපාලන සාක්ෂරතාවය, සහ පළාත් පාලනය පිළිබඳ අධ්‍යාපනය, ජාතික අධ්‍යාපන විෂය මාලාවට අන්තර්ගත කිරීම අනිවාර්යය වේ. ප්‍රජාතාන්ත්‍රික සහභාගිත්වය යනු සංකේතාත්මක ක්‍රියාවක් ලෙස නොව සක්‍රීය සහ සිදුවෙමින් පවතින ක්‍රියාවලියක් ලෙස වඩා දැනුවත් පුරවැසියන් පිරිසක් ඇති කිරීමට මෙම සංකල්පයන්ට මුල් කාලීන නිරාවරණය වීම තුළින් හැකි වේ.

මෙවැනි අධ්‍යාපනයක් තුළින් පුරවැසියන් තුළ දේශපාලන නියෝජ්‍යත්වයක හැඟීමක් ජනිත කිරීමට ඉලක්ක කරගත යුතු අතර, බලය අවසානයේදී පවතින්නේ ඡන්දදායිකයන්ගේ මතය බව සහ දේශපාලන ක්‍රියාකාරීන් ඔවුන්ගේ පොරොන්දු වලට වගකිව යුතු සහ වගකියන බවට අවධාරණය කළ යුතුය. මෙවැනි අඩු වයසකදී සිදුවන තීරණාත්මක බැඳීම දිරිමත් කිරීමේ මෙම ප්‍රවේශය මගින්, කිඳා බැස ඇති නරුමවාදය සහ "කිළිටි දේශපාලනය" සාමාන්‍යකරණය අභියෝගයට ලක් කිරීමට දායක විය හැක.

### 8.6.2 අධ්‍යාපනික අන්තර්ගතය තුළ කාන්තාවන්ගේ දේශපාලන නායකත්වය ප්‍රධාන ලෙස ධාරාගත කිරීම.

වර්තමානයේ බහුතරයක් පුරුෂ-කේන්ද්‍රීය ලෙස විදහා දක්වන අංශ වන දේශපාලනය සහ නායකත්වය තුළ සුවිශේෂී භූමිකා රඟ දක්වන ලද කාන්තාවන් අර්ථාන්විත ලෙස ඉස්මතු කිරීමට ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතිය නැවත පරීක්ෂාවකට ලක්කළ යුතුය. කාන්තා නායිකාවන් පාසල් පෙළ පොත් තුළට සහ පන්ති කාමර සාකච්ඡා තුළට ඇතුළත් කිරීමෙන්, දේශපාලන අධිකාරිය ස්වභාවයෙන්ම පුරුෂ බවට වන අදහස කඩා බිඳ දමා, කාන්තා නායකත්වය සාමාන්‍යකරණය කිරීමට උපකාර කළ හැක. බලය සහිත තනතුරු තුළ කාන්තාවන්ගේ මුල් කාලීන සහ අඛණ්ඩ දෘශ්‍යතාවය, නායකත්වය සහ පොදු ජීවිතය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී උපකල්පනයන් නැවත හැඩගැස්වීමට අනිවාර්යයෙන් අවශ්‍ය වේ.

### 8.6.3 රැකබලා ගැනීමේ කාර්යයන් සහ දේශපාලන සහභාගීත්වය වටා පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රතිමාන අභියෝගයට ලක් කිරීම

කාන්තාවන් මූලික ලෙසම රැක බලාගන්නනන් සහ දේශපාලනය යනු පුරුෂාත්මක සහ සදාචාරාත්මක ලෙස පහතට වැටුනු වසමක් ලෙසද, එබැවින් එය කාන්තාවන්ට නුසුදුසු බවට වන ඉතා ගැඹුරින් කාවැදුනු විශ්වාසයක් පවතියි. මෙවැනි ප්‍රතිමාන ආමන්ත්‍රණය සඳහා, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ශ්‍රම විභේදනයන් ප්‍රශ්න කරන සහ කාන්තාවන්ගේ සමාජ භූමිකාවන්ගේ උපකල්පනයන්ට අභියෝග කරන, නොනවතින, දීර්ඝ-කාලීන මහජන දැනුවත් කිරීම් සහ අධ්‍යාපනික ප්‍රචාරක ව්‍යාපාර අවශ්‍ය වේ.

කාන්තාවන්ගේ දියුණුව ඔවුන්ගේ විවාහක හෝ ගෘහස්ත තත්වය සමග අනවරත ලෙස බැඳී පැවතීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ශ්‍රමයෙහි පුළුල් වූ සංස්කෘතිමය තර්කනය පිළිඹිබු කරන අතර, එය සමාජ සහ ස්වයං-අපකීර්තියට ලක්වීම යන කාරණා දෙකටම හේතු වේ. උදාහරණයක් ලෙස, දේශපාලනිකව සාර්ථක වන කාන්තාවන් ඔවුන් "සාර්ථක" පවුල් ජීවිතයක් යැයි හඳුන්වන අපේක්ෂාවන්ට අනුගත නොවුනහොත්, බොහෝ අවස්ථාවන්හිදී ඍණාත්මක ලෙස විනිශ්චය වේ.

මෙම ආකල්පයන් වෙනස් කිරීම යනු අතිශය ලෙස අත්‍යවශ්‍ය නමුත් ක්‍රමානුකූල ක්‍රියාවලියක් වුවද, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය සීමා කරවන සමාජ කොන්දේසි පරිවර්තනය කිරීමට තිරසාර අධ්‍යාපනික සහ සංස්කෘතිකමය මැදිහත්වීමක් අනිවාර්ය ලෙස අවශ්‍ය වේ.

## ආශ්‍රිත මූලාශ්‍රය


Acker, Joan. 1992. “From Sex Roles to Gendered Institutions.” *Contemporary Sociology* 21(5): 565–69. doi: 10.2307/2075528.

Altschuler, Daniel and Javier Corrales. 2012. “The Spillover Effects of Participatory Governance: Evidence from Community- managed Schools in Honduras and Guatemala.” *Comparative Political Studies* 45(5): 636-666. doi: 10.1177/0010414011427133.

Attanayake, Anula. 2008. “Elitism in women’s political participation in Sri Lanka within a South Asian context.” In *Women’s political participation and representation in Asia: Obstacles and challenges*, eds. Kazuki Iwanaga, 253–275. Denmark: Nordic Institute of Asian Studies.

Athukorala, Shehara, Supriya Ramanathan, Meredith Applegate and Sarah Bibler. 2021. *Women’s political representation in Sri Lanka: Electoral system analysis and recommendations*. Arlington: International Foundation for Electoral Systems.

Beckwith, Karen. 2005. “A Common Language of Gender?” *Politics and Gender*, 1 (1): 128- 137. doi: 10.1017/S1743923X05211017

Benjamin, Matthew. 2025.” From Tokenism to Transformation: Feminist Critiques of Gender Quota Laws in Politics.” Unpublished manuscript, uploaded to ResearchGate. Accessed March 12, 2025. https://www.researchgate.net/publication/390932730_From_Tokenism_to_Transformation_Feminist_Critiques_of_Gender_Quota_Laws_in_Politics

Bird, Karen. 2003. “Who are the Women? Where are the Women? And What Difference Can They Make? Effects of Gender Parity in French Municipal Elections.” *French Politics* 1(1): 5-38. doi: 10.1057/palgrave.fp.8200014

Bjarnegård, Elin. 2013. *Gender, Informal Institutions and Political Recruitment: Explaining Male Dominance in Parliamentary Representation*. Basingstoke: Palgrave Macmillan.

Bjarnegård, Elin and Meryl Kenny. 2015. “Revealing the ’Secret Garden’: The Informal Dimensions of Political Recruitment.” *Politics and Gender* 11 (4): 748-753. doi:10.1017/S1743923X15000471

Bjarnegård, Elin and Meryl Kenny. 2016. "Comparing Candidate Selection: A Feminist Institutionalist Approach." *Government and Opposition 51 (3)*: *370–92. doi:10.1017/gov.2016.4.*

Bystydzienski, Jill M. 1995. *Women in Electoral Politics: Lessons from Norway*. Westport: Praeger Publishers.

Ceylon Observer. 1931. "No Wives in Council." *Ceylon Observer,* March 5.

Chapman, Jennifer. 1993. *Politics, Feminism and the Reformation of Gender*. London: Routledge.

Chappell, Louise. 2006. "Moving to a comparative politics of gender?" 2(2): 221–263. doi:10.1017/S1743923X06211048.

Chappell, Louise and Georgina Waylen. 2013. "Gender and the Hidden Life of Institutions." *Public Administration 91 (3): 599-615. doi: 10.1111/j.1467-9299.2012.02104.x*

Chatterjee, Partha. 1993. *The Nation and Its Fragments: Colonial and Postcolonial Histories*. Princeton: Princeton University Press.

Childs, Sarah and Mona Lena Krook. 2006. "Should Feminists Give up on Critical Mass? A Contingent Yes." *Politics and Gender 2 (4):522-530. doi:10.1017/s1743923x06251146.*

Childs, Sara and Mona Lena Krook. 2008. "Critical Mass Theory and Women's Substantive Representation." *Political Studies* 56(3): 725–736. doi: 10.1111/j.1467-9248.2007.00712.x

Childs, Sara and Mona Lena Krook. 2009. "Analysing Women's Substantive Representation: From Critical Mass to Critical Actors." *Government and Opposition* 44(2): 125-145. doi:10.1111/j.1477-7053.2009.01279.x.

Connell, Raewyn. W. 2002. *Gender*. Cambridge: Polity Press.

Conway, M. Margaret, David W. Ahern and Gertrude A. Steuernagel. 2004. *Women and Political Participation: Cultural Change in the Political Arena*. Washington, DC: Congressional Quarterly, Inc.

Cornwall, Andrea and Anne Marie- Goetz. 2005. “Democratizing Democracy: Feminist Perspectives.” *Democratisation* 12(5): 783-800. doi:10.1080/13510340500322181.

Dahlerup, Drude, Zeina Hilal, Nana Kalandadze and Rumbidzai Kandawasvika-Nhundu. 2014. *Atlas of Electoral Gender Quotas*. Stockholm: International Institute for Democracy and Electoral Assistance. https://www.idea.int/sites/default/files/publications/atlas-of-electoral-gender-quotas.pdf

Dahlerup, Drude and Milica Antic Gaber. 2017. “The Legitimacy and Effectiveness of Gender Quotas in Politics in CE Europe.” *Teorija in Praksa* 54(2):307-316.

De Alwis, Malathi. 1994. “Towards a feminist historiography: reading gender in the text of the nation.” In *Introduction to Social Theories,* eds. Nira Wickramasinghe and Radhika Coomaraswamy. New Delhi: Konark Publications.

De Alwis, Malathi.1995. “Gender, Politics and the ‘Respectable Lady.’” In *Unmasking the Nation: The Politics of Identity and History in Modern Sri Lanka,* eds. Pradeep Jeganathan and Qadri Ismail, 137-157. Colombo: Social Scientists’ Association.

De Alwis, Malathi. 1995–96. “Notes toward a Discussion of Female Portraits as Texts.” *Pravda* 4 (5and6): 16–21. https://polity.lk/wp-content/uploads/2024/09/Pravada-vol4.56-Notes-towards-discussion-of-female-portraits-as-texts.pdf.

De Alwis, Malathi. 1997. “The Production and Embodiment of Respectability: Gendered Demeanours in Colonial Ceylon” In *Sri Lanka: Collective Identities Revisited,* eds. Michael Roberts, 105-143. Colombo: Marga Institute.

De Alwis, Malathi. 1998. *Maternalist Politics in Sri Lanka: A Historical Anthropology of its Conditions of Possibility*. New York: University of Columbia.

De Alwis, Malathi. 2002. “The Changing Role of Women in Sri Lankan Society.” *Social Research* 69(3): 675-691.http://www.jstor.org/stable/40971569.

De Alwis, Malathi. 2004. “The Moral Mother Syndrome.” *Indian Journal of Gender Studies* 11(1): 65–73. doi:10.1177/097152150401100105.

De Alwis, Malathi and Kumari Jayawardena. 2023. *Casting Pearls: The Women’s Franchise Movement in Sri Lanka*. Colombo: Kumari Jayawardena.

Department of Census and Statistics. 2026. *"Members of Parliament by Year and Sex."* Accessed March 21,2026. https://www.statistics.gov.lk/Resource/en/GenderStatistics/WomenEmpowerment/Membersofparliamentbyyearandsex.pdf

De Silva, Jani. 2005. Globalization, terror and the shaming of the nation: Constructing local masculinities in a Sri Lankan village. Bloomington, IN: Trafford.

De Silva, Wimala. 1995. *Participation of Women in Politics and Decision Making in Women, Political Empowerment and Decision Making*. Colombo: Centre for Women's Research

Dolan, Julie A., Melissa M. Deckman, and Michele L. Swers. 2010. *Women and Politics: Paths to Power and Political Influenc*e. New York: Pearson.

Durest-Lahti, Georgia. 2008. "Gender Ideology: Masculinism and Feminalism." In *Politics, Gender, and Concepts: Theory and Methodology,* ed. Gary Goertz and Amy Mazur, 159-192.Cambridge: Cambridge University Press.

Enloe, Cynthia.2014. "Gender Makes the World Go Round: Where Are the Women?" In *Bananas, Beaches and Bases: Making Feminist Sense of International Politics*, 2nd ed., 1–36. University of California Press. http://www.jstor.org/stable/10.1525/j.ctt6wqbn6.6.

Evteeva, Maria, Lucrecia Burges, and Tomeu Sales Gelabert. 2024. "Internalised Misogyny: The Patriarchy inside Our Heads." *Journal of Integrated Social Sciences* 14 (1): 82–108. https://www.jiss.org/documents/volume_14/JISS%202024%2014(1)%2082-108%20Internalized%20Misogyny.pdf.

Findlay, Bruce. and Margaret Piggott. 2005. "Double Jeopardy: Lesbians and the Legacy of Multiple Stigmatised Identities." *Australian Journal of Psychology* 57: 85. doi:10.25916/sut.26263172.v1

Franceschet, Susan, Mona Lena Krook and Jennifer M. Piscopo. "The Impact of Gender Quotas: A Research Agenda." Paper presented at the Annual Meeting of the American Political Science Association, Toronto, Canada, September 3-6, 2009. http://mlkrook.org/pdf/FKP%20APSA%202009.pdf

Gallagher, Michael. 1988. “Introduction.” In *Candidate Selection in Comparative Perspective The Secret Garden of Politics,* ed. Michael Gallagher and Michael Marsh, 1-20. London:Sage.

Gamson, Joshua. 1997. “Messages of Exclusion: Gender, Movements, and Symbolic Boundaries.” *Gender and Society 11(2): 178–99*. http://www.jstor.org/stable/190542.

Giri, Anbika. 2024. *Women’s Political Participation in Federal Nepal Achievements and Challenges*. Lalitpur: Democracy Resource Center Nepal. https://www.democracyresource.org/wp-content/uploads/2024/10/DRCN_Womens-Political-Participation-in-Federal-Nepal-Achievements-and-Barriers-_English_2024.pdf.

Goetz, Anne Marie. 2007. “Gender Justice, Citizenship and Entitlements: Core Concepts, Central Debates and New Directions for Research.” In *Gender Justice, Citizenship and Development,* ed. Maitrayee Mukhopadhyay and Navsharan Singh, 16-57. New Delhi/Ottawa: Zubaan /International Development Research Centre.

Gooneratne, Yasmine. 1986. *Relative Merits: A Personal Memoir of the Bandaranaike Family of Sri Lanka*. London: Hurst.

Gouws, Amanda and Diana Højlund Madsen. 2024. “Big man politics and multi-party rule call for new gender plans.” *The Nordic Africa Institute*. Accessed October 15, 2025. https://nai.uu.se/stories-and-events/news/2024-11-13-big-man-politics-and-multi-party-rule-call-for-new-gender-plans.html

Hawkesworth, Mary. 2005. *“Engendering Political Science: An Immodest Proposal.” Politics and Gender* 1(1):141-156. doi: 10.1017/S1743923X0523101X.

Helmke, Gretchen, and Steven Levitsky. 2004. “Informal Institutions and Comparative Politics: A Research Agenda.” *Perspectives on Politics* 2(4): 725–40. doi: 10.1017/S1537592704040472.

Helmke, Gretchen, and Steven Levitsky. 2006. “Introduction.” In *Informal Institutions and Democracy: Lessons from Latin America,* ed. Gretchen Helmke and Steven Levitsky, 1-32. Baltimore: Johns Hopkins University Press.

Herath, Herath Mudiyanselage Ariyarathna. 2015. "Place of Women in Sri Lankan Society Measures for Their Empowerment for Development and Good Governance." *Vidyodaya Journal of Management* 1 (1): 1-14. doi:10.31357/vjm.v1i1.2475.

Hewamanne, Sandya. 2008. Stitching identities in a free trade zone: Gender and politics in Sri Lanka. Philadelphia: University of Pennsylvania Press.

Hochschild Arlie and Anne Machung. 2012. *The second shift: Working families and the revolution at home*. London: Penguin Publishing Group.

Holmes, Georgina . 2020. "Feminist Institutionalism ." In *United Nations Peace Operations and International Relations Theory*, ed. Kseniya Oksamytna and John Karlsrud, 214-235. Manchester: Manchester University Press. https://centaur.reading.ac.uk/86471/1/Peacekeeping%20and%20Feminist%20Institutionalism_Pre-print_Holmes%202019%20copy.pdf

Hooper, Charlotte. 2001. *Manly States: Masculinities, International Relations and Gender Politics*. New York: Columbia University Press.

Inter-Parliamentary Union (IPU). 2025a. "Sri Lanka: 2020 Parliamentary Elections." *Inter-Parliamentary Union*. Accessed April 15, 2025. https://data.ipu.org/parliament/LK/LK-LC01/election/LK-LC01-E20200805/.

Inter-Parliamentary Union (IPU). 2025b. "Sri Lanka: Parliamentary Elections." *Inter-Parliamentary Union*. Accessed April 15, 2025. https://data.ipu.org/parliament/LK/LK-LC01/.

Inter-Parliamentary Union (IPU). 2026. "Monthly ranking of women in national parliaments." *Inter-Parliamentary Union*. Accessed March 15, 2026. https://data.ipu.org/women-ranking/?date_month=2&date_year=2026.

Jayawardena, Janaki. 2002. "Cultural Construction of the 'Sinhala Woman' and Women's Lives in Post-Independence Sri Lanka." Doctoral Thesis, University of York.

Jayawardena, Kumari. 1986. *Feminism and Nationalism in the Third World.* London: Zed.

Jayawardena, Kumari and Malathi de Alwis. 1996. "Embodied violence: Communalising women's sexuality in South Asia." *Reproductive Health Matters* 4(8):162-166. doi:10.1016/S0968-8080(96)90372-9.

Jayawardena, Kumari .1997. "Vivienne Goonewardena: "La Pasionaria" of Sri Lanka." *Pravada* 4 (10 and11): 16-18. https://polity.lk/wp-content/uploads/2024/09/Pravada-4.1011-Vivienne-Goonewardena.pdf.

Jayawardena, Kumari. 2017. *Labour, Feminism and Ethnicity in Sri Lanka.* Colombo: Sailfish.

Jayaweera, Swarna. 1990. "European Women Educators under the British Colonial Administration in Sri Lanka." *Women's Studies International Forum,* 13(4), 323–331 doi: 10.1016/0277-5395(90)90029-W.

Kandiyoti, Deniz. 1991. "Bargaining with patriarchy." In *The Social Construction of Gender,* eds. Judith Lorber and Susan A. Farrell. London/Delhi: Sage Publications.

Kanold, Erica. 2020. "Life is unfair – but not without reason : A field study of Sri Lankan women's struggle for equal political representation and influence" Bachelor's Thesis. Uppsala University, Sweden. https://urn.kb.se/resolve?urn=urn:nbn:se:uu:diva-412805

Kanter, Rosabeth Moss. 1977. "Some Effects of Proportions on Group Life." *American Journal of Sociology,* 82(5), 965–990. doi:10.1086/226425

Kenny, Meryl. 2007. "Gender, institutions and power: A critical review." *Politics* 27(2): 91–100. doi: 10.1111/j.1467-9256.2007.00284.x

Khan, Ayesha, and Sana Naqvi. 2020. "Dilemmas Of Representation: Women in Pakistan's Assemblies." *Asian Affairs 51 (2): 286–306. doi:10.1080/03068374.2020.1748414.*

Kiribamuna, Sirima, 1999. *Women and Politics in Sri Lanka: A Comparative Perspective.* Kandy: International Centre for Ethnic Studies.

Kittilson, Miki Caul. 2013. "Political Parties." In *The Oxford Handbook of Gender and Politics,* ed. Georgina Waylen, Karen Celis, Johanna Kantola and S. Laurel Weldon, 536- 554. Oxford: Oxford University Press.

Kodikara, Chulani.2008. "Women and Politics in Sri Lanka: The Challenges to Meaningful Participation." *Groundviews*. Accessed April 10,2025. http://www.groundviews.org/2008/09/02/women-and-politics-in-sri-lanka-the challenges-to-meaningful-participation/#more-978

Kodikara, Chulani. 2009. *The Struggle for Equal Political Representation of Women in Sri Lanka: A Stocktaking Report for the Ministry of Women's Empowerment and the United Nations Development Programme*. Colombo: United Nations Development Programme. https://www.undp.org/sites/g/files/zskgke326/files/migration/lk/WPE-FINAL-PDF.pdf.

Kodikara, Chulani. 2016. "The Long March." *Options* 51: 13–15.

Kodikara, Chulani and Kumudini Samuel. 2018. "The Significance of the 25% Quota for Women in Local Government." *Groundviews*. Accessed April 20,2025. https://groundviews.org/2018/02/07/the-significance-of-the-25-quota-for-women-in-local-government/.

Kodikara, Chulani. 2023. "Searching for Winning Horses: Women, Electoral Democracy, and the Local Government Quota in Sri Lanka." In *Democracy and Democratization in Sri Lanka (Vol 1),* eds. Jayadeva Uyangoda , 413-448. Colombo: Bandaranaike Centre for International Relations.

Kottegoda, Sepali. 2023 "Unpaid Care Work Is Work." *Polity* 11 (1): 85-87. https://polity.lk/wp-content/uploads/2024/06/Polity_Vol.11.1_21Sepali.pdf.

Kularatne, Hilda.1922. "Women's Place in our National Life." *Young Lanka,* February 26.

Krook, Mona and Fiona Mackay. 2011. *Gender, Politics and Institutions: Towards a Feminist Institutionalism*. Basingstoke: Palgrave Macmillan.

Lauth, Hans-Joachim. 2000. "Informal Institutions and Democracy." *Democratization 7 (4): 21–50*. doi*:10.1080/13510340008403683*.

Liyanage, Kamala. 2018a. "Women Political Parties in Sri Lanka." In *Political Parties in Sri Lanka: Change and Continuity,* eds. Amitha Shastri and Jayadeeva Uyangoda, 315-354. New Delhi: Oxford University Press.

Liyanage, Kamala, 2018b. “Testing the Politics of Presence: Women’s Representation in Local Government in Sri Lanka.” In *Women Governing Institutions in South Asia,* ed. Nizam Ahmed, 305- 321. Cham, Switzerland: Palgrave Macmillan,

Lombardo, Emanuela and Petra Meier. 2014. *The Symbolic Representation of Gender. A Discursive Approach*. Aldershot: Ashgate.

Lovenduski Joni and Pippa Norris. 1989. “Selecting Women Candidates: Obstacles to the Feminisation of the House of Commons.” *European Journal of Political Research* 17 (5): 533-562. doi: 10.1111/j.1475-6765.1989.tb00206.x.

Lovenduski, Joni. 2005. *Feminizing Politics*. Cambridge: Polity Press.

Lovenduski, Joni. 2011. “Foreword.” *Gender, Politics and Institutions,*ed. In Mona Lena Krook , Fiona Mackay, vii-xi. Basingstoke: Palgrave.

Lowndes, Vivien. 2005. “Something Old, Something New, Something Borrowed …: How Institutions Change (and Stay the Same) in Local Governance.” *Policy Studies 26 (3–4): 291–309. doi:10.1080/01442870500198361.*

Lupien, Pascal. 2020. “Women and Participatory Mechanisms in Latin America: Deepening Democracy or More of the Same?.” *Gender, Place and Culture* 28(1):1-28. doi:10.1080/0966369X.2020.1817874.

Mackay, Fiona, Meryl Kenny and Louise Chappell. 2010. “New Institutionalism Through a Gender Lens: Towards a Feminist Institutionalism?.” *International Political Science Review* 31 (5):573-588. doi: 10.1177/0192512110388788.

Mahoney, James and Kathaleen Thelen. 2010. *Explaining Institutional Change: Ambiguity, Agency, and Power*. Cambridge: Cambridge University Press.

Mangayarkarasu, R. “Women Leadership in Local Governance in India: A Study of Women Panchayat Leaders in Tamil Nadu.” Paper presented at the International Conference on Political Science, Sociology and International Relations, Global Science and Technology Forum, Singapore, November 7-8,2011.

Manuratne, S. A. Prabha M., Harindra B. Dassanayake, Rajni Gamage, and Kanaka Abeygunawardena. 2024. *An Assessment of Women’s Political Representation through the 25 Percent Quota in Sri Lanka: Impact and Lessons Learnt.* Colombo: International Foundation for Electoral Systems. https://muragala.lk/wp-content/uploads/2024/02/Women-25-Quota-Study-Final-English.pdf.

Marecek, Jeanne. 2000. “Am I a Woman in These Matters? Notes on Sinhala Nationalism and Gender in Sri Lanka.” *Gender Ironies Of Nationalism: Sexing The Nation* 139-160. https://works.swarthmore.edu/fac-psychology/604

Mehta, G. S. 2002. *Participation of Women in the Panchayati Raj System*. New Delhi: Kanishka Publishers.

Meier, Petra and Eline Severs. 2018. “The Dark Side of Descriptive Representation: Bodies, Normalisation and Exclusion.” *Politics and Governance 6 (3): 31. doi:10.17645*/pag.v6i3.1412.

Munasinghe, V. Prabath and Kaushalya Ariyarathne. 2019. *Quest for Agency Reflections on Women’s Quota in Local Governance*. Colombo 07: Law and Society Trust.

Muslim Women’s Research Action Forum. 1999. *Between two worlds: Muslim women in a multi ethnic society*. Colombo: Muslim Women’s Research and Action Forum.

Naseer, Sobia, Uzma Ashiq Khan, Safa Mubashar, and Maryam Zafar. 2023. “Women’s Political Participation and Representation in Pakistan: Critical Analysis.” *Asian Journal of Academic Research* 4 (2): 73–90. https://www.ajar.org.pk/index.php/home/article/view/2023-vol-04-issue-2-womens-political-participation/pdf

Norris, Pippa and Joni Lovenduski. 1995. *Political Recruitment: Gender, Race and Class in British Parliament*. Cambridge: Cambridge University Press

Obeyesekere, Gananath. 1984/1987. The cult of goddess Pattini. Chicago: University of Chicago Press.

Obiria, Moraa. 2025. “Here comes the sunset clause: Why men could also need gender top-up in Parliament.” *Daily Nation*. October 10.

Parliament of Sri Lanka. 2026a. *“Women in Parliament.”* Accessed March 21, 2026. https://www.parliament.lk/en/learn/women-in-parliament/list?

Parliament of Sri Lanka. 2026b. *“Evolution of the Parliamentary System.”* Accessed March 21, 2026. https://www.parliament.lk/en/learn/handbook-of-parliament/evolution-of-the-parliamentary-system

Patel, Taran, Laurence Romani, Poonam Oberoi and Chandra Ramasamy. 2021. "Gender Role Encapsulation as Resistance to Patriarchy: Women Politicians' Work and Gender Equality in India." *Organization 30 (2): 307-325*. doi: 10.1177/1350508421995764.

Peiris, Pradeep. 2018. "Changing Dynamics of the Party-Voters Nexus." In *Political Parties in Sri Lanka: Change and Continuity,* eds. Amita Shastri and Jayadeeva Uyangoda, 71-99. New Delhi: Oxford University Press.

Peiris, Pradeep. 2014. "Catch All Parties and the Party- Votes Nexus: A Study on the Nature of the Party-Voter Relationship of the UNP and SLFP." PhD Thesis, University of Colombo.

Peiris, Pradeep and Hasini Lekamwasam. 2021. *Necessary Yet Insufficient: Women's Quota for Wider Political Representation in Sri Lanka*. Colombo: Women and Media Collective.

Peiris, Pradeep. 2022. *Catch-all parties and party-voter nexus in Sri Lanka*. Singapore: Palgrave Macmillan.

Pejovich, Svetozar. 1999. "The Effects of the International of Formal and Informal Institutions on Social Stability and Economic Development." *Journal of Markets and Morality* 2(2), 164-81. doi: 10.4337/9781847200167.00012

People's Action for Free and Fair Election.2023. *"Let's make the increased women's representation in politics a blessing for the country."* Accessed March 21,2026. https://www.paffrel.com/images/publications/2023/Lets%20make%20the%20increased%20womens%20representation%20in%20politics%20a%20blessing%20for%20the%20country.pdf

Phillips, Anne. 1995. *The Politics of Presence*. Oxford: Clarendon Press.

Phillips, Anne. 1998, "Democracy and Representation: Or, Why Should it Matter who Our Representatives Are?." In *Feminism And Politics: Oxford Readings In Feminism*, ed. Anne Phillips, 224-240. New York: Oxford University Press.

Pinto-Jaywardena, Kishali and Chulani Kodikara. 2003. *Women and Governance in Sri Lanka*. Colombo: International Centre for Ethnic Studies.

Pitkin, Hanna Fenichel. 1967. *The Concept of Representation*. Berkeley, CA: University of California Press.

Qamar, Darakhsha. 2023. "Gender and the Nationalist Imagination of Women in Sri Lanka." *Samyukta: A Journal of Gender and Culture 8 (1*). doi: 10.53007/sjgc.2023.v8.i1.174.

Rai, Anuradha. 2016. "Women in Democracies: Quota System and Political Empowerment of Women in Changing Societies." *The Indian Journal of Political Science 77 (1): 15–20*. https://www.jstor.org/stable/26575661.

Rai, Shirin. 2005. " Case Study: South Asia" In *Women in Parliament : Beyond Numbers,* ed. Julie Ballington and Azza Karam, 174-184. Sweden: International Institute for Democracy and Electoral Assistance

Ranatunga, R. M. C. L. K., and P. M. Dunusinghe. 2021. "Nature of Time Poverty in Sri Lanka." *Sri Lanka Journal of Economic Research 9 (1): 51-69*. doi: 10.4038/sljer.v9i1.155.

Rambukwella , Harshana, and Dr Kanchana N. Ruwanpura. 2016. "The Paradox of Sri Lanka's Elite Political Women." *Dangerous Women,* July 11, 2016. https://dangerouswomenproject.org/2016/07/11/sri-lanka-political-women/.

Samarakoon, Gayani, Deanna Grant-Smith, Robyn Mayes, and Dinuka Wijetunga. 2022. "An Intersectional Approach to Understanding the Inequality and Subordination of Sri Lankan Women Apparel Workers." *Vidyodaya Journal of Management 8 (2): 208 -236*. doi: 10.31357/vjm.v8iii.6102.

Sater, James N. 2007. "Changing Politics from Below? Women Parliamentarians in Morocco." *Democratization* 14 (4): 723-742.doi: 10.1080/13510340701398352

Sawer, Marian. 2000. "Parliamentary Representation of Women: From Discourses of Justice to Strategies of Accountability." *International Political Science Review 21(4): 361–80. doi:10.1177/0192512100214003*.

Schwartz, Helle. 2004. "Women's Representation in the Rwandan Parliament- An Analysis of Variations in the Representation of Women's Interests Caused by Gender and Quota." M.A. Thesis. University of Gothenburg, Sweden. https://www.researchgate.net/publication/239605822_Women's_Representation_in_the_Rwandan_Parliament_-_An_Analysis_of_Variations_in_the_Representation_of_Women's_Interests_Caused_by_Gender_and_Quota

Selkirk, Rev. James. 1844. *Recollections of Ceylon*. London: J. Hatchard and Son.

Seneviratne, Maureen. 1969. *Some Women of the Mahawamsa and Culawamsa*. Colombo: H.W. Cave.

Shvedova, Nadezhda. 2005. "Obstacles to Women's Participation in Parliament" In *Women in Parliament: Beyond Numbers,* ed. Julie Ballington and Azza Karam, 33-50. Sweden: International Institute for Democracy and Electoral Assistance.

Siriwardhana, Isuri W. 2023. "Political Parties in Sri Lanka and the Question of Internal Democracy." In *Democracy and Democratization in Sri Lanka (Vol 1),* eds. Jayadeva Uyangoda , 413-448. Colombo: Bandaranaike Centre for International Relations.

Tripp, Aili Mari. 2006. "Uganda: Agents of Change for Women's Advancement?" In *Women in African Parliaments*, ed. Gretchen Bauer and Hannah E. Britton, 111-132. Boulder: Lynne Rienner.

UNFPA. 2025. *Barriers to Women's Political Participation in Sri Lanka: A Literature Review*. Colombo: UNFPA.

UN Women. 2021. "Women's Effective Participation and Decision Making in Public Life, Elimination of Violence, for Achieving Gender Equality, and Empowerment of All Women and Girls." *UN Women*. Accessed April 21, 2025. https://asiapacific.unwomen.org/sites/default/files/Field%20Office%20 ESEAsia/Docs/Publications/2021/12/bd-Advocacy-Brief-s.pdf.

Uyangoda, Jayadeeva and Neloufer de Mel. 2012. *Reframing Democracy: Perspectives on the Culture of Inclusion and Exclusion in Contemporary Sri Lanka*. Colombo: Social Scientists' Association.

Uyangoda, Jayadeeva. 2018. "Political Parties in Crisis or Transition?" *Colombo Telegraph*. Accessed 17 March, 2026. https://www.colombotelegraph.com/index.php/political-parties-in-crisis-or-transition/.

Verité Research. 2018. *"The Cabinet Decision to Ban Women from Purchasing Liquor is Unconstitutional."* Accessed February 16, 2026. https://www.veriteresearch.org/wp-content/uploads/2024/05/Cabinet-Decision-to-Ban-Women-from-Purchasing-Liquor-is-Unconstitutional.pdf.

Vijeyarasa, Ramona. 2020. "Women's Absence in Sri Lankan Politics: Lessons on the Effectiveness and Limitations of Quotas to Address under-Representation."

*Women's Studies International Forum* 81 (May): 1-8. doi:10.1016/j.wsif.2020.102371.

Wickramasinghe, Maithree and Chulani Kodikara. 2012. "Representation in Politics: Women and Gender in the Sri Lankan Republic." In *Sri Lankan Republic at 40,* ed. Asanga Welikala, 771-820. Colombo: Centre for Policy Alternatives.

Winslow, Deborah. 1980. "Rituals of First Menstruation in Sri Lanka." *Man 15 (4): 603 -625. doi:10.2307/2801536.*

Witz, Anne and Mike Savage. 1992. "Theoretical Introduction: Gender in Organizations." In *Gender and Bureaucracy*, ed. Mike Savage and Anne Witz, 3-64. Oxford: Blackwell.

Women and Media Collective. 2023. *Policy Brief: Unpaid Care Work*. https://womenandmedia.org/wp-content/uploads/2023/04/POLICY-BRIEF-UNPAID-CARE-WORK-V3.pdf

Women's Environment and Development Organization. 2007. *Women Candidates and Campaign Finance*. New York: Women's Environment and Development Organization. https://wedo.org/wp-content/uploads/women-candidates-and-campaign-finance-report-final.pdf.

World Bank. 2025a. *"Population, Female (% of Total Population) - Sri Lanka."* Accessed April 15, 2025. https://data.worldbank.org/indicator/SP.POP.TOTL.FE.ZS.

World Bank. 2025b. *"Featured Indicators – Sri Lanka."* Accessed March 15, 2026. https://genderdata.worldbank.org/en/economies/sri-lanka

Young, Iris Marion. 2002. *Inclusion and Democracy*. Oxford: Oxford University Press.

Yuval- Davis, Nira. 1997. *Gender and Nation*. London: Sage.

Zetterberg, Pär. 2009. "Engineering Equality? Assessing the Multiple Impacts of Electoral Gender Quotas." PhD Dissertation, Uppsala Universitet, Sweden. https://uu.diva-portal.org/smash/get/diva2:211066/FULLTEXT01.pdf

# පළාත් පාලන දේශපාලනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී යථාර්ථයන්හි පැවැත්ම සහ බලපෑම

## උවිනි පණ්ඩිත

මෙම වාර්තාව මගින් දිස්ත්‍රික්ක කිහිපයක් පුරා පවත්වන ලද අතිතීව්‍ර සම්මුඛ සාකච්ඡා මත පදනම්ව, පළාත් පාලනය සඳහා 2018 දී 25% කෝටාව හඳුන්වා දීමෙන් පසු තේරී පත් වූ කාන්තාවන්ගේ ජීවන අත්දැකීම් ගවේෂණය කර ඇත. පුරුෂාධිපත්‍යය සම්මතයන් සහ භාවිතයන් මගින් ගැඹුරින් හැඩගස්වා ඇති දේශපාලන අවකාශයන්ට ඇතුළු වීමේදී මෙන්ම සැරිසැරීමේදී ඇති සංකීර්ණ යථාර්ථයන් ඔවුන්ගේ ප්‍රවෘතීන් මගින් අනාවරණය කරගත හැකි විය.

කෝටාව මගින් කාන්තාවන්ගේ නියෝජනය වැඩි කිරීම සඳහා සැලකිය යුතු පියවරක් සනිටුහන් කළ ද මෙම පර්යේෂණය මගින් පෙන්නුම් කරන දෙයක් නම් කාන්තා දේශපාලන නියෝජනය පැවැත්මකට පමණක් සීමා වෙමින් පවතින අතර බලපෑමක් සහතික නොකරන බවයි. කාන්තා මන්ත්‍රීවරියන් මූල්‍ය සීමාවන් සහ සීමිත ප්‍රචාරක සහය දැක්වීමක සිට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අපේක්ෂාවන් දක්වා මෙන්ම තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ගෙන් ද බැහැර කිරීමක් පෙනේ. එමෙන්ම ඔවුන් පුරුෂාධිපත්‍යය සහිත පක්ෂ ව්‍යුහයන් සහ සභා තුළ වූ ප්‍රතිරෝධය දක්වා අභියෝග රාශියකට මුහුණ දෙන බව විස්තර කරයි. මෙම බාධක බොහෝ විට අර්ථවත් ලෙස දේශපාලනයට සහභාගී වීමට සහ ඔවුන්ගේ භූමිකාවන්හි අධිකාරිය ක්‍රියාත්මක කිරීමට ඇයට ඇති හැකියාව සීමා කර ඇත.

මෙම පඨිතය හරහා ස්ත්‍රීවාදී ආයතනිකවාදී ඉදිරි දර්ශනයක් මත ගොඩනැගීම හා කාන්තාවන් කොන් කරන අවිධිමත් සම්මතයන් සහ ආයතනික භාවිතයන් මගින් නියෝජනයේ විධිමත් ජයග්‍රහණ අඩපණ කරන ආකාරය ඉස්මතු කර ඇත. එබැවින්, එය සංඛ්‍යාත්මක ඇතුළත් කිරීමෙන් ඔබ්බට ගොස් තිරසාර ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියි. එමෙන්ම හුදෙක් කාන්තාවන් ලෙස පමණක් නොව පළාත් පාලනය සඳහා පූර්ණ ලෙස මෙන්ම ඵලදායී ලෙස සහ සමාන කොන්දේසි මත සහභාගී වීමට ඇති හැකියාව සහතික කිරීම සඳහා දේශපාලන ආයතන ප්‍රතිසංවිධානය කරන ලෙස ද ඉල්ලා සිටී.

ISBN: 978-624-5502-52-3

9 786245 502523

INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

මුද්‍රණය : හොරයිසන් ප්‍රින්ට් (පුද්) සමාගම.